287 වන කාණ්ඩය - 9 වන කලාපය
தொகுதி 287 - இல. 9
Volume 287 - No. 9

2021 දෙසැම්බර් 02 වන බ්‍රහස්පතින්දා
2021 டிசம்பர் 02, வியாழக்கிழமை
Thursday, 02nd December, 2021

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

සුගීෂ්වර වික්‍රමසිංහ පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු වීරසුමන වීරසිංහ මහතා] - පළමුවන වර කියවන ලදී.

**විසර්ජන පනත් කෙටුම්පත, 2022 - [දහසයවැනි වෙන් කළ දිනය]:**

[ශීර්ෂ 176, 336 (වරාය හා නාවික); ශීර්ෂය 434 (ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන); ශීර්ෂය 166 (ජලසම්පාදන); ශීර්ෂ 433, 332 (ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන)] - කාරක සභාවේදී සලකා බලන ලදී.

**කල් තැබීමේ යෝජනාව:**

ඇළ, වේලි හා වාරිමාර්ග නිසි ලෙස නඩත්තු කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

சுகீஸ்வர விக்ரமசிங்க மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ]- முதன்முறை மதிப்பிடப்பட்டது.

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022 - [ஒதுக்கப்பட்ட பதினாறாம் நாள்]:**

[தலைப்புக்கள் 176, 336 (துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை); தலைப்பு 434 (களஞ்சிய வசதிகள், கொள்கலன்கள் முனையங்கள், துறைமுக வழங்கல் வசதிகள், இயந்திரப் படகுகள் மற்றும் கப்பற்றொழில் அபிவிருத்தி); தலைப்பு 166 (நீர் வழங்கல்); தலைப்புக்கள் 433, 332 (கிராமிய மற்றும் பிரதேச குடிநீர் வழங்கல் கருத்திட்ட அபிவிருத்தி)] – குழுவில் ஆராயப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**

கால்வாய்கள், அணைக்கட்டு மற்றும் நீர்ப்பாசன வாய்க்கால்களை உரிய முறையில் பராமரித்தல்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

PRIVATE MEMBERS' BILLS:

Sugeeswara Wickramasinghe Foundation (Incorporation) – [The Hon. Weerasumana Weerasinghe] – Read the First time

APPROPRIATION BILL, 2022 – [Sixteenth Allotted Day]:

Considered in Committee – [Heads 176, 336 (Ports and Shipping); Head 434 (Warehouse Facilities, Container Yards, Port Supply Facilities and Boats and Shipping Industry Development); Head 166 (Water Supply); Heads 433, 332 (Rural and Divisional Drinking Water Supply Projects Development)]

ADJOURNMENT MOTION:

Proper Maintenance of Canals, Anicuts and Irrigation Channels

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2021 දෙසැම්බර් 02වන බ්‍රහස්පතින්දා***
*2021 டிசம்பர் 02, வியாழக்கிழமை*
*Thursday, 02nd December, 2021*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කළුතර-දකුණ, නාගොඩ, හිල් හවුස් පාර, අංක 1118/1/ඊ දරන ස්ථානයේ පදිංචි ජේ.ඒ. හේමලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පොළොන්නරුව, නව නගරය, රජයේ සේවක නිවාස යෝජනා ක්‍රමය, අංක 397 දරන ස්ථානයේ පදිංචි කේ.පී. චාමින්ද ධර්මතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -460/2020- (1), ගරු මොහමඩ් මුසම්මිල් මහතා.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම්: පදිංචිකරුවන්ට ඔප්පු
## காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான கண்டி மாவட்டத்திலுள்ள காணிகள்: குடியிருப்பாளர்களுக்கான உறுதிகள்
## LAND IN KANDY DISTRICT BELONGING TO LAND REFORM COMMISSION: DEEDS FOR RESIDENTS

714/2020

**2.** **ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් පිහිටි ප්‍රදේශ කවරේද;

(iii) එම ඉඩම්වල පදිංචි වී සිටින පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සඳහන් පවුල් ඒකක සඳහා නීත්‍යනුකූල ඔප්පු ලබා දී තිබේද;

(ii) එසේ නම් ලබා දී ඇති ඔප්පු සංඛ්‍යාව කොපමණද;

(iii) ඔප්පු ලබා දිය යුතු, එහෙත් මේ වනතෙක් ඔප්පු ලබා දී නොමැති පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(iv) ඉඩම් ඔප්පු නොමැති පවුල් ඒකක සඳහා ඔප්පු ලබා දීමට සකස් කර ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான கண்டி மாவட்டத்தில் அமைந்துள்ள காணிகளின் அளவு யாதென்பதையும்;

(ii) மேற்படி காணிகள் அமைந்துள்ள பிரதேசங்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி காணிகளில் குடியிருக்கும் குடும்ப அலகுகளின் எண்ணிக்கை எவ்வளவென்பதயும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

[ගරු මයන්ත දිසානායක මහතා]

(ஆ) (i) மேற்குறிப்பிட்ட குடும்ப அலகுகளுக்குச் சட்ட ரீதியான உறுதிகள் வழங்கப்பட்டுள்ள னவா என்பதையும்;

(ii) ஆமெனில், வழங்கப்பட்டுள்ள உறுதிகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) உறுதிகள் வழங்கவேண்டியபோதும் இதுவரை யும் உறுதிகள் வழங்கப்படாத குடும்ப அலகு களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iv) காணி உறுதிகள் இல்லாத குடும்ப அலகுகளுக்கு உறுதிகளை வழங்குவதற்குத் தயாரிக்கப்பட் டுள்ள வேலைத்திட்டம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Will he inform this House -

(i) extent of land belonging to the Land Reform Commission situated within the Kandy District;

(ii) the areas in which they are situated; and

(iii) how many family units are resident on those land?

(b) Will he also inform this House -

(i) whether lawful deeds have been given to the above-mentioned family units;

(ii) if so, how many such deeds have been given;

(iii) the number of family units which have not received deeds yet, out of those which should be given deeds; and

(iv) what is the course of action formulated for giving deeds to family units which do not have deeds for lands?

(c) If not, why?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ඉඩම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - காணி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Lands)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දළ වශයෙන් ගොඩ-මඩ ඉඩම් අක්කර එක්ලක්ෂ හැත්තෑපන්දහසක් පමණ ඇත. මෙය නිශ්චය කර ගැනීම සඳහා ඉඩම් ලේඛනයක් පිළියෙල කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, ඒ සඳහා මාස හයක පමණ කාලයක් ගත වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ii) පහත දැක්වෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ එම ඉඩම් පිහිටා ඇත.

1. පස්බාගේ කෝරළය
2. ගඟඉහළ කෝරළය
3. දොළුව
4. උඩපළාත
5. ගඟවට කෝරළය
6. පාතහේවාහැට
7. දෙල්තොට
8. තුම්පනේ
9. යටිනුවර
10. උඩුදුම්බර
11. මැදදුම්බර
12. පාතදුම්බර
13. කුණ්ඩසාලේ
14. උඩුනුවර
15. හාරිස්පත්තුව
16. අකුරණ
17. පූජාපිටිය

(iii) නිශ්චිතව ඉඩම් හඳුනා ගැනීමේ කටයුතු අවසන් කරන තෙක් එම ඉඩම්වල පදිංචි පවුල් ඒකක සංඛ්‍යාව නිශ්චිතව හඳුනා ගැනීමේ ගැටලුවක් පවතී. අනවසර පදිංචිකරුවන් මෙන්ම එකම ඉඩම් කොටස් තුළ පවුල් ඒකක කිහිපයක් පදිංචිව සිටීම ද මීට හේතු වේ.

ඉඩම් ලේඛන සැකසීම දැනට දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාවට නංවා ඇත. ඉදිරියේදී ඒ අනුව කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය මෙන්ම එම ඉඩම් භුක්ති විඳින්නන් පිළිබඳව නිශ්චිත තොරතුරු ද ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

(ආ) (i) ඔව්. ප්‍රාදේශීයව පවත්වනු ලබන ජංගම සේවා මඟින් හඳුනා ගනු ලබන සහ ඉල්ලුම් කරනු ලබන තැනැත්තන් වෙත නීත්‍යානුකූල ඔප්පු ලබා දීම සිදු කෙරේ. මේ සඳහා "ඉඩම් කොමිසම ගමට" වැඩසටහන සකස් කර ඇත.

(ii) ලේඛනගත තොරතුරු වාර්තාවල 1998 වසරින් පසුව ඔප්පු 7,000ක සංඛ්‍යාවක් නිකුත් කර ඇති බව සඳහන් වන අතර, කොමිෂන් සභාව ආරම්භයේ සිට මේ දක්වා ඔප්පු විශාල ප්‍රමාණයක් නිකුත් කර ඇත. 1972 සිට පැවති තොරතුරු සහිත ලේඛන දිරාපත් වීම හා ක්‍රමවත්ව යාවත්කාලීන නොවීම මත අතීතයේදී ඔප්පු ලබා දීම සම්බන්ධයෙන් වූ නිශ්චිත සංඛ්‍යාත්මක දත්ත සැපයිය නොහැකිය.

(iii) රැස්කර ගත් තොරතුරු අනුව ඔප්පු ලබා දිය යුතු පවුල් ඒකක පහත දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. | පස්බාගේ කෝරළය | - 910 |
| 2. | ගඟඉහළ කෝරළය | - 919 |
| 3. | දොළුව | - 350 |
| 4. | උඩපළාත | - 150 |
| 5. | ගඟවට කෝරළය | - 10 |
| 6. | පාතහේවාහැට | - 169 |
| 7. | දෙල්තොට | - 192 |
| 8. | තුම්පනේ | - 103 |
| 9. | යටිනුවර | - 25 |
| 10. | උඩුදුම්බර | - 17 |
| 11. | මැදදුම්බර | - 325 |

12. පාතදුම්බර - 51

13. කුණ්ඩසාලේ - 200

14. උඩුනුවර - 135

15. හාරිස්පත්තුව - 130

16. අකුරණ - 138

17. පූජාපිටිය - 290

(iv) ඉහත පරිදි විසිරී සිටින පවුල් ඒකක අතුරින්, දිස්ත්‍රික්කය තුළ නව ඉඩම් හා පදිංචි ඉඩමේ නීත්‍යානුකූල හිමිකමක් මෙතෙක් ලැබී නොමැති තැනැත්තන් හඳුනා ගැනීම සඳහා ජංගම සේවා/ සුදුසුකම් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරගෙන යනු ලබයි. එහිදී, ඉදිරිපත් කරනු ලබන ලේඛනමය තොරතුරු ආශ්‍රයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන තැනැත්තන් තෝරා ගැනීමෙන් පසු ඉඩම් ඔප්පු ලබාදීම සිදු කරයි. මේ යටතේ "රන්බිම" නමින් ලබාදෙනු ලබන ඔප්පුවක් මඟින් ඉඩමේ සින්නක්කර අයිතිය "ගෙදරටම ඔප්පුව ලබාදීම" නම් වූ සුවිශේෂී වැඩසටහනක් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද 2021/01 අංක දරන නව චක්‍රලේඛය යටතේ මේ සඳහා අවශ්‍ය විධිවිධාන සලසා ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

LRC එකට අයත් නොවන ඉඩම්වල ඉන්න අයට නීත්‍යානුකූල ඔප්පු ලබා දීමේ වැඩසටහනක් තිබෙනවාද, ගරු ඇමතිතුමනි? උදාහරණයක් කියනවා නම්, ගාමිණී දිසානායක මැතිතුමාගේ කාලයේදී එතුමාගේ සංකල්පයක් අනුව ස්වර්ණභූමි ඔප්පු, ඒ වාගේම ජයභූමි ඔප්පු ලබා දුන්නා. මේ ඉඩම්වලටත් එවැනි ක්‍රමයක් තිබෙනවාද? ඒ වාගේම මම දැනගන්න කැමැතියි, මහවැලි කලාපවල විශේෂයෙන්ම තුන්වන, හතරවන පරම්පරාවට සහ අනුපවුල්වලටත් ඉඩම් ඔප්පු ලබා දීමේ ක්‍රමවේදයක් තිබෙනවාද කියලා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

මහවැලි කලාපයට අදාළ ප්‍රශ්නය අපේ ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමාට තමයි යොමු කරන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. LRC එකට අයිති ඉඩම්වලට සහ අනෙකුත් සියලු ඉඩම්වලට ජංගම සේවා පවත්වමින් අපි ඉඩම් ඔප්පු ලබා දෙනවා. මේ අවුරුද්දේ අපේ ඉලක්කය ඉඩම් ලක්ෂයකට ඔප්පු ලබා දීම. ඒකෙන් අපි 60,000කට වැඩි සංඛ්‍යාවකට දැනට ඔප්පු ලබා දී තිබෙනවා. මේ අවුරුද්ද අවසන් වෙනකොට -දෙසැම්බර් මාසය වෙනකොට- 75,000කට ඔප්පු, බලපත්‍ර, දීමනා පත්‍ර ලබා දීමේ විශේෂ වැඩසටහනක් දැනට ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ඔබතුමා සඳහන් කළ පරිදි, මෙම ඉඩම්වල කාලයක් තිස්සේ පදිංචි අය ඉන්නවා. 1972දී තමයි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ "රන්පවුම් ඉඩම්" පවරා ගත්තේ. 1972 ඉඳන් අනවසරයෙන් පදිංචිව සිටින විශාල පිරිසක් ඉන්නවා. මම නාවලපිටියේ ජංගම සේවයකට ගිය වෙලාවේ දැක්කා, අවුරුදු 50ක් තිස්සේ -1972 දී පදිංචි වුණු අයට- ඉඩම් ඔප්පු හම්බ වෙලා නැති අයත් ඉන්න බව. ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙනකොට ඒ ඉඩම්වල ඔප්පු සියල්ල ලබා දීගෙන යනවා. අපට මේ අවුරුද්දේ ලක්ෂයකට ඉඩම් ඔප්පු ලබා දීමේ ඉලක්කයක් තිබුණා. නමුත් කොරෝනා වසංගතය නිසා ඒ ඔප්පු ලක්ෂයම ලබා දෙන්න බැරි වුණත්, ඔප්පු 75,000ක් ලබා දෙන්න අපි කටයුතු කරනවා. 2022 වර්ෂයේදී දීමනා පත්‍ර සහ ඉඩම් ඔප්පු 150,000ක් ලබා දෙන්න අපි විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා අහනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, ගරු ඉඩම් ඇමතිතුමාගෙන් මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කාලයේදී විතරක් නොවෙයි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව තුළ දීර්ඝ කාලයක් තිස්සේ වංචා, දූෂණ ගණනාවක් සිදුවෙලා තිබෙන බව ඔබතුමාත් දන්නවා. පසුගිය කාලයේ ලොකු ආන්දෝලනයකට ලක් වුණු සිද්ධියකුත් තිබෙනවා. දිසානායක කියලා විධායක අධ්‍යක්ෂවරයෙකු සේවයෙන් ඉවත් කර තිබෙනවා. ඔහු ඉවත් කිරීමට හේතුව, දූෂණ හා වංචාවලට සම්බන්ධ වීමද? නමුත්, ඔහුට තිබෙන යම් යම් සම්බන්ධතා එක්ක එළියේ ඉඳලා එම ක්‍රියාවලියේ යෙදෙනවා කියා තොරතුරු වාර්තා වනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා ගන්න පියවර මොකක්ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

දිසානායක මහත්මයාගේ දූෂණ චෝදනා පිළිබඳව පිටස්තර අය එක එක කට කථා කිව්වත්, කරපු පරීක්ෂණයෙන් එවැනි දෙයක් ඔප්පු වෙලා නැහැ. නමුත්, යම් යම් පුද්ගලයන් විවේචනය කරපු එතුමාගේ විවේචනාත්මක හඬ පටයක් පිටවෙලා තිබුණා. ඒ කාරණාව මත එතුමා සේවයෙන් ඉවත් කළා. මොකද, එතුමා කරලා තිබුණේ එතුමාට අයිති නැති වැඩක්.

ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාල වකවානුවේ LRC එකේ files 200ක් අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ files 200 සොයා ගන්න මම විශේෂ පොලිස් කණ්ඩායමක් යෙදෙව්වා. Files 200ක් අස්ථානගත වෙලා තිබෙනවා කියන්නේ, එතැන ලොකු වංචාවක් වෙලා තිබෙනවා. ඒ වාගේම සමහර අයට ඉඩම් අක්කරය රුපියල් 500 ගණනේ දීලා තිබෙනවා. COPE එකේදීත් ඒක සාකච්ඡාවට භාජන වුණා. ඒ පිළිබඳව අපි විශේෂ පරීක්ෂණක් පවත්වනවා. 1972 සිට මේ දක්වාම විශාල දූෂිත තත්ත්වයකට පත්වෙලා තිබෙන ආයතනයක්, මේක. ඒක මම නැහැ කියන්නේ නැහැ. උදාහරණයක් කිව්වොත්, නොච්චියාගම ප්‍රදේශයේ අක්කර 50ක කැලෑ ඉඩමකට මීගමුව ප්‍රදේශයේ පොල් ඉඩම් අක්කර 50ක් මාරු කරලා තිබෙනවා.

හන්තාන ප්‍රදේශයේත් ඒ වාගේ ඉඩම් විශාල ප්‍රමාණයක් අවභාවිත වෙලා තිබෙනවා. මේ පිළිබඳව අපි විශේෂ පරීක්ෂණයක් කර ගෙන යනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -745/2020- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවා තිබෙන භාණ්ඩ: පියවර
அநுராதபுரத்திலுள்ள பிரதேச செயலகங்களில் முடக்கி வைக்கப்பட்டுள்ள பொருட்கள்: நடவடிக்கை
GOODS RETAINED AT DIVISIONAL SECRETARIES' DIVISIONS IN ANURADHAPURA: STEPS TAKEN

992/2020

**4. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජනතාවට බෙදා දීමට නියමිත භාණ්ඩ තොග ජනතාවට බෙදා නොදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවා තබා තිබෙන බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொருளாதாரக் கொள்கைகள் மற்றும் திட்டச் செயற்படுத்துகை அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மக்களுக்குப் பகிர்ந்தளிக்கப்பட வேண்டிய பொருட்கள் மக்களுக்குப் பகிர்ந்தளிக்கப்படாமல் அநுராதபுர மாவட்ட பிரதேச செயலகங்களில் வைக்கப்பட்டுள்ளன என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அமைச்சு இது தொடர்பில் மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Economic Policies and Plan Implementation, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:

(a) Will he inform this House -

(i) whether he is aware that the stocks of goods to be distributed among the people are kept back in the Divisional Secretaries' Divisions of Anuradhapura District without being distributed;

(ii) if so, the steps that will be taken by the Ministry in this regard?

**(b)** If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் அரச பாதுகாப்பு மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும் உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation, State Minister of National Security and Disaster Management and State Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2021 වර්ෂය තෙක් පසුගිය වර්ෂවල විවිධ වැඩසටහන් යටතේ ජනතාවට බෙදා දීම සඳහා මිලදී ගත් භාණ්ඩ අතුරින් 2019 වර්ෂයේ දිස්ත්‍රික් විමධ්‍යගත මූලධන අය වැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 1,144කින් තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මිලදී ගෙන ඇති පහත සඳහන් තණකොළ කපන යන්ත්‍ර 06ක් හැර වෙනත් නොබෙදූ භාණ්ඩයක් කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රඳවාගෙන නොමැත.

| අනු අං. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඉතිරි භාණ්ඩ පිළිබඳ විස්තර | | | | ප්‍රතිලාභීන් වෙත ලබා දීම ප්‍රමාදවීමට හේතුව |
|---|---|---|---|---|---|---|
| | | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය | වටිනාකම | මිලදී ගත් වර්ෂය | |
| 01 | තඹුත්තේගම | තණකොළ කපන යන්ත්‍ර | 6 | රු.74, 520.00 | 2019 | නම් කර එවන ලද ගොවි සංවිධාන ක්‍රියාකාරී මට්ටමක නොපැවතීම හේතුවෙන් භාණ්ඩ ලබා නොදී රඳවා ගැනීම |

(ii) ඉහත නොබෙදූ භාණ්ඩ පිළිබඳ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡාකොට තීරණයක් ගෙන භාණ්ඩ බෙදා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති වෙත සහ තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයෙන් අසා ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22හි, 2021 වර්ෂය වනතෙක් ජනතාවට බෙදා දීමට වෙන් කළ මුදලින් සියලු භාණ්ඩ අරගෙන බෙදා දී තිබෙනවා. 2019 අවුරුද්දේ විමධ්‍යගත මුදල්වලින් ගරු දුමින්ද දිසානායක මැතිතුමා තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට තණකොළ කපන මැෂින් 06ක් ගන්න රුපියල් 74, 520ක මුදලක් ලබා දී තිබෙනවා. ඒ භාණ්ඩ

ලබා දීම සඳහා "සිතමු කාන්තා ගොවි සංවිධානය" ඇතුළු සංවිධාන 6ක් නම් කර තිබෙනවා. ඒ ගොවි සංවිධාන අතර යම් මත ගැටුමක් වෙලා තවම ඒ උපකරණ බෙදා දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ කාරණය ගරු දුමින්ද දිසානායක රාජ්‍ය ඇමතිතුමාට යොමු කරනවා, වෙනත් සංවිධානයකට හෝ මේ භාණ්ඩ බෙදා අවසන් කරන්න කියලා. මොකද, 2019 අවුරුද්දේ ඉඳලා මේ භාණ්ඩ තිබෙනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු ඇමතිතුමනි, මම ඔය ප්‍රශ්නය යොමු කරන කාලයේ තිබුණේ ඔය ගැටලුව නොවෙයි. යහ පාලන රජයේ අවසාන කාලයේ අඩු ආදායම්ලාභීන්ට බෙදා දෙන්න roofing sheets වාගේ බඩු ටිකක් ලැබුණා. දැන් ඒ ගැන කථා කර වැඩක් නැහැ. ඒ භාණ්ඩ, රාජ්‍ය නිලධාරින් විසින් තෝරාගත්, ඒ සඳහා සුදුසුකම් ලැබූ අයට දෙන්නේ නැතිව ඔබතුමන්ලාගේ හිතවතුන්ට බෙදා දී අවසන්. දැන් ඒ ගැන කථා කර වැඩක් නැහැ.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඊයේ ඔබතුමන්ලා තීරණයක් ගන්නවා, පෞද්ගලික අංශයට රසායනික පොහොර ගෙන්වීමට අවසරය ලබාදීම වෙනුවෙන් කටයුතු කරනවා කියලා. ඊයේ අපට ඒක දැන ගන්න ලැබුණා. අපට දැන ගන්න තිබෙන ප්‍රධානම ප්‍රශ්නය මේකයි, ගරු ඇමතිතුමනි. දැන් අපේ රටේ ඩොලර් ප්‍රශ්නයක් තිබෙනවා. පෞද්ගලික අංශයෙන් රසායනික පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය ගෙන්වනකොට ඒ සමාගම්වලටත් ඩොලර් ප්‍රශ්නයට මුහුණ දෙන්න වෙයි ද? අද ලෝක වෙළඳපොළේ යූරියා ටොන් එකක මිල සැහෙන ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ අනුව යූරියා මිටියක් සාමාන්‍යයෙන් රුපියල් 10,000කට වැඩි මුදලක් වෙයි කියලා තමයි අපට දැන ගන්න තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා නැවත ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දීලා හෝ මේ යූරියා ලබා දීමට යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න සූදානමක් තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු කථානායකතුමනි, මට තිබෙන්නේ වතුරත් එක්ක ගනුදෙනු.

ගරු මන්ත්‍රීතුමා, යූරියා දැම්මාම ඒකෙන් සියයට 30ක් පමණයි ගහකට උරා ගන්නේ. ඉතිරි ටික ඔක්කෝම වතුරත් එක්ක හෝදාගෙන ඇවිල්ලා වැවේ ඉතුරු වෙනවා. ඔබතුමාගේ ප්‍රශ්නය, කෘෂිකර්ම ඇමතිතුමාට මම යොමු කරන්නම්. එතුමා ඔබතුමාට පෞද්ගලිකව පිළිතුරක් එවයි.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු ඇමතිතුමනි, ඔබතුමා වාරිමාර්ග සම්බන්ධව කටයුතු කරන එක හරි. මම මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ ගරු අගමැතිතුමාගෙන්.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය විධියට මට දැන ගන්න ඕනෑකම තිබෙන්නේ-

**ගරු චමල් රාජපක්ෂ මහතා**
( மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන ප්‍රශ්නයට මම දෙන පිළිතුර පිළිබඳ යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම් පමණයි අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ඊට පරිබාහිර ඒවා අහන්න බැහැ. ස්ථාවර නියෝග 33හි පැහැදිලිව ඒ බව සඳහන් වෙනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු ඇමතිතුමනි, අපට කාලෝචිත ප්‍රශ්නයක් අහන්න පුළුවන්. මම මේ ප්‍රශ්නය ඇහුවේ මීට සැහෙන කාලයකට කලින්. ප්‍රශ්නය න්‍යාය පත්‍රයට එනකොට කාලය ගිහිල්ලා නේ. ඒ නිසා කාලෝචිත ප්‍රශ්න අපට අහන්න වෙනවා. ඒ නිසා තමයි මම ඇහුවේ.

ගරු ඇමතිතුමනි, ඊළඟට තිබෙන ගැටලුව තමයි අනුරාධපුරය දිස්ත්‍රික්කයේ කොවිඩ්-19 රෝගීන් වැඩිවීම. අනුරාධපුර නගරය ආශ්‍රිතව ඊයේ විතරක් කොරෝනා නිසා 4දෙනෙක් මිය ගිහින් තිබෙනවා. එ් වාගේම, අනුරාධපුරය රතු කලාපයක් බවට පත්වෙලා තිබෙනවා. පාසල් සිසුන් 1,000කට වැඩි ප්‍රමාණයක් කොරෝනා ආසාදිතයන් බවට පත්වෙලා තිබෙනවා. ඒ වාගේම, ගුරුවරු 100කට වැඩි ප්‍රමාණයක් රෝගීන් බවට පත්වෙලා තිබෙනවා. මේ නිසා අනුරාධපුරයේ නගර ආශ්‍රිතව සහ ගම්මානවල කොරෝනා රෝගීන් විශාල ප්‍රමාණයක් වාර්තා වෙනවා. අපේ රට මීට කලින් කොරෝනා දැඩි අවදානම් තත්ත්වයේ තිබුණු කාලයේ, රට lock down කරලා තිබුණු කාලයේ අසන්නට ලැබුණු කොරෝනා රෝගීන් ප්‍රමාණයට වැඩි රෝගීන් ප්‍රමාණයක් අද වන විට වාර්තා වෙනවා කියලා අපේ කනට ඇහෙන්න තිබෙනවා. අනුරාධපුරයේ කරන PCR tests ප්‍රමාණය, Antigen Tests ප්‍රමාණය බොහෝ අඩු කරලා තිබෙනවා. ඒ නිසා මේ පරීක්ෂණ වැඩි කරලා, මේ රෝගීන් හඳුනාගෙන, නැවතත් අපි කලින් ක්‍රියාත්මක වෙච්ච ක්‍රමවේදයට යන්න කියලා මම ඉල්ලා සිටිනවා. මිනිස්සු මැරෙන ප්‍රමාණය අඩු කර ගන්න සහ මිනිසුන්ට මේ වයිරසය බෝවෙන එක නතර කර ගන්න vaccine එකට විතරක් ඉඩ දෙන්න එපා කියලාත් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ වෙනුවෙන් ඔබතුමන්ලා යම් වැඩ පිළිවෙළක් සකස් කරනවා ද, එවැනි වැඩ පිළිවෙළක් ඔබතුමන්ලා ක්‍රියාත්මක කරනවා ද කියලා මම අහනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව සාකච්ඡා කරන්න දිනපතාම අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ නිලධාරින් සහ අනෙකුත් නිලධාරින් හමු වෙනවා. ඔබතුමා කියපු කරුණු මම ඒ අය වෙත යොමු කරන්නම්. එතකොට ඒ අයගේ අවධානය යොමු කරලා අවශ්‍ය කටයුතු කරලා දෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -1938/2021-(1), ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා - *[සභා ගර්භය තුළ නැත.]* දෙවන වටය.

## ගල්නෑව පොලිස් ස්ථානය සහ නිල නිවාස: අලුත්වැඩියාව
## கல்னேவ பொலிஸ் நிலையம் மற்றும் உத்தியோகபூர்வ இல்லங்கள்: திருத்தம்
GALNEWA POLICE STATION AND QUARTERS: REPAIR

745/2020

3. **ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ishak Rahuman)
මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු බුද්ධික පතිරණ මහතා]

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ගල්නෑව පොලිස් ස්ථානය ආරම්භ කරන ලද දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අබලන් තත්ත්වයක පවතින බවත්;

(ii) ආරම්භ කරන ලද දින සිට මේ වනතෙක් එම ගොඩනැගිලි ප්‍රමාණවත් පරිදි අලුත්වැඩියා කර නොමැති බවත්;

එතුමා දන්නේද?

(ඇ) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අලුත්වැඩියා කරනු ලබන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது மக்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) அநுராதபுரம் மாவட்டத்தில் அமைந்துள்ள கல்னேவ பொலிஸ் நிலையம் ஆரம்பிக்கப்பட்ட திகதி யாதென் பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி பொலிஸ் நிலையம் மற்றும் அதற்குரிய உத்தியோகபூர்வ இல்லங்கள் சேதமடைந்த நிலையில் காணப்படுகின்றன என்பதையும்;

(ii) ஆரம்பிக்கப்பட்ட திகதியிலிருந்து இதுவரை மேற்படி கட்டிடங்கள் போதுமான வகையில் சீரமைக்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(இ) மேற்படி பொலிஸ் நிலையம் மற்றும் அதற்குரிய உத்தியோகபூர்வ இல்லங்கள் எத்திகதியில் சீரமைக்கப் படுமென்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security:

(a) Will he inform this House of the date on which the Galnewa Police Station of the Anuradhapura District was first established;

(b) Is he aware that -

(i) aforesaid Police Station and the quarters of the same are in a dilapidated condition; and

(ii) aforesaid buildings have not been adequately repaired since the establishment?

(c) Will he also inform this House of the date by which aforesaid Police Station and its quarters will be repaired?

(d) If not why?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) 1982.09.17 දින ආරම්භ කර ඇත.

(ආ) (i) පොලිස් ස්ථානයේ ගොඩනැගිලිවල සුළු අලුත්වැඩියා කිරීම් සිදු කර පොලිස් ස්ථානය පවත්වාගෙන යනු ලබයි.

(ii) එම ගොඩනැගිල්ලේ පූර්ණ අලුත්වැඩියාවක් සිදු කිරීම සඳහා මේ වන විටත් දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ අධීක්ෂණයෙන් රුපියල් 7,048,473.27ක වටිනාකමකින් යුත් ඇස්තමේන්තුවක් සකස් කර ඊට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී.

(ඇ) අදාළ ප්‍රසම්පාදන කටයුතු අවසන් වූ වහාම අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -1938/2021- (1), ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සඳහා සති හතරක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### සුගීෂ්වර වික්‍රමසිංහ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### சுகீஸ்வர விக்ரமசிங்க மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### SUGEESWARA WICKRAMASINGHE FOUNDATION (INCORPORATION) BILL

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"සුගීෂ්වර වික්‍රමසිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப் படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி கல்வி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Education for report.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රධාන වැඩ කටයුතු. විසර්ජන පනත් කෙටුම්පත - 2022, කාරක සභා අවස්ථාව.

## විසර්ජන පනත් කෙටුම්පත, 2022
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022
## APPROPRIATION BILL, 2022

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: දෙසැම්බර් 01]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: டிசம்பர் 01]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee.- [Progress: 01st December]
[HON. SPEAKER in the Chair.]

**176 වන ශීර්ෂය.- වරාය හා නාවික අමාත්‍යවරයා**
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 184,450,000

**தலைப்பு 176.- துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்**
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 184,450,000

HEAD 176.- MINISTER OF PORTS AND SHIPPING
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 184,450,000

**434 වන ශීර්ෂය.- ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 101,150,000

**தலைப்பு 434.- களஞ்சிய வசதிகள், கொள்கலன்கள் முனையங்கள், துறைமுக வழங்கல் வசதிகள், இயந்திரப் படகுகள் மற்றும் கப்பற்றொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 101,150,000

HEAD 434.- STATE MINISTER OF WAREHOUSE FACILITIES, CONTAINER YARDS, PORT SUPPLY FACILITIES AND BOATS AND SHIPPING INDUSTRY DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 101,150,000

**166 වන ශීර්ෂය.- ජල සම්පාදන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 363,475,000

**தலைப்பு 166.- நீர் வழங்கல் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 363,475,000

HEAD 166.- MINISTER OF WATER SUPPLY
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 363,475,000

**433 වන ශීර්ෂය.- ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 54,980,000

**தலைப்பு 433.- கிராமிய மற்றும் பிரதேச குடிநீர் வழங்கல் கருத்திட்ட அபிவிருத்தி இராஜாங்க அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 54,980,000

HEAD 433.- STATE MINISTER OF RURAL AND DIVISIONAL DRINKING WATER SUPPLY

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 54,980,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
වරාය හා නාවික අමාත්‍යාංශය - ශීර්ෂ අංක 176 සහ 336; ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - ශීර්ෂය 434; ජලසම්පාදන අමාත්‍යාංශය - ශීර්ෂය 166; ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - ශීර්ෂ අංක 433 සහ 332.

සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 12.30 දක්වා සහ අපර භාග 1.00 සිට අපර භාග 5.00 දක්වා කපා හැරීමේ යෝජනාව, ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා.

[පූ.භා. 9.49]

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු සභාපතිතුමනි, "2022 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේදී අද දින, -2021.12.02 වන බ්‍රහස්පතින්දා- විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත්

[ගරු තිස්ස අත්තනායක මහතා]

දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 176, 336, 434, 166, 433 සහ 332 දරන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මුලින්ම වරාය නාවික අමාත්‍යාංශය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න මම කැමැතියි. විශේෂයෙන්ම වරාය කියන්නේ රටක ජීවනාලියයි. රටේ ආදායම් උත්පාදනය වෙනුවෙන් ලෝකයේ හැම තැනම වරාය පාවිච්චි කරලා තිබෙන විධිය, යොදාගෙන තිබෙන විධිය ඉතාම විශිෂ්ටයි. අපේ කොළඹ වරායත් ඒ අතර විශිෂ්ට තැනක තිබුණා. විශේෂයෙන්ම කොළඹ වරාය අපේ ජාතික ආදායම් උත්පාදනයේදී විශේෂ දායකත්වයක් සපයන වරායක් කියලා මුළු ලෝකයම දන්නවා. දකුණු ආසියාවේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් අපේ වරාය වැඩිදියුණු කිරීමට පසු ගිය කාලය තුළ නොයෙක් පියවර අපි අරගෙන තිබෙනවා. ඒ එක්කම මෙම වරායේ සංවර්ධනය වෙනුවෙන්, නවීකරණය වෙනුවෙන් ලොකු සේවාවක් ඉටු කරපු දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මේ වෙලාවේ මා ගෞරවයෙන් සිහිපත් කරන්න කැමැතියි. එතුමාගේ කාලයේදී, වරායට තිබුණු අන්තර්ජාතික පිළිගැනීම ඉහළ තත්ත්වයකට ගෙනෙන්න අවකාශය ලැබුණා. ගරු සභාපතිතුමනි, වරාය කියන්නේ ජාතික වැදගත්කමක් ඇති ස්ථානයක් පමණක්ම නොවෙයි. ජාතික ආදායම් උත්පාදනය කරන මූලික කේන්ද්‍රස්ථානයක් බවට අපි එය පරිවර්තනය කර ගන්න ඕනෑ.

මම විශේෂ කාරණා දෙක තුනක් කියන්න කැමැතියි, ගරු සභාපතිතුමනි. පසුගිය කාල සීමාවේ කොළඹ වරායේ නැඟෙනහිර ජැටියේ -නැඟෙනහිර පර්යන්තයේ- ඉදිකිරීම් පිළිබඳව විශාල ප්‍රශ්නයක් මතු වුණා. වරායේ නැඟෙනහිර පර්යන්තය වෙනත් ආයෝජකයෙකුට -ඉන්දියානු සමාගමකට- දෙන්න ආණ්ඩුව උත්සාහ කිරීම හරහා ඇති වුණ අර්බුදය ආණ්ඩුව විසඳා ගත්තේ බටහිර පර්යන්තය ඒ ආකාරයෙන්ම ඉන්දියානු සමාගමකට දීලායි. නැඟෙනහිර පර්යන්තයේ ඉදිකිරීම් නැවත නවතා දමා තිබෙනවා. අද මොකක්ද මේ නැඟෙනහිර පර්යන්තයේ තත්ත්වය?

අපේ වරායේ තිබෙන සුවිශේෂම පර්යන්තයක් තමයි මේ නැඟෙනහිර පර්යන්තය. මෙය සියයට 100ක් වැඩිදියුණු කරලා නැති වුණත් ගැඹුරු මුහුදක් තිබෙන, විශාල ඉඩකඩක් තිබෙන, අපට ආදායම් ලබාගන්න සහ ලොකු නැව් අපේ වරායට ඇතුළු කරගන්න පුළුවන් පර්යන්තයක්. මේ පර්යන්තයේ දැනට තව කොටසක් වැඩිදියුණු කරන්න තිබෙනවා. පසුගිය කාල සීමාව තුළ මේ නැඟෙනහිර පර්යන්තය වැඩිදියුණු කිරීම සඳහා ගත් ක්‍රියා මාර්ග ගැන ඒ තරම් සෑහීමකට පත්වෙන්න පුළුවන් කියලා හිතන්න බැහැ. මොකද එහිදී ආන්දෝලනාත්මක සිදුවීම් ගණනාවක් වුණා. ඒ නිසාම නැඟෙනහිර පර්යන්තය විකිණීම පිළිබඳ ආණ්ඩුවේ අදහස අත්හැර ගත්තා. හැබැයි, දැන් තිබෙන ප්‍රශ්නය තමයි කොළඹ වරායේ මේ නැඟෙනහිර පර්යන්තය සංවර්ධනය කිරීම සඳහා, වැඩිදියුණු කිරීම සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් හෝ වුවමනාවක් ආණ්ඩුවට තිබෙනවාද කියන කාරණය. මම එසේ අහන්න හේතු වුණු කාරණා කීපයක් තිබෙනවා. ඉන් එකක් තමයි, මුලින් තිබුණු යෝජනාව අනුව, මේ පර්යන්තය වැඩිදියුණු කිරීම සඳහා මිලියන 13,000ක මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් වෙන් කරලා තිබුණාය කියා වාර්තා වනවා.

ඒ මුදලින් නැඟෙනහිර පර්යන්තය වැඩි දියුණු කිරීම වෙනුවට, දැන් ආණ්ඩුව යෝජනාවක් කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 325ක විදේශ ණයක් ලබා ගැනීමට උත්සාහ කරමින් ඉන්නවා. ඒ ඇයි? වරායේ රඳවාගෙන තිබුණු මේ මුදල පැත්තකට දාලා නැවත වතාවක් වාණිජ බැංකුවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 325ක ණය ලබා ගැනීමට ආණ්ඩුව සැලසුම්සහගතව මේ උත්සාහ කරන්නේ වෙන කාරණයකට නොවෙයි. ආණ්ඩුවේ ඩොලර් අර්බුදය විසඳා ගැනීම සඳහායි මෙහෙම කරන්න හදන්නේ. ආණ්ඩුවේ ඩොලර් අර්බුදය විසඳා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය යම් ආකාරයක අවදානමකට ලක් කිරීමේ උත්සාහයක් තිබෙන බව අපට පේනවා. කොහොම වුණත්, අපි කියන්නේ මෙච්චරයි. දැනට මේ නැඟෙනහිර පර්යන්තයේ මීටර් 600යි වැඩි දියුණු කරලා තියෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, මම මේ ගැන කිව්වාට පස්සේ ඔබතුමා කථා කරන්න. කමක් නැහැ නේද? ඔබතුමාගේ කථාව මම අහනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට බාධා කරන්නේ නැහැ. හැබැයි මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අද දින මෙම විවාදය අවසානයේ මගේ පිළිතුරු කථාව කරනකොට මෙම ගරු සභාවේ ඉන්න කියලා. මොකද මෙතැන වැරදි මතයක් යනවා.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මම පසුගිය අවුරුද්දේත් ඔබතුමාගේ කථාව අහගෙන හිටියා.

කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තයේ මීටර් 600යි වැඩි දියුණු කරලා තියෙන්නේ. මේකේ තව මීටර් 600කට වඩා අලුත්වැඩියා කරන්න තිබෙනවා. ඒ කියන්නේ, මේ පර්යන්තය මීටර් 1,360ක් දිගයි. ඒක සම්පූර්ණ කළොත් තමයි අන්තර්ජාතික නැව්වලට, විශාලතම නැව්වලට අපේ මේ පර්යන්තයට ඇතුළු වෙන්න පුළුවන් වෙන්නේ, එකවර අවස්ථා දෙකකදී. එතකොට තමයි ඒ පර්යන්තයේ කටයුතු කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, නැඟෙනහිර පර්යන්තයේ ඒ ඉතිරි කොටස අලුත්වැඩියා කිරීම; ඒ වැඩි දියුණු කිරීම; අලුතෙන් ඉදිකිරීම කඩිනම් කරන්න කියලා. එහෙම නැති වුණොත්, අපේ වරායේ තිබෙන අන්තර්ජාතික වටිනාකම බිඳ වැටිලා, අනෙකුත් පර්යන්ත කරන පෞද්ගලික සමාගම්වලට අපේ ව්‍යාපාර කටයුතු සියල්ල යනවා කියන කාරණයත් මම මතක් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, මේ ගැනම මම තව එක දෙයක් කියන්න ඕනෑ. මේ පර්යන්තයට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර ගෙන්වීම සිදු කරන්නේ නැහැ.

සාමාන්‍යයෙන් දොඹකරයක් ඇණවුම් කරලා ගෙන්වීම සඳහා අවුරුදු දෙකක විතර කාලයක් ගත වෙනවා. කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තයට අවශ්‍ය දොඹකර වර්ග කිහිපයක් තිබෙනවා. ඒ දොඹකර වර්ග කිහිපය ගෙනැල්ලා සම්පූර්ණ කළොත් තමයි එම පර්යන්තයෙන් අපට පූර්ණ ප්‍රයෝජන ගන්න පුළුවන්කම ලැබෙන්නේ. මීටර 1,300ක් දිග මෙම පර්යන්තයේ කටයුතු සඳහා STS දොඹකර 12ක්, RTG දොඹකර 32ක්, prime movers 50ක් ආදී වශයෙන් විශාල යන්ත්‍ර ප්‍රමාණයක් වුවමනා වෙනවා. නමුත් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු වෙන්නේ නැහැ. ඒ කටයුතු ප්‍රමාද කිරීම හරහා සිදු වන්නේ මොකක්ද කියලා අපට හිතා ගන්න පුළුවන්. ඒකෙන් පෙනෙන්නේ වරායේ නැඟෙනහිර පර්යන්තය ගැන ආණ්ඩුවේ තිබෙන උනන්දුව අඩුකම විතරක් නොවෙයි. අනාගතයේ දවසකදී මේකත් පෞද්ගලික අංශයට

පැවරීමටද යන්නේ කියලා අපට ලොකු සැකයක් තිබෙනවා, ගරු සභාපතිතුමනි.

වරායේ බටහිර පර්යන්තය අදානි සමාගමට දුන් නිසා මෙහි වැඩ කටයුතු නොකර ඉන්න එපා. ඒ වැඩ කටයුතු වැඩි දියුණු කරමින්, වරාය අධිකාරියේ තරගකාරීත්වය වැඩි කරන්න ඔබතුමන්ලා මීට වඩා ලොකු වැඩ කොටසක් කළ යුතුයි. එහෙම නැති වුණොත් වෙන්නේ, නැඟෙනහිර පර්යන්තයේ වටිනාකම අඩු වෙලා, ඒකේ වැඩ කටයුතු අඩු කරලා, පෞද්ගලික අංශය මඟින් කරගෙන යන පර්යන්ත කිහිපයට අපේ ව්‍යාපාර කටයුතු භාර දෙන්න සිදු වීමයි. නැඟෙනහිර පර්යන්තය කියන්නේ වරායේ තිබෙන රන් නිධානයක්. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, එය වැඩි දියුණු කිරීම සඳහා ඉදිරි වසර දෙක තුළ කඩිනම් වැඩ පිළිවෙළක් දියත් කරලා, වරායේ ආදායම් මාර්ග, ජාතික ආදායම වැඩි කරන්න පියවර ගන්න කියලා.

ගරු සභාපතිතුමනි, ඊළඟට තවත් ඉතාම වැදගත් කාරණයක් කියන්න මම කැමැතියි. අද ආණ්ඩුව ඩොලර් හොයා ගැනීම සඳහා කොයි දේටත් "ආයෝජනය" කියන ලේබලය අලවලා, අපේ ඉඩකඩම් විකිණීම, ගොඩනැඟිලි විකිණීම සහ වෙනත් ආකාරයේ සම්පත් විදේශීයකරණය කරමින් සිටිනවා. රජය සතුව තිබෙන වෙනත් සම්පත් අපට අහිමි කිරීම කරගෙන යනවා.

මේකට හොඳම උදාහරණය තමයි, සේවා සැපයුම් සඳහා යොදාගෙන තිබෙන කොළඹ වරායේ අක්කර 13ක ඉඩම මේ වනකොට CICT සමාගමට පවරා දීමට ඇමතිතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවාය කියන කාරණය. ඇමතිතුමාගේ කැබිනට් පත්‍රිකාව අනුව කියන්නේ, කොළඹ වරායේ සේවා සැපයුම වැඩිදියුණු කිරීම සඳහා මේ යෝජනාව ඉදිරිපත් කරනවාය කියලායි. මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කිහිපයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. වරායේ මේ ස්ථානය ඉතාම වැදගත් වන්නේ, පර්යන්ත සියල්ලේම සීමාවේ තිබෙන, කොළඹ වරාය නගරයේ ප්‍රවේශ මාර්ගය ආසන්නයේ පිහිටා තිබෙන ඉඩමක් නිසායි. අපේ ආදායම් මාර්ග වැඩිදියුණු කර ගැනීමේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියටම පුළුවන්කම තිබෙනවා, සේවා මධ්‍යස්ථානයක් ලෙස ඒ ඉඩම වැඩිදියුණු කරන්න. හැබැයි, එසේ තිබියදී මේ ඉඩම ඩොලර් මිලියන 150ක ආයෝජනයක් හැටියට සලකා CICT සමාගමට පවරා දීමට උත්සාහ කරන්නේ ඇයි? මොකක්ද, මේකේ සංයුතිය? CICT සමාගම ස්වේච්ඡාවෙන් යෝජනාවක් ඉදිරිපත් කරමින් කියනවා, "අපි මේක වැඩිදියුණු කරන්නම්" කියලා. සාමාන්‍යයෙන් රජයේ ගනුදෙනුවක් වනකොට, එක්කෝ ඒ සඳහා ටෙන්ඩර් කැඳවීමක් තිබෙන්න ඕනෑ; විවෘතභාවයක් තිබෙන්න ඕනෑ; තරගකාරිත්වයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම, රජයේ අයිතිය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අයිතිය තිබෙන්න ඕනෑ; එය පාලනය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා වරාය අධිකාරියට හෝ රජයට තිබෙන්න ඕනෑ. මේ එකක්වත් නැතුව ඒ කොටස්වලින් සියයට 70ක් CICT සමාගමට දෙන්නයි මේ යෝජනා කරලා තිබෙන්නේ. මෙය ඉතාම වැරැදියි. මේකේ තිබෙන අභිරහස්ම දේ තමයි, ශ්‍රී ලංකා වරාය අධිකාරියට සියයට 15ක් යනකොට ඉතුරු සියයට 15 දේශීය ආයෝජකයකුට දෙනවා කියන කාරණය. කවුද, මේ කියන දේශීය ආයෝජකයා? මේක හංගලා තිබෙන්නේ. මේ සියයට 15 දෙන දේශීය ආයෝජකයා කවුද කියලාත් හෙළි කරන්නත් ඕනෑ. මේක ඉතාම බරපතළ කාරණයක්.

ඊළඟ කරුණය තමයි, ඉඩමක් බදු දීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය මෙතැනදී අනුගමනය නොකිරීම. ඒ සම්බන්ධයෙන් තිබෙන එක කාරණයක් තමයි, ටෙන්ඩර් කැඳවීම වෙනුවට ස්වේච්ඡා යෝජනාවක් හැටියට ඉල්ලුම් පත්‍රයක් කැඳවා තිබීම. දෙවැනි එක තමයි, ඉඩම් ලබා දීමේදී මෙතෙක් අනුගමනය කළ ක්‍රමවේදය වරායේ මෙම ඉඩම ලබා දීමේදී අනුගමනය නොකිරීම. මේකෙදි ආරම්භක ගෙවීමක් නැහැ. අක්කර 13ක් දෙනවා. හැබැයි, අක්කර 13ට ආරම්භක ගෙවීමක් නැහැ. ඒ වාගේම මාසිකව අක්කරයකට රුපියල් 850,000ක් වාගේ අඩු මුදලක් අය කරන්නේ.

ගරු සභාපතිතුමනි, උදාහරණයක් කිව්වොත්, මේ වරායේම අක්කරයකුත් පර්චස් 4ක් ටෝකියෝ සිමෙන්ති සමාගමට දීලා තිබෙනවා. ටෝකියෝ සිමෙන්ති සමාගම ඒ අක්කරයයි පර්චස් 4 ගන්නකොට රුපියල් මිලියන 925ක මූලික මුදලක් ගෙව්වා විතරක් නොවෙයි, අක්කරයක් පාවිච්චි කිරීම සඳහා මාසයකට රුපියල් මිලියන 3 බැගින් වරාය අධිකාරියට ගෙවනවා. වරායේ තිබෙන ඉතාම සුවිශේෂී ස්ථානයේ අක්කර 13ක් මේ ආකාරයෙන් නිකම්ම නිකම් දීමට උත්සාහ කරන්නේ ඇයි කියන එක ලොකු ප්‍රශ්නයක්. මේක ඇතුළේ වෙනත් ගනුදෙනු තිබෙනවා කියනවා; වෙනත් ආකාරයේ ක්‍රියාවන් සිදු වෙනවා කියනවා. මේක ඉතාම බරපතළයි. ඒ නිසා වරාය සතුව තිබෙන එම ඉඩම අන්සතු කිරීම වරායේ අනාගතයට සුබදායක නොවෙයි කියලා අපි ඉතාම පැහැදිලිව කියනවා.

මේ දක්වා කවදාවත් වරායේ සේවා සැපයුම් බාහිර අංශවලට දුන්නේ නැහැ. අපි පර්යන්ත කිහිපයක් -1999 වසරේදී රැජින පාලම පර්යන්තය, ඊට පසුව මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ CICT පර්යන්තය, ඒ වාගේම WCT පර්යන්තය - ආයෝජන හැටියට සලකා විදේශීය සමාගම්, එහෙම නැත්නම් බාහිර සමාගම්වලට දීලා තිබෙනවා. ඒ විධියට වරායේ පර්යන්ත දුන්නත් මෙතෙක් කල් කිසිම අවස්ථාවක සේවා සැපයීම දුන්නේ නැහැ.

ඒක වරායේ ප්‍රධාන ආදායම් මාර්ගයක්. එය මේ ආකාරයෙන් අන් සතු කිරීම හරහා වරාය නිකම්ම නිකම් නාවික අධිකාරියක් බවට පරිවර්තනය වෙනවා. ඒකයි මේකේ බරපතළකම. ඒ නිසා අප කියන්නේ, මේ වාගේ ගනුදෙනුවලට යන්න එපා කියලා. ඒක ආයෝජනයක් කියලා හිතන්න එපා. මොකද, ආයෝජනය කියන්නේ අපේ තිබෙන ඉඩ කඩම් විකිණීම, ගොඩනැඟිලි විකිණීම, අපේ වත්කම් විකිණීම නොවෙයි. මේ රටේ අලුතින් යමක් පටන් ගන්න පුළුවන් විධියට කෙනෙක් ඇවිල්ලා ආයෝජනය කිරීම තමයි අවශ්‍ය. එහෙම නැතිව, විකුණලා සල්ලි ගැනීම ආයෝජනයක් හැටියට සලකන්න එපා කියලා මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, මේ සේවා සැපයීම් අන්සතු කිරීම වරාය අධිකාරියට වන පාඩුවක් හැටියට අප සලකන්නේ ඇයි? මේ සේවා සැපයුම් ක්‍රියාවලිය තුළින් 2020 වර්ෂයේදී වරාය රුපියල් බිලියන 52ක ආදායමක් ලබාගෙන තිබෙනවා. වරාය ලබපු ඒ ආදායමෙන් සියයට 6.5ක්ම ලබාගෙන තිබෙන්නේ ඒ ස්ථානය හැසිරවීම මඟින්. ඒ වාගේම අර්ධ මෙහෙයුම්වලින් දැන් දිගින් දිගටම පාඩු ලබමින් තිබෙනවා. මේවා ආරම්භ කරන කොට CICT එක සියයට 17ක කොටස් අයිතියකින් ලාභය ගත්තේ. නමුත් දැන් CICT එක සියයට 70ක් වරායේ කටයුතුවලින් ලාභ ලබනවා. මේ නිසා අපේ වරාය නාමික වරායක් වන එක අහන්න දෙයක් නොවෙයි. ඒ නිසා මම විශේෂයෙන් ඉල්ලා සිටින්න කැමැතියි, මේ ගනුදෙනුව ගැන නැවත හිතන්න කියලා. මේ විධියට පවරා දීම අපි අනාගත පරම්පරාවට කරන ලොකු අපරාධයක්. මේ ගැන නැවත හිතන්න කියලා මම යළිත් ඉල්ලා සිටින්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, දැන් වරාය සතුව තිබෙන තවත් ඉඩම් දෙකක් පවරා දෙන්න යෝජනා කරනවා. මම දන්නේ නැහැ, මොකක්ද මේ උන්මාදය කියලා. තිබෙන දේවල් ඔක්කොම විකුණාගෙන විකුණාගෙන යනවා. මොකක්ද මේ කරන්න හදන්නේ? මහර තිබෙනවා "ගල්වළ ඉඩම" නමින් වරාය වැඩි

[ගරු තිස්ස අත්තනායක මහතා]

දියුණු කිරීමට ගල් ලබා ගත් විශාල ඉඩමක්. නිවාස යෝජනා ක්‍රමයක් සඳහා දැන් ඒ ඉඩමත් පෞද්ගලික අංශයට විකුණා දමන්න යෝජනා කර තිබෙනවා.

ඊළඟට, බ්ලූමැන්ඩල්වල තිබෙනවා වරායේ නිවාස ඉදිකර තිබෙන ඉඩම් කොටසක්. එම ඉඩමත් වැඩිදියුණු කිරීම සඳහා කියා පෞද්ගලික අංශයේ ව්‍යාපාර අංශයකට පවරා දීමට කටයුතු කරමින් තිබෙනවා. මම අහන්නේ, එතකොට වරායට ඉතිරි වෙන්නේ මොනවාද කියලායි. වරාය සතු ඉඩම් මේ ආකාරයට විකුණා දැමීම හරහා අපට කියන්න පුළුවන්ද, අනාගතයේ දකුණු ආසියාවේ නාවික කේන්ද්‍රය බවට ශ්‍රී ලංකාව පරිවර්තනය වනවා කියලා? එහෙම කියන්න බැහැ. මේ මුළු වරායම අනාගතයේ දවසක චීනයට, ඉන්දියාවට හෝ තවත් ආයතනවලට මෙහෙම දෙන්න ගියොත්, ශ්‍රී ලංකාවේ අපට අපේම කියා ජාතික වරායක් නැති වේවි. අපේ නාමික වරාය කිහිපයක් තිබෙනවා. හැබැයි, මෙහෙම කරන්න ගියොත් ප්‍රධානම වරාය වන කොළඹ වරාය අපේ අයිතියෙන් ඈත් වනවා කියන එක හොඳින් මතක තබාගෙන ක්‍රියා කරන්න කියලා විශේෂයෙන්ම මේ මොහොතේ මම මතක් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, මම තවත් ගනුදෙනුවක් ගැන කියන්න ඕනෑ. සමහර අයට මේ ගනුදෙනුව සුළුවෙන් පෙනෙන්න පුළුවන්. කොවිඩ් වසංගතය නිසා වරාය අධිකාරියේ සේවකයන්ගේ ආරක්ෂාව උදෙසා surgical masks දෙන්න තීරණය කළා. මේ masks මිලදී ගැනීමේදී ලොකු වංචාවක් සිදු වෙලා තිබෙනවා. මේ mask එකක් සාමාන්‍යයෙන් කඩේ රුපියල් 5යි; 6යි. තොග වශයෙන් ගන්න කොට රුපියල් 3ට, 4ටත් ගන්න පුළුවන්කම ඇති. නමුත් මේ masks මිලදී ගැනීමේදී වරාය අධිකාරිය PJ Pharma Care (Pvt.) Limited කියන ආයතනයෙන් මිල ගණන් කැඳවා, mask එකක් රුපියල් 40 ගණනේ ගන්නවා. මේ mask එකක් රුපියල් 5යි, නැත්නම් 10යි කියලා කිව්වත්, එකක් රුපියල් 40 ගණනේ මිලදී ගන්න වරාය අධිකාරිය ක්‍රියා කරන්නේ කාගේ සල්ලිවලින්ද? හිතන්න! මෙහි අතරමැදියෝ ඉන්නවා. මේ වාගේ ගනුදෙනු විශාල ප්‍රමාණයක් සිදු වෙනවා. මම මේ එක ගනුදෙනුවක් ගැන විතරයි කිව්වේ. මේ ආකාරයෙන් වරායේ ඉතා විශාල ලෙස මූල්‍ය වංචා සිදු වෙමින් තිබෙනවා. මේක ඉතාම නරක පූර්වාදර්ශයක් හැටියටයි අපි දකින්නේ. වරාය වැඩිදියුණු කිරීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග රැසක් තිබියදීත් ඒවා පිළිබඳ අවධානය යොමු නොකර දිනෙන් දිනම වරාය අභාවයට යන මට්ටමකට පරිවර්තනය කරන්න තමයි මේ උත්සාහ දරමින් සිටින්නේ.

අපේ රටේ වරාය ගණනාවක් තිබෙනවා; කන්කසන්තුරේ, ත්‍රිකුණාමලය, ඔලුවිල්, ගාල්ල, හම්බන්තොට යනාදි වශයෙන් වරාය ගණනාවක් තිබෙනවා. හම්බන්තොට වරායේ අයිතිය දැන් අපට නැහැ. මේ වරායවලින් ගන්න තිබෙන ප්‍රයෝජනය අප වෙන වෙනම තක්සේරු කරගන්න ඕනෑ. විශේෂයෙන්ම මම දුටුවා, ගාල්ල වරාය සංචාරක වරායක් හැටියට වැඩිදියුණු කරන්න උත්සාහ කරන බවට වන සඳහනක්. ඒක හොඳයි. අප කියන්නේ මොකක් හෝ ආර්ථික ප්‍රයෝජනයක් ලැබෙන විශේෂ තැන් හඳුනාගෙන ඒවා වැඩිදියුණු කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලායි. එවැනි වැඩ පිළිවෙළ කොළ කෑල්ලක තිබුණාට වැඩක් නැහැ. ඒවා ක්‍රියාවට පරිවර්තනය කරන්න. ඒක ඉතාම වැදගත්. මොකද, හැම වරායකම වටිනාකම අපට ලැබෙන්නේ ඒවායෙන් ආදායම් උත්පාදනය කරන තත්ත්වයකට ගියොත් විතරයි.

හම්බන්තොට වරායේ තත්ත්වය ගැන කථා කරන්න මම කැමති නැහැ. හම්බන්තොට වරාය, අපේ ජාතික වරායන් අතර තිබුණත් ඒක විකුණා දැමීමට ගත් තීරණය මම නම් අනුමත කරන්නේ නැහැ. ඒක වැරැදියි. අපේ රටේ ජාතික සම්පතක් හැටියට යමක් එකතු වුණොත්, ඒ එකතු වුණු සම්පත වැඩිදියුණු කරනවා විනා ඒවා විකුණා දැමීමට හෝ අන්සතු කිරීමට ගන්නා තීරණයට අපට එකඟ වෙන්න බැහැ. අපි ඉන්නේ ඒවායේ තාවකාලික භාරකරුවන් හැටියටයි. අපට පුළුවන්කමක් නැහැ, අවුරුදු පහකට බලය අරගෙන ඇවිල්ලා, ජාතියක්, අනාගතයක් වෙනුවෙන් තිබෙන සම්පත් විකුණා දමන්න හෝ කාටහරි දෙන්න. නමුත් අවාසනාවකට, මේ දේ සිදු වෙන බව තමයි කියන්න වෙන්නේ.

ගරු ඇමතිතුමනි, ඊට අමතරව මට තව කාරණා දෙකක් කියන්න තිබෙනවා. ඒ, වරාය සම්බන්ධව නොවෙයි. සීමාසහිත ලංකා නැව් සංස්ථාව ගැනයි මම කියන්නේ. සීමාසහිත ලංකා නැව් සංස්ථාව දිගින් දිගටම විශාල වශයෙන් පාඩු ලබන ආයතනයක් බවට පත්වෙලා තිබෙනවා. මේ ආයතනය කාලයක් ඉතා ඉහළ තත්ත්වයක තිබුණා. අද සීමාසහිත ලංකා නැව් සංස්ථාව නාමික වශයෙන් තිබුණත්, ඒකේ එක නැවක්වත් නැහැ. ඒකේ තිබෙන්නේ කුලියට ගත් නැව්. මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වැරැදි තොරතුරක් ලබා දීලා තිබෙන්නේ. අපේ සීමාසහිත ලංකා නැව් සංස්ථාවට අයිති නැව් දෙකක් තිබෙනවා.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

සීමාසහිත ලංකා නැව් සංස්ථාවට අයිති නැව් දෙකක් තිබෙන බව මම පිළිගන්නවා, ගරු ඇමතිතුමනි. හැබැයි, ඒ නැව් දෙකත් කුලියට දීලා තිබෙන්නේ. ඒ නිසා අපි කියන්නේ, සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් මීට වඩා යම් ආකාරයක ආර්ථික ප්‍රයෝජනයක් ලබාගැනීම සඳහා කටයුතු කළ යුතුයි කියන එකයි. භාණ්ඩ ප්‍රවාහනය සඳහාවත් එම ආයතනය යොදා ගැනීමේ උපාය මාර්ගික පියවරවලට අපි ගිහිල්ලා නැහැ. අඩු ගණනේ එම ආයතනයෙන් අපි ඒ ප්‍රයෝජනයවත් ගන්නේ නැති තත්ත්වයට පත්වෙලා තිබෙනවා. මේ ආයතනය නිකම්ම නාමික ආයතනයක් බවට පරිවර්තනය වෙමින් තිබෙනවා. මේ ආයතනය සඳහා යම් ආකාරයක වැඩසටහනක් සකස් කරන්න, ගරු ඇමතිතුමනි.

ඊළඟට, එක්ස්-ප්‍රෙස් පර්ල් නැව සම්බන්ධ ප්‍රශ්නය ගැන ගරු ඇමතිතුමාගෙන් දැනගන්න මම කැමැතියි. මොකද, මේක ආන්දෝලනාත්මක සිද්ධියක්. එක්ස්-ප්‍රෙස් පර්ල් පර්ල් නෞකාව අපේ මුහුදු තීරයේ, වරාය ආසන්නයේදී ගිනි ගත්තා. ඒ ගිනි ගැනීම හරහා අපට විශාල අනතුරක් ඇති වුණා. මොකක්ද, ඒ අනතුර? නැවට සිදු වූ අනතුර පමණක් නොවෙයි, අපේ මුහුදට, පරිසරයට, වෙරළට, මුහුදු ජීවීන්ට ඒ නිසා විශාල හානියක් සිදු වුණා. ඒ දවස්වල දිගින් දිගටම කිව්වා, එක්ස්-ප්‍රෙස් පර්ල් නැවේ මේ ගිනි ගැනීම හරහා සිදු වුණු පාරිසරික හානියට සහ පුද්ගලයන්ට සිදු වුණු පාඩුව සඳහා වන්දි ලබා දෙනවා කියලා. මම දැක්කා, සුළු වන්දියක් ගෙවා තිබුණා. නමුත් මම අහන්නේ ඒක නොවෙයි. මෙතැන තව කාරණා කීපයක් තිබෙනවා. මේ නැවේ ප්‍රශ්නය නිසා පරිසරයට සිදු වෙච්ච හානියට වන්දි ගෙවීමක් පිළිබඳව තවමත් නිශ්චිත එකඟත්වයක් නැහැ. නැව් සමාගම විවිධ යෝජනා කරනවා ඇති. හැබැයි, මේ ගිනිගැනීම නිසා අපේ පරිසරයට, මුහුදු වෙරළට, මුහුදු ජීවීන්ට බරපතළ හානියක් සිදු වුණා. නිහඬව ඉඳිමින් මේ ප්‍රශ්නය යට යන්න ඉඩහැර තිබෙනවාද කියා ලොකු සැකයක් අපට තිබෙනවා.

ඊළඟ කාරණය තමයි, මේ නැව අපේ මුහුදු තීරයට ගෙනාවේ කවුද කියන එක. ගරු සභාපතිතුමනි, මේ නැව වරායට ඇතුළු වීම පිළිබඳව CCTV කැමරා පද්ධතියේ තිබෙන දත්ත සියල්ල මකා දමා තිබෙනවාය කියා මාධ්‍යවල පළ වෙලා තිබෙනවා මම දැක්කා.

ඒක බරපතළ සැකයක්. ඒ නැව ඇතුළු වෙනකොට මොකක්ද වුණේ, ඒ වනවිට තිබුණු තත්ත්වය කොහොමද කියන සියල්ල කැමරාවල සටහන් වෙනවා නේ. හැබැයි, මේ දත්ත පද්ධතිය මුළුමනින්ම මකා දමා තිබෙනවා. මේ නිසා එතැන යම් කිසි අභිරහසක් තිබෙනවා කියලා අපට සැකයක් තිබෙනවා. මම හිතනවා, ඒ ගැන පරීක්ෂා කර බලන එක හොඳයි කියලා. මේ ගැන උසාවියේදී කරපු ප්‍රකාශයක් මම දැක්කා. මම ඒක දැක්ක නිසායි කියන්නේ. CCTV කැමරා පද්ධතියේ තිබුණු ඒ ඡායාරූප මකා දැමීම බරපතළ කාරණයක්.

ගරු සභාපතිතුමනි, එක්ස්-ප්‍රෙස් පර්ල් නැව තවමත් අපේ මුහුදු සීමාවේ වරාය ආසන්නයේ තිබෙනවා. ඒක ඉවත් කරන්න ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? මේ සඳහා ජාත්‍යන්තර වශයෙන් එකඟතාවක් අරගන්න, නැව් සමාගමේ එකඟතාව අරගන්න, අනුමැතිය අරගන්න හිටියොත්, අපේ වරායට තිබෙන අනතුර ගැනත් හිතන්න ඕනෑ. හැබැයි, අපේ වරායට තිබෙන අනතුර ගැන ක්‍රියා මාර්ග ගැනීමේදී යම් ප්‍රමාදයක් සිදුවෙලා තිබෙනවා. ඒ ගැන සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. ගරු සභාපතිතුමනි, ඒ නැව අයින් කරන්න ඕනෑ. ඒක අයින් කළේ නැත්නම් ලොකු නැව් ගෙන්වා ගැනීමේ දී, ඒවා හැසිරවීමේදී අපිට ප්‍රශ්න මතු වෙන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, නාවික ක්ෂේත්‍රය පිළිබඳව, ගුවන් ක්ෂේත්‍රය පිළිබඳව අද අපිට ප්‍රතිපත්තියක් නැහැ. ශ්‍රී ලංකාව, දකුණු ආසියාවේ නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්න නම්, ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක් අපිට තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම අපි ජාතික නාවික ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ. ඒ සඳහා ඔබතුමා මුල් වෙන්න. මේ වැඩ පිළිවෙළ රටකට අවශ්‍යයි. එවැනි ආකාරයට ප්‍රතිපත්තියක් නිර්මාණය කළොත් තමයි, එකිනෙකට වෙනස් තීන්දු ගන්නේ නැතිව, හැමදෙයකම ප්‍රතිපත්තිමය තීන්දුවකට එළඹෙන්න අපිට පුළුවන් වන්නේ. එම කාරණය පිළිබඳව මම විශේෂයෙන් මතක් කළේ වෙන එකක් නිසා නොවෙයි. "වරාය" කියන්නේ, අපිට විශාල ලෙස ආදායම් උත්පාදනය කර ගන්න පුළුවන්, අපේ ජාතික ආදායමට විශාල ධනයක් එකතු කර ගන්න පුළුවන් අංශයක්. එම නිසා මේ නාවික ප්‍රතිපත්තිය නිර්මාණය කිරීම සඳහා වහාම පියවර ගන්න කියලා මේ මොහොතේ මම ඉල්ලා සිටිනවා.

මම මීට වඩා කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම මේ පෙන්වා දුන් සමහර කාරණා ගැන ඇමතිතුමා දේශපාලනික වශයෙන් උත්තර දෙන්නේ නැතිව, වරාය රැක ගැනීම වෙනුවෙන්, ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් යථාර්ථවාදීව යම් පිළිතුරක් ලබා දෙයි කියලා මම හිතනවා. මේ කාරණා සියල්ල මම කිව්වේ, අභිතකින් නොවෙයි. අපි අපේ වරාය වැඩි දියුණු කර ගන්න ඕනෑ; ඒක හදාගන්න ඕනෑ. තිබෙන අඩුපාඩු සකස් කර ගෙන දකුණු ආසියාවේ තිබෙන ශක්තිමත්ම, හොඳම ආදායම් උත්පාදනය කරන වරාය බවට අපේ වරාය පරිවර්තනය කර ගන්න ඕනෑ. ලෝකයේ, වරායන්වලින්ම විතරක් ජීවත් වෙන රටවල් තිබෙනවා. නාවික ක්ෂේත්‍රයෙන්ම ජීවත් වෙන රටවල් තිබෙනවා. පැනමාව වාගේ රටක් ගත්තොත්, ඒ රටේ ජාතික ආදායම සම්පූර්ණයෙන්ම වරායෙන්, නැත්නම් නාවික ක්ෂේත්‍රයෙන් තමයි ලැබෙන්නේ. එම නිසා අපිටත්, අපේ ජාතික ආදායමෙන් වැඩි කොටසක් වරාය හරහා ගන්න පුළුවන්කම තිබෙද්දී, එය අන්සතු කරන්න එපා කියා මම ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, වරායේ බටහිර පර්යන්තය දුන්නා වාගේ නැගෙනහිර පර්යන්තයත් දෙන්න සූදානම් වෙයිද දන්නේ නැහැ. එහෙම වුණොත් අපිට මොනවත් ඉතුරු වෙන්නේ නැහැ. අන්තිමට අපට "වරාය" කියන ලේබලය විතරක් ඉතුරු වෙයි; අපට වරායක් නැතිවෙයි. ගරු ඇමතිතුමනි, එම නිසා මේ ගැන යහපත් විධියට හිතලා, වරාය රැක ගන්න, වරාය විනාශ කරන්න ඉඩ දෙන්න එපා කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

ගරු සභාපතිතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා. හම්බන්තොට වරාය සම්බන්ධයෙන් අපි අවුරුදු 70ක ගිවිසුමකට ඇවිල්ලා තිබෙනවා. එහෙම නැතිව, එය විකිණීමක් සිදු වුණේ නැහැ.

ඊළඟට මම ගරු සභානායකතුමාගෙන් අහන්න කැමතියි, ගෑස් ප්‍රශ්නය සම්බන්ධයෙන් ඒ වාර්තාව අපට අද ලැබෙනවාද, නැද්ද කියලා. එහෙම නැත්නම් මෙතැන තිබෙන ප්‍රශ්නය සභානායකතුමාට,- *[බාධා කිරීමක්]*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ ගැන කථා කරන්න ඊයේ දිනයේ විශේෂ උපදේශක කාරක සභාවක් රැස් කරන්න කිව්වා. ඒ අනුව එම කාරක සභාව රැස්වුණා. විපක්ෂ නායකතුමා, මන්ත්‍රීවරු, ඇමතිවරු සියලු දෙනා එයට සහභාගි වුණා. සියලු නිලධාරින් ඒකට කැඳවලා සාකච්ඡා කළා. ඒ අනුව එම කාරක සභාවේ දී ගත් තීරණයේ වාර්තාව ගරු අමාත්‍යතුමා ලබාදෙයි, හිටපු අගමැතිතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

ගරු සභාපතිතුමනි, මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය මෙකයි. මේ පරීක්ෂණ සඳහා ලංකාවේ රසායනාගාරයක් නැහැ; we have not got a laboratory for testing. මම හිතන විධියට ආණ්ඩුව රුපියල් මිලියන 250ක්, මිලියන 500ක් දුන්නොත්,- *[බාධා කිරීමක්]* ඒ ගැන ගරු සුසිල් ප්‍රේමජයන්ත රාජ්‍ය ඇමතිතුමාගෙන් අහ ගන්න පුළුවන්. ඒක කරන්න ඕනෑ. මේ විධියට කල් යන්නේ ඒ හේතුව නිසායි. මම හිතන විධියට, ඒ සඳහා ලංකාවේ රසායනාගාරයක් හදන එක තමයි ප්‍රධාන වශයෙන් කළ යුත්තේ. *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු සභාපතිතුමනි, ගරු සභානායකතුමා කිව්වා වාගේ, ඔබතුමාගේ උපදේශය අනුව ඊයේ සියලු මන්ත්‍රීවරු කාරක සභාවේ දී ඒ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළා. ඊයේ එතැන දී අවසාන තීරණයකට ආවා, එම වාර්තා ටික අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියලා. මම ඔබතුමාට කියනවා, ඒක ගැන පොඩ්ඩක් සොයා බලන්න කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

අපේ හිටපු අගමැතිතුමා ඇහුවෙත් ඒ කාරණයම තමයි.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු සභාපතිතුමනි, අපේ හිටපු අගමැතිතුමා කිව්වා හම්බන්තොට වරාය සම්බන්ධයෙන් අවුරුදු 70ක ගිවිසුමකට ඇවිල්ලා තිබෙනවා කියලා. සාමාන්‍ය සම්ප්‍රදාය අනුව, තිස්තුන්

[ගරු තිස්ස අත්තනායක මහතා]

අවුරුද්දකට බදු දුන්නොත් එය සින්නක්කරව දීමක් හැටියට තමයි සලකන්නේ. ඇත්තටම ඒක ආපහු ගන්න බැහැ. ලංකාවේ එසේ ආපසු ලබාදුන් ආයතනයක් කියන්න, බලන්න? එදා 20 අවුරුද්දක එකඟතාවකට ප්‍රීමා සමාගම දුන්නා, පිටි නිෂ්පාදන කර්මාන්තය ඇති වුණා. හැබැයි, අදටත් අපට ඒ සමාගම ආපහු ගන්න පුළුවන් වුණාද? අපි හිතමු, වරාය බදු දුන්නා කියලා. ඒක කළේ, අපිට මේ ණය මුදල ගෙවන්න බැහැ කියලා. හැබැයි, ඒ ගත්ත සල්ලිවලින් ණය මුදල ගෙවලා නැහැ. භාණ්ඩාගාරයට ඒ සල්ලි ටික ගත්තා. තවමත් ණය ගෙවනවා. ඒක තමයි ඇත්ත කථාව. මම හිටපු අගමැතිතුමාත් එක්ක වාදයකට යන්නේ නැහැ. එතුමා මගේ හිටපු නායකයා. නමුත් මේක තමයි ඇත්ත කථාව. අවුරුදු 15කට බදු දුන්නත්, 20කට දුන්නත්, 30කට දුන්නත් මේ එක සම්පතක්වත් අපට ආපහු ගන්න බැහැ. ඒකයි මෙතැන තිබෙන වැරැද්ද.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

ගරු සභාපතිතුමනි, ඒ ගිවිසුම අනුව, අපට පුළුවන් හෙට ගිහිල්ලා ඒ ගිවිසුම අහෝසි කරලා වරාය ආපහු අරගන්න. එතකොට අපට වන්දි මුදලක් තමයි ගෙවන්න තිබෙන්නේ. මොකද, අපි අවුරුදු 70කට දුන්න නිසා. අපි ඩොලර් බිලියනයක් ලබා ගත්තා. භාණ්ඩාගාරයට ගියාම අපි ඒ මුදල විදේශ විනිමය සංචිතයට ඇතුළත් කරනවා.

ඇත්ත වශයෙන්ම, අපි අරගෙන තිබෙන ණය සඳහා වන පොලිය සාමාන්‍ය වාණිජ පොලියට වඩා අඩුයි. අපි ඒ ණය අරගෙන වරාය හදන්න ගත් ණය ගෙව්වොත්, අපට වාණිජ පොලියට ඇමෙරිකානු ඩොලර් බිලියනයක් ගන්න වෙනවා. එම නිසා අපි ඒ ඩොලර් බිලියනය අරගෙන තැන් දෙකක ආයෝජනය කළා. ඒ නිසා තමයි, ආර්ථිකය ඉස්සරහට ගෙනයන්න මුදල් තිබුණේ. මේ ආණ්ඩුවට වුවමනා නම් ඒක අහෝසි කරන්න පුළුවන්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

ගරු සභාපතිතුමනි, හිටපු අගමැතිතුමාට වැරදුණා. අවුරුදු 70කට නොවෙයි, අවුරුදු 99කට තමයි හම්බන්තොට වරාය බදු දීලා තිබෙන්නේ. මම හිතන්නේ හිටපු අගමැතිතුමාට මොකක් හෝ පටලැවිල්ලක් වෙන්න ඇති. මම ඒ ගිවිසුම දැන් ඔබතුමාට දෙන්නම්, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමනි. ඔබතුමා නොවෙයි, ඒ ගිවිසුම අත්සන් කළේ. ඔබතුමා තමයි කෙටුම්පත හැදුවේ. HIPG සහ HIPS වශයෙන් ආයතන 2ක් නම් කරලා කොටස් හැටියට අවුරුදු 99කට දීලා තිබෙනවා. HIPG එක ගත්තාම, හරකා කෑම කන පැත්ත අපට දීලා තිබෙනවා. හරකාගේ කිරි ටිකයි, ගොම ටිකයි එන පැත්ත අනික් ආයතනයට දීලා තිබෙනවා. අත්සන් කරපු ගිවිසුමක් ඔබතුමා කියන විධියට එක රැයකින් ඉරන්න පුළුවන් නම් ඉතාම හොඳයි. ඒක කරගන්න බැහැ, ගරු හිටපු අගමැතිතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

අත්සන් කරපු ගිවිසුම මම පෙන්වන්නම්. ඒක අවුරුදු 70ට අඩු කළා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

ගරු හිටපු අගමැතිතුමනි, ඔබතුමාට කවුරු හරි කියලා ඇති, අවුරුදු 70ට අඩු කළා කියලා. නමුත්, අඩු කරලා නැහැ. අවුරුදු 99ක් විධියට ගිවිසුමේ සඳහන් කර තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

ඒ අත්සන් කරපු ඒ ගිවිසුමේ පිටපතක් ඔබතුමා ළඟ තිබෙනවා නම් පෙන්වන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

මම ඔබතුමාට එය දෙන්නම්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

අවුරුදු 70කින් පස්සේ ආපහු ගන්න පුළුවන් විධියට ඒ ගිවිසුමේ කාලය අඩු කර තිබෙනවා. අපි ඊට ඉස්සෙල්ලා ගන්නවා නම්, ඔවුන්ට වන්දියක් ගෙවන්න වෙනවා. කොහොම හරි, චීනයත් එක්ක කථා කරලා අවශ්‍ය නම්, ආපහු ගන්න පුළුවන්. ඒක සුළු දෙයක්. වන්දියක් ගෙවන්න විතරයි තිබෙන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

ගරු සභාපතිතුමනි, හිටපු අගමැතිතුමාට නම් ඒක සුළු ප්‍රශ්නයක්. එතුමාට ඒක එච්චර ලොකු ප්‍රශ්නයක් නොවෙයි. ඒක විකුණලා අහනවා, දැන් ආපහු ගන්න බැරි ඇයි කියලා. හොඳ වෙලාවට ඒ ආණ්ඩුව ගියේ. නැත්නම් මුළු ලංකාවම විකුණනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

දැන් ඔය මාතෘකාව ගැන විවාද කළා ඇති.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

හම්බන්තොට වරාය ඒ විධියටම කරගෙන යන්න ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් එකඟවෙලා තිබෙනවා. ප්‍රශ්නයක් තිබෙනවා නම්, කරුණාකර ඒක කැබිනට් මණ්ඩලයේ සාකච්ඡාට ගන්න. වරාය අධිකාරිය කෑ ගැහුවාට මේක කරන්න බැහැ. වරායේ කළමනාකාරිත්වය මේක වල් කරගෙන තිබෙන්නේ. ඒක කැබිනට් මණ්ඩලයට අරගෙන සාකච්ඡා කරන්න. ඒ අය කියන ඒවා අහන්න එපා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු සනත් නිශාන්ත රාජ්‍ය අමාත්‍යතුමා.

[පූ.භා. 10.19]

**ගරු සනත් නිශාන්ත මහතා (ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனத் நிசாந்த - கிராமிய மற்றும் பிரதேச நீர்க் கருத்திட்ட அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Sanath Nishantha - State Minister of Rural and Divisional Drinking Water Supply Projects Development)

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ හිටපු මහ ලේකම්තුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබීම පිළිබඳව මම හදවතින්ම සතුටු වෙනවා. තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා කියන්නේ, අපි ආදරය කරන බොහොම හොඳ නායකයෙක්. මම මේ රටේ ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා වුණත්,

එතුමාගේ කථාවට යම්කිසි පිළිතුරක් ලබා දීලා මගේ කථාව පටන් ගත්තොත් හොඳයි කියා හිතුවා.

විශේෂයෙන්ම එතුමාගේ කථාවේදී කියැවුණා, රන් නිධානයක් අපි බදු දෙන්න යනවා කියලා. ඇත්තටම රන් නිධානයක් බදු දී අවසන් වුණු වෙලාවක්. එදා එක්සත් ජාතික පක්ෂය සිරිසේන-වික්‍රමසිංහ ආණ්ඩුව කාලයේ අපේ වරායක් බදු දුන්නා. '99 අවුරුදු බදු දෙකකට' කියා තමයි ඒ සම්බන්ධයෙන් අපි ළඟ තිබෙන තොරතුරුවල තිබෙන්නේ. දැනට ඒ ගිවිසුම අත්සන් කර තිබෙන්නේ 99 අවුරුදු බද්දකට. නමුත්, තවත් 99 අවුරුද්දකට බදු දෙනවා කියා පොරොන්දුවකුත් තිබෙන බවට තමයි අපි ළඟ තොරතුරු තිබෙන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
තිබෙනවා නම්, ගෙනැල්ලා දෙන්න බලන්න.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
කොහොම නමුත්, තමුන්නාන්සේලා එදා අපේ වරාය 99 අවුරුද්දකට බදු දීලා අපේ පරම්පරා ගණනකට ජාතික සම්පතක් නැති කළා. ඒ වරාය ඉදිකිරීම සඳහා ගත් ණය මුදල අදටත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය හරහා ගෙවාගෙන යනවා. ඒ බර තමයි, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අද දරාගන්න බැරිවෙලා තිබෙන්නේ. ඒ බර තමයි, ශ්‍රී ලංකා වරාය අධිකාරිය අද මේ කර ගහන්නේ. එදා ක්‍රියාත්මක කළ වැරදි තීන්දු, ඒ අය ගත් වැරදි ක්‍රියා මාර්ගවලට තමයි අද ශ්‍රී ලංකා වරාය අධිකාරියට වන්දි ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ. හම්බන්තොට වරාය අපි දකින්නේ හරියට රත්තරන් බිත්තර දමන කිකිළියක් වාගේයි. මේ රත්තරන් බිත්තර දමන කිකිළිව මෙතුමන්ලා වසර 99කට බදු දුන්නා. ඇත්තටම විකුණාගෙන කෑවා කියා තමයි කියන්න වෙන්නේ. මේ කිකිළියගේ රත්තරන් බිත්තර හම්බ වෙන්නේ අපට නොවෙයි, චීන සමාගමට. මේ වැරදි ගනුදෙනු කරපු අය, අපේ මහ බැංකුව කොල්ල කාපු අය, තිබුණු ණය ප්‍රමාණය දෙගුණයක් බවට පත් කරපු අය මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළදී අද බබාලා වාගේ කථා කරනකොට ඇත්තටම ලොකු කනගාටුවක් ඇති වෙනවා.

මේ රටේ ණය ප්‍රමාණය කොච්චරද කියලා ආපස්සට හැරිලා බැලුවොත්, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005දී මේ රට භාර ගනිද්දි රටේ තිබුණු ණය ප්‍රමාණය දළ වශයෙන් ට්‍රිලියන 2යි. මහ මුහුදෙන් තුනෙන් දෙකක්, රටේ මහ පොළොවෙන් තුනෙන් එකක් කොටින්ගේ අතට ගිය වෙලාවක තමයි එතුමා රට භාර ගත්තේ. දරුවා පාසලට ගිහින් එළියට එනතෙක් දෙමව්පියන් පාසල ළඟ මුර කළා. එවැනි වාතාවරණයක් තමයි එදා අපේ රටේ තිබුණේ. එහෙම රටක් තමයි එතුමා එදා භාර ගත්තේ. එතුමා එහෙම භාර ගත් රටේ යුද්ධය අවසන් කළා. ඊට පස්සේ රටේ දැවැන්ත සංවර්ධනයක් කළා.

සංවර්ධනයට සහ යුද්ධය කරන්න ගත් ට්‍රිලියන 5ක ණය ප්‍රමාණයත් එක්ක අපේ ණය ප්‍රමාණය ට්‍රිලියන 7ක් වුණා. හැබැයි, රටේ යුද්ධය අවසාන වුණා විතරක් නොවෙයි, ආර්ථික වර්ධන වේගය අතින් ගත්තාම චීනය ආසන්නයට එන්න, ලෝකයේ දෙවන ස්ථානයට ළඟා වෙන්න හැකි දැවැන්ත ආර්ථික වර්ධන වේගයකින් අපේ රට ඉස්සරහට ගියා. රටේ වරායන් හැදුණා, ගුවන් තොටුපළවල් හැදුණා, අධිවේගී මාර්ග හැදුණා, අස්සක් මුල්ලක් නැර විදුලිය ලැබුණා, ප්‍රජාශාලා හැදුණා, මාතෘ සායන හැදුණා. ද්විතීයික පාසල් වැඩසටහන, පෝෂිත පාසල් වැඩසටහන, ගම නැඟුම, මග නැඟුම, දිවි නැඟුම ආදී වැඩසටහන් ක්‍රියාත්මක වෙලා මුළු රටම එකම වැඩබිමක් බවට පත් වුණා. රට එහෙම වැඩබිමක් බවට පත්වෙලා තිබෙනකොට එදා වික්‍රමසිංහ මහත්තයා අපේ තරුණ නංගිලා මල්ලිලාට බලාපොරොත්තු දීලා මේ රටේ යම්කිසි වෙනසක් කෙරුවා. ඒ වෙනස වෙච්ච කාලයේ මම දැක්කා, ත්‍රිරෝද රථයක ගහලා තිබෙනවා, "වෙනස මාරයි රට හමාරයි" කියලා. රට විනාශ වුණා. රටේ ණය ප්‍රමාණය දෙගුණයක් වුණා. වික්‍රමසිංහ මහත්තයෝ, මහින්ද රාජපක්ෂ මහත්මයා 2015 ජනවාරි 08වන දා තමුන්නාන්සේලාට මේ රට භාරදෙනකොට රටේ සමස්ත ණය ප්‍රමාණය ට්‍රිලියන 7යි. නමුත්, තමුන්නාන්සේලා නැවත වතාවක් අපට රට භාර දෙන්නේ ට්‍රිලියන 14කට ඉතාම ආසන්න ප්‍රමාණයකට රටේ ණය ප්‍රමාණය වැඩි කරලා. ඒ අනුව, ණය ප්‍රමාණය දෙගුණයක් බවට පත් වුණා. තමුන්නාන්සේලා මහ බැංකුව කොල්ල කෑවා; අපේ වරායන් වික්කා; ජාතික සම්පත් නැති කළා; ගොවියා, කිරි ගොවියා, ධීවරයා පාරට දැම්මා. ඒ විනාශය කරපු උදවිය අද මෙතැනට ඇවිල්ලා බබාලා වගේ කථා කරනවා.

ගරු සභාපතිතුමනි, මම දැන් කථාව පටන් ගන්නම්, අපි කරපු වැඩවලින්. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගනිද්දි රටේ පානීය ජල අවශ්‍යතාව ඉෂ්ට වෙලා තිබුණේ ජනතාවගෙන් සියයට 53.7කට විතරයි. මේ වෙනකොට ඒ ප්‍රමාණය සියයට 59.25ක් දක්වා වැඩි කර තිබෙනවා. හැබැයි, සියයට 59.25 කියන්නේ සැපයුම විතරයි. මීට වඩා විශාල intake එකක් රඳවා ගත හැකි, නැත්නම් පිරිපහදු කළ හැකි මධ්‍යස්ථාන ප්‍රමාණයක් මේ වෙද්දි ඉදිවෙමින් පවතිනවා. වසර එකහමාරක් දෙකක් යද්දි අපට සියයට 70ක, 75ක ආසන්නයට ළඟා වෙන්න පුළුවන් වෙයි. අතිගරු ජනාධිපතිතුමා අපට දීලා තිබෙන ඉලක්කය තමයි, 2025 වෙනකොට රටේ සියලු ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දෙන්න ඕනෑ කියන එක. ඒ විතරක් නොවෙයි, කරාමය ඇරියාම 24 පැයේම වතුර ටික ලැබෙන්නත් ඕනෑ. තුන්සියහැටපස් දවසේ 24 පැයේම පිරිසිදු පානීය ජලය ලබා දෙන ඉලක්කයට අපේ රට අපි වේගයෙන් ඉස්සරහට අරගෙන යනවා. මේ වෙනකොට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හරහා රටේ ජාතික ජල අවශ්‍යතාවෙන් සියයට 45.80ක් ලබා දෙමින් තිබෙනවා. ඒ වාගේම ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව, ගම්වල සමිති සමාගම් සම්බන්ධ කරගෙන ජලය ලබා දෙනවා. අපි එහි කළමනාකරණය විතරයි කරන්නේ. ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව, ගම්වල සමිති සමාගම් හරහා ඒ කටයුතු කළමනාකරණය කරමින් ජල අවශ්‍යතාවෙන් සියයට 12.25ක් ලබා දෙනවා.

ඒ වාගේම, පළාත් පාලන ආයතන හරහා සියයට 1.20ක ප්‍රමාණයක් ලබා දෙනවා. මේ සියල්ලේ එකතුවෙන් තමයි සියයට 59.25ක ප්‍රමාණයකට අපි ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපේ ඉලක්කය ඉදිරි වසර තුනක කාලය තුළ සැමට පානීය ජලය ලබා දීමයි. ඒ විතරක් නොවෙයි, ජලය දෙන්න බැරි තැන්වලට, ජලය නැති තැන්වලට පවා අපි ජලය ලබා දෙනවා. උදාහරණයක් විධියට යාපනයේ තිබෙන දූපත්වලට ජලය ගන්න තැනක් නැහැ. ඒ දූපත්වලට ජලය ලබා දීමට විශාල මුදලක් අද Water Supply and Drainage Board එක වියදම් කරනවා. මහ මුහුදෙන් වතුර අරගෙන පිරිපහදු කරලා තමයි ඒ ජනතාවට අපි වතුර දෙන්නේ. කියුබික් මීටරයක් පිරිපහදු කිරීමට රුපියල් 120ක් වියදම් කරලා, රුපියල් 10 ගණනේ තමයි ඒ ජනතාවට අපි වතුර ලබා දෙන්නේ. ඒ නිසා ලොකු වැඩ කොටසක් ජල සම්පාදන අමාත්‍යාංශය හරහා අද සිද්ධ වෙනවා.

අද අතිගරු ජනාධිපතිතුමා පානීය ජලය සඳහා වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. මොකද, එක පැත්තකින් වකුගඩු රෝගීන් ප්‍රමාණය වැඩි වෙමින් තිබෙනවා. එයට ප්‍රධාන විකල්පය හැටියට පිරිසිදු පානීය ජලය ලබාදෙන එක සුදුසුයි

[ගරු සනත් නිශාන්ත මහතා]

කියන එක තමයි වෛද්‍යවරු අනුමත කරන්නේ. ඒ සඳහා ගරු වාසුදේව නානායක්කාර මගේ කැබිනට් අමාත්‍යතුමා ලොකු කැපකිරීමක් කරනවා; ලොකු මහන්සියක් ගන්නවා. මේ වැඩ කටයුතු කරන්න එතුමා අපට දැවැන්ත හයියක් දෙනවා. මගේ නායකයා හැටියට එතුමා නිරන්තරයෙන් අපි දිරි ගන්වනවා. දවසේ පැය 24න් පැය 20ක් විතර, මහජන නියෝජිතයෝ, රාජ්‍ය නිලධාරින් ඇතුළු අපේ අමාත්‍යාංශවල ඉන්න සියලුදෙනා පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීමේ වගකීම කරට අරගෙන වැඩ කරනවා. ඒ වාගේම ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ප්‍රියත් බන්දු වික්‍රම මැතිතුමා ඉංජිනේරුවෙක් හැටියට, අත්දැකීම් සම්භාරයක් තිබෙන නිලධාරියෙක් හැටියට මේ ආයතන සියල්ල මෙහෙයවමින් රාජ්‍ය නිලධාරින්ට නිවැරදි නායකත්වයක් ලබා දෙමින් කටයුතු කරනවා. මගේ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විජය බන්දු මැතිතුමාත් මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. එතුමාත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙක්. එතුමාත් නිවැරදි නායකත්වයක් ලබා දෙමින් මේ කටයුතු ඉදිරියට කරගෙන යනවා. ඒ වාගේම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති නිශාන්ත රණතුංග මැතිතුමාත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ. එතුමා ප්‍රමුඛ ඒ අධ්‍යක්ෂ මණ්ඩලය විසිහතර පැයේම අපිත් එක්ක දුරකථනයෙන් සම්බන්ධ වෙමින් මේ රටේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීමේ වගකීම කරට අරගෙන කටයුතු කරනවා. ඒ වාගේම, එහි සාමාන්‍යාධිකාරි තිළිණ විජේතුංග මහතා ප්‍රමුඛ අනෙකුත් නිලධාරින් ලබාදෙන සහයෝගයත් අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ඒ වාගේම, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවට නිවැරැදි නායකත්වයක් ලබා දෙන එහි අධ්‍යක්ෂ ජනරාල් අපේ ජයතිලක හේරත් මහතා ප්‍රමුඛ ඒ නිලධාරින් කරන සේවාවත් අපි මේ වෙලාවේ සිහිපත් කරන්න ඕනෑ. ඒ නිසා අද අපි රටේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට එක පැත්තකින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හැටියටත්, අනෙක් පැත්තෙන් ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව හැටියටත්, අනෙක් පැත්තෙන් ජල සම්පත් මණ්ඩලය හැටියටත් කටයුතු කරනවා. අපේ රටේ තිබෙන ජල මූලාශ්‍ර ආරක්ෂා කරමින්, ජලයේ තිබෙන ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් අද අපි ඒ වගකීමඩ කරට අරගෙන කටයුතු කරනවා.

මේ වෙනකොට පළාත් මට්ටමින් අපි ප්‍රගති සමාලෝචනය කරමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි, අපි ළඟට ඇවිත් ගමේ තිබෙන ප්‍රශ්න ඉදිරිපත් කරනකල් ඉන්නේ නැතුව, ප්‍රශ්නය ළඟට අපි යන වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. "පවස නිවන ඉලක්කයට ගමට වතුර" යන තේමා පාඨය යටතේ, දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සැමට පිරිසිදු පානීය ජලය ලබාදීමේ වගකීම අද අපි කරට අරගෙන තිබෙනවා. අපි කාර්යය කොටස් තුනකට බෙදා වෙන් කරගෙන තිබෙනවා, කඩිනම් විසඳුම්, මධ්‍ය කාලීන විසඳුම්, දීර්ඝ කාලීන ස්ථිර විසඳුම් වශයෙන්.

ගරු සභාපතිතුමනි, කඩිනම් විසඳුම් හැටියට අපි සැලසුම් කරලා තිබෙන්නේ, වකුගඩු රෝගය තිබෙන, පානීය ජලයේ ගුණාත්මක භාවයේ ගැටලු තිබෙන තැන්වලට කඩිනමින් නැනෝ තාක්ෂණය ලබාදීමයි. මේ වනකොට නැනෝ පිරිපහදු කට්ටල විශාල ප්‍රමාණයක් රට පුරා නිර්මාණය වෙමින් තිබෙනවා. මේ කථා කරන මොහොත වෙද්දීත් නැනෝ පිරිපහදු කට්ටල 400ක්, 500ක් රට පුරාම නිර්මාණය වෙමින් තිබෙනවා. ඒ යටතේ කඩිනම් විසඳුම් අපි ලබා දෙනවා, ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා. හැබැයි, ඒ නැනෝ තාක්ෂණයෙන්, එහෙම නැත්නම් ඒ පිරිපහදුව හරහා ලබාදෙන ජලය කෙළින්ම ගෙදරට ලබා දෙන ක්‍රමයක් නොවෙයි. වකුගඩු රෝගය තිබෙන ප්‍රදේශවල ජනතාව යම්කිසි දුරක් ගෙවාගෙන ඒ ස්ථානයට ඇවිල්ලා තමන්ගේ කළගෙඩියෙන්, බූලියෙන් වතුර අරගෙන යන ක්‍රමවේදයක් තමයි හදලා තිබෙන්නේ. මෙය තමයි කඩිනම් විසඳුම හැටියට සැලසුම් කර තිබෙන්නේ.

මධ්‍ය කාලීන විසඳුම් හැටියට අපි සැලසුම් කරලා තිබෙනවා, ජල මූලාශ්‍ර තිබෙන තැන් හඳුනාගෙන, ඇළ - දොළ, ගංගා හඳුනාගෙන- ඒවායින් අවශ්‍ය ජලය ලබා දෙන්න. ගරු සභාපතිතුමනි, අපි ගොඩක් වෙලාවට උත්සාහ කරන්නේ, මහ පොළොවට හානියක් කරන්නේ නැතිව, භූගත ජලයට අත තියන්නේ නැතිව, මතුපිට ජලයෙන් මේ ප්‍රශ්න ගැටලු ටික විසඳා ගන්නයි. ඒ අනුව මතුපිට ජලය අරගෙන පිරිපහදු කරලා ලබාදෙන වැඩ පිළිවෙළක් අපි සූදානම් කරනවා. මධ්‍ය කාලීන විසඳුමක් හැටියට අපි ජාතික ප්‍රජා ජල දෙපාර්තමේන්තුව හරහාත් මේ වෙද්දී විශාල වැඩ කොටසක් කරනවා. ගමේ ජනතාව ඒක රාශි කරගෙන ඒ අයට තියෙන ජල සම්පත කළමනාකරණය කරමින් සමිති සමාගම් හරහා ප්‍රදේශයේ ජනතාවට ජලය ලබාදෙන එක. ජාතික ප්‍රජා ජල දෙපාර්තමේන්තුවත් නව මුහුණුවරක් ඔස්සේ ක්‍රියාත්මක කරන්න අපි කටයුතු සූදානම් කරලා තිබෙනවා. මේ ගම්වල සමිති සමාගම් තිබෙනවා. ඒ සමිතිය භාරයේ තමයි ජාතික ප්‍රජා ජල දෙපාර්තමේන්තුවේ ජල යෝජනා ක්‍රමය තිබෙන්නේ. අතිගරු ජනාධිපතිතුමා අපට දීලා තිබෙන ඉලක්කයත් එක්ක ඉතා ඉක්මනින් පානීය ජලය ලබාදීම සඳහා ජාතික ප්‍රජා ජල දෙපාර්තමේන්තුව නව පියවරක් ගෙන තිබෙනවා. ඒ තමයි, තාවකාලික සමිතියක් හදලා ඒ ප්‍රදේශයට ජලය අරගෙන ඒ ජලය ලබා දෙන එක. හැබැයි, ඒ සමිතිය ස්ථිර සමිතියක් නොවෙයි. ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ගමට පිරිසිදු පානීය ජලය රැගෙන ආවාම ඒ bulk supply එක ඒ වැඩසටහනට connect කරලා ඒ සමිතිය විසුරුවා හැරලා අවසාන කරන වැඩ පිළිවෙළක් තමයි එතැන තිබෙන්නේ.

ක්ෂණික පපඩම්, ක්ෂණික නූඩ්ල්ස් වාගේ ජලය දෙන්න පුළුවන්කමක් නැහැ. තාච්චියට දාලා ආප්ප හදනවා වාගේ ඉක්මනින් ජලය දෙන්න පුළුවන්කමක් නැහැ. ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් නළ පද්ධතියක් හරහා එය ලබා දෙන්න වෙනවා. ඒ කටයුතු කිරීමේදී අපට අත්දැකීම් තිබෙනවා. මාතලේ වාගේ දිස්ත්‍රික්කවල පානීය ජලය ලබා දීම මේ වන කොට සියයට 90ක ඉලක්කයට ළඟා වෙලා තිබෙනවා. එහෙම පානීය ජලය ලබා දෙන්න නළ එළද්දි කළු ගලක් කඩන්න තිබුණා. එය කඩන්න ඒ ගලට බෝර දාන්න බැහැ, ඒ ආසන්නයේ තිබෙන නිවාස පුපුරනවා. එතකොට ජනතාව පාරට බහිනවා, අපේ නිවාස පුපුරනවා කියලා. අනෙක් පැත්තෙන් මාර්ග කිලෝමීටර ලක්ෂයේ වැඩසටහන යටතේ පාරවල් ඉදිවෙමින් පවතිනවා. අද රට පුරා මාර්ග ටික වේගයෙන් ඉදිවෙමින් පවතිනවා. ජලය සැපයීමේදී අපට ඒ මාර්ගවලට හානියක් කරන්න පුළුවන්කමක් නැහැ. පරිස්සමට ඒ වැඩේ කරන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා උපදෙස් දීලා තිබෙන්නේ, ගරු අගමැතිතුමා උපදෙස් දීලා තිබෙන්නේ ඒකාබද්ධ වැඩසටහනක් කරන්න කියලා. ඒ අනුව මහාමාර්ග අමාත්‍යාංශය, ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රජා ජල දෙපාර්තමේන්තුව ඇතුළු අපි සියලුදෙනා එකට වාඩි වෙලා ඒ සැලසුම් කරනවා. අපි මාර්ගයක් හදනවා නම් ඒ මාර්ගය හදන්න පෙර නළ පද්ධතිය වළලලා අවසන් කරන්න ඕනෑ.

අද අපට තිබෙන ප්‍රධාන අභියෝග තමයි, ඒ නළ මිලදී ගැනීම, ඒ නළ නිෂ්පාදනය කිරීම සඳහා අමුද්‍රව්‍ය ආනයන කර ගැනීම සහ කොවිඩ් 19 වසංගතයත් එක්ක රට තුළ මතු වෙලා තිබෙන මේ තාවකාලික ගැටලුව. ඩොලර් අර්බුදයත් මේ කටයුතුවලට බලපාලා තිබෙනවා. ඒ බාධක අප ඒ ඉලක්කයට යැමේදී යම්කිසි බලපෑමක් එල්ල වෙනවා. ඒ සියලු බලපෑම්වලට

ඉතාම සාර්ථකව මුහුණ දෙමින් අපි කටයුතු කරනවා. මගේ නායක, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාගේ නායකත්වය තුළ අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අගමැතිතුමාගේ සැමට පානීය ජලය ලබා දීමේ ඉලක්කයට අපි මේ රට ගෙන යනවාය කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

[10.33 a.m.]

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Hon. Chairman, during the Committee Stage Discussion today, we are discussing the Votes of the Ministries of Water Supply as well as Ports and Shipping.

Initially, if I talk about water supply and drainage as a former Minister in charge, I must say that the Government's programme to increase the overall pipe-borne water coverage to 79 per cent by 2025 is a very ambitious one and they say that the remaining 21 per cent is to be covered by the State Ministry of the Hon. Sanath Nishantha through community water supply schemes. Overall, you are to achieve this 100 per cent coverage in the country within a short span of time, in just three years, and the question I am posing is, how plausible is this gigantic task? If you take the National Water Supply and Drainage Board, it was established somewhere in the 70s, but prior to that, we had the Public Works Department from the colonial days. We had built, during the colonial days, all the dedicated reservoirs such as Labugama and Kalatuwawa for water supply. So, for almost 70 years, we have managed to achieve only a 45 per cent coverage, but now, within merely three years, you are talking about reaching more than half that coverage or a 34 per cent coverage. But, from where are we going to get the required water? There is a problem with regard to water resources. Right now, we need about 2 million cubic metres of water per day and we have to find another almost 1.5 to 2 million cubic metres to reach this additional 34 per cent coverage you are trying to achieve within this three-year horizon. So, that is virtually an impossible task. Of course, if you reach it, all of us would be happy, but then, this type of, in my opinion, very ambitious attempt would not be realized that soon.

For reaching those targets, do we have a water resources study that has been done properly? If you take certain surface rivers in this country - we have almost 100 rivers all over the country - during the dry season, they go dry. Take, for instance, the Ma-Oya. We are tapping Ma-Oya in almost 17 places and that goes dry half the way. Then, Hon Chairman, take the Nilwala and Gin Rivers in your district. The Gin-Nilwala Diversion Project has met with so many obstacles. We were never able to do that.

So, the only way we can achieve that is by creating dedicated reservoirs. Now, what is happening to the Wee-Oya and Yatimahana Reservoirs? I was told that the Department of Irrigation was going to construct those reservoirs and they were doing the feasibility studies. But, I do not know what the situation is now. Those two reservoirs are so important, particularly one, for Wayamba and the other, for the Capital City, Colombo. What the position of both the Yatimahana and Wee-Oya Reservoirs today is a serious issue.

Then, we have to look at water quality studies. When former President Maithreepala Sirisena - he is under attack these days by his own side for many things - undertook his first official visit to China, there was this gift of the best water laboratory in the entire South Asia.

That is now being almost completed in the premises of the Peradeniya Engineering Faculty. That water laboratory has so many facilities and I think we must put it to maximum use. From their Corporate Plan, I can see that there are many plans afoot, but several more things could be done with that laboratory. That being the case, it is important for us to look at water quality and water resources studies.

Then, having upstream reservoirs in every possible river in the country is something that we have to focus on, if we are going to address water scarcity in the future. I think in the Mahaweli River, we can have an upstream reservoir; beyond Nawalapitiya, we can build an upstream reservoir to make sure that the water requirements of the Central Province are more secure. So, those issues have to be attended to.

Then, I say that 79 per cent coverage of pipe-borne water by the National Water Supply and Drainage Board and leaving the rest of 21 per cent to the Department of National Community Water Supply is well and good. But, I think it will be more prudent to bring it down to about 70 per cent and then leave the other 30 per cent to be smaller community-based water supply projects because only the rural areas are left to be covered and most of the urban areas are already covered. The charge per connection is going to be very high if you are going to give pipe-borne water to all the sparsely populated areas or low-density areas. So, it is only a prudent decision to bring that coverage at least to 70 per cent; drop about 9 per cent and then concentrate on leaving about 30 per cent for community-based water supply projects.

Then, I am told that for the second phase of the Water Supply and Sanitation Improvement Project - WaSSIP - funded by the World Bank, which is a very worthwhile project, they have given only US Dollars 30 million, whereas for the first phase, they gave almost US Dollars 170 million because these are all areas which have less coverage. There were seven districts that were identified in the first phase. There are more other districts to be identified in the second phase, but the World Bank's commitment - *[Interruption.]*

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of Water Supply)
That is not correct.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Yes, you can correct it.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
In that phase, we have to continue with the incomplete sections of the WaSSIP in those seven districts and not include new districts.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
But, why do you not include some other districts?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
That is the condition of the World Bank and that is the requirement of our programme. We have not completed the projects in those seven districts. So, how can we think of other districts?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Please revise your programme. What I am saying is, do not to listen to the dictates of the World Bank, but try to persuade them because there are other districts, other rural areas.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
We have not completed those in the seven districts.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
I know. While you complete them, Hon. Minister- *[Interruption.]*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
How do you do that without completing those? Do not talk shop.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
It is a question of persuading the World Bank; it is a question of negotiating with the World Bank and explaining to them. All these are based on a certain criteria. There are several other districts on which the same criteria fall. There are issues because you simply cannot find consumable water sources in every district and I am sure the Hon. Minister's Department can look after many districts, if you allow the -

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන අභියෝගය අපි භාරගෙන තිබෙන්නේ. ඒ කියන්නේ, සියයට 40කට වසර තුනක් තුළ දෙන්නේ කොහොමද කියන කාරණය. 1948දී අපට නිදහස ලැබුණු දා ඉඳලා අවුරුදු 73ක් කරගන්න බැරි වෙච්ච දේ අපි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ කරන්නයි යන්නේ.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ඒක කළා නම් අපි සතුටු වෙනවා.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා ඔය විශ්වාසය තියපු සමහර විදේශ ණය පිළිබඳව ගනිද්දී, එක පවුලක් සඳහා අපි වියදම් කරලා තිබෙන මුදල රුපියල් මිලියනයකටත් වඩා වැඩියි. අද අපි උපරිමය රුපියල් ලක්ෂ දෙකක සීමාව තුළ තමයි ඒක තියාගන්න යන්නේ. මේකෙදි වේගය වැඩි කරගන්න rate contract system එකත් අපි පාවිච්චි කරනවා. ඒ නිසා නළ එළීම් කටයුතු කරන එක වේගවත් කරගන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
I am told that there is a plan to build some water treatment plants. At least 20 to 25 treatment plants are to be built very soon, for which tenders have been called. There is an attempt to get even the contractors involved in signing a tripartite agreement. I am also told that the contractors have backed out from signing the tripartite agreements, that they are not ready. The repayment cannot be tied on to the contractors whereas the ownership is going to be with the National Water Supply and Drainage Board. The National Water Supply and Drainage Board should not impose this on the contractors. In the meantime, the Treasury guarantee will be the primary thing. I am not sure with the current problems, with the loan portfolio being expanded in this fashion, whether it would be possible for you to raise all these monies from local banks ultimately. Already, the Ceylon Petroleum Corporation is indebted to the two State banks to the tune of US Dollars 3.5 billion!

Of course, the National Water Supply and Drainage Board may not be in that category. But still, our tariff cannot be increased.

Then, what is happening to the PPP projects? What is happening to the Weliwita Bulk Water Supply PPP project? That is another issue. A Public-Private Partnership was also proposed by the ADB and the World Bank. There was an attempt initially to start at least a PPP project so that the investment can be shared with the private sector. That issue is also hanging fire.

In the meantime, let me also ask about the desalination project in Jaffna. There are various challenges with that ADB desalination project because for desalination, there has to be more consumption of electricity and there is going to be a severe pressure on the tariff. The contractors will have to run it for another seven years.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Can I interrupt you?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
No, you can answer when you reply, Hon. Minister.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
You are ignorant of what we are doing.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
You can reply later.

So, how are we going to manage the tariff as it is when we have to incur a heavy electricity cost for desalination? That is the first desalination plant. But, of course, it is a good thing to start a desalination plant when you do not have surface water. We tried to persuade the MPP from the Kilinochchi District to allow us to tap water from the Iranamadu Tank. But, unfortunately, because of the pressure by the farmers or for other political reasons, the very people of Kilinochchi were refusing to give water to the people in Jaffna. That was a very unfortunate situation. We should have persuaded them. In fact, we also invested in raising the levels of the tank in order to have more capacity to satisfy the farmers. But all that became futile. Several times, I also attended these discussions. But, unnecessary politics have messed up the whole thing.

I must also say that the Kundasale-Haragama Water Supply Project in the Kandy District is a very urgent need of the area. The Kundasale-Haragama area is a very rapidly urbanizing area and there are several households without water connections. The Hon. Tissa Attanayake was once the organizer of that electorate. That project is of urgent importance and I am sure the Hon. Minister would prioritize that project and have that implemented without delay. - *[Interruption.]* Thank you very much.

With those words, I must also say that ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ප්‍රශ්න රාශියක් තිබෙනවා. විශේෂයෙන්ම ඇතැම් ප්‍රජා මූල සමිති අකර්මණ්‍ය වන තත්ත්වයක් පැන නැඟ තිබෙනවා. එයට විවිධ හේතු බලපාන බව අපි දන්නවා. ජල මූලාශ්‍ර සිඳී යාම, ජල පොම්ප අක්‍රිය වීම, ජල යෝජනා ක්‍රමවල විදුලිය විසන්ධි වීම, ජල නළ දිරාපත් වීම, ගංවතුර සහ විවිධ මාර්ග ඉදිකිරීම්වලදී නළ කඩා බිඳ දැමීම වැනි නොයෙකුත් හේතු ඒකට බලපාලා තිබෙනවා.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රධානම ප්‍රශ්නය තමයි ජාතික පානීය ප්‍රජා ජල සංවර්ධන පනත සම්මත කර නොතිබීම. ඔබතුමා ජලසම්පාදන ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ ඒක කරලා තිබුණා නම්, මේ කටයුතු කරගෙන යන්න අපට ගොඩක් පහසු වනවා.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ඒ පිළිබඳවත් මම කියන්න ඕනෑ. අපිත් ඒකට උත්සාහ කළා. නමුත්, එම කටයුත්ත ක්‍රියාත්මක කරන්න යනකොට ගැටලුවක් මතු වෙනවා, අපේ පළාත් සභා එක්ක. ඇත්ත වශයෙන්ම පළාත් සභාවලට තිබෙන බලතලයක් තමයි අපි උදුරාගෙන තිබෙන්නේ. ඒක අපි මතක තබා ගන්න ඕනෑ. ඒ නිසා, පළාත් සභා එක්ක යම් ගිවිසුමකට එළඹෙන්න. නැත්නම් මේ විෂයය පළාත් සභාවලට බෙදා හරින්න. එක් එක් පළාත් සභාවලට මේ කාර්ය භාරය භාර දෙන්න. මධ්‍යම ආණ්ඩුව මේ ඔක්කෝම බදාගෙන ඉන්න අවශ්‍ය නැහැ. ඒකයි මම කියන්නේ. නමුත්, මේකෙදි අවශ්‍ය විශේෂ අනුදැනුම සම්බන්ධයෙන් අපේ National Water Supply and Drainage Board එකේ උදව්ව ඒ ආකාරයෙන්ම ලබා දෙන්න ඕනෑ. මොකද, ඒ අයට තාක්ෂණ දැනුම අඩුයි. ඒ නිසා තමයි දෙපාර්තමේන්තුව පටන් ගත්තේ. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ කාලයේ පටන් ගත්ත දෙපාර්තමේන්තුවට කිසිම ප්‍රතිපාදනයක් ලබා දී තිබුණේ නැහැ. ප්‍රථම වතාවට අපි ගම් 1,000කට පිරිසිදු නළ ජලය ලබා දීමේ වැඩ පිළිවෙළ පටන් ගත්තා. ඒ වැඩ පිළිවෙළ තවත් ව්‍යාප්ත කර කටයුතු කරන්න ඔබතුමන්ලා මිලියන ගණනාවක් වෙන් කර තිබීම ගැන සතුටුයි. නමුත්, මේ ඔක්කෝම ක්‍රියාත්මක කරන්න එතැන capacity එකක් තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. Capacity එක මදිකම පිළිබඳව විශාල ප්‍රශ්නයක් ඇති වනවා. ඒක අපිත් දැක්ක කාරණාවක්. මොකද, දිස්ත්‍රික් කාර්යාල 25ක් අපි ආරම්භ කළා. නමුත්, ඒවාට අවශ්‍ය පහසුකම් නැහැ.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
අපි ඒ අයට අවශ්‍ය කරන යාන වාහන, කාර්යාල සහ අවශ්‍ය නිලධාරීන් ලබා දී තිබෙනවා.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
කරුණාකර ඒවා ලබා දීම පොඩ්ඩක් ඉක්මන් කරන්න.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම අපි ඒ පහසුකම් ලබා දීලා තිබෙනවා. ලොකු ප්‍රමාණයක් යොදවා තිබෙනවා. ඒ capacity එක අපි ළඟ තිබෙනවා.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
So, make sure that these district offices are properly empowered to have a sufficient workforce to discharge their duties and also see that the field officers are given at least motorbikes and the district offices, one or two double cabs so that they can go around, identify the water sources and have various discussions with the communities as there are so many community-based problems that crop up. So, all of that needs very serious attention.

I also urge the Hon. Minister to consider coming to a compromise with the Provincial Councils in running the community-based water projects in their areas so that we do not tinker with the devolution scheme that had been brought about under the Thirteenth Amendment to the Constitution.

Thank you.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Gunathilaka Rajapaksha. - *[Not in the Chamber.]*

The Hon. Nipuna Ranawaka.- *[Not in the Chamber.]* Then, the Hon. Charles Nirmalanathan.

[மு .ப. 10.50]

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
நன்றி, கௌரவ தவிசாளர் அவர்களே! இன்றைய குழுநிலை விவாதத்தில் விவாதிக்கப்படுகின்ற துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சு தொடர்பாகவும் நீர்வழங்கல் அமைச்சு தொடர்பாகவும் ஒருசில விடயங்களை நான் இங்கு குறிப்பிட விரும்புகிறேன்.

முதலாவதாக, துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர் அவர்கள் இங்கிருக்கின்றபோது அவருடைய அமைச்சு தொடர்பாகக் கூற விரும்புகின்றேன். யுத்தத்துக்கு முன்பு தலைமன்னாரிலிருந்து இந்தியாவினுடைய இராமேஸ் வரம் பிரதேசத்துக்குக் கப்பல் சேவை நடைபெற்றது. அந்தக் கப்பல் சேவை யுத்தம் நடைபெற்றதன் காரணமாக நிறுத்தப்பட்டது. ஆனால், இன்றுவரை அந்தச் சேவை மீள ஆரம்பிக்கப்படவில்லை. இந்திய உயர் ஸ்தானிகரோடு நடைபெற்ற பேச்சுவார்த்தையின்போது, தலைமன்னார் - இராமேஸ்வரம் கப்பல் சேவை தொடர்பாக நடவடிக்கை எடுக்குமாறு அவரிடம் நான் கோரிக்கை விட்டிருந்தேன். அதற்கு அவர், ஆயத்த வேலைகள் நடைபெற்றுக் கொண்டிருப் பதாகவும் அதற்கு இந்தியாவினுடைய முழுமையான ஆதரவு இருப்பதாகவும் கூறியிருந்தார். மேலும், இலங்கை அரசாங்கம் அதற்குச் சாதகமான பதிலை வழங்கியிருப்பதாகவும் அதில் பல தாமதங்கள் இருப்பதாகவும் அவர் சுட்டிக்காட்டியிருந்தார். கௌரவ அமைச்சர் அவர்களே, எதிர்காலத்தில் தலைமன்னார் - இராமேஸ்வரம் கப்பல் சேவையை நடாத்துவதற்குத் தங்களாலான முயற்சியை வெளிநாட்டு அலுவல்கள் அமைச் சருடன் இணைந்து எடுக்கவேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், யுத்தம் நடைபெற்றதன் காரணமாக இடம்பெயர்ந்து இந்தியாவில் இருக்கின்ற ஈழத்தைச் சார்ந்தவர்கள் மீண்டும் இலங்கைக்கு வரமுடியாம லிருக்கிறார்கள். அவர்கள் ஆகாய விமானம் மூலமாக வருவதாக இருந்தால், அவர்களுடைய பொருட்களைக் கொண்டுவர முடியாது. கப்பல் சேவை மூலமாகத்தான் அவர்கள் வருவதற்கு விரும்புகிறார்கள். அவர்கள் இங்கு மிக விரைவில் வரவேண்டும். அதற்கு இந்தக் கப்பல் சேவை பிரதானமான விடயமாக இருக்கிறது. ஆகவே, இந்தக் கப்பல் சேவையை மிக விரைவில் ஆரம்பிக்க வேண்டும் என்று நான் கோரிக்கை விடுக்கின்றேன்.

திருகோணமலை முதல் யாழ்ப்பாணம் வரையிருக்கின்ற கரையோரப் பிரதேசங்களில் எந்தவொரு பிரதேசத்திலும் வெளிச்ச வீடு - lighthouse இல்லை. யுத்தத்திற்கு முன்பு இருந்தது. தற்போதைய மழைக் கால, இருண்ட வேளைகளில் மீன்பிடிக்குச் செல்கின்ற மீனவர்கள் கரைதிரும்புகின்றபோது தங்களுடைய இடங்களைச் சரியாக அடையாளங்காண முடியாமல் சிரமப்படுகின்றார்கள். சிலவேளைகளில் கடலில் தூர இடங்களுக்குச் சென்று தங்களுடைய இடங்களுக்குத் திரும்பவேண்டிய ஒரு சூழ்நிலை காணப்படுகின்றது. கடந்த வருடமும் இது தொடர்பாக அமைச்சர் அவர்களிடம் நான் கேட்டிருந்தேன். அதற்கு அவர் முயற்சி எடுப்பதாகக் கூறியிருந்தார். எனவே, மிக விரைவில் முல்லைத்தீவு மாவட்ட மீனவர்களுக்கு அத்தியவசியமான lighthouseஐ அமைத்துக் கொடுக்க வேண்டும். அது தங்களுடைய அமைச்சின் கீழ் வருகின்ற காரணத்தினால் அந்தக் கோரிக்கையை மீளவும் நான் உங்களிடம் முன்வைக்கின்றேன்.

அடுத்ததாக, நீர் வழங்கல் அமைச்சு பற்றிப் பேச விரும்பு கின்றேன். கௌரவ அமைச்சர் வாசுதேவ நாணாயக்கார அவர்கள் இங்கிருக்கின்றார். அவருக்கு முதலில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். ஒரு மாதத்திற்கு முன்பாக நான் அவரிடம் கோரிக்கையொன்றை விடுத் திருந்தேன். அதாவது, மன்னார் மாவட்டத்தின் மாந்தை மேற்கு பிரதேச செயலகத்திற்குட்பட்ட சன்னார், ஈச்சிலவக்கைக் கிராம மக்கள் குடிநீர் இன்றி மிகவும் கஷ்டப்படுகின்றார்கள் என்றும் கடந்த அரசாங்க காலத்தில் அவர்களுக்கு நீர் வழங்குவது தொடர்பாக என்னால் முயற்சிகள் எடுக்கப் பட்டிருந்தபோதும் அந்த வேலை முற்றுப்பெறாதிருந்த காரணத்தினால் அதனை முடித்துத் தரவேண்டுமென்றும் நான் உங்களிடம் கூறியிருந்தேன். அதனடிப்படையில் அதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்வதற்கான அனுமதியை நீங்கள் வழங்கியிருக்கின்றீர்கள். இன்னும் ஒரு வாரம் அளவில் அவர்களுக்கு நீர் வழங்க முடியும் என்று மன்னார் மாவட்ட பொறியியலாளர் தெரிவித்திருந்தார். யுத்தம் காரணாக இடம்பெயர்வுகளைச் சந்தித்த அந்த மக்கள் நீண்ட காலமாகச் சுத்தமான குடிநீர் இல்லாமல் மிகவும் கஷ்டப்பட்டுக் கொண்டிருந்தார்கள். கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய அமைச்சினுடைய அக்கறைக்காக மீண்டும் என்னுடைய நன்றிகளைத் தெரிவித்துக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, மன்னார் மாவட்டத்தில் கிட்டத்தட்ட 50 சதவீதமானவர்களுக்கு நீர் வழங்கல் அதிகார சபைமூலம் குடிநீர் வழங்கப்படுகின்றது. ஆனால், அந்த நீரானது நீர்த்தேக்கங்களில் இருந்து வருவது கிடையாது. நிலத்தடி நீரை உறிஞ்சித்தான் அந்த மக்களுக்குக் குடிநீர் வழங்கப்பட்டுக்கொண்டிருக்கின்றது. இந்த நிலத்தடி நீரைப் பருகுவதன்மூலம் மக்களுக்குச் சிறுநீரக நோய்கள் ஏற்படு கின்றன. ஏனென்றுசொன்னால், கற்பாறைகளுக்கு உள்ளிருந்துதான் அந்த நிலத்தடி நீர் பெறப்படுகின்றது. அதனைத்தான் அங்கிருக்கின்ற மக்கள் பருகுகின்றார்கள். ஏற்கெனவே பொலநறுவை, அனுராதபுரம், வவுனியா மாவட்டங்களில் அதிகமானவர்கள் சிறுநீரக நோயினால் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அங்கு சிறுநீரக நோய் அதிக தாக்கம் செலுத்துகின்றது. அதேபோல், மன்னார் மாவட் டத்திலும் நீர்த்தேக்கங்களில் இருந்து நீரை வழங்காமல் நிலத்தடி நீரை எடுத்து அந்த மக்களுக்குக் குடிநீராக வழங்கு கின்றார்கள். அது சுத்தமான குடிநீராக இருக்க முடியாது. அதில் நிறையவே கல்சியம் இருக்கின்றது. மன்னார் மாவட் டத்தில் நீர் வழங்கல் அதிகாரசபையினால் வழங்கப்படுகின்ற குடிநீரை நாங்கள் பரிசோதித்துப் பார்ப்போமாக இருந்தால், அதில் அதிக கல்சியம் செறிந்துள்ளதை அவதானிக்க முடியும். அந்த நீரைப் பெறுவதற்குப் பயன்படுத்தப்படுகின்ற குழாய் களில் கல்சியம் படிந்திருப்பதை நாங்கள் வெற்றுக்கண்களால் காண்கின்றோம். அந்த நீரினால்தான் எங்களுடைய சகல தேவைகளையும் பூர்த்தி செய்து வருகின்றோம். ஆகவே, எதிர்காலத்தில் நீர்த்தேக்கத்தினூடாக நீரைப் பெற்று அதனை அவர்களுக்கு வழங்கவேண்டும் என்பது என்னுடைய கோரிக்கையாக இருக்கின்றது.

குறிப்பாக, மன்னார் மாவட்டத்தில் முசலி பிரதேச செயலகத்திற்கு உட்பட்ட பிரிவில் கல்லாறு நீர்த்தேக்கம் இருக்கின்றது. மழைக் காலங்களில் வந்து சேருகின்ற நீர் அந்த நீர்த்தேக்கத்தினூடாகக் கடலிற் சென்று கலக்கின்றது. அந்த நீர்த்தேக்கத்தைச் சரியான முறையில் பராமரிக்காததன் காரணத்தினாலேயே அந்த நீர்த்தேக்கத்தின் நீரானது கடலுடன் சென்று கலக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, தங்களுடைய அமைச்சின்மூலம் "Greater Mannar" என்றொரு திட்டம் வரையப்பட்டது. அதனடிப்படையில், கல்லாறு நீர்த்தேக்கத்தை அபிவிருத்தி செய்து முதலில் முசலிப் பிரதேச செயலகத்திற்கு உட்பட்ட மக்களுக்குக் குடிநீர் வழங்குவதாகவும், அதன் பிற்பாடு நானாட்டான் பிரதேச செயலகத்திற்கு உட்பட்ட மக்களுக்குக் குடிநீர் வழங்குவதாகவும், அதன் பிற்பாடு மாந்தை மேற்குப் பிரதேச செயலகத்திற்குட்பட்ட மக்களுக்குக் குடிநீர் வழங்குவதாகவும் கூறப்பட்டது. அதற்காக உலக நாடுகளின் நிதியைப் பெறுவதில் தாமதம் ஏற்பட்டுள்ளதாக நான் அறிகிறேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நிலத்தடி நீர் இல்லாமல் நீர்த்தேக்கத்தினூடாக நீரைப் பெற்று அங்குள்ள மக்களுக்கு குடிநீர் வழங்க வேண்டுமென்பதை நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கிறேன். நிலத்தடி நீரினால் ஏற்படும் பாதிப்பைப் பற்றி நீங்கள் நன்கறிவீர்கள். மன்னார் மாவட்டத்தின் கல்லாறு, அரிப்பு, வங்காளை, பாலியாறு, இலுப்பைக்கடவை போன்ற பிரதேசங்களில் இருக்கின்ற பாலங்களினூடாகவு மழைநீர் முழுமையாகக் கடலோடு கலக்கின்றன.

அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர் கௌரவ சமல் ராஜபக்ஷ அவர்களிடம், கடந்த திங்கட்கிழமை நான் ஒரு கேரிக்கையை விடுத்திருந்தேன். அதாவது, மன்னார் மாவட்டத்தில் அதிகமான வெள்ளநீர் தேங்கியிருக்கின்றது. அந்த வெள்ளநீரானது வழிந்தோட முடியாத நிலை காணப்படுகின்றது. ஆகவே, வடிகால் வெட்டி அந்த நீரைக் கடலுக்குள் அனுப்புவதற்கு ஏதாவது வழி செய்யுங்களென்று இந்தச் சபையில் கேட்டிருந்தேன். அவர் உடனடியாக அங்கிருக்கின்ற அதிகாரிகளைப் பணித்திருந்தார். அந்த வகையில், நேற்று மாத்திரம் அங்கு வெவ்வேறு கிராமங்களில் 15 JCBs மூலம் அந்தப் பணிகள் செய்யப்பட்டன. அதற்காக கௌரவ சமல் ராஜபக்ஷ அவர்களுக்கும் மன்னார் மாவட்ட அனர்த்த முகாமைத்துவ நிலையப் பணிப்பாளர் அவர்களுக்கும் உதவிப் பணிப்பாளர் அவர்களுக்கும் அந்தப் பிரதேசத்தைச் சேர்ந்த உத்தியோகத்தர்களுக்கும் எனது நன்றியைக் கூறிக்கொள்கின்றேன். வட மாகாணத்தின் மன்னார் மாவட்டத்தில் தொடர்ச்சியாக மழை பெய்வதன் காரணமாக அங்கு அதிகமான மழைவீழ்ச்சி பதிவாகின்றது. கௌரவ அமைச்சர் அவர்கள் தன்னால் முடிந்த உதவிகளை அந்த மக்களுக்குச் செய்திருந்தார். மழை நீர் கடலுக்குள் செல்கின்றது; நிலத்தடி நீரினை உறிஞ்சி மக்களுக்குக் குடி நீராகக் கொடுக்கின்றோம். இதுதான் அங்குள்ள தற்போதைய சூழ்நிலையாகும்.

கௌரவ அமைச்சர் அவர்களே, வவுனியா, மன்னார் மாவட்டங்களிலுள்ள அதிகமான பிரதேசங்களில் குடிநீர் பிரச்சினை இருக்கின்றது.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Hon. Member, you have made a request, and your request will be considered. We will have that confirmed. Do not worry about that.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

நன்றி. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயம் தொடர்பாக அதிகக் கவனம் எடுப்பீர்கள் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. ஏற்கனவே நீர் வழங்கல் அதிகாரசபையினால் உயிளங்குளம், கொண்ணையான் குடியிருப்பு, பறப்பான் கண்டல், ஓலைத்தொடுவாய், வேட்டை யான் முறிப்பு, ஆத்திமோட்டை, பேசாலை, தோட்டவெளி, பட்டித்தோட்டம், கீரி, வங்காளை மற்றும் நறுவிலிக்குளம் ஆகிய கிராமங்களின் ஒருசில பகுதிகளுக்கு குடிநீர் வழங்கப்பட்டு ஏனைய பகுதிகளுக்கு வழங்கப்படாமல் இருக்கின்றது. சில கிராமங்களுக்கு முழுமையாக குடிநீர் வழங்கப்படவில்லை; ஒருசில கிராமங்களுக்கு குறிப்பிட்டளவு மாத்திரமே வழங்கப்பட்ட வேண்டியிருக்கின்றது. அந்தப் பகுதிகளுக்கும் குடிநீரை வழங்கும்படி எழுத்துமூலம் கோரிக்கை விடுத்திருந்தேன். அதற்கிணங்க, தங்களுடைய வவுனியா மாவட்ட இணைப்பாளர் எனக்குத் தொலைபேசி அழைப்பை ஏற்படுத்தி, அந்த இடங்களைத் தான் பார்வையிட விரும்புவதாகக் கூறியிருந்தார். அவர் தமிழ் மொழியிலேதான் கதைத்தார். இந்த வரவு செலவுத்திட்டம் முடிந்ததன் பிற்பாடு அந்த இடங்களைக் காட்டுவதாக நான் கூறினேன். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் முயற்சி எடுத்திருக்கின்றீர்கள். அந்த முயற்சி முற்றுப்பெற வேண்டுமென்று நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்ததாக, தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையின் IDB Project and RDF Project இல் ஒப்பந்த அடிப்படையில் பணிபுரிகின்றவர்களுக்கு நிரந்தர நியமனம் வழங்குவது தொடர்பாகக் கூற விரும்புகின்றேன். கௌரவ தினேஷ் குணவர்தன அவர்கள் நீர் வழங்கல் அமைச்சராக இருந்தபோது அரசியல் காரணங்கள் இல்லாமல், ஒப்பந்த அடிப்படையில் இருந்த சிலருக்கு நியமனம் வழங்கியிருந்தார். அதன் பிற்பாடு, அவர்களுக்கு நிரந்தர நியமனம் வழங்கும்படி 2015-2019ஆம் ஆண்டு காலப்பகுதிகளில் நீர் வழங்கல் அமைச்சர்களாக இருந்தவர்களிடம்கூட நான் பலமுறை கோரிக்கை விடுத்திருந்தேன். ஆனால், அவர்கள் அவர்களுக்கு நிரந்தர நியமனம் வழங்காமல், அரசியல் ரீதியாக புதியவர் களுக்கு நியமனம் வழங்கியிருந்தார்கள்.

மன்னார் மாவட்டத்தில்கூட 2010, 2011, 2012ஆம் ஆண்டுகளிலிருந்து ADB Project, RDF Project ஆகிய வற்றில் ஒப்பந்த அடிப்படையில் 24 மணித்தியாலங்களும் பணிபுரிகின்ற சேவையாளர்கள் இருக்கின்றார்கள். எனவே, அவர்களுக்கு நிரந்தர நியமனம் வழங்க வேண்டும் என்று கௌரவ அமைச்சர் அவர்களிடம் நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, இதனை நான் உங்களிடம் எழுத்துமூலமான கோரிக்கையாகவும் தந்திருக்கின்றேன். ஏனென்றால், அங்கு நடைபெறுகின்ற அனைத்துத் திருவிழாக்களிலும் அவர்கள்தான் 24 மணித்தி யாலங்களும் முழுமையாக வேலை செய்கின்றவர்கள். அது திருக்கேதீஸ்வரத்தில் நடைபெறுகின்ற திருவிழாவாக இருக் கலாம் அல்லது மடுத் தேவாலயத்தில் நடைபெறுகின்ற திருவிழாவாக இருக்கலாம் அல்லது அங்கு நடைபெறுகின்ற ஏதாவதொரு திருவிழாவாக இருக்கலாம்! இரவு 12.00 - 1.00 மணிக்கு ஏதாவது ஓரிடத்தில் நீர்க்குழாய் வெடித்துத் தண்ணீர் வெளியேறுகின்றதென்று சொன்னால், உடனடியாக அந்த இடத்துக்கு வந்து அவர்கள் வேலை செய்வார்கள்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Member, you have only two minutes left.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Hon. Member, you have made a request and your request will be considered. We will have that confirmed. Do not worry about that.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

கௌரவ அமைச்சர் அவர்களே, அவர்களுடைய நீண்டநாட் கோரிக்கையை நீங்கள் நிறைவேற்றுவதாகக் கூறியிருக் கிறீர்கள். அதற்கு நான் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, வவுனியா மாவட்டத்தி னுடைய தந்திரிமலைக்கு அண்மையிலிருக்கின்ற வெண்கல செட்டிக்குளப் பிரதேசத்தில் கன்னாட்டி, கணேசபுரம், வீரபுரம், செட்டிக்குளம், முதலியார் குளம் போன்ற கிராமங்களி லிருக்கின்ற மக்கள் குடிநீர் இன்மையால் மிகவும் கஷ்டப்படு கிறார்கள். லோக மல்வத்து ஓயாத் திட்டத்தில் வெண்கல செட்டிக்குளப் பிரதேசத்துக்குக் குடிநீர் வழங்குவதற்கு ஆலோசிக்கப்படுவதாக நான் நினைக்கின்றேன். அந்த வகையில், இந்த விடயத்தையும் உங்களுடைய கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

இந்த வெங்கல செட்டிக்குளத்தில் இருக்கின்ற கன்னாட்டி, கணேசபுரம், பறயனாளங்குளம், புளிச்சாங்குளம், வீரபுரம் போன்ற பிரதேசங்களில் குடிநீர் மிகவும் தட்டுப்பாடாக இருக்கின்றது. அங்கு சுத்தமான குடிநீர் இல்லை. குறிப்பாக, வீரபுரம் கிராமத்தைப் பொறுத்தவரையில், 1994ஆம் ஆண்டு அரசாங்கத்தால் அங்கு 400 குடும்பங்கள் குடியேற்றப்பட்டன. அது குடியேற்றப்பட்ட ஒரு கிராமமாகும். அங்கிருக்கின்ற அதிகமானவர்களுக்குத் தற்பொழுது சிறுநீரக நோய் ஏற்படுகின்றது. ஏனென்றால், அவர்கள் நிலத்தடி நீரைத்தான் பருகுகிறார்கள். வவுனியா, அநுராதபுரம், பொலன்னறுவை மாவட்டங்களில் நிலத்தடியில் அதிகமான கற்பாறைகள் இருக்கின்றன. அந்தக் கற்பாறைகளினூடாக வருகின்ற நீரை அவர்கள் பருகுகின்ற காரணத்தால் அதிகமானவர்கள் சிறுநீரக நோயால் பாதிக்கப்படுகிறார்கள்.

கௌரவ அமைச்சர் அவர்களே, குடிநீர் என்பது ஒரு மனிதனுக்கு மிக மிக முக்கியமான ஒரு விடயம். ஒரு மனிதன் சாப்பாடில்லாமல்கூட இருந்துவிடலாம். ஆனால், குடிநீர் இல்லாமல் இருக்கமுடியாது. அந்த அடிப்படையிலே சுத்தமான குடிநீரை நீங்கள் சகல பிரதேசங்களுக்கும் படிப்படியாக வழங்குவதற்கு நடவடிக்கை எடுத்துக்கொண்டிருக்கிறீர்கள். உங்களுடைய முயற்சிக்கு என்னுடைய வாழ்த்துக்கள்! நான் மேற்குறிப்பிட்ட இந்தப் பிரதேசங்களிலுள்ள மக்கள் சுத்தமான குடிநீரைப் பெறுவதற்கு நீங்கள் நடவடிக்கை யெடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். நன்றி.

[පූ.භා. 11.07]

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

ගරු සභාපතිතුමනි, වරාය හා නාවික අමාත්‍යාංශය ඇතුළු තවත් අමාත්‍යාංශ කීපයක වැය ශීර්ෂ පිළිබඳව අද අපි කථා කරනවා. මේ විවාදයට සම්බන්ධ වෙන්න මට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මුලින්ම මම එක කාරණයක් කියන්න ඕනෑ. පසුගිය කාල වකවානුවේ යහ පාලන ආණ්ඩුව තමයි මේ රට පාලනය කළේ. ඊට කලින්, එක්සත් ජාතික පක්ෂය මේ රටේ ආණ්ඩු කරනකොට, ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ දේශපාලනය කරනකොට, රටේ ජනතාවට මොන තරම් හානියක් සිදු කළාද කියලා අපි දන්නවා. මේ රටේ මිනිසුන්ගේ සියලු අයිතීන් උදුරා ගත්ත පක්ෂ දෙකක් තමයි එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ. අද විමුක්තිය ගැන කථා කරන ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීවරයා වරාය ගැන, මේ හැම එකක් ගැනම කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! The Hon. Velu Kumar will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

අද මේ රටේ ජාතික සම්පත් ගැන කථා කරන අනුර කුමාරලාට පසුගිය කාලයේ මේ රටේ ජාතික සම්පත් විනාශ කළ හැටි මතක නැද්ද? අද සමාජවාදය ගැන කථා කරන ඒ අය තමන්ගේ අනුගාමිකයා කොළ අතු එල්ලලා පාරේ යවනවා; ගමේ පෝස්ටරය ගහන්න ජේවීපී එකේ සහෝදරයාට දෙනවා. තමන්ගේ පුතා night club එකේ රෙද්ද හැට්ටෙ ඇඳපු කෙල්ල එක්ක dance කරනකොට, අනුර කුමාරලා සමාජවාදය ගැන කථා කරනවා. ගමේ, බිම් මට්ටමේ තරුණයා විශ්වවිද්‍යාලයට ගිහිල්ලා ඉගෙන ගෙන එළියට එන්න හදනකොට, ඒ තරුණයාට ඉඩක් දෙන්නේ නැහැ. ඔවුන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් කරනවා. ඔවුන් දේශපාලනයට ඇදලා අරගෙන අන්ත දුක්ඛිත තත්ත්වයකට පත් කරනවා. එහෙමයි කරන්නේ. ඒ විතරක් නොවෙයි, යහ පාලන ආණ්ඩුව පසුගිය වසර කිහිපය තුළ මේ රටේ ආර්ථික වර්ධන වේගය පහළට ඇද දැම්මා.

මේ රටේ ජාතික සම්පතක් තමයි, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට පාලනය කරපු කාලයේ ඉදිකළ හම්බන්තොට වරාය. නාවික ක්ෂේත්‍රයේ වැඩ කරපු කෙනෙක් හැටියට මම ඒ ගැන කථා කරන්න ඕනෑ. හම්බන්තොට ප්‍රදේශයෙන් හැම දාම දවසකට නැව් 200ක් විතර යනවා. මේ නැව් ටික සේවාවන් ලබා ගන්න කොළඹ වරායට, එහෙම නැත්නම් සිංගප්පූරුවට හෝ වෙන කොහේ හරි වරායකට යන්න ඕනෑ. එහෙම නැති වුණොත් මේ නැව්වලට වතුර, කෑම හා ඉන්ධන කියන කිසිම දෙයක් ගන්න හැකියාවක් නැහැ. මේ සේවා සපයන වැඩ පිළිවෙළ ඉලක්ක කරගෙන, හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා දීර්ඝ කාලීනව කල්පනා කරලා, ඒ සේවාවන් සැපයීමේ ක්ෂේත්‍රය අපේ රට තුළට ඇද ගැනීම සඳහා හම්බන්තොට වරාය ඉදිකළා. ඒ දවස්වල හම්බන්තොට පෙනෙන සීමාවේ ලංකාවේ පුද්ගලයකු සිටියා නම්, ඔහු යන්නේ, "මෙතැන වරායක් ඉදිකරන්න කොන්දක් තිබෙන එකෙක්වත් නැද්ද යකෝ?" කියලා කියාගෙනයි. හැබැයි, ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ඒ කර්තව්‍යය කළා.

අවසානයේ යහ පාලන ආණ්ඩුව ඇවිල්ලා මොකක්ද කළේ? ඒ වරාය විකුණුවා. හම්බන්තොට වරාය හදන කාලයේ කිව්වා,

එතැන ගලක් තිබෙනවා කියලා. හැබැයි, ඒ ගල ගැන කියපු එක්කෙනා ආයෙත් ඒ පැත්තට ගිහිල්ලා ඒ වෙලාවේ ගල අයින් කරලා දුන්නා, මා හිතන හැටියට චීනයට වරාය විකුණන්න. ඒ නිසා ගලේ ප්‍රශ්නය නැතිව ගියා. එතුමන්ලා හැම දාම අසත්‍ය තමයි කිව්වේ. එදාත් බොරුවෙන්ම රජය වුණු විපක්ෂය, හැම දාම ගෙන ගියේ බොරුව. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා වරාය හදන තුරු කිව්වා ඒකේ ගල් තිබෙනවා, වරායට නැව් එන්න බැහැ කියලා. මත්තල ගුවන් තොටුපොළ හදනකොට කිව්වා, මේ ගුවන් තොටුපොළට ගුවන් යානාවලට එන්න බැහැ, මොනරුන් හැප්පෙනවා කියලා. ඒ වාගේ, එතුමන්ලා සෑම දෙයක්ම හෑල්ලු කළා. අධිවේගී මාර්ග හදනකොට කිව්වා, රාජපක්ෂලාට ඇඹුල්තියල් ගෙනෙන්න තමයි මේ අධිවේගී මාර්ග හදන්නේ කියලා. ඒ වාගේ, මේ රටේ සියලු දේවල් ඉතාම සිල්ලරට දමලා තමයි එතුමන්ලා කථා කළේ. හැබැයි, අද වනකොට මේ රට දියුණුවට පත්වෙලා තිබෙනවා නම් එහෙම දියුණුවට පත් වුණේ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාල සීමාවේ ගත්ත තීන්දු, තීරණ නිසායි.

මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියලා තිබුණා, විදේශ රටවලින් සහනාධාර ගන්න ඒ අයට අවස්ථාව ලැබුණාය කියලා. හැබැයි, පසුගිය යහ පාලන ආණ්ඩුව මේ රටේ ආර්ථික වර්ධන වේගය level එකක් පහළට බැස්සුවා.

තමුන්නාන්සේලා දන්නවා, පසුගිය කාලසීමාවේ කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සහ බටහිර පර්යන්තය පිළිබඳ දැඩි කථා බහක් ඇති වුණු බව. බටහිර පර්යන්තය දෙන්න යනකොට වෘත්තීය සමිති ඔක්කොම එකතු වෙලා විරෝධතා ගෙනාවා. අවසානයේ මොකද වුණේ? 51: 49ට තිබුණු ව්‍යාපාරය පැත්තකට දාලා සියයට 85යි, ලංකාවට සියයට 15යි තිබෙන ව්‍යාපාරයකට රටට යන්න සිද්ධ කළා. මේවා ගැන මේ අය දැනුවත්ද, නොදැනුවත්ද කියන එක මම දන්නේ නැහැ. හැබැයි, අපට මහා කනගාටුවක් තිබෙනවා. මේ වෘත්තීය සමිති ක්‍රියාත්මක වෙලා තමන්ගේ ඒ වෘත්තීයවේදීන් වෙනුවෙන් නැඟී සිටිනවාට අපි බොහොම කැමතියි. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණට, එහෙම නැත්නම් සජබයට කඩේ යන සමහර වෘත්තීය සමිති අද මොනවාද කරන්නේ? මේ රට අර්බුදයෙන් අර්බුදයට ඇද දමලා, ඒ අයට වැජඹෙන්න පුළුවන් වාතාවරණය හදාගන්න අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්න විතරයි ඒ අය ඉන්නේ. සේවකයන් වැඩි ප්‍රමාණයක් අරගෙන, සේවයෙනුත් නිදහස් වෙලා නිකම් පඩි ගන්න අය තමයි මේවායේ වැඩි හරියක් ඉන්නේ.

යහ පාලන ආණ්ඩුවේ අය හම්බන්තොට වරාය විකුණලා, මේ රටේ ජාතික සම්පත් ටික විනාශ කරලා අද මෙතැනට ඇවිල්ලා වැදි බණ කියනවා. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීවරයා අද කථා කරනවා, විපක්ෂයේ නායකයා කියලා. හැබැයි, අපි දැක්කා නේ, පසුගිය දවසක රැළියක් පවත්වනවා කියලා සෙනඟ 500ක්වත් කොළඹට ගෙනෙන්න එතුමාට බැරි වුණා. කොළඹට සෙනඟ ගෙනෙන්න කථා කරලා, අන්තිමට Galle Face එක ඉස්සරහා එතුමා තනියම කථාවක් කළා; සෙනඟ බොහොම සුළු ප්‍රමාණයක් ගෙනැල්ලා එතුමා තනියම කථාවක් කළා. අපි දැක්කා, එදා එහා පැත්තේ ලොබියේ ඉඳගෙන එතුමන්ලාගේ පක්ෂයේ පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමා කියනවා, "මේ මනුස්සයා මටවත් කථාවක් දුන්නේ නැහැ, ඔළුව ඉදිමිච්ච මිනිහෙක්" කියලා. අන්න ඒ වාගේ ඒකාධිපති තැනකට දැන් විපක්ෂය ගෙන ගිහිල්ලා ඉවරයි. තමුන්නාන්සේලා බලාගන්න, තව ටික දවසක් යනකොට සජබය කෑලි කෑලිවලට සුන්නද්දූලි වෙලා යන්නේ කොහොමද කියලා. ඒ දවස වැඩි ඈතක නොවෙයි. ගරු මන්ත්‍රීතුමන්ලා වැඩි විශ්වාසයක් තියාගෙන ඉන්න එපා. මේ වෙනකොටත් 'සජිත්ට බැහැ' කියන එක ඔප්පු වෙලා ඉවරයි. ඒ වාගේම මම හිතන්නේ නැහැ, කවදාවත් සජිත්ට ආණ්ඩුවක් ගොඩ නඟන්න බලයක් ලැබෙයි කියලා. ඒ මට්ටමට එනවා තියා, අද ඉතිරි වෙලා ඉන්න හතර පස්දෙනා තියාගන්නවත් සජබයට බැහැ.

පසුගිය කාලයේ විපක්ෂය කාන්තා හිංසනය ගැන කථා කළා. හැබැයි, එතුමන්ලාගේ පක්ෂයේ සාමාජිකයකුගේ, එතුමන්ලාගේ හිටපු අමාත්‍යවරයකුගේ ගෙදර දැරියෝ හය හත්දෙනෙකුව දූෂණය කරනකොට, එක දැරියක් පුච්චලා මරනකොට විපක්ෂය කාන්තා හිංසනය ගැන වචනයක්වත් කථා කරනවා අපි දැක්කේ නැහැ. ඒ හිටපු ඇමතිවරයාගේ ගෙදරම පුංචි දැරිවියක් මරා දානකොට කාන්තා හිංසනය ගැන කථා කරපු එක්සත් ජාතික පක්ෂයේ, සජබයේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියෝ ටික කොහේද හිටියේ? හැබැයි, දේශපාලන වාසියක් ගන්න පුළුවන් නම් ඕනෑම වෙලාවක ඕනෑම කුණු ගොඩක් කර තියාගෙන අළෙවි කරන්න දඟලන කණ්ඩායමක් නම් අපි දැක්කා.

හැම දාම කොම්පැනිකාරයොත් එක්ක ඩීල් දාලා හම්බ කරපු කෝටි ගණනක මුදලුත් එක්ක අද

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇතුළු ඒ කණ්ඩායම Facebook එකේ රජ කරන්න හදනවා. Facebook එකේ රජ වෙන්න පුළුවන්. හැබැයි, ඒ වාගේ නායකයෙක් ජනතාව බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Harin Fernando. You have 18 minutes.

[පූ.භා. 11.17]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත් අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂ පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ මඩ ෆැක්ටරියක කථාවකින් පසු කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මම ඒ කිසි කථාවකට උත්තර දෙන්න යන්නේ නැහැ. ඒකට හේතුව, මේ රටේ මිනිස්සු අද පාරට බැහැලා තිබෙන විධිය ගැන අපි අලුතෙන් යමක් කියන්න ඕනෑ නැති නිසායි.

අද මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ මා මිත්‍ර ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමාගේ subject එක වන වරාය ගැනයි. වරායක් කියන්නේ රටකට විශාල ආදායමක් ගෙන දෙන ස්ථානයක්. ඒ වාගේම අපි දන්නවා, ලංකාව geographically locate වෙලා තිබෙන තැන අනුව, එහෙම නැත්නම් අපේ රටේ ස්ථානගත වීම අනුව අපට ලෝකයේ විශාල වැදගත්කමක් ලැබී තිබෙන බව.

ලෝකයේ අවුරුද්දකට මිලියන 900ක් TEUs කරනවා. ලංකාවේ කරන්නේ මිලියන 7යි. ඒක හරි නේද, ගරු ඇමතිතුමනි? මිලියන 7යි. ඒ වාගේම සිංගප්පූරුව මිලියන 40ක් TEUs කරනවා. ඩුබායි, මිලියන 19ක් TEUs කරනවා.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

නමුත් අපි තවම TEUs handle කරන්නේ මිලියන 7යි, ගරු ඇමතිතුමනි. දැන් මෙහෙම කියනකොට කියාවි, "අපි තව සංවර්ධන කටයුතු කරනවා" කියලා. සංවර්ධන කටයුතු කරගෙන යනකොට, ECT එක වෙනම තිබෙනවා; CICT එක වෙනම තිබෙනවා; SAGT එක තිබෙනවා; JCT එක තිබෙනවා; ඒ වාගේම හම්බන්තොට වරායත් තිබෙනවා. ඒ ටික විතර නේ, අපට තිබෙන්නේ. ECT - East Container Terminal - එක අපි හදන්න ඕනෑ. ඒ වාගේම West Container Terminal එක අදානි සමාගමට දෙනවා කියන කථාවත් මේ වෙලාවේ යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ argument එක එන්නේ මෙතැනට. ලංකාවට එන බිස්නස්වලින් සියයට 70ක්ම transshipments. ඒ කියන්නේ, ලොකු vesselsවලින් ඇවිල්ලා feeder vesselsවලට දමා, ඊට පසු ඒවා ඉන්දියාව, බංග්ලාදේශය වැනි යන්න ඕනෑ ස්ථානවලට යනවා. එතකොට අපි competition පැත්තෙන් බැලුවොත්, අද අපේ SAGT එකේ සහ JCT එකේ volume එක කොච්චරද? CICT කියන චීන ආයතනයම තමයි මට කලින් කථා කළ මන්ත්‍රීතුමා කියපු සියයට 85 ගන්නා ආයතනය. සියයට 85ක්! ඔවුන්ට සියයට 85ක් යනවා, ඒකෙන් එන ආදායමෙන්. ඒ බිස්නස් එක ගෙනියන්නේ අපි නොවෙයි; ලංකා වරාය නොවෙයි. ඒක ගෙනියන්නේ චීනය. ගරු ඇමතිතුමනි, මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය ඒක නොවෙයි. ලොකුම ප්‍රශ්නය, හම්බන්තොට වරාය සම්බන්ධ ප්‍රශ්නයයි. අපි වික්කා, අරක කළා, මේක කළා කියා ඒ වරාය සම්බන්ධයෙන් කොහේවත් නැති කතන්දර කිව්වා නේ. ලොකු පොලියකට ණයක් ගත්තාට පස්සේ, අපට කරන්න වෙන විකල්පයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උගන්ඩාවේ airport එකක සංවර්ධන කටයුතු සඳහා ලබා ගත් ඇමෙරිකානු ඩොලර් මිලියන 270ක් ගෙවා ගන්න බැරිවීම නිසා ඒකේ අයිතිය චීනය අරගත්තා, දන්නේම නැතුව. අපි කියන්නේ මේකයි. ඔය හම්බන්තොට වරායේ තවම gantries දමා නැහැ. තවම එන්නේ ro-ro vessels විතරයි. හම්බන්තොට වරායේ gantries දැම්මාට පසු මොකක්ද වෙන්නේ? නිකම් හිතා බලන්න, අපේ shipping route එකේ ඉස්සෙල්ලාම හම්බවෙන station එකෙන් තෙල් ගහන්නේ නැතුව ඒ එන නැව් කොළඹට එනවාද? ඇයි, මම මෙහෙම කියන්නේ? ලෝකයේ හොඳම වරාය කොහේද තිබෙන්නේ? ශ්‍රේණිගත කිරීම්වලට අනුව ලෝකයේ number one වරාය තිබෙන්නේ කොහේද? *[බාධා කිරීමක්]* නැහැ. ලෝකයේ number one වරාය තිබෙන්නේ චීනයේ. ඒක තමයි ෂැංහයි වරාය. The world's number one port is Shanghai. Number two is, Singapore, number three is, Ningbo-Zhoushan in China, number four is, Shenzhen in China, number five is, Guangzhou Harbor also in China and number six is, Busan in South Korea. Sri Lanka is ranked as number 25. මම මේ කියන්න හදන්නේ වෙනම කථාවක්. චීන පාලනය යටතේ තිබෙන හම්බන්තොට වරාය පසු කරගෙන යනකොට, ඉදිරියේදී ලංකාවේ පාලනය යටතේ තිබෙන වරායට එනවාට වඩා, චීනය පාලනය කරන හම්බන්තොට වරායට මේ නැව් යෑමේ ප්‍රවණතාව වැඩියි. හේතුව තමයි, business models. අපි ගත්තොත් Maersk, APL කියන shipping lines, ඒ ගොල්ලන් ගන්නේ ඒ ports පාලනය කරන ආයතනත් එක්ක bulk එකක්; bulk එකකට තමයි ගෙවන්නේ. එහෙම ගෙවනකොට, ඒ ගොල්ලන්ගේ terms වෙන විධියකට negotiate කරන්න ඒ ගොල්ලන්ට පුළුවන්.

ගරු ඇමතිතුමා සභාවේ ඉන්න නිසා මට යම් කාරණයක් ගැන අහන්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා 2014දී gantries හතරක් ගන්න ගියා. එදා හිටපු Team එක කවුද? එදා ඔබතුමා නියෝජ්‍ය ඇමති. ඔබතුමාගේ ඇමති එදා මහින්ද රාජපක්ෂ මහත්මයා, මට මතක විධියට. අපි ඒක නැවැත්වුවා. ඔබතුමන්ලා ආයෙත් gantries හතරක් ගේන්න කථා කරලා තිබෙනවා. හැබැයි, ඊට ඉස්සෙල්ලා ඔබතුමන්ලා Daya Ratnayake, Mr. Premachandra, MD කියන කට්ටිය එම තනතුරුවලින් අයින් කළා. මම දන්නේ නැහැ, මේකට හේතුව මොකක්ද කියලා. ඒ gantries ගේන එකට ඒ ගොල්ලන් විරුද්ධ වුණු නිසා ඔබතුමන්ලා ඒ අය අයින් කළාද කියන එක ඔබතුමාගේ කථාවේදී පැහැදිලි කරයි කියා මා විශ්වාස කරනවා. හැබැයි, වරායක් හැටියට දියුණු වෙන්න නම් අපට multimodal එකක් වෙන්න ඕනෑ. දුකම කථාව තමයි, මහින්ද රාජපක්ෂ මහත්මයා අවුරුදු පහකට පමණ කලින් කියපු කාරණයම cut and paste එකක් දමා මෙදා පාර අය වැය කථාවේත් තිබීම. බැසිල් රාජපක්ෂ මහත්මයා අය වැය කථාව කරද්දී මේක හරියටම කියෙව්වේ නැහැ. ඒ අනුව, වරාය සම්බන්ධයෙන් මහ වැඩ පිළිවෙළක් ගැන අය වැයේ කියා නැහැ.

මම තව එක කරුණක් මතක් කරන්න කැමැතියි. දිවංගත මංගල සමරවීර මැතිතුමා එදා හොඳ යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාව තමයි, shipping linesවලට තමන්ගේ value-added services දෙන්න නම් ඔවුන්ට සියයට 49ක හෝ 51ක කොටස් දෙන්න කියන එක. ඒ සම්බන්ධයෙන් එතුමන්ලා සාකච්ඡාවක් පැවැත්වුවා.

හැබැයි, ඒකට මිනිස්සු විරුද්ධ වුණා. එහෙම විරුද්ධ වුණේ වෙන කවුරුවත් නොවෙයි, ලංකාවේම හිටපු agents ලා. ඔවුන් විරුද්ධ වුණා, තමන්ගේ principal ඇවිල්ලා, මේ රටේ ආයෝජනය කරන එකට. අන්න, එහෙමයි වරායක් දියුණු කර ගන්න ඕනෑ නම් කටයුතු කරන්න ඕනෑ. සිංගප්පූරුවේ බැලුවොත්, value-added services ඔක්කොම තිබෙනවා.

වරාය කියන්නේ කන්ටේනර් එහෙට මෙහෙට යවන තැනක් විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. වරායට ship chandler services එකක් තිබෙනවා. කෑම අරින්න පුළුවන්, මිනිසුන්ගේ බඩු දමන්න පුළුවන්. ඒ විධියට නොයෙකුත් දේවල් වරායක් අවට කර ගන්න පුළුවන්. නමුත් අවාසනාවට මේ ආණ්ඩුවට බැරිවෙලා තිබෙනවා, මේ සම්බන්ධයෙන් හරියාකාර maritime policy එකක් හදන්න. මම දැක්කා, ගරු මුදල් ඇමතිතුමා මේකට කියනවා naval policy කියලා. අපේ ගරු මුදල් ඇමතිතුමාට තේරුම් කර දෙන්න ඕනෑ, naval policy කියන්නේ Navy එක සම්බන්ධයෙන් තිබෙන එකක් බව. ඒක maritime policy වෙන්න ඕනෑ. එතුමා කිව්ව ඒ වචනය පවා වැරැදියි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. අපි කියන්නේ මේකට multimodal logistic ministry එකක් ඕනෑ කියායි, ගරු ඇමතිතුමනි. වරාය තනි වෙන්න බැහැ. කලින් තිබුණේ "වරාය හා ගුවන් සේවා" කියායි.

අපි තවම ඉන්නේ වරායට අදාළ මුල් Act එක යටතේ; ඒක වෙනස් කරගෙන නැහැ; අලුත් නීති ගෙනැල්ලා නැහැ; අලුත් මිනිසුන්ට එන්න පුළුවන් වන විධියට බිස්නස් එක හදාගෙන නැහැ. ඒ නිසා මේ වරාය කියන subject එක ඉතා වටිනා දෙයක්. *[බාධා කිරීමක්]* වරාය ගැන තේරෙන්නේ නැති මිනිස්සු තමයි ඔය කෑ ගහන්නේ. වරායක් කෙසේ වෙතත් අඩු ගණනේ දික්ඕවිට වරායවත් දැකලා නැති අය තමයි ඔය කථා කරන්නේ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා 'වැඩ්ඩා' නම් මම වරාය ගැන ප්‍රශ්නයක් දෙකක් ඔබතුමාගෙන් අහන්නම් උත්තර දෙනවාද? ඔබතුමා 'වැඩ්ඩා' වාගේ ඔය පැත්තේ ඉඳගෙන කෑ ගහනවානේ. *[බාධා කිරීමක්]* ඒක අදාළ නැහැ. ප්‍රශ්නයක් අහන්න, ඔබතුමාට උත්තරයක් දෙන්න පුළුවන්ද? මන්ත්‍රී කෙනෙකු හැටියට ඔබතුමාට මම අහන ප්‍රශ්නයට උත්තරයක් දෙන්න පුළුවන්ද? *[බාධා කිරීමක්]* Would you answer if I ask you a question? Can I ask you a question? Would you answer me?

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගෙන් අහනවා හම්බන්තොට වරාය වික්කේ කීයටද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
That is not a point of Order. Hon. Harin Fernando, you continue.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේක තමයි ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මොළයේ ප්‍රමාණය; මේක තමයි මේ වෙලාවේ එතුමන්ලාගේ බුද්ධි ප්‍රමාණය. වරාය විකුණලා නැහැ, අපි ඒක අවිවාදයෙන් කියනවා. ඒ වෙලාවේ අපට ගෙවන්න තිබුණු ණය වෙනුවෙන්, -අපි ගත් ණය නොවෙයි, මෙතුමන්ලා වැඩි පොලියට ගත් ණය වෙනුවෙන් - equity stake එකක් දුන්නා. මම හිතන විදියට නම් ඒක ප්‍රශ්නයක් නොවෙයි. ලෝකයේ maritime business එක ඇත්තටම public-private partnership එකක් එක්ක ක්‍රියාත්මක වන්න ඕනෑ. එහෙම නැතිව වරායන්, ගුවන් තොටුපොළවල් ලෝකයේ දියුණු රටවල ආණ්ඩු විසින් කරන්නේ නැහැ. දියුණු රටවල වරායන්, ගුවන් තොටුපොළවල් මිලදී ගන්නේ පෞද්ගලික සමාගම් සහ ආණ්ඩු එකතුවෙලා. හැබැයි, negotiation එක කාටද? සියයට 50:40ද, 60:40ද, 70:30ද, 85:15ද? ඔන්න, ඔතැන තමයි ගැහිල්ල තිබෙන්නේ. මට වරාය හා නාවික ඇමතිතුමාත් එක්ක විවාදයක් නැහැ. වරාය පිළිබඳව දන්නේ නැති මිනිස්සු කථා කරන එක ගැනයි මම දුක් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ECT එක අපට කොච්චර වටිනවාද කියලා මම කිව්වා. ECT එක පුළුවන් තරම් ඉක්මනට හදන්න වෙනවා, ගරු ඇමතිතුමනි. මොකද, අපට තිබෙන ඉල්ලුමට සැපයුම දෙන්න බැරි වුණොත් අපේ රට වටේ තිබෙන අනික් වරායවලට මේ නැව් යනවා. "අදානි" කොම්පැනිය ඉන්දියාවේ හදන්න පුළුවන් තැන්වල වරායන් හදා අවසානයි. ලංකාවේ වරායත් හැදුවාට පස්සේ අපේ බිස්නස් එකෙන් සියයට 70ක් යන්නේ Indian business එකකට නම් අපට එතැන ලොකු threat එකක් තිබෙනවා. ඒ threat එක minimize කරන්න නම්, අපි මොකක්ද කරන්න ඕනෑ? අපට productivity එක වැඩි කර ගන්න වනවා. ඒ productivity එක වැඩි කරන්න මොනවාද අපට තිබෙන යෝජනා? මම හිතන්නේ SAGT එක තව අවුරුදු දෙක තුනකින් renewal එකට එනවා. *[බාධා කිරීමක්]* අවුරුදු කීයකින්ද? *[බාධා කිරීමක්]* අවුරුදු හයකින්. ඒ කියන්නේ මම ඇමතිවෙලා ඉන්න කාලය වනකොට. තව අවුරුදු හයකින් විතර SAGT එක renewal එකට එනවා. මේ කාරණය හොඳට කල්පනා කර බලන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
මම ඔබතුමාට සුබ පතනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
අනිවාර්යයෙන්ම මම දන්නවා, ඔබතුමා මට සුබ පතනවා කියලා. අපේ වරාය හා නාවික ඇමතිතුමා බුද්ධිමත් විදියට කථා කරනවා. එතුමාට පිටුපස ඉන්න මන්ත්‍රීවරු බෙරිහන් දෙනවා.

ගරු ඇමතිතුමනි,, මම වරාය ගැන ඔබතුමාට කියන්නේ මේකයි. මේ වැඩ පිළිවෙළ කරන්න ඉතා ඉක්මනට අපට මුදල් අවශ්‍යයි. වරායේ ECT එක හදන්න ඔබතුමාට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, මුදල් හොයා ගන්නේ කොහොමද කියන එක.

වරාය අධිකාරියේ තිබෙන ඩොලර් මිලියන 250ත් මුදල් අමාත්‍යාංශයෙන් release කරන්නේ නැහැ. මම කියන එක හරිද? ඇයි ඒ? ආණ්ඩුවට මුදල් නැති ප්‍රශ්නයක් තිබෙනවා. එතකොට, විදේශීය ආයෝජකයන් ගෙන්වන්නේ නැතිව වෙන විකල්පයකුත් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා අමාරු තැනක ඉන්නේ. එක පැත්තකින් යුනියන්වලින් කෑ ගහනවා. එක පැත්තකින් අනෙක් අය බෙල්ල මිරිකා ගෙන ඉන්නවා. අනෙක් පැත්තෙන්, චීනයෙන් බිස්නස් එක ගන්නවා. මම කියපු ඒවා සුළුපටුව තකන්න එපා. චීනෙන් හම්බන්තොට වරාය හැදුවාට, තවම ඒක operational නැහැ නේ. ඔබතුමාත් දන්නවා, එතැනට ro-ro vessels විතරනේ එන්නේ. ඒකේ gantries ටික දාලා බඩු බාන්න ගත්තාම මොන එහෙකටද නැව් කොළඹ වරායට එන්නේ? Rush එකක් නැත්නම් හම්බන්තොටට ඒ භාණ්ඩ බාන්නේ නැද්ද? එතකොට කොළඹ SLPA එකේ බිස්නස් අඩු වෙන්නේ නැද්ද? මේ ඔක්කෝම කළා තමයි. ණය ගත්ත නිසා අමාරුවේ වැටුණා. හැබැයි, අපේ productivity එක වැඩි කර ගත්තේ නැත්නම් අපට ප්‍රශ්නයක් එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද අලුත් දෙයක් අනාවරණය කරන්න කැමැතියි. ඒ තමයි, මේ දවස් ටිකේ දිගටම කථා වෙන ගෑස් ප්‍රශ්නය. නැව්වලින් නේ ඔය ගෑස් ගෙනැල්ලා බාන්නේ. සමහර අය කියනවා, ගෑස්වල ප්‍රොපේන් සියයට 50ක් දක්වා වැඩි කරලා තිබෙනවා කියලා; පනහට පනහ වුණාය කියනවා. මට මේක තේරුම් ගන්න බැහැ. මොකද, ප්‍රොපේන් ඩොලර් 40ක් විතර වැඩියි. එතකොට, මේ ගෑස් ගේන්න බැරි සල්ලි නැති අපි, ඇයි මේක පුපුරන්න කියලා ප්‍රොපේන් සියයට 50ක් ගහ ගන්නේ? මට තිබෙන ප්‍රශ්නය ඒකම නොවෙයි. මෙන්න, මේකයි මට තිබෙන ප්‍රශ්නය. හොඳටම අහගන්න ඕනෑ මේ කථාව. ලංකාවේ මිනිසුන්ට මේක තේරෙන්න ඕනෑ. ගෑස් සිලින්ඩර නිකම් පුපුරන්නේ නැහැ. අපි අහලා තිබෙනවාද, ලෝකයේ ගෑස් සිලින්ඩර පුපුරන බවක්? දැන් කියනවා, කරාමයක ප්‍රශ්නයක් තිබෙනවා කියලා. නමුත් ඒකත් නොවෙයි ප්‍රශ්නය. මම ඔබතුමාට මේ කාරණය පැහැදිලිව කියනවා. ඒ වාගේම මම **සභාගත***  කරනවා, නැව්වලින් බානකොට සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා තිබුණු LPG composition එකට අදාළ වාර්තාව.

ඒක ඒ රටෙනුත් බලනවා; මේ රටෙනුත් බලනවා. ඒ නිසා මෙහෙම වෙන්න බැහැ. එහෙමනම් කොතැනක හරි සෙල්ලමක් තිබෙනවා. මොකක්ද දන්නවාද සෙල්ලම? ඔබතුමන්ලා දැක්කාද, ඊයේ පෙරේදා ලිට්රෝ සමාගම valuation එකක් කරනවා; valuation එක කරන්න දාලා තිබෙනවා ටෙන්ඩර් එකක්. දැන් එක පැත්තකින් ලිට්රෝ ගෑස් සමාගම විකුණන්න සෙට් වෙනවා. අනෙක් පැත්තෙන් ගෑස් සිලින්ඩර පුපුරනවා කියලා demand එක අඩු කර ගන්නවා. එතකොට මිනිස්සු දරවලින් උයන්න හදනවා. සල්ලි තිබෙන මිනිස්සු electric cookersවලින් උයනවා. එතකොට ගෑස්වලට තිබෙන ඉල්ලුම අඩු වෙනවා; සල්ලි ගෙවන්න තිබෙන ප්‍රමාණය ඒ තරම් වෙන්නේ නැහැ. එතකොට ආණ්ඩුවට පොඩි චාන්ස් එකක් එනවා.

---
* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

ඊට වඩා ලොකු කාරණය තමයි, ලාභ ලබපු ලිට්රෝ සමාගම මේ හදිසියේ valuation එකක් කරන්නේ මොන හේතුවකටද? ලිට්රෝ සමාගම විකුණන්න පාරක් කපන්නද අපේ අහිංසක මිනිසුන්ගේ ගෙවල්වල සිලින්ඩර පුපුරන්නේ? ඒ ගැන හිතලා බලන්න, මේක වෙනමම පැත්තක්. මේ හැමෝම තාක්ෂණික දේවල් ගැන කථා කරනවා. මේ සෙල්ලම් කරන්නේ ජීවිතත් එක්ක. මම හැමදාම කිව්වේ මේකයි. පාස්කු ප්‍රහාරයත් එක්ක සෙල්ලම් කරලා ආණ්ඩු ගත්ත මිනිසුන්ට, ගෑස් සිලින්ඩරයක් පුපුරන එක මහා ලොකු දෙයක්ද?

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය සම්බන්ධව කථා කරන මේ වෙලාවේ මෙතුමා වෙනත් දෙයක් ගැන කථා කරනවා. මෙතැන ඒවාට උත්තර දෙන්න,-*[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි.

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)
හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, ඔබතුමා වරාය ගැන නොවෙයි නේ කථා කළේ. *[බාධා කිරීම්]*

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 3ක් ඉතුරු වෙලා තිබෙනවා. තවත් විනාඩි 3ක් වැඩිපුර දීලා තිබෙනවා. එතකොට ඔබතුමාට විනාඩි 6ක් තිබෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
එළකිරි නේ. මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, thank you ඒ වෙලාව දුන්නාට.

වරාය ගැනයි, වරායෙන් ගෙනැල්ලා බාන ගෑස් ගැනයි තමයි අපි නම් කථා කළේ. දැන් මේ වෙන අය කථා කරපුවා බලන්නකෝ. මම ඒ මන්ත්‍රීතුමා කවුද කියලාවත් දන්නේ නැහැ. හැබැයි, ඒ මන්ත්‍රීතුමා කථා කළේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලාගේ ළමයි රට යන හැටි; ඉගෙන ගන්නා හැටි; සජිත් ප්‍රේමදාස මැතිතුමා තනියෙන් කථා කරපු හැටි; පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමා ගැන නේ. ඒවා බලාගෙන හිටියා වාගේ කියන්නේ. කරුණු නැති වුණාම නිකම් වැඩකට නැති කථා කියනවා වෙනුවට, කරුණුත් එක්ක කථා කරන්න. මේ විවාද තිබෙන්නේ, කාටවත් මඩ ගහන්න නොවෙයි. මම මෙතැන එක මනුස්සයෙකුටවත් මඩ ගැහුවාද? කවුරු හෝ පුද්ගලයෙකුගේ හෝ මන්ත්‍රීවරයෙකුගේ නමක් කියලා මඩ ගැහුවාද? අපි එහෙම මඩ ගහන්නේ නැහැ. පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ පළමුවෙනි පාර නම්, දේශපාලනය ඉගෙන ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉල්ලීමක් කරනවා, මේ ගැන හොයා බලන්න කියලා. මම අවිවාදයෙන් කියනවා, ලිට්රෝ ගෑස් සමාගම විකුණන්න හදන විශාල ගේමක මුල් ආරම්භයක් හැටියට තමයි මේ ගෑස් සිලින්ඩර පුපුරන්නේ. මම කිව්වාට පස්සේ හර්ෂ ද සිල්වා මැතිතුමා මේ ගැන කරුණු සොයා බලයි කියලා මම හිතනවා. මම කියන කථාවේ යම් කරුණක් තිබෙනවා. ලිට්රෝ සමාගම මොකටද ටෙන්ඩරයක් දාලා තිබෙන්නේ මේ හදිසියේ? මම නැවත වතාවක් මේ කාරණය කියනවා. පුපුරන කොට ගෑස් සිලින්ඩරවලට තිබෙන ඉල්ලුම අඩු වෙනවා.

සල්ලි තිබෙන මිනිහා electric cooker එකට යනවා. අනෙක් මිනිහා දර ළිපට යනවා. එතකොට ගෑස්වලට ගෙවන්න ඕනෑ ප්‍රමාණය අඩු වෙනවා. අන්න! මේ මොළ හතේ අය තමයි. සුපිරි මොළ හතේ අය! මේ වාගේ ගේමක් ගහලා ලිට්රෝ එක විකුණන්න මොළ හතක්ම තිබෙන්න ඕනෑ. ඒ නිසා සමහර අය ඔහේ නිකම් කෑ ගැහුවාට, ගෑස් සිලින්ඩර පුපුරන එක පිටුපස මේ ආණ්ඩුව ඉන්නවා ද කියන සැකය අපට මේ අවස්ථාවේ මතු වෙන බව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරායවල් ගැන කියා ගෙන එනකොට මම ඔබතුමාට කිව්වා, අපි අද ඉන්න තැන කොතැනද කියලා. මම නැවත වතාවක් කියනවා, මේ රජයේ දේවල් පෞද්ගලීකරණය කරනකොට බුද්ධිමත් සංවාද අවශ්‍ය වෙන්නේ percentage එක හැටියට කීයක් දෙනවාද, ලැබෙනවාද කියන එක ගැනයි. දැන් චීනයත් එක්ක අපේ deal එකක් තිබෙනවා. ඉන්දියාවත් එක්ක deal එකක් තිබෙනවා. කොළඹ වරායේ CICT තමයි වැඩියෙන්ම හොඳටම වැඩ කරන්නේ. ඇමතිතුමා, මම හරි ද? CICT එකේ තමයි volume එක වැඩිම. එතකොට JCT එක ගත්තාම, ඒකේ 7,000ක් විතර සේවකයන් ඉන්නවා. කරන TEUs ප්‍රමාණය බොහොම සුළු ප්‍රමාණයක්. එතැන යූනියන් ප්‍රශ්න, අනෙකුත් ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න ඕනෑ, මේ රජය. ඒ මිනිසුන්ගේ ඉල්ලීම් වැරදි නැහැ. 'Gantry cranes ගෙනෙන්න, ආදායම් වැඩි කරන්න පුළුවන්, අපට දීපන්, අපි කරලා පෙන්වන්නම්' කියලා ඒ අය කියනවා. අපි ඔක්කොම විකුණනවා. හතර වටේට තිබෙන ඒවා විකුණනවා. ගරු ඇමතිතුමනි, විකුණුවත් කමක් නැහැ. නමුත් සියයට 60යි 40යි වාගේ model එකකට එන්න ඕනෑ. අපට සියයට 40ක්වත් හම්බ වෙන්න ඕනෑ. සියයට 60ක් ඒ ආයෝජනය කරපු මිනිහාට ලැබෙනවා. සාමාන්‍යයෙන් පිළිගත්ත ක්‍රමය තමයි, 70:30 අනුපාතය. හැබැයි මොකක්ද වුණේ? මුල්ගල තියන්නත් ඉස්සෙල්ලා ජෝන් කීල්ස් සමාගමට තිබුණු සියයට 15ත් CICT එකට දුන්නා. එතකොට, CICT එකට සියයට 85යි. ලංකාවේ රජයට එන්නේ සියයට 15යි. හැබැයි, ඒ ගිවිසුම ගහන්න ඉස්සෙල්ලා තිබුණේ සියයට 70යි 30යි කියලා. මාර ගේම් නේද? මේවා නොවෙයිද ගේම් කියන්නේ? අපි මේ කථා කරන්නේ රුපියල් 10ක්, 20ක්, 30ක්, 50ක්, 1,000ක්, 15,000ක්, 20,000ක්,100,000ක් ගැනද? නැහැ. මේවා රුපියල් කෝටි ගණන් මුදල්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් මේ කරන්නේ. මේ contracts negotiate කරන්න ඇත්ත වශයෙන්ම මීට වඩා,-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා, සියයට 70යි 30 යි කියන එක තහවුරු කරනවාද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඒ කිව්වේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
CICT එකේ ගිවිසුම තිබුණේ සියයට 70යි 30යි. ඒක සියයට 85යි 15ට බැස්සුවා කියලා ඔබතුමා කියනවා. ඒක තහවුරු කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
තහවුරු කරනවා. මම වග කීමෙන් කියනවා. ඇමතිතුමා, ඔබතුමා වග කීමෙන් උත්තරයක් දෙන්නකෝ. ඔබතුමා ඒක මගෙන් තහවුරු කර ගන්න ඕනෑ නැහැ. ඔය ඉන්නේ වරාය ඇමතිතුමා. එතුමාගෙන් ඒක තහවුරු කර ගන්න. හොඳද? මම නොවෙයි ඇමති. මම ඇමති නොවෙයි, වාසුදේව නානායක්කාර ඇමතිතුමනි. මම ඇමති වෙච්ච දවසට හොඳට කරලා පෙන්වන්නම්. වරාය ඇමතිතුමනි, අද CICT එක සියයට 85-15ට නොවෙයි ද තිබෙන්නේ? ඔබතුමා කියන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්. ඒක අපි දන්නවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඉතින් එහෙනම් මොකක්ද අහන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ. නැහැ, සියයට 70-30 කිව්ව එක,-

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඉතින්, එයිට්කන් ස්පෙන්ස් සමාගමට තිබුණු සියයට15ත් CICT එකට දුන්නා නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ. නැහැ. ඔබතුමා කිව්වා, සියයට 70-30යි කියලා. ඉතින් ඒක තහවුරු කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඉතින්, තවත් තහවුරු කරන්න දෙයක් තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන හැම කථාවක්ම වග කීමෙන් කියන්නේ. ගරු වරාය ඇමතිතුමාට පුළුවන් මම කියපු කථාව වැරදිද නැද්ද, සියයට 70යි 30ට නොවෙයි ද මුල් ගල තියනකොට තිබ්බේ කියලා කියන්න. CICT එක ආරම්භ කරනකොට එයිට්කන් ස්පෙන්ස් සමාගම ඔවුන්ට තිබුණු සියයට 15ත් CICT එකට දුන්නා. ඊට පස්සේ සියයට 85ක් වුණා. ඒක තමයි ප්‍රශ්නය. වරායවලට චීනයේ ආධිපත්‍යයක් තිබෙනවා. එක පැත්තකින් ඉන්දියාව අපේ transshipment කරලා තිබෙනවා. වරාය වහලා දාලා චීනයටයි, ඉන්දියාවටයි විකුණලා දාන්න. ඒක ඊට වඩා හොඳයි. දැන් එහෙම තමයි ඔබතුමන්ලාට කරන්න වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සම්පත තමයි මේ වරාය. ඒ වරාය රැක ගන්න අපි Public-Private Partnershipsවලට ගියාට කමක් නැහැ. ඒක රටට වාසිදායක වන ප්‍රතිශතයකට ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට බාධා කළේ නැහැ. ඔබතුමාගේ කථාව කරගෙන යන්න ඉඩ දුන්නා. මම ඔබතුමාගෙන් එක ඉල්ලීමක් කරනවා. ඔබතුමා කරපු යෝජනා, චෝදනා සියල්ලටම මම පිළිතුරු ලබා දෙනවා. අද හවස මගේ පිළිතුරු කථාව කරනකොට පුළුවන් නම් ඔබතුමා සභාවේ ඉන්න. ඔබතුමා කියපු හැම දේකටම මම බොහොම පැහැදිලිව පිළිතුරු ලබා දෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මේ ගැන අවධානයෙන් ඉන්න අපි, ඔබතුමාගේ කථාව කොහේ හිටියත් අහනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ.

[පූ.භා. 11.39]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය හා නාවික අමාත්‍යාංශය, ජලසම්පාදන අමාත්‍යාංශය සහ තවත් රාජ්‍ය අමාත්‍යාංශ කීපයකට අදාළ වැය ශීර්ෂ විවාදයට ගන්නා මේ අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, වරාය හා නාවික අමාත්‍යාංශය කියන්නේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක් බව. එය මේ රටේ ආර්ථිකයට, විදේශ විනිමය ලබා ගැනීම සඳහා ඉමහත් කාර්ය භාරයක් කරන වැදගත් අමාත්‍යාංශයක් බව අපි අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. නමුත්, පසුගිය කාල පරිච්ඡේදය තුළ වරායේ සිදු වුණු දේවල් දෙස බලනකොට වරායෙන් අපේ රටට ඵලදායීතාවක්, එහෙම නැත්නම් ආර්ථික වශයෙන් විශාල ලාභයක් ලබා ගන්න පුළුවන් වෙයිද කියලා අද අපට ලොකු සැකයක් තිබෙනවා. අපට මතකයි, පසුගිය කාලයේ කොළඹ වරායේ ජැටි කිහිපයක්ම විකිණීම සඳහා කටයුතු කළ ආකාරය. බොහෝ අවස්ථාවල යහ පාලන රජයට, එදා හිටපු එක්සත් ජාතික පක්ෂ රජයන්වලට නොයෙකුත් චෝදනා එල්ල කළා, වරාය ඇතුළු රජයේ දේපළ සියල්ලම විනාශ කරන්න, එහෙම නැත්නම් විකුණන්න කටයුතු කළේ එම රජයන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ වරායේ පළමුවැනි ජැටිය ජෝන් කීල්ස් සමාගමට විකුණන්න කටයුතු කළේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුව කාලයේයි. ඊට පස්සේ මහින්ද

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

රාජපක්ෂ මැතිතුමාගේ කාල සීමාවේදී එය චීන සමාගමකට විකුණන්න කටයුතු කළා. වරායට ලොකු සම්පතක් වෙලා තිබෙන, ඒ වාගේම වරායට ලොකු ආදායමක් ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන නැඟෙනහිර ජැටිය ඉන්දියාවේ අදානි සමාගමට විකුණන්න පසුගිය දවස්වල ලොකු උත්සාහයක් දරනවා අපි දැක්කා. නමුත් අපි දන්නවා, වෘත්තීය සමිතිවල විරෝධතාව, සේවකයන්ගේ විරෝධතාව නිසා එදා ඒක කර ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ කියලා. දැන් මේ ආණ්ඩුව නැවත වරක් කොළඹ වරායේ බටහිර ජැටිය ඉන්දියාවේ අදානි සමාගමට ලබා දෙන්න හදනවා. එම ජැටියත් වරායේ ඉතාම වැදගත් සන්ධිස්ථානයක්. අද එම ජැටියත් විකුණන්න කටයුතු කරමින් සිටින බව මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

මේ රටේ තිබෙන සම්පත් ආරක්ෂා කරනවා කියලා තමුන්නාන්සේලා හැම අවස්ථාවකදීම කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වරායේ ඉතිහාසය ගත්තොත්, 1956 වර්ෂය අපට මතක් වෙනවා. දැන් පෞද්ගලික අංශය ගැන කථා කරනවා. පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා මේ රට දියුණු කරන්න ඕනෑය කියනවා. ආයෝජකයෝ ගේන්න ඕනෑය කියනවා. අපට මතකයි, එදා අධිරාජ්‍යවාදීන් ඉන්නකොට කොළඹ වරාය මොන වාගේ තැනක ද තිබුණේ කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම, පෞද්ගලික අංශය සහ විදේශීය සමාගම් තමයි එම වරාය ඉතාම හොඳ තත්ත්වයෙන් නඩත්තු කරමින් අරගෙන ආවේ. පසුව ජනසතු කිරීම නිසා කොළඹ වරාය සම්පූර්ණයෙන්ම විනාශ වුණු බව අපි දන්නවා. එම ජනසතු කිරීම නිසා ජාත්‍යන්තර වශයෙන් එම වරායට තිබුණු ස්ථානය අහිමි වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සිංගප්පූරුව, හොංකොං රාජ්‍යය, ඩුබායි රාජ්‍යය සහ අනෙකුත් වරායවලට ඉතා විශාල දියුණුවක් අත් පත් කර ගන්න හැකියාව ලැබුණේ, අපේ වරාය ජනසතු කිරීම තුළ එදා හිටපු සමාගම් ඉවත් වීම නිසායි කියන එක මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ. එහි ප්‍රතිඵල තමයි අද අපි දකින්නේ. එදා ජනසතු කරනකොට මේ ආණ්ඩුවේ තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිත් එතැන තිබුණා. ඊට පස්සේ තමුන්නාන්සේලාගේම ආණ්ඩුවල මහින්ද රාජපක්ෂ මැතිතුමා, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ඒවා ඔක්කෝම නැවත වරක් පෞද්ගලික අංශයට දෙන්න කටයුතු කළා. අපි දන්නවා, වරාය සේවකයෝ, ඒ වාගේම වෘත්තීය සමිති මැසිවිලි නඟනවා, දැනට ඉතිරිවෙලා තිබෙන්නේ නැඟෙනහිර ජැටිය පමණයි කියලා. ගරු ඇමතිතුමනි, එම නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය දියුණු කිරීමේ වැඩ කටයුත්ත කඩිනමින් ආරම්භ කරන්න කියලා. මොකද, එතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. තමුන්නාන්සේලා වරායේ බටහිර ජැටිය දීලා, ඊට පස්සේ ඉන්දියාව ඒක දියුණු කරලා ප්‍රතිඅපනයන කටයුතුත් එක්ක ඒ හරහා අනෙකුත් වරායන්වලට මෙහෙයුම් කටයුතු පටන් ගත්තොත්, අපේ නැඟෙනහිර ජැටියෙන් ප්‍රයෝජනයක් ගන්න බැරි වෙනවා. එතකොට අපි බලාපොරොත්තු වන ඉලක්කයට, එහෙම නැත්නම් ආදායමට යන්න බැරි වෙනවා. ඒක ලොකු ගැටලුවක්. එම නිසා, එම ජැටියේ ඉතිරි කොටස දීර්ඝ කරලා, එය දියුණු කරලා ඊට අවශ්‍ය කරන දොඹකර ටික, අවශ්‍ය කරන මෙහෙයුම්වලට සරිලන cranes ටික ලබා ගැනීමේ වැඩ පිළිවෙළ කඩිනම් කර ගත්තොත්, අපට එම ජැටිය ආරක්ෂා කර ගන්න පුළුවන් වෙයි. අඩුම ගණනේ ආර්ථික වශයෙන් තිබෙන මර්මස්ථානයක්, ඒ වාගේම ජාතික ආරක්ෂාව අතින් වැදගත්කමක් තිබෙන ස්ථානයක් නිසා අපි මේකේ එක ජැටියක් හෝ සංවර්ධනය කර ගත්තොත්, වරායට විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්. ඒ වාගේම විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ලබා ගන්නත් පුළුවන්. මේ කාරණා අපි අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. මොකද, රටේ සම්පත් ආරක්ෂා කරන්න ඕනෑ, රජයේ දේපළ ආරක්ෂා කරන්න ඕනෑ කියලා තමයි තමුන්නාන්සේලා හැම වෙලාවේම කිව්වේ. එම නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා, අනිවාර්යයෙන්ම වරායේ සේවකයන්ගේත්, රටේ ජනතාවගේත් ඉල්ලීම අනුව වරාය ආරක්ෂා කරලා, අඩුම ගණනේ මේ එක වැඩ කටයුත්තක් හෝ කරන්න පියවර ගන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය සතු ඉඩම් විකුණන්න හදනවා කියා පසුගිය දවස්වල ලොකු චෝදනාවක් තිබුණා නේ. තමුන්නාන්සේලා දන්නවා, විශේෂයෙන් අක්කර 13ක ඉඩමට Cabinet Paper එකක් දැනට ඉදිරිපත් කර තිබෙන බව. එයට අනුමැතිය අරගෙන තිබෙනවා. අපි දන්නවා මේකත් චීන සමාගමට විකුණන්න කටයුතු කර තිබෙන බව. මේ රටේ ජනතාවට, ඒ වාගේම වරාය සේවකයන්ට අද ලොකු බියක් තිබෙනවා. මොකද, මේ ඉඩමත් අඩු ගණනකට ලබා දීලා logistic කටයුතු ටික කරන්නත් ඒ චීන සමාගමට ලබා දෙන්න හදනවා. මේ කටයුත්ත දැනට සම්පූර්ණයෙන් කරන්නේ වරාය අධිකාරියෙන් කියා අපි දන්නවා. මෙහෙයුම් කටයුතු, අනෙකුත් පර්යන්ත කටයුතු, ප්‍රතිඅපනයන කටයුතු සම්පූර්ණයෙන්ම වරාය අධිකාරියෙන් කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කටයුතු වෙනත් ආයතනයකට ලබා දුන්නොත්, එයින් අපේ ආදායමට ලොකු ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ වාගේම විදේශ විනිමයත් වෙනත් ආයතනවලට යනවාය කියන එක මම අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා වරායේ නාමයෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ සම්බන්ධව සොයා බලන්න කියලා. අඩුම තරමින් වරායේ එක ජැටියක්වත් ආරක්ෂා කරගන්න. ඒ වාගේම වරායේ මෙහෙයුම් කටයුතු, ප්‍රතිඅපනයන කටයුතු, ගබඩා පහසුකම් සැපයීම ආදී හැම එකක්ම වරාය අධිකාරිය යටතේ තබාගන්න, ගරු ඇමතිතුමනි. මේක දේවල් කිසි කෙනෙකුට ලබා දෙන්න කටයුතු කරන්න එපා කියලා තමයි අපි මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය ගැන කථා කරද්දී, නාවික ක්ෂේත්‍රයත් ඊට අදාළ වන බව අපි දන්නවා. බොහෝ වෙලාවට ඈත අතීතයේ සිටම අපේ නාවිකයන්ට හොඳ ඉල්ලුමක් තිබෙනවා. අපේ නාවිකයන්ගේ සේවය හොඳයි කියා ජාත්‍යන්තර නැව් සමාගම්වල පිළිගැනීමක් තිබෙනවා. පසුගිය කාල සීමාව තුළදී ජාත්‍යන්තරයට අවශ්‍ය කරන නාවිකයන් බිහි කරන්න අපට අවස්ථාවක් ලැබුණේ නැහැ. අපි බොහොම සුළු ප්‍රතිශතයක් තමයි නාවිකයන් හැටියට මේ රටින් බැහැරට, ජාත්‍යන්තරයට ලබා දෙන්නේ. වරාය අධිකාරිය මැදිහත් වෙලා හෝ නාවික හමුදාව සමඟ සම්බන්ධ වෙලා හෝ අඩුම ගණනේ පෙර තිබුණා වාගේ නාවික ක්ෂේත්‍රයට හොඳ පුහුණු සේවකයෝ ටිකක් බිහි කරන්න අපට පුළුවන් නම්, ඔවුන්ට හොඳ පුහුණුවක් ලබා දෙන්න හැකියාවක් තිබෙනවා නම්, අපට ඒ සේවය ජාත්‍යන්තර සමාගම්වලට ලබා දෙන්න පුළුවන් කියා මම හිතනවා. ඒ තුළින් අපට අමතර විදේශ විනිමයක් ලබා ගන්නත් පුළුවන් වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. වරාය හා නාවික අමාත්‍යාංශය ගැන ඊට වඩා කථා කරන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ.

මේ අවස්ථාවේදී මම අපේ ජලසම්පාදන අමාත්‍යාංශය ගැනත් වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. මම එක යෝජනාවක් ඉදිරිපත් කරනවා, ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි. අපි දන්නවා රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසයේ බස්නාගොඩ ජලාශය ගැන. ගරු ඇමතිතුමනි, මේ ගැන සියයට සියයක් වගකීම ඔබතුමාට නැති වුණත්, මේ ජලාශය ඇති කළේ ගම්පහ ප්‍රදේශයට ජලය ලබා ගැනීම සඳහා බව මම කියන්න ඕනෑ. ඒ ජලාශයට ඉඩම් ගත්ත නිසා පවුල් 100ක් පමණ අද අවතැන් වෙලා ඉන්නවා. ඒ අවතැන් වුණු අයට වන්දි ලබා දෙනවාය කියා

පොරොන්දු වෙලා තිබෙනවා. මම මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමාගේ කාරුණික අවධානය ඒ කෙරෙහි යොමු කරන්න කියලා. මොකද, ඒ අයට ලබා දෙන්න තීරණය කර තිබෙන වන්දි මුදල්, ඒ වාගේම ඒ තක්සේරු වාර්තා සම්බන්ධයෙන් ඒ අය කිසිසේත් සෑහීමට පත්වෙලා නැහැ. වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධ විවාදය අවස්ථාවේදී මට කථා කරන්න අවස්ථාවක් ලැබුණේ නැති නිසා තමයි මම මේ අවස්ථාවේ එය ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ. මොකද, ජලසම්පාදනය සම්බන්ධවයි මේ කටයුත්ත කෙරුණේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ ගොල්ලන්ගේ හේතු දැක්වීමත් සමඟ අපට දැනුම් දුන්නොත්, අපට පුළුවන් ඒ ගැන බලන්න. මොකද, කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙනවා, සියලුම පවරාගැනීම්වලට දැනට වඩා යථාර්ථවාදී වන්දියක් ගෙවීම පිළිගන්නවාය කියලා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා. මම ඒ අයට උපදෙස් දෙන්නම්, තමුන්නාන්සේට අභියාචනයක් ඉදිරිපත් කරන්න කියලා. අපි වාරිමාර්ග ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කළා පුළුවන් නම්, අපට සාකච්ඡාවක් ලබා දෙන්න කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉඩම් ලබා දී තිබෙනවා. නමුත්, ඒ ගොල්ලන් කියනවා මේ මුදල මදි කියලා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)
මුදල මදි, ගරු ඇමතිතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි, ලියලා එවන්න.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

ඊළඟට මම කියන්නේ යටියන්තොට ප්‍රදේශයේ වී ඔය ජලාශය ගැන. වී ඔය ජලාශය සම්බන්ධවත් ගැටලු සහගත තත්ත්වයක් මතුවෙලා තිබෙනවා. අපි දන්නවා, කොළඹ ප්‍රදේශයට ජලය ලබා දෙන්නත්, ඒ වාගේම ගංවතුර පාලනය කිරීමත් සඳහා මේ ව්‍යාපෘතිය යෝජනා කර තිබෙන බව. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. පසුගිය දවස්වල එහි මිනුම් කටයුතු කළා, ගරු ඇමතිතුමනි. මිනුම් කටයුතු කළාට කොච්චර පවුල් සංඛ්‍යාවක් අයින් කරනවාද, කොච්චර සීමාවකට මේ ජල මට්ටම එනවාද කියන එක සම්බන්ධයෙන් සැකයක් තිබෙනවා. ඒ අය ස්ථිර වශයෙන් දැනුම් දී නැහැ, අනිවාර්යයෙන් මෙන්න මේ මේ පවුල් ටික අයින් කරනවා කියලා. ගරු ඇමතිතුමනි, ඒ තත්ත්වය තුළ ඒ අයට අද ගෙවල් වැඩිදියුණු කර ගන්න විධියකුත් නැහැ. ඔවුන් දෙගිඩියාවෙන් ඉන්නේ. මේ නිසා අද ඒ අයට ඒ ඉඩම් වැඩිදියුණු කරගන්න, අලුතින් තේ වගාවක් ආරම්භ කරන්න, වෙනත් වගාවක් කරන්නත් නොහැකි වෙලා තිබෙනවා.

මේ සඳහා කොච්චර ඉඩම් ප්‍රමාණයක් ගන්නවාද, ගෙවල් කොපමණ සංඛ්‍යාවක් ඉවත් වෙනවාද කියන එක සම්බන්ධව තවම තොරතුරක් නැහැ. මම ඉල්ලා සිටිනවා ඒ කටයුතු කරනවා නම්, අවම හානියක් යටතේ කරන්න කියලා. ගරු ඇමතිතුමනි, දැන්ම ඒ ගැන පරීක්ෂණයක් කරලා මේ අහවල් අහවල් ගෙවල් ටික තමයි ඉවත් වෙන්නේ, මේ අහවල් අහවල් ඉඩම් ටික තමයි ගන්නේ කියන එක ඒ ජනතාවට කියන්න. එතකොට ඒ අයට බලාපොරොත්තු අයින් කරගෙන වෙනත් කාර්යයක නියැළෙන්න පුළුවන්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමා හෝ ප්‍රාදේශීය ලේකම්තුමිය තමයි ඒ ගැන පිළිතුරක් දිය යුත්තේ. ඉවත් කරන ඔය ඔක්කෝම පවුල් සංඛ්‍යාව සහ ඉඩම් ප්‍රමාණය පිළිබඳ විස්තර ගන්න බලාපොරොත්තු වෙන්නේ එතුමිය හරහා. නමුත්, ඒ අයට ඕනෑ වෙලාවක විරෝධතා පළ කරන්න පුළුවන්.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)
ඒ සම්බන්ධයෙන් ඒ ජනතාව තුළ විරුද්ධත්වයක් නැහැ, ගරු ඇමතිතුමනි. මේ කටයුත්ත සම්බන්ධයෙන් පසුගිය දවස්වල නොයෙකුත් ආකාරයේ සාකච්ඡා, උද්ඝෝෂණ තිබුණා. නමුත් දැන් ඒ ජනතාව තීන්දු කරලා එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා, "අපට සාධාරණ වන්දි මුදලක් ලබා දෙනවා නම් ප්‍රශ්නයක් නැහැ" කියලා. මේ අහවල් අහවල් ගෙවල් ටික තමයි ඉවත් වෙන්නේ කියලා දැන්ම කියනවා නම්, ඒ අයට යම්කිසි විකල්ප වැඩ පිළිවෙළකට යන්න පුළුවන් කියන එකයි කියන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ප්‍රාදේශීය ලේකම්තුමියට දැනුම්දීමක් කරන්න. එතකොට එතුමිය පියවරක් ගනීවි. මම හිතන විධියට ප්‍රාදේශීය ලේකම්ට මේ පිළිබඳව තීරණය කරන්න අමාරුයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හෝ අනෙකුත් අදාළ නිලධාරීන්, ඉංජිනේරුවන් ගිහිල්ලා තමයි තීරණය කරන්න වෙන්නේ, ජලාශයට යට වෙන භූමි ප්‍රමාණය කොච්චරද කියන එක. ඒ නිසා ඒ කටයුත්ත කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු අමාත්‍යතුමනි, මේකෙදි වන්දි මුදල් ලබා දීම සම්බන්ධවත් අපට ගැටලුවක් තිබෙනවා. ඒ සම්බන්ධවත් ඔබතුමා මැදිහත් වෙන්න. පසුගිය දවස්වල රුවන්වැල්ලේ කාරණාව සම්බන්ධයෙන් ඉල්ලීමක් කළා වාගේ, මේ කාරණය සම්බන්ධවත් තක්සේරු වාර්තා ලබා දීමේදී ඒ කටයුත්ත කරන්න කියලායි මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටින්නේ.

ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාට තව එක කාරණාවක් කියන්න ඕනෑ. ප්‍රජා ජල ව්‍යාපෘති පිළිබඳ කථා කෙරුවොත්, ලෝක බැංකු ආධාර යටතේ, WASSIP යටතේ ජල යෝජනා ක්‍රම රාශියක් ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. මම නියෝජනය කරන යටියන්තොට ප්‍රදේශයේත්, කෑගල්ල දිස්ත්‍රික්කයේත් ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළා.

අද ජල සම්පාදන රාජ්‍ය ඇමතිවරයා ප්‍රකාශ කළා, එතුමන්ලා තමයි මේ කටයුත්ත කෙරුවේ, පානීය ජල අවශ්‍යතාව සියයට 60, 75 දක්වා සපුරන්න එතුමන්ලා කටයුතු කරලා තිබෙනවා කියලා. නමුත් ගරු ඇමතිතුමනි, මම කියන්න ඕනෑ, පසුගිය අපේ රජය කාලයේ ආරම්භ කරපු ජල යෝජනා ක්‍රම හැරෙන්න අලුත්

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

යෝජනා ක්‍රම කිසිවක් ආරම්භ කරලා නැති බව. ගරු ඇමතිතුමනි, හුඟක් වෙලාවට මේ ආරම්භ කරපු ජල යෝජනා ක්‍රමවල වැඩකටයුතු අවසන් කරන්න ප්‍රමාද වෙලා තිබෙනවා. ඒ ප්‍රමාදය මඟහරවා කඩිනමින් ඒ කටයුතු අවසන් කරන්න. මොකද, ගොඩක් කල් ගිය ජල යෝජනා ක්‍රම තිබෙනවා; සෑහෙන කාලයක් -අවුරුදු ගණන්- ගත වෙලාත් අවසන් කරන්න බැරි වෙච්ච යෝජනා ක්‍රම ගණනාවක් තිබෙනවා. ඒ ගැන ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා ඒ ව්‍යාපෘති කඩිනම් කරන්න කටයුතු කරන්න.

අපි කිව්ව කාරණා ගැන -අපේ විපක්ෂයෙන් කරපු යෝජනා සම්බන්ධව- ඔබතුමන්ලා, විශේෂයෙන් ගරු ඇමතිතුමන්ලා වාගේම රජය සාධාරණව කල්පනා කර බලලා මේ රටේ සම්පත්, දේපළ ආරක්ෂා කරන යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරාවි කියා අපි බලාපොරොත්තු වෙනවා. ඒ සම්බන්ධව කටයුතු කරන්න විශේෂයෙන් වරාය හා නාවික ඇමතිතුමාට, ජලසම්පාදන ඇමතිතුමාට වාගේම රාජ්‍ය ඇමතිතුමන්ලාට සහ නිලධාරි මණ්ඩලයට ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.52]

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමාට පෙර කථා කළා, අපේ හිටපු ඩිජිටල් ඇමතිතුමා; බැලුන් ඇමතිතුමා. එතුමා අද මෙතැනදී සුද්ධෝදන වාගේ කථා කළා. මගේ කථාව ආරම්භ කරන්න ඉස්සර වෙලා මම එතුමාගෙන් අහන්න කැමැතියි, එතුමා ඒ Google balloon එක යවන්න කොච්චර මුදලක් වියදම් කළා ද, ඒක කඩා වැටුණේ කොහේටද කියලා. මොකද, ඒ සඳහා ගිය වියදම මේ රටේ ආර්ථිකයට මරු පහරක් වුණා.

මම අහගෙන හිටියා, ඒ හිටපු ඇමතිතුමා කියනවා පාස්කු ප්‍රහාරය පාවිච්චි කරලා දැන් තිබෙන ආණ්ඩුව ඡන්ද ගත්තා කියලා. එතුමාට මම මේ කාරණය කියන්න කැමැතියි. ඔබතුමාගේ පියා ඔබතුමාට එදා කිව්වා, පල්ලියට යන්න එපා කියලා. ඒ ඔබතුමාගේ ජීවිතය ගැන හිතලා විතරයි. හිටපු ඇමති කෙනෙක් හැටියට ඔබතුමා තුළ රටට ආදරයක් තිබුණා නම්, ඇයි ඒ ගැන කිසිවෙකුටත් දැනුම් නොදුන්නේ? ඒ ප්‍රහාරය නිසා අහිංසක මිනිස්සු 260දෙනෙක් මැරුණා. එදා තමුන්නාන්සේලාගේ රජයක් නේ තිබුණේ. ඔබතුමාට මේ රටට කියන්න තිබුණා, මෙන්න මේ පණිවිඩය මගේ තාත්තා දුන්නා, නැත්නම් වෙන කවුරු හරි දුන්නා කියලා. එහෙම කියලා ඒ අහිංසක මිනිස්සු, කතෝලික ජනතාව, තමුන්ගේ ජනතාව බේරා ගන්න තිබුණා. එහෙම කරන්නේ නැතුව, අද එතුමා වෙන වෙන කථා කියනවා; සුද්ධෝදන වාගේ කථා කරනවා. ඒ ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විවාදයට ගන්නා වැය ශීර්ෂ යටතේ දැන් මම කථා කරන්නම්. අපි සැමට සුරක්ෂිත ජලය සහිත රටක් අවශ්‍යයි. මේ ගැන මම පොඩ්ඩක් කියන්න ඕනෑ. මට මතකයි, අපේ රජයක් පැවැති 2010-2015 කාලයේ එවකට ජල සම්පාදන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේ අපේ වර්තමාන සභානායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා බව. එතුමා එවකට ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාත් සමඟ එකතු වෙලා මහනුවර උතුර-පාතදුම්බර ජල ව්‍යාපෘතිය ආරම්භ කළා. එදා අපි ඒ ජල ව්‍යාපෘතිය ආරම්භ කළත්, 2015 දී පැවැති ජනාධිපතිවරණයෙන් අපි පරාජයට පත් වෙලා ආණ්ඩුව මාරු වුණාට පස්සේ, එවකට යහ පාලන ආණ්ඩුවේ ජලසම්පාදන අමාත්‍යවරයා විධියට කටයුතු කළ -මට පෙර මේ ගරු සභාවේ කථා කළ- රවුෆ් හකීම් මැතිතුමා අපි සකස් කළ plan එක එතුමාට අවශ්‍ය අවශ්‍ය හිතවත්කම් මත වෙනස් කළා. මේ මොහොතේ මම අපේ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා පසුගිය ආණ්ඩුවේ අය වෙනස් කරපුවා නැවත සංශෝධනය කරලා, මහනුවර උතුර - පාතදුම්බර ජල ව්‍යාපෘතිය විශේෂයෙන් පාතදුම්බර, හාරිස්පත්තුව, ගඟවටකෝරළයේ සිට කුරුණෑගල දක්වා අරන් යන්න කටයුතු කළා. ඒ ගැන මම සන්තෝෂ වෙනවා. මම නියෝජනය කරන්නේ හාරිස්පත්තුව ආසනය. මේ ව්‍යාපෘතිය තුළින් හාරිස්පත්තුව ආසනයේ පමණක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 3ක් ආවරණය වෙලා, පවුල් 75,000කට පමණ ජලය ලැබෙනවා. ඊළඟට, මහනුවර දිස්ත්‍රික්කයේත් ලක්ෂ 5කට අධික පිරිසකට මේ ජල ව්‍යාපෘතියෙන් සෙත සැලසෙනවා, ගරු ඇමතිතුමනි. එදා බුදු හාමුදුරුවන් සිටි කාලයේත් ගමන් බිමන් යන මිනිසුන්ට පිපාසයක් දැනෙනකොට වතුර ටිකක් බොන්න පින්තාලි හදලා තිබුණු බව අපි අහලා තිබෙනවා. පින්තාලි හදලා මිනිසුන්ට එහෙම වතුර බොන්න සලස්වන එක බොහොම පිනක්. ඒ වාගේම නිවාස, මංමාවත් හදන එකත් බොහෝම පිනක් හැටියටයි අපේ බෞද්ධ දර්ශනයේ සඳහන් වෙන්නේ. මේ ව්‍යාපෘතියට යන මුදල පොඩි ගණනක් නොවෙයි, කෝටි 5,000ක්. එපමණ මුදලක් වෙන් කරලා මහනුවර දිස්ත්‍රික්කයේ එවැනි ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපේ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාටත් මහනුවර ජනතාවගේ ගෞරවය පුද කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී අද කවුරුවත් සඳහන් නොකරපු තවත් ව්‍යාපෘතියක් තිබෙනවා. ඒ තමයි, මහනුවර නගර සභාව සම්බන්ධ කරගෙන සිදු කරන අපජල කළමනාකරණ ව්‍යාපෘතිය. එම ව්‍යාපෘතියට බිලියන 18ක් වෙන් කර තිබෙනවා. මීට පෙර කවදාද මේ වාගේ දේවල් කෙරුණේ? කොරියානු රජයේ ආධාර ඇතිව බිලියන 18ක අපජල කළමනාකරණ ව්‍යාපෘතියක් අද මහනුවර නගරයේ ක්‍රියාත්මක වෙනවා. දැනට සතියකට දෙකකට පෙර අපේ ගරු අග්‍රාමාත්‍යතුමාත්, ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාත් මහනුවර සහ අරලියගහ මන්දිරයේ සිට එය විවෘත කළා. කලින්, මහනුවර නගරයේ තිබුණු අසූචි, කුණු සියල්ල ගියේ මහවැලි ගඟට. දැන් ඒ අසූචි, කුණු මහවැලි ගඟට යාම නවත්වා තිබෙනවා. නව තාක්ෂණය උපයෝගි කරගෙන දැන් මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙනවා. මුලින් සඳහන් කළ water supply project එක සහ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් අපේ දිස්ත්‍රික්කයට බිලියන ගණනක් වෙන් කර තිබුණා. ඒ ගැන අපේ කෘතඥතාව පළ කරනවා.

පසුගිය යහ පාලන ආණ්ඩුවේ හිටපු සමහර ඇමතිවරු කළ දේවල් අපි දන්නවා. පසුගිය ආණ්ඩුවේ ජල සම්පාදන අමාත්‍යාංශය බාරව හිටපු ඇමතිවරයෙක් තමයි, නැඟෙනහිර පළාතේ කාත්තන්කුඩියේ හිටපු මිනිස්සු මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවට - මගේ ආසනයට- ගෙනැල්ලා දැම්මේ. අපි දන්නෙත් නැහැ. එතකොට යහ පාලන ආණ්ඩුවේ හිටපු, හාරිස්පත්තුව නියෝජනය කරපු ඇමතිවරු බකන්නිලාගෙන

හිටියා. අකිල විරාජ් කාරියවසම් හිටපු අධ්‍යාපන ඇමතිවරයා එදා අධ්‍යාපන අමාත්‍යාංශයට කාර්යාල කාර්ය සහායක සහ කම්කරුවන් ලෙස තමන්ගේ බල ප්‍රදේශයෙන් තරුණ තරුණියන් බඳවාගෙන ඒ අය හාරිස්පත්තුවට එවා තිබෙනවා. ඒ දවස්වල හැම දාම උදේට කුලියාපිටියේ ඉඳන් හාරිස්පත්තුව දක්වා බස් එකක් එනවා. තවමත් ඒ බස් එක එනවා. එදා එහෙමයි ඒ ගොල්ලන් කටයුතු කළේ. එදා මහනුවර දිස්ත්‍රික්කයේ අපේ හාරිස්පත්තුවේ water supply project එකට කාත්තන්කුඩිවල ඉඳලා කට්ටිය එව්වා. එදා එහෙම කරපු අය අද සාධාරණය ගැන කථා කරනවා. ඒ අය මේ වෙලාවේ සභාවේ ඉන්නවා නම් හොඳයි. එදා එතුමන්ලා වැඩ කළේ එහෙමයි. නමුත් අපේ ඇමතිතුමා එවැනි කෙනෙක් නොවෙයි; අපේ ජනාධිපතිතුමා එවැනි කෙනෙක් නොවෙයි; අපේ අගමැතිතුමා එවැනි කෙනෙක් නොවෙයි. ඒ සියලු දෙනාටම අවශ්‍ය වුණේ සැමට ජලය ලබා දීමටයි. මේ අය UNP ද, JVP ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ද, වෙනත් පක්ෂයක උදවිය ද කියලා එතුමන්ලා බැලුවේ නැහැ. ඒ සැම දෙනාටම අවශ්‍ය ජලය ලබාදෙන ව්‍යාපෘතිය දැන් ක්‍රියාත්මක වී තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මගේ ආසනයේ අංකුඹුර ප්‍රදේශය රටේ ආර්ථිකයට දැවැන්ත ශක්තියක් දෙන ප්‍රදේශයක්; සුළු අපනයන භෝග වගා කරන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශය තිබෙන්නේ කඳු මුදුනකයි. අපි ඉල්ලපු ඉල්ලපු හැම තැනටම ඔබතුමන්ලා ජලය ලබා දුන්නා. නමුත්, අංකුඹුර කියන්නේ කඳු සහිත ප්‍රදේශයක්. එම ප්‍රදේශය උස් තැනක පිහිටා තිබෙන නිසා උඩට ජලය අරන් යන්න බැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒ කඳු ගැටය මතටත් ජලය ගෙනියන්න වැඩ පිළිවෙළක් යොදන්න කියලා මධ්‍යම පළාතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිතුමාට මම දැනුම් දුන්නා. එතුමා ඒක කරගෙන යනවා.

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මට ඒ ගැන බොහොම සන්තෝෂයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! The Hon. Ajith Rajapakse will now take the Chair.

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்*

*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. AJITH RAJAPAKSE *took the Chair.*

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රදේශයේ මහා සංඝරත්නය මගෙන් ඉල්ලීමක් කළා, මොන ක්‍රමයකින් හෝ ඒ ප්‍රදේශයටත් ජලය ලබා දෙන්න කියලා. දැන් අපේ ගරු ඇමතිතුමා ඒ ලබා දීම සපථ කළා. ඒ ගැනත් ඔබතුමාට අපගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා. මම මතක් කරන්න ඕනෑ, ජල තාක්ෂණය පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලය පරිශ්‍රයේ ඉදිකර තිබෙන බව. මෙය මහනුවරට පමණක් නොවෙයි, රටටම ලැබුණු සම්පතක් හැටියටයි අප සලකන්නේ.

ඊළඟට මම කියන්න ඕනෑ, අපේ ගරු සනත් නිශාන්ත පෙරේරා මැතිතුමාගේ රාජ්‍ය අමාත්‍යාංශය පිළිබඳවත්. ඒ පිළිබඳව කථා කරන කොට මට මතක් වෙනවා, මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් සිටි කාලයේ හිටපු ජනාධිපති, වත්මන් අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මධ්‍යම පළාතට ග්‍රාමීය ජල ව්‍යාපෘති, ප්‍රජා ජල ව්‍යාපෘති ලබා දුන් ආකාරය. ඒ අනුව මා නියෝජනය කරන හාරිස්පත්තුව ආසනයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනටම ව්‍යාපෘති 40ක් පමණ ලබා දුන්නා. ජල ව්‍යාපෘති කටයුතු පිළිබඳව සොයා බලන්න මීට මාසයකට, දෙකකට උඩදී අපේ වර්තමාන රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත පෙරේරා මැතිතුමා මහනුවර දිස්ත්‍රික්කයටත් ආවා. තරුණ අමාත්‍යවරයකු හැටියට එතුමා රට පුරා යමින් ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බව අපි දන්නවා. අපේ පළාත කඳුකර පළාතක්. වතුර ගෙනැල්ලාම ඒ පළාතේ සමහර උදවියගේ උකුල් ඇට ගෙවිලා තිබුණේ. එවැනි තත්ත්වයක් පවතිද්දි තමයි එදා අපේ ගරු අගමැතිතුමා ඒ ප්‍රජා ජල ව්‍යාපෘති ලබා දුන්නේ. අපේ ආණ්ඩුව පැවැති කාලයේ හැකි උපරිම මට්ටමෙන් ප්‍රජා ජල ව්‍යාපෘති මඟින් ඒ ප්‍රදේශයේ ජනතාවට ජලය ලබා දුන්නා. නමුත් කියන්න කනගාටුයි, පසු ගිය ආණ්ඩුව කාලයේ ඒ ව්‍යාපෘති ගැන කිසිම හෙවිල්ලක් බැලිල්ලක් කළේ නැහැ. වර්තමාන ගරු අමාත්‍යතුමා මහනුවරට ගිය වෙලාවේදී අපි නැවත වරක් ඉල්ලීමක් කළා, ඒ ප්‍රජා ජල ව්‍යාපෘති නැවත පණ ගන්වා ක්‍රියාත්මක කරන්න කියලා. ඒ සම්බන්ධයෙන් එතුමා අපට හොඳටම උදවු උපකාර කළා. දැන් ඒ කටයුතු ක්‍රියාත්මක වෙනවා. ඒ පිළිබඳව සනත් නිශාන්ත පෙරේරා රාජ්‍ය ඇමතිතුමාටත් අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

"සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළ යටතේ, 2025 වන කොට මේ රටේ සියයට සියයක් පානීය ජලය දෙන්න අපේ රජය කටයුතු කරනවා. ඒ පිළිබඳත් අපේ ප්‍රසාදය පිරිනමනවා. විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ, අලුත් අවුරුද්දේ -ලබන වර්ෂය තුළ- නව ජල ව්‍යාපෘති 268ක් අපි ආරම්භ කරන බව. ඒ වාගේම, දැනට තිබෙන ව්‍යාපෘති 94ක් නවීකරණය කෙරෙමින් පවතිනවා. අපට බොහොම සතුටුයි, අද මේ රටේ ජලසම්පාදන අමාත්‍යාංශය සහ ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙකු සහ තරුණ රාජ්‍ය අමාත්‍යවරයෙකු යටතේ ක්‍රියාත්මක වීම ගැන. ඒ ගැන අපි කාටවත් වචනයක් කියන්න බැහැ. ඒ ගැන විපක්ෂයට වුණත් වචනයක් කියන්න බැහැ. මොකද, එතුමන්ලා නවීන තාක්ෂණය යොදා ගනිමින්, ඉතාම ක්‍රමානුකූලව ජල සම්පාදනය සම්බන්ධයෙන් විශාල වෙනසක් මේ රට තුළ සිදු කරමින් යනවා. මම මේ කථා කළේ මහනුවර දිස්ත්‍රික්කයට අදාළව කරපු කටයුතු ගැන විතරයි. නමුත් මම දන්නවා, එතුමන්ලා රට පුරා විශාල මෙහෙයක් සිදු කරන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වරාය හා නාවික අමාත්‍යාංශය ගැනත් කථා කරන්න බලාපොරොත්තුවෙන් හිටියා. නමුත් ඒ සඳහා දැන් වෙලාවක් නැහැ. ඒ ගැන කනගාටුයි. අවසාන වශයෙන්, අපේ අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමාට, ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාට, ගරු රාජ්‍ය ඇමතිතුමාට මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ගෞරවය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[பி.ப. 12.02]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சு, நீர் வழங்கல் அமைச்சு ஆகிய இரண்டு அமைச்சுக்கள் தொடர்பான இன்றைய குழுநிலை விவாதத்திலே, திருகோணமலை மாவட்டத்தில் இந்த அமைச்சுக்களின்கீழ் வருகின்ற சில முக்கிய விடயங்கள் சம்பந்தமாக இந்த இடத்திலே கூறலாம் என்று நினைக்கின்றேன். உலகின் இயற்கைத் துறைமுகங்களில் இரண்டாவது சிறந்த இயற்கைத் துறைமுகமாகத் திருகோணமலைத் துறைமுகம் காணப்படுவது எல்லோருக்கும் தெரிந்த விடயம். எங்களுடைய மாவட்டத்திலே அமைந்திருக்கும் இத்துறைமுகத்திலே முதலீடு செய்து நாட்டுக்கு வருமானத்தை ஈட்டுகின்ற முயற்சிகளை இது வரையும் எந்தவோர் அரசாங்கமும் மேற்கொள்ளவில்லை என்பது மிகவும் கவலைக்குரிய விடயமாகும். சீனாவிடம் கடன் வாங்கி ஹம்பாந்தோட்டையில் துறைமுகம் அமைந்தார்கள். அதிலே வருமானம் கிடைக்கின்றதா அல்லது அது மீண்டும் சீனாவுக்கே அன்பளிப்பாக வழங்கப்பட்டுள்ளதா? என்பதில் ஒரு சந்தேகமான நிலைப்பாடு காணப்படுகின்றது. அதுபோல், சில முஸ்லிம் கட்சியினரைத் திருப்திப்படுத்துவதற்காக ஒலுவில் துறைமுகம் அமைக்கப்பட்டது. அதனால் அங்கு இன்று கடலரிப்பு பிரச்சினைதான் எஞ்சியிருக்கின்றது. ஆனால், திருகோணமலை இயற்கைத் துறைமுகம் சம்பந்தமாக எந்தவொரு நடவடிக்கையும் எடுக்கப்படவில்லை.

குறிப்பாக, இந்த இயற்கைத் துறைமுகத்திற்குச் சில சிறிய அபிவிருத்தி விடயங்களைச் செய்வதன்மூலம் இந்த நாட்டுக்கு வருமானத்தை ஈட்ட முடியும் என்பதோடு, கூடுதலான நன்மைகளைப் பெறுவதற்கான வாய்ப்புகளும் காணப்படுகின்றது. குறிப்பாக, திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற இயற்கைத் துறைமுகத்தைவிட, சீனக்குடா எண்ணெய்த் தாங்கிகள், கனிய மணல், சீனித் தொழிற்சாலை போன்றவையும் அங்கு காணப்படுகின்றன. இவ்வாறான வளங்களைக் கொண்டிருக்கின்ற இந்தத் திருகோணமலை மாவட்டம் புறக்கணிக்கப்படுகின்றமை உண்மையில் அந்த மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் எனக்குக் கவலையளிக்கின்ற விடயமாகவுள்ளது. இந்த இயற்கைத் துறைமுகத்தை அபிவிருத்தி செய்யாமல், கப்பல் வராத துறைமுகங்களையும், விமானம் வராத விமான நிலையங்களையும் உருவாக்குகின்ற நிலைப்பாடே இங்கு காணப்படுகின்றது. ஆகையால், கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்திலே கவனம் செலுத்தி, திருகோணமலை இயற்கைத் துறைமுகத்தை அபிவிருத்தி செய்யும் வேலைத்திட்டங்களை எதிர்காலத்திலே மேற்கொள்ள வேண்டுமென்று நான் இந்த இடத்திலே கேட்டுக் கொள்கிறேன்.

அதேபோன்று, அங்கு மக்கள் குடியிருப்புப் பகுதிகளாகக் காணப்படுகின்ற சில பிரதேசங்கள் துறைமுக அதிகார சபைக்குச் சொந்தம் எனத் தெரிவிக்கப்பட்டு வெளியிடப்பட்டிருக்கின்ற 1984ஆம் ஆண்டு வர்த்தமானி அறிவித்தல் சம்பந்தமாகச் சில விடயங்களை இந்த இடத்திலே நான் குறிப்பிட விரும்புகின்றேன். குறிப்பாக வெள்ளைமணல், நாச்சிக்குடா, கருமலையூற்று, சின்னம்பிள்ளைச்சேனை, நீரோட்டுமுனை, மகிழுற்று, திமுத்துகம, கரடிப்பூவால், சீனக்குடா, காவட்டிக்குடா, முத்துநகர், கப்பற்றுறை, சுமேதங்கரபுர, மட்கோ, பூம்புகார் போன்ற பிரதேசங்கள் சுமார் 30,000க்கு மேற்பட்ட மூவின மக்களும் வாழுகின்ற பிரதேசங்களாகக் காணப்படுகின்றன. அத்துடன், வாக்காளர்கள் பதிவு ஆரம்பித்த காலத்திலேயிருந்து இந்தப் பிரதேசங்களிலே வாழுகின்ற மக்கள் வாக்களிக்கின்ற உரிமையைப் பெற்றிருக்கின்றார்கள். அங்குள்ள முத்துநகர் போன்ற பகுதிகள் அரசாங்கத்தினாலேயே மீள்குடியேற்றப்பட்ட பிரதேசங்களாகக் காணப்படுகின்றன. ஆனால், 1984ஆம் ஆண்டு இந்தப் பகுதிகள் அனைத்தும் துறைமுக அதிகாரசபைக்குச் சொந்தமானதென வர்த்தமானி வெளியிடப்பட்டது. அதன் காரணமாக 2004ஆம் ஆண்டு முதல் அந்தப் பகுதிகளிலே எவ்வித கட்டுமானச் செயற்பாடுகளையும் முன்னெடுக்க முடியாத சூழல் அந்தப் பிரதேசங்களிலே இருக்கின்ற மக்களுக்கு ஏற்பட்டிருக்கின்றது.

உதாரணமாக, இரண்டு வீடுகளுக்கு நடுவில் இருக்கின்ற இடத்திலே ஒரு கட்டிடத்தை அமைக்கமுடியாத ஒரு சூழல் இருக்கின்றது. அவ்வாறான கட்டிட நிர்மாணப் பணிகளை மேற்கொள்வதாக இருந்தால் அதைத் துறைமுக அதிகாரசபையினுடைய அதிகாரிகள் தடைசெய்கின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. அத்துடன், நீரிணைப்புக்களைப் பெற முடியாத மிகவும் அசௌகரியமான நிலைமைகளும் அந்தப் பிரதேசங்களில் ஏற்படுத்தப்பட்டுள்ளன. இதனால் அங்கிருக்கின்ற மக்களுக்கு வங்கியிலே கடன்பெற முடியாத ஒரு சூழ்நிலையும் அந்தப் பிரதேசங்களிலே வியாபாரத்தை மேற்கொள்ளமுடியாத சூழ்நிலையும் காணப்படுகின்றது. ஆகையால், பல தசாப்தங்களாக அந்தப் பிரதேசங்களிலே வாழுகின்ற மக்களுக்குச் சரியான நீதி கிடைக்க வேண்டும். அதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கையெடுக்க வேண்டும். அரசாங்கத்தினால் மீள்குடியேற்றப்பட்ட மேற்கூறிய பகுதிகளிலேகூட இன்னும் பல கஷ்டங்களை அந்தப் பிரதேச மக்கள் அனுபவித்துக்கொண்டிருக்கிறார்கள். ஆகையால், அது சம்பந்தமாகவும் கௌரவ அமைச்சர் அவர்கள் கவனத்தில் எடுத்து, அதற்கான நடவடிக்கைகளை மேற்கொள்ளவேண்டுமென்பது என்னுடைய பிரதான ஒரு வேண்டுகோளாகக் காணப்படுகின்றது.

மேலும், மேற்கூறிய இடங்களிலே எங்களுடைய புராதன மதஸ்தலங்களான கருமலையூற்றுப் பள்ளிவாசல் மற்றும் நாச்சிக்குடா, சிலுவைமலை போன்ற மதஸ்தலங்கள் காணப்படுகின்றன. பழைமைவாய்ந்த அந்த மதஸ்தலங்களைக் கூட அபிவிருத்தி செய்யமுடியாத ஒரு சூழல் அந்தப் பிரதேசங்களிலே காணப்படுகின்றது. ஆகையால், அவ்வாறான மதஸ்தலங்களையும் எதிர்காலத்திலே நல்ல முறையில் அபிவிருத்தி செய்வதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கையெடுக்க வேண்டும் என்பதை இந்த இடத்திலே கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, இங்கு கௌரவ நீர் வழங்கல் அமைச்சர் அவர்கள் இருக்கின்ற இச்சந்தர்ப்பத்தில் எங்களுடைய திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற குடிநீர் சம்பந்தமான பிரச்சினைகளைப் பற்றிக் கூறலாமென்று நினைக்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே! கந்தளாய், தம்பலகாமம், கிண்ணியா, திருகோணமலைப் பகுதிகளுக்குக் குடிநீரைக் கொண்டுவருகின்ற பிரதான நீர்க்குழாய்கள் தம்பலகாமம், சிராஜ் நகர்ப் பகுதிகளிலே அடிக்கடி உடைகின்ற நிலை

காணப்படுகின்றது. குறிப்பாக, 2020ஆம் ஆண்டிலே 7 தடவை இது உடைந்திருக்கின்றது. 2021ஆம் ஆண்டு 3 தடவை இது உடைந்திருக்கின்றது. அதனைச் சரிசெய்வதாயின் தொடர்ச்சியாக 3-5 நாட்களுக்குமேல் எடுக்கின்றது. இதனால், அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்கள் 5 அல்லது 6 நாட்களுக்கு நீரைப் பெறமுடியாத தர்மசங்கடமானதொரு சூழ்நிலைக்குத் தள்ளப்படுகின்றார்கள். குறிப்பாக, இந்த இடங்களிலே GI குழாய்கள் பொருத்தப்பட்டு இருந்ததாகவும் பின்னர் அது துருப்பிடித்ததன் காரணமாக PVC குழாய்கள் மாற்றப்பட்டதாகவும் ஆனால், PVC குழாய்களும் சரிவராததன் காரணத்தினால் மீண்டும் GI குழாய்களைப் பொருத்துவதற்காகவே இவ்வாறான நடவடிக்கைகளை எடுப்பதாகவும் அதிகாரிகள் சொல்கின்றார்கள். எனவே, இந்த வேலைத்திட்டத்தை விரைவுபடுத்தி மிகவிரைவில் இந்தப் பிரச்சினையை முடிவுக்குக் கொண்டுவரவேண்டும் என்பதைக் கௌரவ அமைச்சர் அவர்களிடம் வலியுறுத்திக் கேட்டுக்கொள்கின்றேன்.

அதுபோல், சுமார் 20,000 மக்களைக்கொண்ட தோப்பூர் மற்றும் அதனை அண்டியிருக்கின்ற பகுதிகளிலே இரண்டு நாட்களுக்கு ஒருமுறை நீர் விநியோகம் நடைபெறுகின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. மாவிலாற்றிலிருந்து வருகின்ற நீரானது சுத்திகரிக்கப்பட்டு, பாலத்தோப்பிலுள்ள நீர்த்தாங்கியின்மூலம் அப்பகுதி மக்களுக்கு விநியோகிக்கப்படுகின்ற நடவடிக்கை மேற்கொள்ளப் படுகின்றது. இங்கு அமைக்கப்பட்டிருக்கின்ற நீர்த்தாங்கியைக் கொண்டு முழுப் பிரதேசத்திற்கும் தொடர்ந்து நீரை விநியோகம் செய்யமுடியாத காரணத்தினால் அந்த மக்கள் இப்பிரச்சினையை எதிர்நோக்குகின்றார்கள். ஆகவே, இப்பகுதியிலே இன்னுமொரு நீர்த்தாங்கியை அமைத்து, அப்பகுதிகளுக்கு நீர் வழங்குகின்ற செயற்பாட்டிலே கூடுதலான கவனம் செலுத்தவேண்டுமெனவும் கௌரவ அமைச்சர் அவர்களிடம் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

குச்சவெளிப் பிரதேச செயலகத்திற்குட்பட்ட கும்புறுப்பிட்டி, சலப்பை ஆறு, இரணைக்கேணி, குச்சவெளி, புடவைக்காடு, திரியாய், கல்லராவ, மதுரங்குடா போன்ற கிராமங்கள் இதுவரைக்கும் நீர் இணைப்பினைப் பெறாத பிரதேசங்களாகக் காணப்படுகின்றன. இதனால், அப்பகுதி மக்கள் தூய குடிநீரைப் பெறுவதற்குப் பல சிரமங்களை எதிர்நோக்குகின்றார்கள். எனவே, இப்பகுதிகளுக்கு உடனடியாக பிரதான நீர்க்குழாய்களைப் பொருத்த நடவடிக்கை எடுக்கப்படவேண்டும் என்பதை கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக்கொள்கின்றேன். குச்சவெளிப் பிரதேசமானது எங்களுடைய முன்னாள் நீர் வழங்கல் அமைச்சரினுடைய கட்சியைச் சார்ந்த ஆதரவாளர்கள் கூடுதலாகக் காணப்படுகின்ற பிரதேசமாகும். அவருடைய கட்சியைச் சார்ந்த தவிசாளர்கள் மற்றும் மாகாண சபை உறுப்பினர்கள் அந்தப் பிரதேசத்தில் இருக்கின்றார்கள். இவர்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற பிரதேசத்திற்கு நீர் வழங்கப்படவில்லை என்பது ஒரு குறையாக இருந்தாலும், இதற்குரிய பிரதான காரணம் என்ன? என்பது எங்களுக்குத் தெரியாது. எனவே, இந்த அரசாங்கமாவது பாதிக்கப்பட்ட அந்த மக்களுக்குக் குடிநீர் வசதியினைப் பெற்றுக் கொடுப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும் என்பதுதான் கௌரவ அமைச்சரிடம் நான் கேட்கின்ற விடயமாகும்.

அதேபோன்று, கந்தளாய் நீர் சுத்திகரிப்பு நிலையத்தில் தினமும் சுத்திகரிக்கப்படுகின்ற நீரின் அளவு போதாமையினால் தம்பலகாமம், கிண்ணியா, திருகோணமலை ஆகிய பகுதிகளிலே ஒருநாள் விட்டு ஒருநாள் குடிநீர் வழங்கப்படுகின்ற நிலை காணப்படுகின்றது. எனவே, கந்தளாய் நீர் சுத்திகரிப்பு நிலையத்தில் தினமும் சுத்திகரிக்கப்படுகின்ற நீரின் அளவை அதிகரிப்பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படவேண்டும்.

மூதூரிலிருந்து கிண்ணியாவிற்கு நீர் வழங்குவதற்கான பிரதான நீர்க்குழாய் இணைப்புக்களைப் பொருத்துவதற்கான நடவடிக்கை எடுத்தால், கிண்ணியாப் பகுதிகளிலே தினமும் நீரை வழங்குவதற்கான நடவடிக்கையை மேற்கொள்ளமுடியும். கிண்ணியா மஹ்ரூப் கிராமத்தில் தற்போது 15 இலட்சம் லீற்றர் நீரைச் சேமிக்கக்கூடிய நீர்த்தாங்கியொன்று காணப்படுகின்றது. அங்கு 50 இலட்சம் லீற்றர் நீரைச் சேமித்து வைக்கக்கூடிய மேலுமொரு நீர்த்தாங்கி அமைக்கப்பட வேண்டும் என்பதும் எங்களுடைய வேண்டுகோளாகக் காணப்படுகின்றது. அதேபோன்று, கிண்ணியா பிரதேச சபைப் பிரிவில் 12,000க்கும் மேற்பட்ட குழாய்நீர்ப் பாவனையாளர்கள் உள்ளார்கள். இங்கு தற்காலிகமாக அமைக்கப்பட்ட தேசிய நீர் வழங்கல் வடிகாலமைப்புச் சபையினுடைய அலுவலகம் தற்போது மூடப்பட்டிருக்கின்றது. ஆகவே, இந்த 12,000க்கும் மேற்பட்ட பயனாளிகளின் நன்மைகருதி குறித்த காரியாலயத்தை மீண்டும் ஆரம்பிப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்படவேண்டுமென நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
What is the office that has been closed down?

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hn. Imran Maharoof)
It is a suboffice of the National Water Supply and Drainage Board.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Where is it?

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
It is in Kinniya.

எங்களுடைய பிரதேசத்திலே குடிநீர் சம்பந்தமான பல பிரச்சினைகள் காணப்படுகின்றன. குறிப்பாக, இன்று சில அமைப்புக்களினால் பல உதவிகள் வழங்கப்படுகின்றன. அவ்வாறான அமைப்புக்களின் உதவியினால் நாங்கள் சமுர்த்திப் பயனாளிகளுக்கான இலவச உதவிகளை வழங்குவதுடன், அவர்களுக்கான நீர் இணைப்பினையும் பெற்றுக் கொடுக்கின்றோம். ஆகையால், அரசாங்கத்தினால் தற்போது முன்னெடுக்கப்பட்டிருக்கின்ற இந்தப் புதிய வேலைத் திட்டத்தின்கீழ் ஏனையவர்களுக்கான நீர் வசதியையும் பெற்றுக்கொடுப்பதற்கான செயற்பாடுகளைக் கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்கவேண்டும் என்பதையும் இந்த இடத்திலே நான் கேட்டுக்கொள்கின்றேன்.

அதேபோன்று, இன்றைய விவாதத்துக்குரிய இரண்டு அமைச்சுக்களுடனும் சம்பந்தப்படாவிட்டாலும் ஒரு விடயத்தை நான் இந்த இடத்திலே கூறவேண்டும். குறிப்பாக, அண்மையிலே ஏற்பட்ட மழை வெள்ளத்தினால் புத்தளம்

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

பிரதேசம் மிகவும் பாதிப்படைந்து காணப்படுகின்றது. புத்தளப் பிரதேசத்திலே கற்பிட்டி, ஆலங்குடா போன்ற பகுதிகளிலே கடந்த 21 நாட்களாகப் பெய்த மழையினால் வெள்ளநீர் தேங்கி அங்கு சுமார் 425 குடும்பங்கள் பாதிக்கப்பட்டுத் தங்களது வாழ்வாதாரத்தை இழந்திருக்கின்றார்கள். எனினும், அந்த வெள்ளநீரை வெளியேற்ற அரசாங்கம் இன்றுவரை எந்த நடவடிக்கையும் எடுக்கவில்லை என்ற குற்றச்சாட்டு அந்தப் பிரதேசத்திலே இருக்கின்ற மக்களினால் முன்வைக்கப் படுகின்றது. ஆலங்குடாப் பிரதேசத்திலே 500க்கும் மேற்பட்ட பாடசாலை மாணவர்களுடைய கல்விச் செயற்பாடுகள் இன்று பாதிக்கப்பட்டிருக்கின்றது. வெள்ள நீர் தேங்கிக் கிடப்பதினால் ஆலங்குடாப் பிரதேசத்தின் பிரதான பாதை பாதிக்கப் பட்டிருக்கின்ற காரணத்தினால் அதனைப் பயன்படுத்துவோர் கிட்டத்தட்ட 3 கிலோமீற்றர் தூரத்திற்கு மாற்றுப் பாதையைப் பயன்படுத்தவேண்டிய ஒரு சூழல் அங்கே காணப்படுகின்றது. அதுபோலவே, வெள்ள நீர் தேங்கிக்கிடப்பதினால் கூலிவேலை செய்யக்கூடியவர்களுடைய வாழ்வாதாரம் பெரிதும் பாதிக்கப்பட்டிருக்கின்ற ஒரு நிலை காணப்படு கின்றது. ஆகையால், இந்த 425 குடும்பங்களினுடைய நிலைமையையும் கருத்திற்கொண்டு அவர்களுடைய வாழ்வாதாரத்தைச் சீர்படுத்தும் வகையில், முதலிலே தேங்கி யிருக்கின்ற அந்த வெள்ளநீரை வடிந்தோடச் செய்வதற்கான நடவடிக்கையில் அரசாங்கம் கவனம் செலுத்தவேண்டும் என்பதை இந்த இடத்திலே கேட்டுக்கொள்கின்றேன்.

குறிப்பாக, இன்று விவாதத்திற்கு எடுத்துக்கொள்ளப் பட்டிருக்கின்ற இந்த இரண்டு அமைச்சுக்களும் மிகவும் பிரதானமான அமைச்சுக்களாகக் காணப்படுகின்றன. எங்களு டைய மாவட்டத்திலுள்ள பல பிரதேசங்களிலே துறைமுகம் சார்ந்த பல பிரச்சினைகள் காணப்படுகின்றது. துறை முகத்துக்குச் சொந்தமான காணிகள் எனச் சில இடங்களிலே உள்ள காணிகள் அடையாளப்படுத்தப்பட்டதன் காரணமாக அங்கிருக்கின்ற மக்களுக்கும் அதிகாரிகளுக்கும் இடையில் பல குழப்பங்கள் ஏற்பட்டிருக்கின்றன. இந்தக் குழப்ப நிலையை நிவர்த்திசெய்வதற்காக நான் ஆரம்பத்தில் சொன்ன சகல விடயங்களையும் கருத்திற்கொண்டு அவற்றுக்கான தீர்வைப் பெற்றுத்தருகின்ற ஒரு நிலைப்பாட்டை கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ளவேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

அங்கிருக்கின்ற பிரதேசங்கள் யுத்தத்தினால் பாதிக்கப்பட்ட பிரதேசங்களாகும். அந்தவகையில், யுத்த காலத்திற்கூட அங்கே குடியிருந்த மக்களை, இப்பொழுது "இந்த இடம் உங்களுடைய இடமல்ல; நீங்கள் இங்கிருந்து எழும்பவேண்டும்" என்று சொல்வது எவ்வளவு வேதனையான ஒரு விடயம் என்பதை நீங்கள் உணரவேண்டும். ஆகையால், அங்கிருக்கின்ற மக்களுடைய நிலைமையைக் கருத்திற்கொண்டு அதற்கான ஒரு தீர்வைப் பெற்றுத்தரவேண்டும் என்று கௌரவ அமைச்சர் அவர்களிடம் வலியுறுத்தி, எனது உரையை முடித்துக் கொள்ளுகின்றேன். நன்றி.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට කෙටි පිළිතුරක් දෙන්න ඔබතුමාගේ අවසරය ලබා දෙන්න.

ත්‍රිකුණාමලයට ජලය සපයන නළ පද්ධතිය අලුතෙන් එළීමට දැන් ටෙන්ඩර් කැඳවා තිබෙනවා. ඒ ටෙන්ඩර් එක ඉක්මනට අපි ලබා දෙනවා. ඒ වාගේම කන්තලේ පිරිපහදුවේ capacity එක වැඩි කරන්නත් අපි ටෙන්ඩර් කැඳවා තිබෙනවා. ඒ ටෙන්ඩර් එක ගත්තාට පස්සේ එහි වැඩ පටන් ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.17]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අපි ප්‍රධාන වශයෙන් වරාය හා නාවික අමාත්‍යාංශයේත්, ඒ වාගේම ජල සම්පාදන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳව කථා කරනවා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ජල සම්පාදන විෂයභාර කැබිනට් අමාත්‍ය ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා, අපේ රටේ ජීවත්වන වතු ප්‍රජාව වෙනුවෙන් මේ සභාව තුළ දැඩි ලෙස, දිගින් දිගටම තමන්ගේ අදහස් ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම වතුකරයේ ජනතාවගේ රුපියල් දාහේ දෛනික වැටුප පිළිබඳව පසුගිය දවස්වල වතුකරය තුළ ඇති වූ නොසන්සුන්තාව - කළමනාකාරිත්වය හා වතු කම්කරුවන් අතර ඇති වූ ප්‍රශ්නය- පිළිබඳව, ඒ වාගේම වතුකරයේ නිවාස පිළිබඳව එතුමා දැඩිව තමන්ගේ ස්ථාවරය මේ සභාව තුළ ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට තවත් කාරණාවක් කියන්න කැමැතියි. ඔබතුමා අනෙකුත් අමාත්‍යාංශ ගැන ඔබතුමාගේ ස්ථාවරය ඉදිරිපත් කළා. ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා වතුකරයේ ජනතාවට විශාල කාර්ය භාරයක් කරන්න අවස්ථාව තිබෙනවා. මම එහෙම කියන්නේ මේ නිසායි. ප්‍රවාහනය වෙන්න පුළුවන්, සෞඛ්‍යය වෙන්න පුළුවන්, නිවාස වෙන්න පුළුවන් මේ ජාතික ප්‍රවාහයෙන් වතුකරයේ ජනතාව අයින් කරලා තිබෙනවා; වෙන් කරලා තිබෙනවා. අද දවස වෙනකොට ජල සම්පාදනය සම්බන්ධයෙනුත් සිදුවන්නේ ඒ දෙයම තමයි. ජල සම්පාදන ජාතික වැඩ පිළිවෙළ තුළ වතුකරයේ කිසිම ප්‍රදේශයකට ඒ අවශ්‍ය පානීය ජලය ලබා ගැනීමේ අවස්ථාව සලසා දීලා නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, පිරිසිදු පානීය ජලය ලබාදීමේ විශේෂ වූ වැඩසටහනක් වතුකරයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න කියලා. ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන විශේෂ ව්‍යාපෘතියක් ඒ සඳහා යෝජනා කරලා ක්‍රියාත්මක කරන්න, ගරු ඇමතිතුමනි. ඒක ක්‍රියාත්මක කිරීම ඔබතුමාගේ අතේ තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජල මූලාශ්‍ර තිබෙන්නේ වතුකරයට සම්බන්ධ කඳු ප්‍රදේශවලයි. ඒ ජල මූලාශ්‍රවල ඉඳලා තමයි නගරයට, ඒ වාගේම ග්‍රාමීය ප්‍රදේශවලට පානීය ජලය ලබා ගන්නේ. නමුත්, ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට ඒ පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ අවස්ථාවක් නැහැ. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, ප්‍රජා ජල යෝජනා ක්‍රම ගැන. ප්‍රජා ජල යෝජනා ක්‍රම තිබෙන්නේ, ග්‍රාමීය මට්ටමේ ජනතාවට අවශ්‍ය පානීය ජලය ලබා දෙන්න. නමුත්, ඒකට වතු ක්ෂේත්‍රය ඇතුළත් කර ගන්නේ නැහැ. පසුගිය අපේ රජය පැවැති කාලයේත් මහනුවර දිස්ත්‍රික්කය තුළ විශාල ප්‍රජා ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළා. ඒ හැම දෙයක්ම කළේ වත්තේ තිබෙන ජල මූලාශ්‍රය පාවිච්චි කරගෙන.

ඒවා පාවිච්චි කරලා ග්‍රාමීය ප්‍රදේශවලට ජලය ලබා දෙනවා. ග්‍රාමීය ප්‍රදේශවලට ජලය ලබා දෙන්න ඕනෑ. ඒ ස්ථාවරයේ අපි ඉන්නවා. ඒ සමානාත්මක අයිතිය වතුකරයේ ජනතාවටත් ලබා දෙන්න ඕනෑ. ප්‍රතිපත්තිමය වශයෙන් 'වතු' කියන එකත් ඇතුළත් කරලා ප්‍රජා ජල යෝජනා ක්‍රම වැඩිදියුණු කරන්න, ගරු ඇමතිතුමනි. වතුකරයේ තිබෙන පාසලක් වෙන්න පුළුවන්, රෝහලක් වෙන්න පුළුවන්, ඩිස්පෙන්සරියක් වෙන්න පුළුවන්, පොදු ස්ථානයක් වෙන්න පුළුවන්, ඒ කිසිම තැනක පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට අවස්ථාවක් නැහැ. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දුවක් අරගෙන ඒ සඳහා ව්‍යාපෘතියක් ඉදිරිපත් කරන්න කියලා.

මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ හාරගම ජල යෝජනා ක්‍රමය විශාල ව්‍යාපෘතියක්. ඒ ව්‍යාපෘතියේ කටයුතු අද සිදු වෙනවා. ඒ සංවර්ධනයත් එක්ක තමයි අපට ඒ ප්‍රශ්න විසඳා ගන්න පුළුවන් වෙන්නේ. ඒ යෝජනා ක්‍රමය කඩිනමින් අවසන් කර දෙන්න කියලාත් මේ අවස්ථාවේදී මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

இந்த அரசாங்கம் தேசிய பாதுகாப்பை மையப் படுத்தித்தான் ஆட்சிக்கு வந்தது என்பது எங்களுக்குத் தெரியும். ஆனால், இன்று நாட்டினது பாதுகாப்பும் கேள்விக்குறியாகி இருக்கின்றது; வீட்டினது பாதுகாப்பும் கேள்விக்குறியாகி இருக்கின்றது. இன்று, நாங்கள் துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சு பற்றி பேசுகின்றபோது, ஒரு விடயத் தைப் பற்றிக் குறிப்பிடவேண்டியுள்ளது. குறிப்பாக, சீனாவின் கழிவுகளைச் சுமந்துகொண்டு வந்திருக்கும் சீனக் கப்பல் இன்றும் இலங்கையின் கடற்பரப்பில் தரித்து நிற்பதானது எங்களுடைய தேசிய பாதுகாப்புக்கு அச்சுறுத்தலை ஏற்படுத்தக்கூடிய விடயமாகும். இது துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர் அவர்களின் மாவட்டமான களுத்துறைப் பிரதேசத்துக்கு அண்மித்த கடற்பரப்பிலேயே தரித்து நிற்கின்றது. ஆனால், இந்த அரசாங்கம் அது தொடர்பாக என்ன நிலைப்பாட்டைக் கொண்டிருக்கின்றது என இன்றுவரை தெரியாத நிலையிலேயே உள்ளது. ஆகவே, இது சீனாவினால் ஆளப்படுகின்ற ஒரு நாடு என்ற நிலையை அடைந்திருக்கின்றதா? எனக் கேட்க வேண்டியிருக்கின்றது.

ඊළඟට මම අහන්න කැමැතියි, චීන නැව පිළිබඳව. අපි දන්නවා, මීට මාස දෙකකට පමණ පෙර චීන කුණු ටික අරගෙන ආ නැවක් ශ්‍රී ලංකා මුහුදු ප්‍රදේශය තුළ තිබෙන බව. රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමා නියෝජනය කරන කළුතරට ඉතා ආසන්න මුහුදේ අද වනකොට ඒ නැව තිබෙන බවයි අපට ආරංචි වෙලා තිබෙන්නේ. ජාතික ආරක්ෂාව ඉදිරියට දාලා ආපු ආණ්ඩුවක්, මේක. නමුත්, අද වනකොට රටේ ආරක්ෂාවත් නැහැ, ගෙදර ආරක්ෂාවත් නැහැ. අද ගෑස් සිලින්ඩර පිපිරෙනවා. අනෙක් පැත්තෙන්, අපේ මුහුද ආක්‍රමණය කරගෙන චීන නැවක් ඇවිල්ලා නතර කරගෙන ඉන්නවා; චීන නැව නැංගුරම් දාගෙන ඉන්නවා. ඒ තුළ චීන කසළද තිබෙන්නේ, නැත්නම් රටට අභියෝගයක් වන දේවල් ද තිබෙන්නේ කියන ප්‍රශ්නය තිබෙනවා.

අපට මතකයි, පසුගිය කාලයේ "New Diamond" නැව ගිනි ගත්තා. එම නැව ගිනි ගැනීම නිසා අපට සිදු වූ අලාභයට ලබා ගත් වන්දිය මොකක්ද, එහි අද තත්ත්වය මොකක්ද? ඒ වාගේම මෑතකදී "X-Press Pearl" නැව ගිනි ගත්තා. ගරු ඇමතිතුමනි, ඔබතුමා වරාය හා නාවික අමාත්‍යාංශය භාර ගත් පසු දිගින් දිගටම මෙවැනි සිදුවීම් කීපයක් වුණා. ඉන් එක් සිදුවීමක් තමයි, "X-Press Pearl" නැව ගිනි ගැනීම. එම නැව ගිනි ගැනීම නිසා වරායත් ආශ්‍රිත මුහුදු ප්‍රදේශවලට සහ ඒ අවට ගොඩබිමට විශාල හානියක් වුණා. ඒ අලාභයට වන්දියක් ලබා ගන්නවා කිව්වා. ඒ හානි වෙච්ච ප්‍රදේශවල ජනතාවටත් වන්දි ලබා දෙනවා කිව්වා. ඒ සම්බන්ධයෙන් දැන් තත්ත්වය මොකක්ද කියා අපි අහනවා.

ඊළඟට, ඉතා භයානක රසායන ද්‍රව්‍ය සහිත චීන නැවක් හම්බන්තොට වරායට අවසරයක් නැතුව ඇතුළු වුණා. ඒ තත්ත්වයම තමයි කුණු ටික අරගෙන ආපු චීන නැවෙත් තිබෙන්නේ. ඒ චීන නැව දැන් නැංගුරම් දාලා තිබෙනවා. කවුරුවත් ඒ ගැන කථා කරන්නේ නැහැ. ඒ නැව තුළ කුණු තිබෙනවාද, ආයුධ තිබෙනවාද, එහෙම නැත්නම් රසායනික ද්‍රව්‍ය තිබෙනවාද කියා කවුද පරීක්ෂා කර තිබෙන්නේ? මේ නිසා අද ජාතික ආරක්ෂාව පිළිබඳ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනතාව කථා වෙනවා, පොහොර සහනාධාරය කපා හරින්න තමයි රසායනික පොහොර තහනම් කළේ කියලා. රසායනික පොහොර තහනම් කරලා, මේ රජය ඒක දැන් ගෙනියන්නේ සූදුවක් වාගේයි. රසායනික පොහොර තහනම් කරලා, ඒ වෙනුවෙන් විවිධ කටයුතු කරලා, අද වනකොට නැවත ඒ තහනම ඉවත් කරන තැනට ඇවිල්ලා තිබෙනවා. මේ රජය අද ඒකම ගෑස් සම්බන්ධ ප්‍රශ්නයේදීත් කරගෙන යනවා. දැන් අපට විශාල සැකයක් තිබෙනවා, මේ ප්‍රශ්නයේදී රජය ලිට්‍රෝ ගෑස් ආයතනයත් පාවිච්චි කරගෙන මේ රටට යම්කිසි විධියේ ප්‍රෝඩාවක් කරලා, ජනතාව අමාරුවේ දාලා තිබෙනවාද කියලා. ඒ ගැන අපට ප්‍රශ්න කරන්න වෙනවා. අද වනකොට අපි චීනයට යටත් වෙලා, චීනයේ කොලනියක් විධියට ක්‍රියාත්මක වන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ ගැන අග්‍රාමාත්‍යතුමා, ජනාධිපතිතුමා හෝ කැබිනට් අමාත්‍යවරු කථා කරන්නේ නැති; කට අරින්නේවත් නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ.

අපේ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා සභාවේ ඉන්න වෙලාවේ මම මේ කාරණය විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, වතුකරයේ ජනතාව පරිභෝජනයට ගන්නා තිරිඟු පිටි -පාන් පිටි- මිල මේ රජය ආවායින් පස්සේ රුපියල් 27කින් පමණ වැඩි කර තිබෙනවා. මෑතකදී පාන් පිටි කිලෝවක මිල රුපියල් 17.50කින් වැඩි කළා. මීට කලින් රුපියල් 10කින් වැඩි කළා. මේක විශාල ප්‍රශ්නයක්. මේ රජය දිගින් දිගටම ජනතාවගේ බඩට ගහන රජයක් බවට පත් වෙලා තිබෙන්නේ. ජනතාවට මේවා දරා ගන්න බැහැ. අපේ රටේ ජනතාවගේ ප්‍රධාන ආහාරය තමයි බත්. ඒ වාගේම පාන් පිටිවලින් සකස් කරන ආහාරත් ජනතාව පරිභෝජනයට ගන්නවා. අද හාල්වල මිලත් අහස උසට නැඟලා තිබෙන්නේ. දැන් පාන් පිටි මිලත් ඉහළ දාලා. මෙවැනි තත්ත්වයක් යටතේ ජනතාව කොහොමද ජීවත් වෙන්නේ කියන ප්‍රශ්නය අද අපට අහන්න වෙලා තිබෙනවා.

இது இந்த நாட்டிலே ஏற்பட்டிருக்கக்கூடிய மிக மோசமான நிலைமையாகும். எங்களுடைய மக்களின் இரண்டு பிரதான உணவுகள் அரிசி மற்றும் கோதுமை மா. இன்று அரிசியின் விலை பல மடங்கு கூடியிருக்கின்றது. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்ததன் பிறகு கோதுமை மாவின் விலை 10 ரூபாயால் அதிகரிக்கப்பட்டது. இப்போது மீண்டும் 17 ரூபாய் 50 சதத்தினால் அதிகரிக்கப்பட்டு, இரண்டு தடவைகளில் 27 ரூபாய் 50 சத விலை அதிகரிப்பினை இந்த அரசாங்கம் செய்திருக்கின்றது.

இந்த அரசாங்கம் மக்களை எந்த வகையிலும் நிம்மதியாக வாழவிடாத ஓர் அரசாங்கமாக மாறியிருக்கின்றது. இன்று நாள்தோறும் எரிவாயு - கேஸ் சிலிண்டர்கள் வெடித்துக் கொண்டிருக்கின்றன. ஒரு பக்கம் அன்றாடத் தேவைகளுக் குரிய அத்தியாவசியப் பொருட்களைக் கொள்வனவு செய்ய முடியாத துர்ப்பாக்கிய நிலையிலே இருக்கின்றபோது, மறுபக்கம் வீட்டிலே இருப்பதா அல்லது வீட்டுக்கு வெளியிலே இருப்பதா? சமைப்பதற்கு எரிவாயுவைப் பயன்படுத்த முடியுமா, முடியாதா? என்ற பல கேள்விகளுக்கு மத்தியிலே

[ගරු වේලු කුමාර් මහතා]

மக்கள் துன்புறுகின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. ஆகவே, இந்த அரசாங்கம் இனியாவது பொறுப்புள்ள அரசாங்கமாகச் செயற்பட வேண்டும் என்பதை மீண்டுமொரு தடவை ஞாபகப்படுத்துகிறேன்.

எங்களுடைய சமூகம் தொடர்பாக நீர் வழங்கல் அமைச்சர் கௌரவ வாசுதேவ நாணாயக்கார அவர்களின் நிலைப் பாட்டுக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன். கௌரவ அமைச்சரவர்களே, நான் முதலிலே குறிப்பிட்டது போன்று, தோட்டத்துறையிலுள்ள மக்களுக்குச் சுத்திகரிக்கப் பட்ட குடிநீரினை வழங்குவதற்கான விசேட திட்டத்தை நீங்கள் உங்களுடைய காலத்திலே உருவாக்கி, இலங்கையின் வரலாற்றிலே, குறிப்பாக எங்களது மக்களின் வரலாற்றிலே உங்களது பெயரையும் சேர்ப்பதற்குரிய - அடையாளப் படுத்துவதற்குரிய ஒரு வேலைத்திட்டத்தைச் செய்யுங்கள் என்ற அழைப்பை நான் உங்களிடம் விடுக்கிறேன். அதேபோன்று, எதிர்வரும் ஆண்டிலே துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர் அவர்களும் தனது பணிகளைச் சிறப்பாகச் செய்வதற்கு எங்களுடைய வாழ்த்துக்களைத் தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

දිවා ආහාර විවේකය සඳහා පස්වරු 1.00 දක්වා සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා**.**

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා ] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The Hon. Lalith Ellawala, please. You have ten minutes.

[අ.භා. 1.00]

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජලසම්පාදන අමාත්‍යාංශය, වරාය හා නාවික අමාත්‍යාංශය සහ තවත් රාජ්‍ය අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව තමයි අද දිනයේ අපි කථා කරන්නේ. මුලින්ම, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙම අමාත්‍යාංශ සඳහා ඉතා අවංක, පළපුරුදු, අත්දැකීම් බහුල අමාත්‍යවරුන් පත් කිරීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තුතිය ජනාධිපතිතුමාට පුද කරනවා. ජලසම්පාදන අමාත්‍යාංශය සඳහා පළපුරුදු, අත්දැකීම් බහුල නායකයෙකු වන අපේ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාත්, වරාය හා නාවික අමාත්‍යාංශය සඳහා අපේ දිස්ත්‍රික් නායක ගරු රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමාත්, ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා ලෙස සනත් නිශාන්ත මැතිතුමාත්, ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා ලෙස අපේ ජයන්ත සමරවීර මැතිතුමාත් පත් කර තිබෙනවා. එවැනි පළපුරුදු, අත්දැකීම් බහුල ඇමතිවරුන් එම අමාත්‍යාංශවලට පත් කිරීම පිළිබඳව මම නැවතත් අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය යථාර්ථයක් කරන්න, රටේ ජනතාවට සියයට 100ක් පිරිසිදු පානීය ජලය ලබා දෙන්න මෙවර අය වැයෙන් රුපියල් මිලියන 48,963ක මුදලක් වෙන් කර දීම පිළිබඳව මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් මගේ හද පිරි ස්තුතිය පුද කර සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රට මහා සාගරයෙන් වට වී තිබෙන්නේ. ඒ වාගේම ගංගා තුළින් රට හරහා මහා ජල කඳක් රැගෙන යනවා. හැබැයි, සති තුන හතරක් වර්ෂාව නැති වෙච්ච ගමන් අපේ ජනතාව බොන්න වතුර නැහැ කියලා කෑ ගහනවා. ඒකට හොඳ උදාහරණයක් මම කියන්නම්. කළුතර දිස්ත්‍රික්කය ගත්තාම, කළුතර දිස්ත්‍රික්කය හරහා යන්නේ කළු ගඟ. මේ කළු ගඟ අවට සිටින, කළු ගඟ දෙපැත්තේ සිටින -මීටර් 100ක දුරකින් ඉන්න- ජනතාව පවා සති තුන හතරක් පායපු ගමන්, "බොන්න වතුර නැතෝ" කියලා කෑ ගහනවා. මගේ ආසනයේ මිල්ලනිය ප්‍රදේශයේත් මේ ප්‍රශ්නය තියෙනවා. මම අද බෙහෙවින් සතුටු වෙනවා, ගරු ජල සම්පාදන අමාත්‍යතුමාත්, ඒ අමාත්‍යාංශයේ ලේකම්තුමා සම්බන්ධයෙනුත්. දක්ෂ ලේකම්වරයෙක් මේ අමාත්‍යාංශයේ ඉන්නේ. එතුමා අපේ ප්‍රදේශවලට ඇවිල්ලා ජල කළමනාකරණයෙහි ප්‍රගතිය ගැන සාකච්ඡා කළා. 2022, 2023 වෙනකොට කළුතර දිස්ත්‍රික්කයට සියයට 100ක්ම පිරිසිදු පානීය ජලය ලබා දෙන්න පුළුවන් කියන කාරණය මම සතුටින් මතක් කරන්න ඕනෑ.

මම මේ වෙලාවේ අපේ විපක්ෂය ගැනත් වචනයක් කියන්නම ඕනෑ. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සභාවේ නොහිටියත්, මේවා හැන්සාඩ් වාර්තාවලින් හෝ එතුමන්ලා දැක ගන්න ඕනෑ. එතුමන්ලා මෙම ගරු සභාවට ඇවිල්ලා හැම දාම කරන්නේ ආණ්ඩු පක්ෂයට බණින එක; දොස් කියන එක. එතුමන්ලා කවදාවත් ආණ්ඩු කරපු නැති අය විධියට තමයි කථා කරන්නේ. අද විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු නොයෙක් දේවල් කියනවා. ඒ සමහර අය අවුරුදු 25, 30 පාර්ලිමේන්තුව නියෝජනය කරපු අය. හැබැයි, ඒ කථා කරන කිසිවෙකුට බැරි වුණා, අපේ දිස්ත්‍රික්කයේ ජල කළමනාකරණය කරන්න. කළුතර දිස්ත්‍රික්කයේ හිටපු මගේ බොහොම හිතවත් නායකයා කිව්වා, අතිගරු ජනාධිපතිතුමා ඇතුළු රජය ෆේල් කියලා. මට කනගාටුවෙන් වුණත් කියන්න වෙනවා, කොයි කවුරුත් කථා කරනකොට තමන් ගැනත් ආපසු හැරිලා බලන්න ඕනෑ බව. අපේ හිටපු නායකතුමා ප්‍රවාහන අමාත්‍යාංශය භාර ගන්නකොට කිව්වා, "වාහනයේ රේඩියේටර් එකෙන් ගිහිල්ලා සයිලන්සර් එකෙන් එළියට එන්න මට පුළුවන්" කියලා. ඒ වුණාට අපි කියන්න ඕනෑ, අදටත් ප්‍රවාහන අමාත්‍යාංශය ගැන කියනකොට ජනතාව මතක් කරන්නේ අනිල් මුණසිංහ මැතිතුමා, ෆවුසි ඇමතිතුමා වාගේ අය බව. හැබැයි එතකොට කළුතර දිස්ත්‍රික්කයේ අපේ හිටපු නායකතුමාට තේරෙනවා ඇති, කවුද පාස්, කවුද ෆේල් කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කයිවාරු ගහන නායකයන්ට බැරි වුණාට, අද අපේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුතුව ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවටත්. රටේ ජනතාවටත් සියයට 100ක් පිරිසිදු පානීය ජලය ලබාදීමට කටයුතු කරන බව ඉතා සතුටින් මම මතක් කරන්න කැමැතියි.

අද විපක්ෂය අමතක කරන්න හදන යහ පාලනයේ ඉතිහාසයෙන් බිඳක් මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. අපට මතකයි, 2015 අවුරුද්දේ මේ රට යහ පාලන ආණ්ඩුවට භාර දෙනකොට තිබුණු සමස්ත ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 7.4යි. හැබැයි අපට මතකයි, යහ පාලන ආණ්ඩුවේ අවසාන කාලය වෙනකොට සමස්ත ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 11ක් බව. ඒ අනුව යහ පාලන ආණ්ඩුව අවුරුදු 5 අවසන් වෙනකොට රුපියල් ට්‍රිලියන 6කට වඩා ණය අරගෙන තියෙනවා. හැබැයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ අවුරුදු 9ටම අරගෙන තිබුණේ රුපියල් ට්‍රිලියන 5.2ක් විතර ණය ප්‍රමාණයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි නම් ඒ ගත්ත ණයවලින් වැඩ කළා. අවුරුදු 30ක් තිස්සේ මේ රටේ මහා යුද්ධයක් තිබුණා. ඒ යුද්ධය අපි අවසන් කළා. ඒ වාගේම අධිවේගී මාර්ග හැදුවා; වරාය හැදුවා; ගුවන්තොටුපොළ හැදුවා. අපේ ආණ්ඩු කාලය තුළ මේ රටට මහා සංවර්ධනයක් ගෙනාවා.

හැබැයි, අපි හදපු ඒවා විකුණපු එක තමයි යහ පාලන ආණ්ඩුව කළේ. හම්බන්තොට වරාය විකුණන කොට අපි ගිහිල්ලා උද්ඝෝෂණය කළාම, විරෝධය දැක්වූවාම අපට මොකක්ද කළේ? අපට කඳුළු ගෑස් ගහලා, වෙඩි තියලා, ගහලා පැන්නුවා; හිරේ දැම්මා. එහෙම කරලා හම්බන්තොට වරාය චීනයට විකුණලා දැම්මා. එදා කිව්වේ කොහොමද? අපට මතකයි, ඒ ආණ්ඩුවේ අය තමන් හඳුන්වා ගත්තේ කොහොමද කියලා. ආසියාවේ හොඳම මොළය තිබෙනවාය කිව්වේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට. හොඳම මුදල් ඇමතිවරයා කිව්වේ රවි කරුණානායකට. ඒ වාගේම හොඳම ආර්ථික ඔස්තාර් කිව්වේ හර්ෂ ද සිල්වා මැතිතුමාට. 'යකඩ මිනිසා' කිව්වේ පාඨලී චම්පික රණවක මැතිතුමාට. ඒ විධියට තමයි එතුමන්ලා හඳුන්වා ගත්තේ. හැබැයි ඒ සියලු දෙනාම -නඩයම- එකතු වෙලා මේ රට විනාශ කරපු එක තමයි කළේ. ඒ අය මේ රට එහෙම විනාශ නොකළා නම්, අපට මීට කලින් මේ ගොඩක් ප්‍රශ්න විසඳන්න තිබුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමන්ලා අපට අසත්‍ය චෝදනා එල්ල කළාට, මඩ ගැහුවාට අපට මතකයි එදා දූලාංජලී ප්‍රේමදාසලා රුපියල් පන්දාහේ හොර නෝට්ටු අච්චු ගැහුවාය කියලා අතටම අහුවුණා. අවසරයකින් තොරව ඒ පවුලේ අයගේ photos ගත්තාය කියලා ඒ cameraman මරා දැම්මා. ඒ වාගේ තත්ත්වයක් තමයි විපක්ෂ නායකතුමාගේ තාත්තා රට පාලනය කරනකොට තිබුණේ. ඒවා ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට විපක්ෂයට කියන්න මතක් වෙන්නේ එකම දෙයයි. ගමේ ගොඩේ කථාවක් තිබෙනවා නේ, "අහේතු කාලේන කජ්ජේන පුහුලං" කියලා. අපි දන්නවා, පුහුලම බිමට වැටෙනකොට මුලින්ම කජ්ජ තමයි වැටෙන්නේ. විපක්ෂ නායකතුමාට අපි මේ කාරණය කියන්න ඕනෑ. අපි අලුතෙන් පාර්ලිමේන්තුවට ආවේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාලය තුළ අපි දැකපු දෙයක් තිබෙනවා. විපක්ෂ නායකතුමා හැසිරෙන විධිය දැක්කාම අපිට කියන්න වෙනවා, කජ්ජ ගහේ තිබෙද්දී පුහුලම බිමට වැටුණත්, ඔය විධියට ක්‍රියා කරන විපක්ෂ නායකතුමාට නම් කවදාවත් මේ රටේ පාලනය භාර ගන්න බැහැ කියලා.

ජනතා විමුක්ති පෙරමුණ එදා ආණ්ඩු නැතුවයි හොරකම් කළේ. එදා ජනතාවගේ රත්තරන් ටික, මුතු මැණික් ටික, මුදල් කියන සියල්ල හොරකම් කළා. හොරකම් කරලා, තුන්-හතරදෙනා ට්‍රිලියන ගණන්වලින් ඒවා බෙදා ගත්තා. ඒවා බෙදා ගන්න බැරි වෙන කොට ජනතා විමුක්ති පෙරමුණේ අය එදා ගෝනිබිල්ලෝ වාගේ ගිහිල්ලා තමන්ගේ රෝහණ විජේවීර සහෝදරයාව පාවා දීලා, පෙන්වලා, මරා දැම්මා. එහෙම අය තමයි ඉන්නේ. ඊළඟ මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණට ඔය තිබෙන ආසන තුනත් නැති වෙන බව මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The next speaker is the Hon. Vijitha Herath. You have 12 minutes.

[අ.භා. 1.11]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පුහුලම කඩා ගත්තාම ඔහොම තමයි. තමන්ගේ දිස්ත්‍රික්කයේ නායකයා කියන එක්කෙනාට "රත්තරන්" කියන නම නිකම්ම හැදුණේ නැහැ. කෝච්චියේදී මාල කඩලා, රත්තරන් කඩලා තමයි "රත්තරන්" කියන නම හැදුණේ. ගරු මන්ත්‍රීතුමනි, "රත්තරන්" ගැන කථා කළොත්, ඔබතුමාටයි මටයි හෙට එළිවෙන තුරු කථා කරන්න වෙයි. රත්තරන් කවුද, තමන්ගේ හාම්පුතා කවුද කියන එක මුළු රටම දන්නවා. ඒක නිසා පුහුලම කඩා ගත්තාම තමන්ට දැනෙන්නේ නැහැ, තමන් පුහුලම කඩාගෙන ඉන්නේ කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හම්බන්තොට වරාය චීනයට විකුණලා, ඒ වරායට බදු සහන දෙන්න පාර්ලිමේන්තුවට ගෙනාවා, විශේෂ ආර්ථික ව්‍යාපෘති පිළිබඳ පනත් කෙටුම්පතක්. මහින්ද රාජපක්ෂ මැතිතුමා, නාමල් රාජපක්ෂ මැතිතුමා, ඔය උද්ඝෝෂණය කළාය කියන මන්ත්‍රීවරු කවුරුවත් ඒ පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය දෙන්න හිටියේ නැහැ. එදා ඒකට විරුද්ධව අපි තමයි ඡන්දය දුන්නේ. විශේෂ බදු සහන දෙන්න මලික් සමරවික්‍රමලා එදා ගෙනාපු පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය දෙන්න පක්ෂයක් විධියට ඔබතුමන්ලා හිටියේ නැහැ. ඔබතුමන්ලා ඉතිහාසය දන්නේ නැහැ, පිට ඉඳපු නිසා. ඒවා ඉගෙන ගන්න. වරාය විකුණනවාට අපි එදා විරුද්ධ වුණා වාගේම අදටත් විරුද්ධයි. ඒවා විකුණනවාට විරුද්ධව වෙනවා කියලා විතරක් නොවෙයි, විකුණපුවා නැවත පවරා ගන්නවා කියලායි ඔබතුමන්ලා බලයට ආවේ. එදා විහාරමහාදේවි උද්‍යානයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා කිව්වා, "ගන්න එපා මේ ජාතික සම්පත්, අපි බලයට ආවාට පස්සේ නැවත පවරා ගන්නවා." කියලා.

එහෙම කියලා ඇවිල්ලා තමයි, වරායේ නැඟෙනහිර ජැටිය ඉන්දියාවට විකුණන්න ගියේ; අන්තිමට බටහිර ජැටිය ඉන්දියාවට විකුණුවේ. ඒක කොහොමද? ඒක හොඳයිද? *[බාධා කිරීමක්]* ඒක නේ. ඒ නිසා කථා කරනකොට පුහුලම කොහේද තිබෙන්නේ කියලා දැනගෙන කථා කරන්න. තමන් තේරුම් ගෙන කථා කරන්න. කොයි ආණ්ඩුවෙන් හෝ ජාතික සම්පත් විකුණනවා නම් ඒක ජාතික අපරාධයක්. ඒකට අපි එදාත් විරුද්ධයි; අදත් විරුද්ධයි. ඒ ප්‍රතිපත්තියේ අපි හැම දාම ඉන්නවා. ජාතික අවශ්‍යතා වෙනුවෙන්, විශේෂයෙන් අපේ රටේ ජාතික ආරක්ෂාව සහ ජාතික ආර්ථිකය ගොඩ නැඟීමේදී මේ සම්පත් ආරක්ෂා කරගත යුතුයි කියන ස්ථාවරයේ ඉඳගෙන තමයි අපේ මැදිහත්වීම කරන්නේ.

අද ජලසම්පාදන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවත් සාකච්ඡා කරනවා. දොම්පේ ආසනයේ මිලාන් ජයතිලක මන්ත්‍රීවරයා ගෙදර මොකක් හෝ අවුලක් වෙලා ඇවිල්ලාද කොහෙද, උදේ වරුවේ අපිත් මේ සභාවේ නැති වෙලාවේ හිටපු ගමන් අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ නම කියලා මොනවාද කියලා තිබුණා. අපි ඒ වෙලාවේ මේ සභාවේ සිටියේ නැහැ. එතුමා පාළු ගෙයි වළං බිඳලා තිබුණා. එතුමාගේ බාප්පා 1971 ඉඳලා ජනතා විමුක්ති පෙරමුණේ හිටපු හොඳ ක්‍රියාකාරී පුද්ගලයෙක්. මම මිලාන් ජයතිලක මන්ත්‍රීතුමාට කියනවා, ජේවීපී එක කටයුතු

[ගරු විජිත හේරත් මහතා]

කළේ කොහොමද කියලා බාප්පාගෙන් අහගන්න; එහෙම නැත්නම් තාත්තාගෙන් -රාළහාමිගෙන්- අහගන්න කියලා. එතුමා මේ සභාවට ඇවිල්ලා ජනතා විමුක්ති පෙරමුණට මඩ ගහනවා. ජනතා විමුක්ති පෙරමුණ සම්බන්ධයෙන් විවේචන එන්නේ ඇයි? අද දරාගන්න බැහැ. තමන්ගේ බැරිකම විවෘතව හෙළිදරව් කරනකොට ඒකට මුහුණ දෙන්න බැරිකමට තමයි උන්නැහේලා ඇවිල්ලා මෙහෙම කථා කරන්නේ. එතුමා නියෝජනය කරන දොම්පේ ආසනයේ මිනිසුන්ට අද බොන්න වතුර ටිකක් නැතුව ඉන්නවා. ඒ නිසා ජේවීපී එකට මඩ ගහ-ගහ ඉන්නේ නැතුව, ඒ ගැන බලන්න කියලා මම එතුමාට කියනවා. අවුරුදු 10ක්, අවුරුදු 15ක් තිස්සේ ඒ මිනිසුන්ට බොන්න වතුර ටිකක් නැතුව ඉන්නවා. කඳු උඩ ඉන්න ජනතාවට ජල පහසුකම් ලබා දෙන්න කිසිම ආණ්ඩුවක් සමත්වෙලා නැහැ. පරකඩමුල්ල, මඩේපොළවත්තේ මිනිස්සු අවුරුදු 15ක කාලයක් තිස්සේ වතුර නැතිව ඉන්නවා. කිසිම ආණ්ඩුවකින් ඔවුන්ට තවම වතුර ටික හම්බවෙලා නැහැ කියන එක මම ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාට අවධාරණයෙන් මතක් කරනවා. බස්නාහිර පළාතේ කළුතර, කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කවල එවැනි ප්‍රදේශ ගණනාවක් තිබෙනවා. රටේම තිබෙනවා විශාල වශයෙන්. නිකම් මඩ ගහ-ගහ ඉන්නේ නැතුව ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න. මේවා මඩ ගහපු මන්ත්‍රීවරයාගේ දොම්පේ ආසනයේ දැනටම තිබෙන ප්‍රශ්න. වහරක, පුවුපාගල, කුරුඳුහේන, බඳුවත්ත, මණ්ඩාවල උතුර, මණ්ඩාවල දකුණ යන ප්‍රදේශවල මිනිසුන්ට බොන්න වතුර නැහැ. ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉන්නේ ආණ්ඩු පක්ෂයේ. ඉතින්, ඇමතිතුමාට කියලා කරුණාකර ඒ ප්‍රදේශවල ජනතාවට බොන්න වතුර ටික අරගෙන දෙන්න. ජේවීපී එකට මඩ ගහන එක වෙනම කරගන්න.

විශේෂයෙන්ම මණ්ඩාවල ප්‍රදේශයේ ජනතාව අවුරුදු ගණනාවක් තිස්සේ වතුර නැතුව ඉන්නවා. ඒ ප්‍රදේශයට කිසිම ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ වාගේම පරකඩමුල්ල, මඩේපොළ වත්ත කියන්නේ කඳු සහිත ප්‍රදේශයක්. ඒ ප්‍රදේශවල ජල ව්‍යාපෘතියක් කරන්න ගියාම ටිකක් අමාරු බව ඇත්තයි. ඒ ප්‍රදේශයේ ජනතාවට තමන්ගේ අවශ්‍යතා සඳහා වතුර ටික ලබාගන්න කිසිදු ක්‍රමයක් ඇතිවෙලා නැහැ. විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක වුණත්, ප්‍රාදේශීය වශයෙන් ආසනවල කෙළවර දුෂ්කරතා ඇතිව ජීවත්වන, වතුර ප්‍රශ්නයට විශාල වශයෙන් මුහුණ දෙන ජනතාව ඉන්නවා. ඒ ජනතාව වෙනුවෙන් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් මැදිහත්වෙන්න, ගරු ඇමතිතුමනි.

නාගස්හන්දිය ප්‍රදේශයේ ප්‍රජා ජල ව්‍යාපෘතියක් තිබෙනවා. හැබැයි, පායන කාලයට ඒකේ වතුර හිඳෙනවා, වහින කාලයට වතුර තිබෙනවා. වහින කාලයට කොහොමත් වතුර ගන්න පුළුවන්. පායන කාලයට තමයි ඇත්තටම මේ ප්‍රශ්නය තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙනුත් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

වතු ජනතාවගේ පානීය ජල පිළිබඳ ප්‍රශ්නය ගැනත් මම කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ රටේ වැඩිම පීඩාවට පත්වන, දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාවක් ඉන්නේ වතුකරයේ කියලා ඔබතුමාත් දන්නවා. ඒ අයට වැටුප හරියාකාරව ලැබෙන්නේත් නැහැ. දැන් පාන්පිටි මිල රුපියල් 10කින් හා රුපියල් 17.50කින්, ඒ කියන්නේ, රුපියල් 27.50කින් ඉහළ ගිහින් තිබෙනවා. ඒ නිසා ඔවුන්ට අද රොටියක් කන්න විධියක් නැහැ. ඔවුන්ගේ ප්‍රධාන ආහාරය රොටි. අද පාටිත් නැහැ, පෙතිත් නැහැ. අද ඔවුන් ඉතාම අසරණ තත්ත්වයට පත්වෙලායි ඉන්නේ. ඒ අයට බොන්න වතුර ටිකවත් හරියාකාරව ලැබෙන්නේ නැහැ. ඔවුන්ට වතුරත් නැහැ, පෙතිත් නැහැ, රොටිත් නැහැ, විදුලියත් නැති වෙනවා. ඒක බරපතළ ප්‍රශ්නයක්. ඇත්තටම ගත්තොත්, වතුකරයේ ජනතාව තමයි අපට ප්‍රධාන අපනයන ආදායම ගෙනෙන්නේ. ඒ ප්‍රදේශවලට පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක වීම ප්‍රාදේශීය සභා හරහා හෝ ජල සම්පත් මණ්ඩලය හරහා හෝ නිවැරැදිව සිද්ධ වෙන්නේ නැහැ. වතුකරයේ තිබෙන වතුර ටික ඒ වතුවල ඉන්න ජනතාවට දෙන්නේ නැතුව වෙනත් ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් ව්‍යාපෘති සඳහා ලබා දෙනවා. ඒක, විශේෂයෙන්ම වතුකරයේ ජනතාව මුහුණ දෙන ලොකු ප්‍රශ්නයක්. මම ගරු ඇමතිතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා මැදිහත් වීමක් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද නිවාසවලට පානීය ජලය සපයනවා වාගේම, වරාය සම්බන්ධයෙනුත් කටයුතු කරනවා වාගේම, අපේ රටට ගෑස් ගෙන්වීමේදී මතුවෙලා තිබෙන අර්බුදය ගැනත් වැඩි අවධානයක් යොමු කරන්න වෙනවා. ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ සභාපතිවරයා පැහැදිලිව කිව්වා, "ගෙනාපු නැව ගොඩබාගන්න විධියක් නැහැ. ඒක පිටුපස මහා දූෂණ, හොරකම්, වංචා තිබෙනවා. දූෂිත ජාවාරම් කණ්ඩායමක් ඉන්නවා. ඒ නිසා ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා" කියලා. නැවෙන් ගෑස් ටික බාගන්න බැරි වුණෙත් ඒ ප්‍රශ්නය නිසාය කිව්වා. එහෙම නම් ඒකේ වගකීම තිබෙන්නේ ඔබතුමන්ලාට. ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ සභාපතිතුමා ඔබතුමන්ලා පත් කරපු කෙනෙක්. එතකොට එතැන කවුරු හෝ මාෆියාවක් මෙහෙයවනවා නම්, එක්කෝ ඒ හිටපු සභාපති වෙන්න පුළුවන්. හිටපු සභාපති අනිල් කොස්වත්ත මහත්මයා දැන් ඉන්නේ රක්ෂණ සංස්ථාවේ Director Board එකේ. ඒ කියන්නේ ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ හිටපු සභාපති දැන් ඉන්නේ ඊට උඩින් තිබෙන මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ. හිටපු සභාපතිවරයාගේ දූෂණ, වංචා තිබෙනවා; නීතිඥ ගාස්තු විතරක් කෝටි ගණනක් වියදම් කර තිබෙනවා කියලා දැන් ඉන්න සභාපතිවරයා චෝදනා එල්ල කරනවා. මේ චෝදනා විමර්ශනය කරන මව් ආයතනය -රක්ෂණ සංස්ථාව- ඊට ඉහළින් තිබෙන්නේ. එතකොට, මේ පරීක්ෂණ කවදාවත් සිද්ධ වෙයිද? වෙන්නේ නැහැ. එතැනම ප්‍රශ්නයක් තිබෙනවා.

අද තවත් ලොකු ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ තමයි නිවාසවල තිබෙන ගෑස් සිලින්ඩරවලින් ගිනි ජාලා මතුවෙන එක. ඇත්තටම ඔබතුමන්ලා බලයට ආවේ රටේ ජාතික ආරක්ෂාව සපයන්න. නමුත් අද කුස්සියේ ආරක්ෂාවත් නැහැ. ජාතික ආරක්ෂාව කොහොමද සපයන්නේ, කුස්සියේ ආරක්ෂාව දීගන්න බැරි ආණ්ඩුවක්? අද හැම ගෙදරකම -සල්ලි තිබෙන, සල්ලි නැති, දුප්පත්, පොහොසත් හැම ගෙදරකම- අය ඉන්නේ මාරාන්තික බියකින්; කොයි වෙලාවේ ගෑස් සිලින්ඩරයේ ගිනි පත්තුවෙයිද කියලා බයෙන්. මේ ගැන හොයන්න දැනට කමිටුවක් පත් කරලා සති දෙකකින් ඒ සම්බන්ධයෙන් වාර්තාවක් දෙන්න කියලා දැනුම් දීලා තිබෙනවා. සති දෙකකින් වාර්තාව එනකොට ගෙවල්වල කුස්සිවල ගෑස් සිලින්ඩර පුපුරලා, ගිනි අරන් ඉවරයි. මෙයට ක්ෂණික මැදිහත් වීමක් අවශ්‍යයි. ජනාධිපතිවරයා වහාම නියෝග දෙන්න ඕනෑ. මේ මොහොත ගත්තොත්, මේ මතභේදයට තුඩු දෙන ගෑස් බෙදා හැරපු ප්‍රමාණයක් තිබෙනවා. ඒ ගෑස් සිලින්ඩර ටික වහාම එකතු කරන්න ඕනෑ. එකතු කරලා ඒ වෙනුවට විකල්ප ගෑස් සිලින්ඩර ලබා දෙන්න. ඒක තමයි ඉස්සෙල්ලාම කරන්න ඕනෑ. එහෙම කරන්නේ නැතිව මේ ප්‍රශ්නය ඇදෙන්න දීලා, ඊට පස්සේ කමිටුවක් පත් කරලා ඒ වාර්තාව එනතුරු සති දෙකක් තිස්සේ බලාගෙන ඉඳලා, වාර්තාව ආවාට පසු, ඒ ගැන analyse කරලා ක්‍රියාමාර්ග ගන්නකොට මාසයක් විතර යනවා. එතකොට වෙන්න ඕනෑ දේ වෙලා ඉවරයි. ඒ නිසා මේ ප්‍රශ්නයට රජයේ පාර්ශ්වයෙන් ක්ෂණික ප්‍රතිචාරයක් අවශ්‍යයි.

මේ ගෑස් කථාව පිටුපස තිබෙන කතන්දර ගොඩක් අද සාකච්ඡාවට ලක් වෙලා තිබෙනවා නේ. අප්‍රේල් මාසයේ 28වැනි දා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙන් කරපු ඉල්ලීමට ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ එවකට සිටි සභාපති අනිල් කොස්වත්ත මහත්මයා ලිපියක් යවනවා. ඒ ලිපිය යවන්නේ යූ.ඒ. රත්නසිරි, අධ්‍යක්ෂ ජනරාල්, සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයට. ඒ ලිපියේ ඉතා පැහැදිලිව කියනවා, මේ ගෑස් සිලින්ඩරවල බියුටේන්, ප්‍රොපේන් සංයුතිය වෙනස් කළා කියලා. ඒ විතරක් නොවෙයි, සංයුතිය වෙනස් කරන්න කලින් ගෑස් සිලින්ඩරයේ බරත් වෙනස් කළා කියනවා. කිලෝග්‍රෑම් 12.5ක් තිබුණු ගෑස් සිලින්ඩරයේ බර ප්‍රමාණය කිලෝග්‍රෑම් 9.3ට අඩු කළා. හැබැයි, අඩු කරපු ගෑස් සිලින්ඩරයේ බර කිලෝග්‍රෑම් 9.3යි කියලා සඳහන් කළේ නැහැ. ඒ වෙනුවට ඒකේ සඳහන් කළා, ලීටර් 18යි කියලා. බැලූ බැල්මට පේනවා, ලීටර් ගණන වැඩි වුණාම, 12.5, 18ට වැඩි වුණා කියලා. නමුත් ඇත්ත කථාව ඒක නොවෙයි. බරින් අඩු කළා. බරින් අඩු කරලා කිලෝග්‍රෑම් 9.3හි තිබෙන ලීටර් ගණන තමයි සඳහන් කළේ. ඒ ගැන ලිට්රෝ ගෑස් ලංකා සමාගමෙන් යවන පැහැදිලි කිරීමේදී එතුමන්ලා ඒකේ තිබෙන වාසි කිහිපයක් ගැනත් සඳහන් කරලා තිබෙනවා. එතුමන්ලා කියනවා, "මේකේ තාප ජනන අගය සාපේක්ෂව ඉහළ අගයක් ඇත. ඉවුම් පිහුම් කාර්යක්ෂමව සිදුකළ හැක" කියලා. ඒ කියන්නේ, කිලෝග්‍රෑම් 9.3ට අඩු කළාට පස්සේ. එකම පරිමාව තිබෙන සිලින්ඩරයේ කිලෝග්‍රෑම් ප්‍රමාණය අඩු කළාම එතැන තිබෙන space එක -හිස් අවකාශය- වැඩි වෙනවා. ඒ තුළින් තාප ජනන අගය සාපේක්ෂව ඉහළ අගයක් ගන්නවා. ඉවුම් පිහුම් කාර්යක්ෂමව සිදු කරන්න පුළුවන් කියනවා. ඒ වාගේම "වැඩි වාෂ්ප පීඩනය නිසා ස්ථාවර ගිනි දැල්ලක් ඇති වේ. " කියලා කියනවා. කලින් තිබු එකේ අඩු වාෂ්ප පීඩනය නිසා අස්ථාවර ගිනි දැල්ලක් තමයි ඇති වෙන්නේ. මෙහෙම වෙනස් කළාට පස්සේ වැඩි පීඩනය නිසා ස්ථාවර ගිනි දැල්ලක් ඇති වෙනවා කියනවා.

ඊළඟට එහි කියා තිබෙනවා, "පරිසරයේ උෂ්ණත්වය අඩු වීමත් සමඟ ගෑස් වාෂ්පීකරණය අඩු වී ගොස් පාවිච්චි කිරීමට නොහැකිව LPG සිලින්ඩරයේ ඉතිරි වේ" කියලා. ඒ කියන්නේ, කලින් තිබුණු එකේ සියල්ල අවසන් වෙන්නේ නැතිව ගෑස් යම් ප්‍රමාණයක් ඉතිරි වෙනවා. ඒක අවාසියි. හැබැයි, කිලෝග්‍රෑම් ප්‍රමාණය අඩු කළාට පස්සේ ඉහළ ප්‍රොපේන් සංයුතියක් ඇති නිසා ගෑස් වාෂ්පීකරණය හොඳින් සිදු වන බවත්, සිලින්ඩරයේ ගෑස් ඉතිරි නොවී සම්පූර්ණයෙන් පාවිච්චි කළ හැකි බවත්, අන්න ඒ වාගේ තත්ත්වයන් නිසා ප්‍රොපේන් සංයුතිය වැඩි කළ බවත්, බියුටේන් සංයුතිය අඩු කළ බවත් කියනවා. මේ ප්‍රමාණයන් වෙනස් කිරීම පිළිබඳව ලිට්රෝ ගෑස් සමාගම නීත්‍යානුකූලව මේ ලිපි මඟින් ඉතා පැහැදිලිව පිළිගන්නවා. ඒ බව පිළිගන්නවා විතරක් නොවෙයි, මේ බලන්න එතුමන්ලා මෙන්න මේ ප්‍රස්තාරයත් ඉදිරිපත් කරනවා. මේ ප්‍රස්තාරයේ පෙන්වනවා උෂ්ණත්වය, උෂ්ණත්වයට සාපේක්ෂව පීඩනය වෙනස් වෙන්නේ කොහොමද කියලා. ප්‍රස්තාරයේ යටම තිබෙන්නේ 0ත් 100ත් දක්වා ප්‍රොපේන්-බියුටේන් අනුපාතය. සෙන්ටිග්‍රේඩ් අංශක 30දී ප්‍රොපේන් - බියුටේන් 50:50 ආවාම බාර් 6ක පීඩනයක් ඇති වෙනවා; kilopascal 600ක පීඩනයක් ඇති වෙනවා. ඒ කියන්නේ, පීඩනය වැඩි වෙනවා. ලිට්රෝ ගෑස් සමාගම ඒ ලිපියට යවපු පිළිතුරට අදාළ මේ පැහැදිලි කිරීම තුළ ඉතා පැහැදිලිව සඳහන්ව තිබෙනවා ප්‍රොපේන්-බියුටේන් සංයුතිය වෙනස් කළාට පස්සේ පීඩනය වැඩි වුණා කියලා. ප්‍රෙපේන්වල පීඩන ධාරිතාව වැඩියි. එහෙම නම්, ප්‍රොපේන් ප්‍රමාණය වැඩි කළාම පීඩනයේ වැඩි වීමක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රොපේන්වල මිල උච්චාවචනය වෙනවා. ප්‍රොපේන්වල මිල වැඩිම නැහැ, හැම වෙලාවේම. ලෝක වෙළෙඳ පොළේ විවිධ කාලවලදී -ශීත කාලවලදී, උෂ්ණ කාලවලදී- ප්‍රොපේන් මිල අඩු වැඩි වෙනවා. මේ කියන කාලයේත් ප්‍රොපේන් මිල සාපේක්ෂව අඩුයි. ඒ අඩු වීමත් එක්ක ප්‍රොපේන් ප්‍රමාණය වැඩි කරලා, ගෑස් සිලින්ඩරය රුපියල් 100කින් අඩු කිරීමක් පවා කරනවා. රුපියල් 100ක් අඩු කරනවා නේ. රුපියල් 1,493ට තිබුණු එක රුපියල් 1,395ට අඩු කරනවා. ඒවා පාරිභෝගිකයන්ට වාසි විධියට දක්වමින් තමයි ලිට්රෝ ගෑස් සමාගම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට, සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයට මේ ලිපිවලින් කරුණු පැහැදිලි කරන්නේ.

එතැනදී සිද්ධ වෙච්ච ක්‍රියාවලිය රටේ කවුරුත් දන්නවා. කිලෝග්‍රෑම් 12.5ට තිබ්ච්ච සිලින්ඩරය කිලෝග්‍රෑම් 9.3ට අඩු කළාම ඒ සිලින්ඩරයට liquid විධියට දාන ප්‍රොපේන් සහ බියුටේන්වල ප්‍රමාණය අඩු වීමක් වුණා. එතකොට හිස් අවකාශය වැඩියි. ප්‍රොපේන් ප්‍රමාණය වැඩි වුණාම පීඩනයත් වැඩියි. කවුරුත් ඉතා පැහැදිලිව විද්‍යාත්මකව පිළිගන්නවා ප්‍රොපේන් වැඩි කළාම පීඩනය වැඩියි කියලා. ඒ පීඩනය වැඩි වීමට සාපේක්ෂව regulator එක වෙනස් කළාද? ඒ අනෙකුත් තාක්ෂණික උපකරණ වෙනස් කළාද? washer එක වෙනස් කළාද? ඒවා කරලා නැහැ. අපේ රටේ තවමත් regulators පිළිබඳව කිසිදු ප්‍රමිතියක් නැහැ. වෙළෙඳ පොළේ regulators තිබෙනවා, ඒ ඕනෑම එකක් ගෙනැල්ලා සවි කර ගන්නවා. සංයුතිය වෙනස් කරන්නේ නැති කාලයේදී මේක ප්‍රශ්නයක් වුණේ නැහැ. හැබැයි, සංයුතිය වෙනස් කළාම ඒ තිබෙන regulator එක, ඒ තිබෙන washer එක, ඒ තිබෙන උපකරණ ටික, වැල් කට මේ පීඩනයට ඔරොත්තු දෙනවාද? එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. හරි පැහැදිලියි, ඒක ඔරොත්තු දීලා නැති බව. ඒ නිසා තමයි උතුරලා යන්නේ. ඒ නිසා තමයි සබන් පෙණ එන්නා වාගේ ඒ liquid එක උතුරලා එළියට එන්නේ. ඒකෙන් තමයි ගෑස් ලීප් ගිනි ගන්නේ.

මීට බොහෝ කාලයකට පෙර ගෑස් නිපදවීමේ සහ බෙදා හැරීමේ අයිතිය Ceylon Petroleum Corporation එකට තිබුණා. ඒ කාලයේ සමහර ලොකු restaurants, ලොකු ආපනශාලා තමන්ගේ පහසුව සඳහා ලොකු සිලින්ඩරවලට regulator එකක් නැතිව කෙළින්ම වැල් එක ගහලා උදුනට සවි කරලා ගෑස් ලබා ගත්තා අපට මතකයි. ඒක නීති විරෝධී වැඩක්. ඒ කාලයේ Ceylon Petroleum Corporation එක ගිහින් වැටලීම් කරලා ඒවා අල්ලලා තහනම් කළා. දැන් ගෙවල්වල ගෑස් පාවිච්චි කරන අයට එහෙම කරගන්න බැහැ. මොකද, regulator එක නැතිව පාවිච්චි කරන එක අනතුරුදායකයි. ඒ ගොල්ලන් regulator එකක් එක්ක තමයි ගෑස් සිලින්ඩරය පාවිච්චි කරන්නේ. හැබැයි, වෙළෙඳ පොළේ තිබෙන මේ regulator එක මේ ගෑස් පරිමාවේ සංයුතිය වෙනස් කිරීමට ගැළපෙන්නේ නැහැ. එතැන ගැටලුවක් තිබෙනවා. ඒක හොඳටම ඔප්පු වන අවස්ථා තිබෙනවා. ගෑස් සිලින්ඩරයේ බර අඩු කළාට පස්සේ අපි ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළා. අපි ඒ සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න ඇහුවා. රාජ්‍ය ඇමතිතුමා උත්තර දුන්නා. ඒ වෙලාවේ කිව්වේ සංයුතියේ කිසිදු වෙනසක් නැහැ කියලා. පස්සේ කිව්වා සංයුතිය වෙනස් කළා කියලා. නමුත්, කිලෝග්‍රෑම් 9.3ට අඩු කළ ගෑස් සිලින්ඩරවල යම් ප්‍රමාණයක් ඒ වන කොටත් වෙළෙඳ පොළට නිකුත් කරලා තිබුණා. නැවත ඒ පිළිබඳව උසාවි ක්‍රියාමාර්ග ගත්තා; ඊට විරුද්ධව නඩු ක්‍රියාමාර්ගවලට ගියා.

ඒ නඩු ක්‍රියාමාර්ගවලට යන කොට, ලිට්රෝ ගෑස් සමාගම තමන් සතුව stock එකේ තිබ්ච්ච කිලෝග්‍රෑම් 9.3 ගෑස් සිලින්ඩරවලට කිලෝග්‍රෑම් 12.5 වනකල් ගෑස් පිරෙව්වා. එහෙම පුරවන කොට, තිබ්ච්ච space එක අඩු වෙනවා. කලින් space එක තිබුණා. ඒ නිසා පීඩනය පාලනය වුණා. ඒ නිසා කිලෝග්‍රෑම් 9.3ට අඩු කරලා බෙදා හැරපු සිලින්ඩරවලින් මේ ප්‍රශ්නය මතු වුණේ

[ගරු විජිත හේරත් මහතා]

නැහැ. හැබැයි, කොම්පැනියේ ඉතිරි වෙලා තිබුණු ටිකට කිලෝග්‍රෑම් 12.5 වනකල් ගෑස් පිරෙව්වාම තිබෙන space එක අඩු වෙනවා; පීඩනය තවත් වැඩි වෙනවා. අන්න එතැනදී ගෑස් එළියට පනින්න හදන ප්‍රවණතාව වැඩි වෙනවා.

අපි දන්නවා, ගෑස් සිලින්ඩර සම්බන්ධයෙන් අපේ රටේ අනුගමනය කරන්නේ ඇමෙරිකානු ප්‍රමිතිය බව. ඒ අනුව කිලෝ පැස්කල් 1,050ක ධාරිතාවක් දරාගන්න පුළුවන්. සංයුතිය 50:50 ලෙස වෙනස් කළත් 740ක විතර උපරිමයකට යන්නේ. කිලෝ පැස්කල් 1,050ට වැඩි වෙන්නේ නැහැ. ඒ නිසා තමයි ගෑස් සිලින්ඩරය පුපුරන්නේ නැත්තේ. සිලින්ඩරය පුපුරන්න නම්, කිලෝ පැස්කල් 1,050ට වඩා වැඩි වෙන්න ඕනෑ. එහෙම එකක් වෙලා නැහැ. මෙහෙම leak වෙන්නේම අර කියන උපකරණවල ප්‍රශ්නයක් තිබෙන නිසායි. ඒ කියන්නේ, එතැන බරපතළ තාක්ෂණික වැරැද්දක් වෙලා තිබෙනවා. විද්‍යාඥයන්ගේ තාක්ෂණික පරීක්ෂණවලින් පසුව තමයි අවසන් නිගමනයට එන්න පුළුවන් වෙන්නේ. හැබැයි, අවසන් නිගමනය එන තෙක් ආණ්ඩුව වහාම කළ යුත්තේ මේ මාරාන්තික ප්‍රශ්නයෙන් මේ රටේ ජනතාව මුදාගැනීමයි.

ගෙවල්වලට පානීය ජලය සපයන්න ඔබතුමන්ලා - ජලසම්පාදන අමාත්‍යාංශය- මැදිහත් වන එක හොඳයි. හැබැයි, ඊට කලින් ගෑස් ප්‍රශ්නය වහාම විසඳන්න, ජනතාවගේ ජීවිත ආරක්ෂා කරගන්න මැදිහත් වෙන්න කියා මම ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු මන්ත්‍රීතුමා, මම ඔය ප්‍රශ්නයටත් පිළිතුරක් දෙන්නම්, ඔබතුමා ඉඩ දෙනවා නම්. ඇත්තටම දැන් බියගම සිට දොම්පේ දක්වා ජල නළ එළීම සිදු කරමින් තිබෙනවා. ඒ, කැලණි දකුණු ඉවුර මහා ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින්. ඒක ගැන ඔබතුමාට දැනුම් දෙන්න කැමැතියි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
බොහොම ස්තුතියි, ඇමතිතුමා. එම ව්‍යාපෘතිය ගැන මම දැනුවත්ව ඉන්නවා. නමුත් ඔය කියන දොම්පේ ඇත කෙළවරේ තිබෙන කඳු ප්‍රදේශවලට, පරකඩමුල්ල, මඩේපොළවත්ත කියන ප්‍රදේශවලට ඔය ව්‍යාපෘතියෙන් වතුර එන්නේ නැහැ. ඒකට වෙනම ජල ව්‍යාපෘතියක් සකස් කරන්න වෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව පුංචි කාරණයක් කියන්න මම සුළු වෙලාවක් ගන්නවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගත් දින මම මේ සම්බන්ධව ඉතා පැහැදිලිව කිව්වා. වෛද්‍ය පරිපාලන නිලධාරින් බඳවා ගැනීමේදී නිකුත් කළ ගැසට් එක රාජිත සේනාරත්න ඇමතිතුමාගේ කාලයේ බිරිඳගේ චුවමනාවට නිකුත් කළ එකක්; මම පෙනී සිටියේ ඒ වෙනුවෙන් කියනවා නම්, ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. ඉතාම පැහැදිලිව, ඒ ගැසට් එක නිකුත් කර තිබෙන්නේ මේ අවුරුද්දේ මාර්තු මාසයේ; ඒ කියන්නේ මේ ආණ්ඩුව යටතේ. 2218/50 අංක දරන ගැසට් එක issue කළේ 2021 මාර්තු මාසයේ 19 වැනි දා. ඒ කියන්නේ රාජිත සේනාරත්න මහත්මයා අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ නොවෙයි. එය, මේ ආණ්ඩුව යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබුවක්. කාගේවත් බිරින්දෑවරුන් වෙනුවෙන් පෙනී සිටින්න මට චුවමනාවක් නැහැ. Community physiciansලාට මේකෙන් අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, ඒ අයටත් එම තනතුරු ලබා ගන්න පුළුවන් විධියට ගැසට් එක සංශෝධනය කරලා එය වහාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. ඒ ගැසට් එක නිකුත් කරලා සියලු පරිපාලන වෛද්‍ය නිලධාරින්ට ඒ තනතුරු ලබා දීමට වහාම මැදිහත් වෙන්න කියන කාරණයත් මතක් කරමින් මා නතර වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The next speaker is the Hon. Lalith Varna Kumara. You have 10 minutes.

[අ.භා. 1.30]

**ගරු ලලිත් වර්ණ කුමාර මහතා**
(மாண்புமிகு லலித் வர்ண குமாரக)
(The Hon.Lalith Varna Kumara)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, වරාය හා නාවික අමාත්‍යාංශයේත්, ජල සම්පාදන අමාත්‍යාංශයේත්, තවත් රාජ්‍ය අමාත්‍යාංශ දෙකකත් වැය ශීර්ෂ විවාදයට ගන්නා මේ මොහොතේ මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. ඒ වාගේම ගරු රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමාට -අපේ දිස්ත්‍රික්කයේ නායකතුමාට- අපේ ගරු වාසුදේව නානායක්කාර අමාත්‍යතුමාට, එම අමාත්‍යාංශවල ලේකම්තුමන්ලාට, ලේකම්තුමියලාට සහ අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් මගේ ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නවවන පාර්ලිමේන්තුවේ මගේ මංගල කථාව තමයි අද දිනයේ මම සිදු කරන්නේ. අමාත්‍යාංශවල අය වැය කාරක සභා අවස්ථාවේදී අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳව කථා කිරීම තමයි සම්ප්‍රදාය. නමුත් මගේ වගකීමක්, යුතුකමක් වනවා, මට මේ ස්ථානයට එන්න සහයෝගය, ශක්තිය දුන් අයට මේ ලැබුණු අවස්ථාවේදී කළගුණ සැලකීම. මම ඒ වෙනුවෙනුත් මේ අවස්ථාවේ අවසර ඉල්ලා සිටිනවා.

කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව ඡන්ද 46,542ක් ලබා දී මාව එම දිස්ත්‍රික්කයේ නවවැනි ස්ථානයට ඔසවා තැබුවා. පාර්ලිමේන්තුවේ ඇති වුණු මන්ත්‍රී පුරප්පාඩුව අනුව මට ඊයේ දිනයේ මේ ගරු සභාව නියෝජනය කිරීමට අවස්ථාව උදා වුණා. ඇත්තටම ඒ වෙනුවෙන් විශේෂයෙන්ම බුලත්සිංහල ආසනය ප්‍රමුඛ කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව දැක්වූ සහයෝගයත්, ඒ වාගේම ස්වාමීන් වහන්සේලා, අන්‍ය ආගමික පූජකතුමන්ලා ලබා දුන් ආශීර්වාදය නිසා මට ලැබුණු ශක්තියත් ඉමහත්. ඒ නිසා ඒ සියලු දෙනාට මගේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා.

මොකද, ජනතා පරමාධිපත්‍යය නිසා තමයි අද මේ පාර්ලිමේන්තුවට එන්න මට අවස්ථාව ලැබුණේ. විශේෂයෙන්ම අපේ අතිගරු ජනාධිපතිතුමා කරගෙන යන වැඩසටහන නිසා තමයි ඇත්තටම අපට මෙවැනි ජයග්‍රහණයක් ලබා ගන්න පුළුවන් වුණේ. එතුමා ජනාධිපති අපේක්ෂකයා හැටියට තම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළින් ලබා දුන් පොරොන්දු පිළිබඳව මේ රටේ ජනතාව ගොඩක් විශ්වාස කරලා එතුමාට ඒ ශක්තිය ලබා දුන්නා. ජනතාවගේ ඒ ශක්තිය තුළ පාර්ලිමේන්තු මැතිවරණයෙනුත් තුනෙන් දෙකක බලයක් ලබා ගන්න එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඇත්තටම ඉවහල් වුණා. එතුමා නිසා තමයි අද මට මේ පාර්ලිමේන්තුවටත් එන්න අවස්ථාව ලැබුණේ. ඒ නිසා එතුමාට

මගේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා. ඒ වාගේම අපේ හිටපු පස්වැනි විධායක ජනාධිපතිතුමා -වර්තමාන අග්‍රාමාත්‍යතුමා- ඇත්තටම අපට ලොකු හයියක්, ශක්තියක් ලබා දුන්නා. අපි විපක්ෂයේ හිටියත්, කොයි පක්ෂයේ හිටියත් එතුමා අපට හැම දාම ශක්තිය, ධෛර්යය ලබා දුන්නා. ඒ නිසා එතුමාටත් මගේ ස්තුතිය හා ගෞරවය පුද කරන්නට ඕනෑ. ඒ වාගේම, ගමේ හැදුණු වැඩුණු අපි වාගේ අයට අවස්ථාව හා ශක්තිය ලබා දෙමින් අපව මෙහෙයවපු දිස්ත්‍රික් නායක ගරු රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමාටත් මගේ ස්තුතිය හා ගෞරවය පුද කරනවා.

අපේ ගරු මහින්ද සමරසිංහ මැතිතුමා මහ මැතිවරණයේදී කළුතර දිස්ත්‍රික්කයෙන් අටවැනි ස්ථානයට තේරී පත් වුණා. එතුමා පසුගිය දිනක පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස් වුණා. ඒ නිසා මට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණා. එතුමාට අද තානාපති ධුරයක් ලැබිලා තිබෙනවා. මම එතුමාට සුබ පතනවා. ඒ වාගේම මට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව උදා කර දීම සම්බන්ධයෙන් එතුමාටත් ස්තුතිවන්ත වනවා. මොකද, මේ රටට එතුමාගෙන් සේවාවක් ලබා ගන්න අවස්ථාව ලැබෙනකොට, මටත් බුලත්සිංහල ප්‍රමුඛ කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවට සේවයක් ලබා දෙන්න ඉඩ ප්‍රස්ථාව ලැබුණා.

මට මුලින්ම දේශපාලනයට එන්න අවස්ථාව ලැබුණේ, නිර්මල කොතලාවල මැතිතුමා සංවිධායක ධුරය දරනකොට මදුරාවල ප්‍රාදේශීය සභාවට තරග කරන්න එතුමා මට nomination ලබා දුන් නිසායි. ඒ දක්වා ඇවිත්, පළාත් සභාවට එන්න එතුමා මට විශාල ශක්තියක් ලබා දුන්නා. ඒ පිළිබඳවත් මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ. ඒ සියලු දෙනාගේම ශක්තිය තුළින් ඇත්තටම මට මේ අවස්ථාව උදා වුණා. බුලත්සිංහල තමයි, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කැඳවුම්කරු, එහෙම නැත්නම් සංවිධායක හැටියට මම වැඩ කරන ආසනය. ඇත්තටම බුලත්සිංහල ආසනයෙන් වමේ කවුරු හෝ පාර්ලිමේන්තුවට ආවා නම් ඒ හැම කෙනෙකුම ඇවිල්ලා තිබෙන්නේ තව කෙනෙකුගේ අවස්ථාව ගිලිහුණාට පසුව, නැත්නම් තව කෙනෙකු අවස්ථාව පුද කළාට පසුවයි. මට මතකයි, රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සිටියදී පළාත් සභා මහ ඇමති අපේක්ෂකයා හැටියට ඉදිරිපත් වුණා. එතකොට එතුමා පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස් වුණා. ඒ නිසා බුලත්සිංහල සංවිධායක හැටියට බන්දුල පරාක්‍රම ගුණවර්ධන මැතිතුමාට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණා. නිර්මල කොතලාවල මැතිතුමාට ඊළඟට පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වුණේත් දෙවැනි වතාවට රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස් වුණු නිසායි. ඇත්තටම මටත් මාස කීපයකට පසුව හෝ පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණේ මහින්ද සමරසිංහ මැතිතුමා මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස් වුණු නිසායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ආසනය ගොඩක් අඟහිඟකම් තිබෙන ආසනයක්. කළුතර දිස්ත්‍රික්කයේ ආසන අටෙන් බුලත්සිංහල හා අගලවත්ත කියන්නේ අඩුම ඡන්ද තිබෙන ආසන දෙකක්. බුලත්සිංහල ආසනය නියෝජනය කරමින්, එම ආසනයේ ජනතාව වෙනුවෙන් පෙනී ඉඳලා බුලත්සිංහල ප්‍රමුඛ කළුතර දිස්ත්‍රික්කයට යම් සේවාවක් කරන්න පුළුවන් නම් ඒක තමයි මගේ යුතුකම වන්නේ.

විශේෂයෙන්ම මගේ දෙමව්පියන් මම මේ අවස්ථාවේ දී සිහිපත් කරන්න ඕනෑ. මගේ අම්මා, තාත්තා මේ සමාජයට සාධාරණයක් ඉටු කරපු දෙපළක්. පිරිමි ළමයි හය දෙනකු හදලා, වැඩිමල් දරුවා ශාසනයට පූජා කළා. හැබැයි, අහේතුවකට 1988-89 කාලයේ උන්වහන්සේ අතුරුදහන් වුණා. අද වනතුරු අපට උන්වහන්සේ ඉන්න තැනක් සොයා ගන්න බැරි වුණා. දැන් උන්වහන්සේගේ නම අතුරුදහන් ලැයිස්තුවේ තමයි තිබෙන්නේ. දේශපාලනඥයකු හැටියට මාව මේ සමාජයට යොමු කළ නිසා 2006 දී අපේ මදුරාවල ප්‍රාදේශීය සභාවේ උපසභාපති හැටියට පත් වෙන්න මට අවස්ථාව ලැබුණා. අවුරුදු තුනක් උපසභාපති හැටියට ඉන්නකොට 2009 දී බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන්න මට අවස්ථාව ලැබුණා. 2009 දී පළාත් සභාව නියෝජනය කළ මට නැවතත් 2014 දී පළාත් සභාව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා. 2020 මහ මැතිවරණයෙන් ජයග්‍රහණය කරලා අද මට මේ පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණා.

මගේ බාල මල්ලී රණවිරුවෙක් හැටියට අවුරුදු 12ක් හමුදාවේ සේවය කළා. රට දැය වෙනුවෙන් මිය යන්න එතුමාට සිදුවුණා. අපේ පවුලේ හය දෙනාගෙන් දෙදෙනකුම රට වෙනුවෙන් ජීවිත කැප කර තිබෙනවා. ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න මාවත් දේශපාලනයට කැප කළ මගේ දෙමව්පියන්ට මම මේ අවස්ථාවේ දී ස්තුතිවන්ත වනවා. මගේ පියා ජීවතුන් අතර නැති වුණත් මම මේ අවස්ථාවේදී මගේ අම්මා සිහිපත් කරනවා. අපේ ගෙදරින් ලැබෙන ශක්තිය මට ලොකු හයියක් වුණා.

ඒ නිසා තමයි බුලත්සිංහල ප්‍රමුඛ කළුතර දිස්ත්‍රික්කය ගොඩනඟන්න මට හැකියාව ලැබුණේ. බුලත්සිංහල හැරුණාම කළුතර දිස්ත්‍රික්කයේ අනෙක් ආසනවල ජනතාවටත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, බුලත්සිංහල ප්‍රදේශයෙන් මම වාගේ කෙනෙකුට මේ ආකාරයට හරි පාර්ලිමේන්තුවට එන්න ශක්තිය ලබා දීම ලොකු දෙයක්. බුලත්සිංහල ආසනයේ තිබෙන්නේ, ඡන්ද 72,000යි. ඒක තමයි ආසන අටෙන්ම ඡන්ද අඩුවෙන්ම තිබෙන ආසනය. එම 72,000නුත් දමිළ ජනතාව 9,000ක් පමණ ඉන්නවා. එවැනි තත්ත්වයක් යටතේ ලේසියෙන් පාර්ලිමේන්තුවට තේරී පත්වෙලා එන්න පුළුවන්කමක් නැහැ.

අද දිනයේ මෙම වැය ශීර්ෂයට අදාළව කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මොකද, මගේ දිස්ත්‍රික් නායකතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න මට අවස්ථාව ලැබී තිබෙනවා. වරාය ගැන කිව්වොත්, අපි දන්නවා, සුද්දාගෙන් පසුව වරායේ වෙනසක් වුණා නම් එහෙම වුණේ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ පමණයි කියලා. එතුමා ගෙනාපු වැඩ පිළිවෙළ නිසා තමයි වරාය සංරක්ෂණය වෙලා, දියුණු වෙලා, වරාය නගරයක් මේ භූමියට ගෙනෙන්න පුළුවන්කම ලැබුණේ. ඇත්ත වශයෙන්ම වරායෙන් කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහලට ලොකු දෙයක් සිද්ධ නොවුණත්, මගේ දිස්ත්‍රික් නායකතුමා නිසා ඇත්තටම ලොකු ශක්තියක්, හයියක් අපිට ලැබෙනවා.

මේ කාරණයත් මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ගරු ජලසම්පාදන අමාත්‍යතුමනි, බුලත්සිංහල ජනතාව වෙනුවෙන් පොඩි, අහිංසක සාධාරණයක් මම ඉල්ලා සිටිනවා. කළු ගඟ යෝජනා ක්‍රමය තිබෙන්නේ, බුලත්සිංහල ආසනය තුළ. කළු ගඟෙන් තමයි වතුර ටික ගන්නේ. හැබැයි, යන්තම් පායනකොට බුලත්සිංහල කොට්ඨාසයේ කළු ගඟ අයිනේ ජීවත් වන ජනතාවට පනිට්ටුවක් අරගෙන වතුර සොයාගන්න දුවන්න වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අලුත් වැඩ පිළිවෙළක් යටතේ කෙත්හේන ජල පවිත්‍රාගාරයටත් කුඩා ගඟෙන් තමයි ජලය ගන්නේ. බුලත්සිංහල හරහා ගංගා දෙකක් ගලා ගෙන යනවා. ඒ ගංගා දෙකට ඇළවල් විශාල ප්‍රමාණයක් එකතු වෙනවා. ඒ ඇළවල් ගංගාවලට වඩා ලොකුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බුලත්සිංහල ජනතාව හැමදාමත් දුක් විඳිනවා. යන්තම් පිනි බැවත් බුලත්සිංහල ජනතාව යට වෙනවා. සුළි සුළඟක් ආවත් යන්නේ මේ හරහා. භූ විෂමතාව අතින් ගත්තාම මේ ප්‍රදේශය නාය යනවා. මට මතකයි, එක් වරක් හැත්තෑ දෙදෙනෙක් පොළොව යට මිහිදන් වුණා. එහෙම දුක් විඳින

[ගරු ලලිත් වර්ණ කුමාර මහතා]

බුලත්සිංහල ජනතාවගේ වතුර ටික සම්බන්ධයෙන් මම අහිංසක ඉල්ලීමක් කරනවා. බුලත්සිංහල ආසනයට වෙනම ජල ව්‍යාපෘතියක් හරි හදලා, ඒ ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, සියලු දෙනාටම මගේ ගෞරවය, ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Next, the Hon. Ajith Mannapperuma. You have 14 minutes.

[අ.භා. 1.40]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී අද අපි ජලසම්පාදන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ඇතුළු තවත් අමාත්‍යාංශ කීපයක වැය ශීර්ෂ ගැන කථා කරනවා. ජලය ගැන අපි කථා කරන මේ මොහොතේ, ගම්පහ, වැලිවේරියේ අපේ සහෝදර ජනතාවට වෙඩි තියලා මැරුණු දවස මට මතක් වෙනවා. මොකද, පානීය ජලය වෙනුවෙන් දිවි පිදුවේ ගම්පහ, වැලිවේරියේ ජනතාව. ඒ අවාසනාවන්ත සිද්ධිය සිදු වුණේ 2013 අගෝස්තු 01වැනිදා. අපේ වැලිවේරියේ ජනතාව "පානීය ජලය නැහැ, තිබෙන ජලය බොන්න බැහැ" කියලා අරගළයක් කරද්දී, හමුදාවෙන් ඇවිත් ඒ මිනිසුන්ට වෙඩි තියලා මරා දැමුවා. වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තමයි එවකට ආරක්ෂක ලේකම් ධුරය දැරුවේ. බොන්න වතුර ඉල්ලා හඬක් නඟපු මිනිසුන් මරපු ඉතිහාසයක් ලෝකයේ කොහේවත් නැහැ. කවදාවත් වතුර ටිකක් ඉල්ලපු මිනිහෙක් මරලා නැහැ. නමුත් අපි දැක්කා, බියගම වෙළඳ කලාපයේ සේවකයෙක් එදා මේ අරගළය නිසා පල්ලියට ගොස් සැඟවුණාම හමුදා නිලධාරීන් ඔහු පිටුපසින් ගිහිල්ලා, පල්ලිය තුළදී තුවක්කු බඳවල්වලින් ගහලා ඒ සහෝදරයා ඝාතනය කළා. ඒ වාගේම පාසල් දරුවන් දෙදෙනෙක් ටියුෂන් පන්ති ගිහිල්ලා එද්දී එදා මේ අරගළයට මැදිහත් වීම නිසා වෙඩි තබා මරා දැමුවා. "රවිෂාන්" සහ ඒ අනෙක් පාසල් දරුවාත්, වෙළඳ කලාපයේ සේවය කළ ඒ තරුණ, සහෝදර සේවකයාත් මම මේ වෙලාවේ සිහිපත් කරනවා. වතුර ඉල්ලා හඬපු ජනතාව වෙනුවෙන් තමන්ගේ ජීවිතය පූජා කිරීම පිළිබඳව ඒ අයට මගේ උත්තමාචාරය පුද කරනවා. මේ සිදුවීම වෙලා දැන් වසර හයකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත් තවම වැලිවේරිය, රතුපස්වල, ගම්පහ ජනතාවගේ ජල ප්‍රශ්නය විසඳුණේ නැහැ; සියයට 100ක් විසඳුණේ නැහැ. අපේ රජය කාලයේත් විවිධ ක්‍රියා මාර්ග මඟින් මේ ජල ප්‍රශ්නය විසඳන්න හැදුවා.

එදා අපි කරස්නාගල පානීය ජල යෝජනා ක්‍රමයට කොන්ත්‍රාත්තුව ලබාදුන්නා. ඒ කොන්ත්‍රාත්තුව ලබාදී කාලයක් ගත වුණත්, තවමත් එය ක්‍රියාත්මක නොවන බව තමයි පේන්නේ. හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා යහ පාලන රජය කාලයේ මේකට මැදිහත් වෙලා ඒ ජනතාවට යම් මට්ටමකින් හෝ ජලය ලබා දීමට හැකි උපරිමයෙන් කටයුතු කළා. ඒ ජනතාවට වෙඩි පහරවල් දෙනවා වෙනුවට, පානීය ජලය ලබා දෙන්න කටයුතු කළා. ඒ වාගේම මේ පවුල්වලට අඩු මුදලකට ජලය ලබා දීමටත් කටයුතු කළා. එදා තිබුණු මට්ටම අනුව එතුමාට පුළුවන් විධියට එතුමා කටයුතු කළා. රතුපස්වල සිද්ධිය නිසා සදාකාලික අබ්බගාත වෙච්ච පුද්ගලයෝ දෙදෙනෙක් හිටියා; රෝගාතුර වෙච්ච අය හිටියා. එදා ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ සියලුදෙනා ජනාධිපති මන්දිරයට ගෙන්වා වන්දි ලබා දීමට කටයුතු කළා. ඒ පිළිබඳව හිටපු ජනාධිපතිතුමාටත්, යහ පාලන රජයටත් මම ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, මම තව කරුණක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. වර්තමානයේ වැලිවේරිය ප්‍රදේශයට -මේ සිද්ධියට ලක් වෙච්ච ප්‍රදේශයට- ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරි මහත්මයෙක් ඇවිල්ලා ගෙයකින් -පවුලකින්- රුපියල් 3,000 ගණනේ එකතු කරලා බට දමනවා. ඒ කියන්නේ, මේකට ගන්නේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සල්ලි නොවෙයි. ඒ සඳහා පුද්ගලයන්ගෙන් සල්ලි එකතු කරනවා. මොකද, වැලිවේරිය ප්‍රදේශයේ ජනතාවට, රතුපස්වල ප්‍රදේශයේ ජනතාවට පානීය ජල ප්‍රශ්නය ඒ තරම්ම බලපානවා. ඒ කවුරුන් හෝ බට ටික දාන්න කියා රුපියල් 3,000ක් අරගෙන -මේ ගමේ කෙනෙක් නොවෙයි.- ඊට පස්සේ ඇවිල්ලා ජල නළ එළනවා. ජනතාව ඒ ජල නළ එළන්න සල්ලි දීලා තිබෙනවා. නමුත්, මම නියෝජනය කරන ප්‍රදේශයේ ජනතාව තවමත් මේ බට දිහා බලාගෙන ඉන්නවා විතරයි. මොකද, මේ බටවලින් ජලය එන්නේ නැහැ. ඒ කියන්නේ, මෙතැනදීත් ජනතාව රැවටීමක් තමයි සිද්ධ වෙන්නේ. වර්තමානයේ තවත් ඒ වාගේම ප්‍රශ්නයක් පරකන්දෙනිය ප්‍රදේශයේත් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කරස්නාගල පානීය ජල යෝජනා ක්‍රමයේ කටයුතු ක්‍රියාත්මක වනකොට මේ ඔක්කෝම ප්‍රදේශ ආවරණය වනවා. මාස තුනක් ඇතුළත එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා මාස තුනක් ඇතුළත මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා කියලා. මම ඇත්තටම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, සද්භාවයෙන් උත්තරයක් දීම පිළිබඳව. හැබැයි, වර්තමානයේ අපට තිබෙන දැනුම අනුව නම් මෙම ව්‍යාපෘතියේ වැඩ සියයට 70ක් පමණ තවමත් සිදු වෙලා නැහැ. කරස්නාගල ජලාශය සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමුවේ 2017 දී පැවැති යහ පාලන ආණ්ඩුවෙන්. 2020 පෙබරවාරි 19 වෙනිදා තමයි ඒක නිම කරන්න තිබුණේ. 2017 ඉඳලා බැලුවොත් මේ වනකොට අවුරුදු හතරකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත්, තවමත් ඒකේ සියයට 70යි වැඩ ඉවර වෙලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමන්ගේ කාලයේදීත්, "අපි තව අවුරුද්දකින් වතුර දෙනවා, තව අවුරුද්දකින් වතුර දෙනවා" කියනවා. අපේ කාලයේදීත් ඒක කිව්වා. දැන් ඔබතුමා කියනවා, තව මාස 3කින් වතුර දෙනවා කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මාස තුනක් ඇතුළත කරස්නාගල පානීය ජල යෝජනා ක්‍රමයෙන් වතුර දීමට පුළුවන් තත්ත්වයට අපි පැමිණෙනවා. ඒකේ වරදක්, අඩුවක් වුණොත් ඒ ගැන මම ඇප වෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, ඒ ප්‍රතිඥාව දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

.07ඊළඟට, පරකන්දෙනිය ප්‍රදේශයේ විශාල ජල ව්‍යාපෘතියක් තිබුණා, "ප්‍රජා ජල ව්‍යාපෘති" කියලා. ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ලක්ෂ 8ක විතර පවුල් සංඛ්‍යාවක් ජීවත් වෙනවා. වසර 5ක් තුළ මේ සියලුදෙනාට ජලය දෙනවා කියා ඔබතුමන්ලා ප්‍රතිඥාවක් දීලා තිබෙනවා. නමුත්, වසර පහකදී ගම්පහ දිස්ත්‍රික්කයටම ජලය දෙන්නේ කොහොමද කියන එක ගැන අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ළඟ අපේ ඒ සැලැස්ම තිබෙනවාද?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔව්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ සැලැස්ම බලලා, කොතැනක හෝ අඩුපාඩුවක් තිබෙනවා නම් කියන්න. ඒ තැන්වලට අපි වැඩ පිළිවෙළක් යොදන්නම්. සැලැස්ම ඔබතුමාට එවා තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, හැම තැනම අඩුපාඩු තිබෙනවා. මේ සැලසුමත් අපට විශ්වාස කරන්න බැහැ. මොකද, දිනෙන් දින, දිනෙන් දින ඔබතුමන්ලා දීපු පොරොන්දු කඩ වෙමින් පවතිනවා. මේ සැලැස්ම විතරක් නොවෙයි. බලන්නකෝ, ඔබතුමන්ලා සැලැස්මක් හැදුවා, "අවුරුදු 10ක් යනකොට මේ රටේ වගාව සියයට සියයක් කාබනික පොහොරවලින් කරනවා" කියලා. නමුත්, ඒ ගැන ජනතාවගේ විශ්වාසය දැන් කැඩිලා ගිහිල්ලා. එතකොට, තවමත් සියයට 50ක ජනතාවට පානීය ජලය දීලා නැහැ.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කියන්නේ අසත්‍ය තොරතුරු. සියයට 59කට වතුර දීලා අවසන්. ඉතිරි සියයට 41ටත් අපි වතුර දෙනවා. වග කීමෙනුයි මම ඒක කියන්නේ. අපි මෙහෙම කියන්නේ ඒක කරන්න පුළුවන් නිසායි. මිනිසුන්ට බොන්න වතුර නැහැ කියන කාරණය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා සතුටු වෙන්න එපා. දෙයියනේ! මේ වාගේ විපක්ෂයක් එක්කනේ අපට රට හදන්න වෙලා තිබෙන්නේ. මට ඇත්තටම කනගාටුයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුරු දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා එදා මීගමුවේ කඩොලාන කළපුවට ඇවිල්ලා "ඔක්සිජන් කන්නද?" කියලා අහපු රාජ්‍ය ඇමතිතුමා නේ. කඩොලාන විනාශ කරන්න ඇවිල්ලා, "ඔක්සිජන් කන්නද?" කියලා ඇහුවා. ජනතාව කොහොමද ඔබතුමා කියන වචන විශ්වාස කරන්නේ? ඒ විශ්වාසය අද නැතිවෙලා තිබෙනවා.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
තමුන්නාන්සේ වගකීමෙන්ද කියන්නේ, මම එහෙම කිව්වා කියලා? තමුන්නාන්සේ ඉංජිනේරු මහත්තයෙක්නේ? තමුන්නාන්සේ මෙතැනට ඇවිල්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

උස්සන්න එපා. ඒක කිව්වේ, තමුන්නාන්සේලාගේ දිස්ත්‍රික්කයේ තමුන්නාන්සේලාගේ කෙනෙක්. මමත් එතැන සිටියා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, please continue with your speech.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට විශේෂයෙන් පැහැදිලි කරන්න දෙයක් නැහැ. ඔබතුමා කියපු කරපු දේවල් එදා මාධ්‍යවල ප්‍රදර්ශනය වුණා. කඩොලාන විනාශ කරන්න ඇවිල්ලා කියපු දේවල් මාධ්‍යවලින් ප්‍රසිද්ධ වුණා. එම නිසා දැන් අපට මේ රජය කියන දේවල් ගැන විශ්වාසයක් නැහැ. පෞද්ගලිකව ඔබතුමා අපිත් එක්ක හිතවත්. නමුත්, ඔබතුමන්ලා දීපු මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන ගැන අද රටේ ජනතාව තුළ කිසිම විශ්වාසයක් නැහැ. මොකද, කියපු දේ නොවෙයි, වෙන දෙයක් නේ ඔබතුමන්ලා කරන්නේ. ඒකයි හේතුව.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ පවුල් ලක්ෂ 8න්, ලක්ෂ 3කට පමණයි පානීය ජලය ලබා දීලා තිබෙන්නේ. තවත් පවුල් ලක්ෂ 5කට පානීය ජලය ලබා දිය යුතුයි. ඔබතුමන්ලා කියනවා, සියයට 100ක් ජනතාවට පානීය ජලය ලබා දෙනවා කියලා.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
ඔක්සිජන් ගැන කිව්වේ, තමුන්නාන්සේලාගේ සමගි ජන බලවේගයට වැඩ කරපු කෙනෙක් ලු. ඔහුගේ නම සුරංග ලු. මට දැන් telephone එකට කථා කරලා ඒක කිව්වේ. සමගි ජන බලවේගයේ කෙනෙක් තමයි එහෙම කියලා තිබෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අපි ජලය ගැන කථා කරමු. දැන් කඩොලාන අතහරිමුකෝ.

ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, සියයට 100ක්ම පානීය ජලය දෙන්න කියා අපි කියන්නේ නැහැ. මොකද, ඒක සම්පූර්ණ කරන්න බැරි ඉලක්කයක්. වගාව සියයට 100ක් කාබනික කරනවා වාගේ ඉලක්කයක් තමයි ඔබතුමන්ලා ප්‍රකාශයට පත් කළේ, පවුල් සියයට 100කටම පානීය ජලය දෙනවා කියලා. අපි කියන්නේ, සියයට 75කටවත් දෙන්න කියායි. මොකද, සමහර පැතිවලට සියයට 100ක්ම අවශ්‍ය වෙනවා කියලා මම කියන්නේ නැහැ. සියයට 75කට පානීය ජලය දීමේ කටයුත්ත ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන සැලැස්ම තුළින් කරන්න බැහැ. ජල අවශ්‍යතාවෙන් සියයට 43ක්ම ජල සම්පාදන ව්‍යාපෘති තුළින්

[ගරු ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ක්‍රියාත්මක වෙනවා. සියයට 7ක් ප්‍රජා ජල ව්‍යාපෘතිවලින් ක්‍රියාත්මක වෙනවා. එම සියයට 7න්, සමහර ප්‍රජා ජල ව්‍යාපෘති දැන් කඩාගෙන වැටිලා. ඒ කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ඒ ව්‍යාපෘති කඩාගෙන වැටිලා, ගරු ඇමතිතුමනි. ප්‍රජා ජල ව්‍යාපෘතිවල ව්‍යුහාත්මක ප්‍රශ්න තිබෙනවා. ඔබතුමාත් දන්නවා ඇති, විශේෂයෙන්ම පරකන්දෙනිය ප්‍රජා ජල ව්‍යාපෘතිය ඇණහිට තිබෙන බව. ඒ නිසා ඒකේ හිටපු සභාපතිවරයා හිතේ අමාරුවෙන්ම මිය ගියා. මොකද, පානීය ජලය ලබා ගන්නා ජනතාව ඔහුට චෝදනා එල්ල කරන්න පටන් ගත්තා. අවංකව සේවයක් කරන්න ගිහිල්ලා එතුමා හිතේ අමාරුවෙන්ම මිය ගියා. ඉතින්, මේ වාගේ දේවල්වලට අපට මැදිහත් වෙන්න වෙනවා; සොයා බලන්න වෙනවා. මොකද, ඔවුන් කාලයක් ප්‍රජා ජල ව්‍යාපෘතිවලින් පානීය ජලය අරගෙන පසුව ජලය ලබා ගන්න නොහැකි වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, කරස්නාගල පානීය ජල යෝජනා ක්‍රමය ගැන ඔබතුමා සඳහන් කළා. ගම්පහ දිස්ත්‍රික්කයට ජලය ලැබෙන්නේ කැලණි ගඟෙන්, අත්තනගලු ඔයෙන් සහ මාඔයෙන්. ඒවායෙන් තමයි අපි ජල ව්‍යාපෘති සැලසුම් කර තිබෙන්නේ.

විශේෂයෙන්ම මෙම කරුණ කෙරෙහි මම ගරු සනත් නිශාන්ත රාජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. මීරිගමට සහ දිවුලපිටියට ජලය සපයාගෙන තිබෙන්නේ මාඔයෙන්. ඔබතුමාගේ සැලැස්මේ තිබෙන්නේ ඒක. ඒ විතරක් නොවෙයි. යටිමාන ජලාශය ඉදිකරනවා කියාත් එහි තිබෙනවා. හැබැයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි, මාඔයට ඒකාකාරී ජල සැපයුමක්, ජල ප්‍රවාහයක් එන්නේ නැහැ. මේ පිළිබඳවත් ඔබතුමන්ලා අවධානය යොමු කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

අපි ඒ ජලාශය ඉදිකරන්නේ අරණායක, යටමාන කඳු මුදුනේ. එතකොට, ජලය වැඩිපුර ලැබෙන කාලයට ඒ ඔක්කෝම ජලය එම ජලාශයේ එකතු වනවා. එතකොට අපට මාඔයට අවුරුද්ද පුරාම ජලය දෙන්න පුළුවන්.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ඔබතුමා හරි. ඒක පිළිගත හැකි සැලැස්මක්. නමුත්, එතැන තිබෙන ප්‍රශ්නය මේකයි, ගරු ඇමතිතුමනි. යටිමාන ජලාශය ඉදිකිරීමේ කටයුතුවලට තවම ඇඟිල්ලක්වත් තබලා නැහැ. නමුත් ඔබතුමන්ලා කියනවා, අවුරුදු 5ක් තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ ජල ප්‍රශ්නය විසඳනවා කියලා. කරස්නාගල ජලාශය ඉදිකරන්න පටන් අරන් අවුරුදු 6ක් ගිහිල්ලාත් තවමත් සියයට 70යි කෙරිලා තිබෙන්නේ. එතකොට, තවම සැලැස්මක්වත් නැතිව මීරිගම, දිවුලපිටිය ප්‍රදේශවල සිටින ජනතාවට අවුරුදු 5කින් ජලය ලබා දීලා පානීය ජල ප්‍රශ්නය විසඳනවා කිව්වාට ඒකෙන් අපි සෑහීමකට පත් වෙන්නේ කොහොමද?

ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමා ප්‍රශ්න දිහා සද්භාවයෙන් බලන ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙකු නිසා මම තව කාරණයක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. කැලණි ගඟෙන් තමයි ගම්පහ දිස්ත්‍රික්කයට පානීය ජලය වැඩිම ප්‍රමාණයක් ලැබෙන්නේ. නමුත්, කැලණි ගඟ රටේ තිබෙන දූෂිතම ජලය තිබෙන ගංගාව බවට පත්වෙලා තිබෙනවා. කර්මාන්තශාලාවලින්, සපුගස්කන්ද පිරිපහදුව තුළින්, අනවසර ඉදිකිරීම් තුළින්, ඒ වාගේම toilets හැරවීම නිසා කැලණි ගඟේ ජලය දූෂිත වෙලා තිබෙනවා. කැලණි ගඟ ගැන පරීක්ෂණයක් කළොත් මිනිස්සු ටැප් වතුර බොන්නේත් නැහැ.

ඒ තරමට කැලණි ගඟේ ජලය දූෂණය වෙලා තිබෙන්නේ. "පිවිතුරු ගංගා" වැඩසටහන දැන් රජය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒක එදා ඉඳන්ම තිබුණු එකක්. එය ක්‍රියාත්මක කරන්න ඕනෑ. ගඟක් වශයෙන් විතරක් නොවෙයි, මම හිතන හැටියට වැඩිම පිරිසක් පානීය ජල අවශ්‍යතාව සඳහා පාවිච්චි කරන, පරිහරණය කරන ගඟ තමයි මේ කැලණි ගඟ. ඒ නිසා පිවිතුරු ගංගා වැඩසටහන හරහා කැලණි ගඟෙන් පිරිසිදු ජල ප්‍රවාහයක් ලබා ගැනීම සඳහා වන කටයුතුවලට මූලික තැන දෙන්න කියලා විශේෂයෙන්ම කියනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මම පරිසර නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කරද්දී, ඒ ගැන විශේෂ අවධානයක් යොමු කළා. විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ පොලීසිය, විශ්වවිද්‍යාලය මේ කටයුත්තට දායක වෙන්නත් කැමැත්ත තිබෙනවා. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. කැලණි විශ්වවිද්‍යාලය මේ කටයුත්තට ඒකාබද්ධ කර ගෙන පිරිසිදු පානීය ජලය ලබාදීමේ කටයුත්ත කරන්න කියලා ඉල්ලනවා. ගරු ඇමතිතුමනි, අපට පෙනෙනවා, මේවා වෙන එකක් නැහැ, මේ කටයුතුත් අනෙක් පොරොන්දු වාගේම තමයි කියලා. නමුත් ඔබතුමා බලාපොරොත්තු වෙන -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2020දී, අලුත් ජල සම්බන්ධතා 116,908ක් ලබා දුන්නා. 2021දී, අලුත් සම්බන්ධතා 201,754ක් ලබා දුන්නා. 2022දී අපි දෙනවා, 436,000ක්. ඒ ගැම්මට ගියොත් අපට කරන්න බැරි ද?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ඔව්. ඒ ගැම්ම හරි. ඒ ගැම්මට ගියොත් හරි. ඒ ගැම්මට ජලාශ ටික ඉදිවෙනවා නම් හොඳයි. ඒකයි කියන්නේ. ඔබතුමාට ඒ ශක්තිය ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා. අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජල ප්‍රශ්නය විසඳන්න ඔබතුමාට ශක්තිය, ධෛර්ය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The next speaker is the Hon. Nipuna Ranawaka. You have 10 minutes.

[අ.භා. 1.54]

**ගරු නිපුණ රණවක මහතා**
(மாண்புமிகு நிபுண ரணவக)
(The Hon. Nipuna Ranawaka)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද කාරක සභා අවස්ථාවේ විවාදයට ගැනෙන අමාත්‍යාංශ පිළිබඳව අවධානය යොමු කරන විට රටේ ජාතික ආර්ථිකයට දැවැන්තම ශක්තියක් වන වරාය හා නාවික අමාත්‍යාංශය සහ රටේ ජනතාවගේ ජීවන තත්ත්වයට ප්‍රධානතම අවශ්‍යතාවක් වන පානීය ජලය ලබා දෙන ජලසම්පාදන අමාත්‍යාංශය ගැන අවධානය යොමු කරමින් මුලින්ම ජල

සම්පාදන විෂයය ගැන කථා කරමින් මගේ කථාව ආරම්භ කරන්නට කැමැතියි.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළ යටතේ 2021- 2024 දක්වා, අවුරුදු 4ක කාලසීමාව තුළ "සැමට පානීය ජලය" ලබා දීමේ වැඩසටහන යටතේ පවුල් ලක්ෂ 35කට ආසන්න ප්‍රමාණයකට පානීය ජල පහසුකම් ලබා දීමට වාසුදේව නානායක්කාර ඇමතිතුමාගේ නායකත්වයෙන් ඒ අමාත්‍යාංශය වැඩකටයුතු හදලා තිබෙනවා. විශේෂයෙන්ම මා ජීවත් වෙන මාතර දිස්ත්‍රික්කයේ නළ ජලය ලබා ගන්නා පවුල් සංඛ්‍යාව 110,000ක් පමණ වනවා. මීට අමතරව, දැනට 6,000 -7,000ක් විතර ජලය ලබා ගන්න පොරොත්තු ලේඛනයේ ඉන්නවා. 2015දී ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ආණ්ඩුව භාරදෙද්දී, මාතර දිස්ත්‍රික්කය තුළ අපි ආරම්භ කරපු ව්‍යාපෘතියක් තිබුණා. ඒ තමයි මාතර අදියර 4 ජල යෝජනා ක්‍රමය. අවුරුදු 4ක්, 5ක් විතර ඒ ජල යෝජනා ක්‍රමයේ වැඩකටයුතු ඉතා මන්දගාමීව සිදුවෙච්ච නිසා ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න අවුරුදු තුන හතරක් ප්‍රමාද වුණා. නමුත් අපට බලාපොරොත්තුවක් තිබෙනවා, ජනවාරි, පෙබරවාරි කාලසීමාව ඇතුළත ඒ යෝජනා ක්‍රමයේ මාලිම්බඩ දක්වා වන අදියර අවසන් කරන්නට අපට හැකියාවක් ලැබෙයි කියලා. ඒ වාගේම ඒ බෙදා හැරීම් සඳහා අවශ්‍ය ඉදිකිරීම් සඳහා දැනටමත් ටෙන්ඩර් කැඳවා තිබෙනවා. ඒ පටිපාටි අනුගමනය කරලා තිබෙනවා. හැබැයි, අපි පිළිගන්න ඕනෑ අද රටේ තිබෙන තත්ත්වයත් එක්ක ඒ භාණ්ඩ ගෙන්වා ගැනීමේදී, නළ ගෙන්වා ගැනීමේදී විවිධ අපහසුතා ඇවිල්ලා තිබෙන බව. ඒවාත් එක්ක යම් ප්‍රමාදයක් මේ කාලසීමාවේ ඇති වුණත්, මාතර දිස්ත්‍රික්කය තුළ සියයට 90කට එහා ජනතාවට ජලය ලබාදීමට බලාපොරොත්තු වනවා. නිරතුරුව පානීය ජල අර්බුදයට මුහුණ දෙන දෙණියාය, මොරවක වැනි ප්‍රදේශවලට ජල සම්පාදන යෝජනා ක්‍රමයක් සඳහා මේ වෙනකොට ටෙන්ඩර් කැඳවීම් කටයුතු අවසන් කරලා තිබෙනවා. මොරවක ජල යෝජනා ක්‍රමය තුළින් ඝන මීටර් 10,000කුත්, දෙණියාය ජල යෝජනා ක්‍රමය තුළින් ඝන මීටර 10,000කුත් වශයෙන් මේ ව්‍යාපෘති දෙක හරහා ලබාදීමට කටයුතු කරනවා.

ඒත් එක්කම ගරු ඇමතිතුමනි, මා පොඩි යෝජනාවක් කරනවා. විශේෂයෙන්ම දෙණියාය ආසනය කේන්ද්‍ර කරගෙන සිංහරාජයත් එක්ක සංචාරක හෝටල් කලාපයක් වෙනුවෙන් සංචාරක අමාත්‍යාංශයට අපි යෝජනාවක් යොමු කරලා තිබෙනවා. ඒ නිසා ඒ සැලසුම් සකස් කරද්දීම ඒ ආයතනවලටත් අවශ්‍ය ජල සැපයුම් ප්‍රමාණය ගණනය කරලා, ඒ අවශ්‍ය කටයුතුත් කරලා දෙන්න පුළුවන් නම් ඒ ව්‍යාපෘතිවලට ශක්තියක් වෙයි.

ඊට අමතරව හක්මන, දෙයියන්දර, මුලටියන යන ප්‍රදේශ හරහා කිරමආර මහින් නළ ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමටත්, අකුරැස්ස ප්‍රදේශයේ යෝජිත ඝන මීටර් 20,000ක ජල යෝජනා ක්‍රමයේ වැඩ එළැඹෙන වසරේ අග භාගයේදී ආරම්භ කිරීමටත් හැකියාවක් ලැබෙයි කියලා විශ්වාසයක් තිබෙනවා. මෙම සියලු ජල යෝජනා ක්‍රම 2025 වන විට අවසන් කොට, මාතර දිස්ත්‍රික්කය තුළ සියයට 90කට එහා ගිය ජල සැපයුමක් ලබා දෙන්න අපට පුළුවන්. දෙණියායේ ඉතා කඳු සහිත ප්‍රදේශ තිබෙන්නේ. එම කඳු සහිත ප්‍රදේශවලට අවශ්‍ය ප්‍රජා ජල වැඩසටහන් කීපයක්ම සනත් නිශාන්ත මැතිතුමාගේ රාජ්‍ය අමාත්‍යාංශය හරහා දැනටමත් ආරම්භ කරලා තිබෙනවා. මීට මාස කීපයකට කලිනුත් හක්මන ප්‍රදේශයේ එවැනි ව්‍යාපෘතියක් විවෘත කළා. ඒ ව්‍යාපෘතිවලින් සියයට සියයකම සාර්ථකත්වයක් අපට බලාපොරොත්තු වෙන්න බැරි වෙයි. මේ ඉලක්කම් එහාට මෙහාට වෙන්න පුළුවන්. නමුත් මේ හැමෝටම ජලය ලබාදීමට අවශ්‍ය පහසුකම් ටික මාතර දිස්ත්‍රික්කය තුළ ඇති කරන්නට අපට හැකිවෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. කෙටි කාලයක් ඇතුළත මේ ව්‍යාපෘති නැවත ආරම්භ කරලා මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට අත්‍යවශ්‍යම පහසුකමක් වූ පානීය ජලය ලබාදීම සඳහා කටයුතු කරපු නිලධාරීන් සියලුදෙනාටත්, අපේ කැබිනට් අමාත්‍යතුමාටත්, රාජ්‍ය ඇමතිවරයා ඇතුළු සියලු නිලධාරින්ටත්, ලේකම්වරු ඇතුළු ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සියලුදෙනාටත් මා ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය විෂයය ගැන කථා කරද්දී ලංකාවේ පිහිටීමත් එක්ක ලංකාවට ආර්ථික වශයෙන් විශාල අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ලංකාවේ පිහිටීමත් එක්ක විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් 2014ට කලින් ලංකාව නාවික කේන්ද්‍රයක් බවට පත් කිරීම සඳහා වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබුණා. ලංකාව කියන්නේ අධිවේගී මාර්ගයකින් වරායන් දෙකක්, ගුවන් තොටුපොළවල් දෙකක් එකට සම්බන්ධ වන රටක්. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සියල්ල 2014ට කලින් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් අපි ඉදිකරලා අවසන් කරලා තිබෙනවා. ඒකේ ප්‍රතිලාභ මේ රටේ ජනතාවට ලබා ගන්න පුළුවන් වන විධියට අලුත් ආයෝජන අවස්ථා ඇති කරලා තිබුණා. හම්බන්තොට වරාය අද අපට අයිති නැහැ. පසුගිය අවුරුදු 4ක යහ පාලන කාලය තුළ හම්බන්තොට වරාය ඇතුළු රජයට තිබුණු සම්පත් බොහොමයක් විකුණුවා. හම්බන්තොට වරාය හරහා සැපයුම් දිස්ත්‍රික්කයක් විධියට කේන්ද්‍ර කරගෙන, මාතර දිස්ත්‍රික්කයත් දියුණු කරන්න අවශ්‍ය සැලැස්මක් ඒ අවස්ථාවේ තිබුණා. පෞද්ගලික අංශයත් එක්ක, විවිධ පුද්ගලයන් එක්ක සම්බන්ධ වෙලා අලුත් ක්‍රමවේදයක් ඔස්සේ අපේ රට තුළට ආයෝජන අවස්ථා ගෙන ආ යුතුයි. අවුරුදු 10කට, 15කට කලින් තිබුණු තැනට වඩා අවස්ථා අද ලෝකයේ තිබෙනවා; ආයෝජනය කරන්න පුළුවන් හැකියාව මේ ලෝකය තුළ වැඩිවෙලා තිබෙනවා. රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමාගේ නායකත්වයෙන් මේ පිළිබඳව අලුත් විධියට හිතලා, මේ සම්පත්වලින් ප්‍රයෝජනයක් අරගෙන වරාය, ගුවන් තොටුපොළ, අධිවේගී මාර්ග මේ සියල්ල සම්බන්ධ කරගෙන අලුත් ආයෝජන අවස්ථා රට තුළට ගෙන එයි කියලා මම විශ්වාස කරනවා. හම්බන්තොට වරාය කේන්ද්‍ර කරගෙන අපි වැලිගම ප්‍රදේශයේ අක්කර 400ක භූමි ප්‍රදේශයක් දැනටමත් හඳුනාගෙන තිබෙනවා කර්මාන්තපුරයක් ඉදිකරන්න. ඒකට අවශ්‍ය ලේඛන සියල්ලම අපි කැබිනට් මණ්ඩලයටත් යොමු කරලා තිබෙනවා. දැනටමත් කර්මාන්තශාලා 5ක් අපට කැමැත්ත ප්‍රකාශ කරලා ලියුම් පවා දීලා තිබෙනවා. ඊළඟ වර්ෂය තුළ අපේ බලාපොරොත්තුවක් තිබෙනවා, ඒ කටයුතු සියල්ල අවසන් කරලා ජනතාවට දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දෙන්න.

වරාය ගැන කථා කරද්දී මම කියන්න ඕනෑ, අද ලෝකයේ නැව් ගාස්තුවල විශාල වැඩිවීමක් තිබෙන බව. කවුරුත් බඩු මිල ගැන කථා කරනවා. හැබැයි, මේ වැඩිවෙලා තිබෙන නැව් ගාස්තු පිළිබඳව කවුරුවත් කථා කරන්නේ නැහැ. මම ඒ ගැන උදාහරණයක් කියන්නම්. මාස 6කට, 7කට කලින් චීනයේ ඉඳලා ගෙනාපු අඩි 40 කන්ටේනර් එකකට ගෙවපු නැව් ගාස්තුව ලක්ෂ 3ක් පමණ තමයි ලංකාවේ මුදල්වලින් තිබුණේ. ගිය සතියේ ඒ භාණ්ඩම, ඒ ස්ථානයේම ඉඳලා කොළඹට ගේන්න ගිය නැව් ගාස්තුව ලක්ෂ 21කට එහා ගිහිල්ලා තිබෙනවා. අද බඩු මිල ගැන විතරක් කථා කරන සියලුදෙනා මේ වැඩිවීම පිළිබඳව කථා කරන්නේ නැහැ. අද ලෝකයේ සෞඛ්‍ය අර්බුදයක් එක්ක ලෝක සංචරණ අර්බුදයක් ඇවිල්ලා තිබෙනවා. සැපයුම් මාර්ගවල අර්බුදයක් ඇවිල්ලා තිබෙනවා. ඒ හා සමඟ ඉහළ ගිය භාණ්ඩ මිල අපට පාලනය කරන්න බැරි වෙලා තිබෙනවා. ඒකට එක විකල්පයක් විධියට මේ අය වැය හරහා බැසිල් රාජපක්ෂ ඇමතිතුමා දේශීය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා, නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැඟීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් අද වෙද්දී ආරම්භ කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යද්දී

[ගරු නිපුණ රණවක මහතා]

විපක්ෂය හැමතිස්සේම කථා කරන්නේ මොනවා ද? අද වැය ශීර්ෂ යටතේ වරාය හා නාවික අමාත්‍යාංශය ගැන සහ ජල සම්පාදන අමාත්‍යාංශය ගැන කථා කරන්නට තිබුණාට, අදත් විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කරන්නේ පොහොර ගැනයි, ගෑස් ටැංකි පුපුරන එක ගැනයි. එතැනින් එහාට කථා කරන්න දෙයක් අද විපක්ෂයට නැති වෙලා තිබෙනවා. මේ ලෝක අර්බුදයට සාර්ථකව මුහුණ දීපු රජයක් විධියට අද සියයට 70කට එහා එන්නත්කරණය අවසන් කරලා තිබෙනවා.

ඒ නිසා අද ඇල්ල, මිරිස්ස, වැලිගම ගියාම යළිත් සංචාරකයන් මේ රටට පැමිණීමේ ප්‍රවණතාවක් ඇති වී තිබෙන බව පෙනෙනවා. අපි මීට මාස දෙක තුනකට කලින් මිරිස්ස, වැලිගම ගියාම දැක්කා, ඒ ක්ෂේත්‍රයේ නියැළුණු අයට අඩු ගණනේ තමන්ගේ වෘත්තියට මොකක්ද වෙන්නේ කියන බලාපොරොත්තුවවත් තිබුණේ නැහැ කියලා. හැබැයි, අද මේ හරහා යම්කිසි බලාපොරොත්තුවක් ඇති වෙලා තිබෙනවා. මම විශ්වාස කරනවා, අපට මේ අර්බුදය ජයග්‍රහණය කරලා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම වැඩ පිළිවෙළ මේ දශකය තුළ ක්‍රියාත්මක කරගන්නට හැකි වුණොත්, දශකයකින් පස්සේ ජීවත් වෙන්න පුළුවන් රටක් ඇති කිරීමට හැකියාව ලැබෙයි කියලා.

පාර්ලිමේන්තුවේ ඉන්න ළා බාලම මන්ත්‍රීවරයා විධියට මම තරුණ පරපුරෙන් ඉල්ලීමක් කරනවා. 1990න් පසුව ඉපදුණු පරම්පරාව, 2000න් පස්සේ ඉපදුණු පරම්පරාව අද අලුත් විධියට හිතන්න පුරුදු වෙලා තිබෙනවා. එහෙම හිතන පරපුරට අවශ්‍ය රට නිර්මාණය කිරීම සඳහා ඔවුන්ටත් යම් කැප කිරීමක් කරන්න වෙයි කියා මම විශ්වාස කරනවා. අපේ දෙමව්පියන් කථා කරනවා, 77 වැඩ පිළිවෙළ ඉස්සරහට ගියා නම්, අද වෙද්දි රට වෙනස් වෙන්න තිබුණා කියලා. අපේ පරම්පරාවටත් තව අවුරුදු 10කින්, 20කින් කියන්න වෙනවා, අපි එදා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා නම්, අද රට මෙතැනින් එහාට යන්න තිබුණා කියලා. ඒ නිසා අපි තරුණ පරපුරෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. මේ රට වෙනුවෙන් යම් කැප කිරීමක් කරන්න අපි සියලුදෙනා සූදානම් වෙන්න ඕනෑ. ඒ සඳහා කැප කිරීමක් කරන්න පුළුවන් නායකයෙක් අපට ලැබී තිබෙනවා. ඒ නායකයා ඒ කැප කිරීම කරලා පෙන්වා තිබෙනවා. එතුමාගේ වැය ශීර්ෂය ගත්තත් බලන්න පුළුවන්-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, please wind up now.

**ගරු නිපුණ රණවක මහතා**
(மாண்புமிகு நிபுண ரணவக)
(The Hon. Nipuna Ranawaka)
මේ කටයුතු කර ගන්න අතිගරු ජනාධිපතිතුමාට, අගමැතිතුමාට, මුදල් ඇමතිතුමාට, කැබිනට් මණ්ඩලයේ සියලුදෙනාට ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. මේ වැඩ පිළිවෙළ සාර්ථකව අවසන් කරගෙන දශකයක් ඇතුළත සෞභාග්‍යයේ දේශය ගොඩනැඟීමට අවශ්‍ය ශක්තිය ලැබේවා කියා පතමින් සියලුදෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The next speaker is the Hon. Mujibur Rahuman. You have 13 minutes. Before he starts, the Hon. Weerasumana Weerasinghe will take the Chair.

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. WEERASUMANA WEERASINGHE *took the Chair.*

[අ.භා.2.04]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන්ම වරාය හා නාවික අමාත්‍යාංශයේ, ජලසම්පාදන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ වෙනුවෙන් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජාතික සම්පතක් වන වරාය කියන්නේ රටක තිබෙන ඉතාම ආර්ථික වැදගත්කමකින් යුත් ආයතනයක්. වරායේ දියුණුවට හැම ආණ්ඩුවක්ම යම් යම් ප්‍රමාණයෙන් දායකවෙලා තිබෙනවා. මට පෙර කථා කළ ආණ්ඩු පක්ෂයේ හුඟක් මන්ත්‍රීවරු චෝදනා කළා, අපේ ආණ්ඩුව කාලයේ හම්බන්තොට වරාය විකුණුවා කියලා. ඒ නිසා ඒ වරාය ගැන අපිට නොයෙකුත් චෝදනා එල්ල වෙනවා. අද ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් එහෙම චෝදනා කළත්, එතුමන්ලාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ හා මැතිවරණ ව්‍යාපාරය තුළ ප්‍රධානම සටන් පාඨයක් හැටියට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එදා ඉදිරිපත් කළා, හම්බන්තොට වරාය නැවත පවරා ගන්නවා කියලා. මා ළඟ තිබෙනවා, "ගෝඨාභය රට හදන සෞභාග්‍යයේ දැක්ම" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය. මෙහි 58 පිටුවේ එතුමා පැහැදිලිවම කියලා තිබෙනවා, "හම්බන්තොට වරාය ගිවිසුම සංශෝධනය කිරීමට චීන රජය සමඟ රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා නොපමාව ආරම්භ කිරීමට කටයුතු යොදනු ලැබේ" කියලා. හැටනවලක්ෂයක ජනතාවගේ ඡන්දය ලබාගන්න මේකත් එතුමා පාවිච්චි කරපු එක සටන් පාඨයක්. නමුත්, එතුමා බලයට ආවාට පස්සේ දෙසැම්බර් 20 වාගේ දවස්වල විදේශීය මාධ්‍යකරුවන් එක්ක ජනාධිපති ලේකම් කාර්යාලයේ පවත්වපු සාකච්ඡාවේදී, හම්බන්තොට ගිවිසුම වෙනස් කිරීමේ අදහසක් එතුමාට නැහැ, හම්බන්තොට ආරක්ෂක තත්ත්වය ගැනයි එතුමා උනන්දු වන්නේ කියලා මාධ්‍යවලට ප්‍රකාශ කරලා තිබුණා. ඊට පස්සේ ඒ කියපු දේම චීන තානාපති කාර්යාලය විසින් ට්විටර් පණිවුඩයක් මඟින් සනාථ කරලා තිබුණා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2019.12.20වන දා කළ ප්‍රකාශය ගැන චීන තානාපති කාර්යාලයෙන් ට්විටර් පණිවුඩයක් නිකුත් කර තිබෙනවා.

ඔබතුමන්ලා අපට ඒ ගැන චෝදනා කරනකොට අනෙක් පැත්තෙන් අපට මේකත් අහන්න වෙනවා. ඔබතුමන්ලා ජනතාවගෙන් වරමක් ගත්තේ මේ වරාය නැවත පවරා ගන්නවා කියලායි. නමුත්, දැන් ඒ දුන් වරමට මොකද වුණේ? ඒක පවරා ගන්නවාද නැද්ද? අපි දන්නවා, දැන් ඒ ගැන ඔබතුමන්ලාගේ කථාවක් නැති බව.

ඔබතුමන්ලාගේ කාලයේ -2015ට කලින්- වරාය හදන්න සියයට 6ක වාගේ ඉහළ පොලී ප්‍රතිශතයකට ඩොලර් මිලියන 400කට වැඩි ප්‍රමාණයක් චීන බැංකුවකින් ණයක් ගත්තා. සියයට 6ක පොලියකට ණය අරගෙන තමයි හම්බන්තොට වරාය හැදුවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතිහාසයට යමු කෝ.

කොළඹ වරායේ අපට පර්යන්ත කිහිපයක් තිබෙනවා. ඒ පර්යන්ත කිහිපය අරගෙන බලන කොට South Asia Gateway Terminal - SAGT - කියන පර්යන්තයේ අයිතිය සියයට 85ක් ජෝන් කීල්ස් සමාගමට දුන්නා. වරාය අධිකාරියට අයිතිය තිබෙන්නේ සියයට 15යි. කවුද ඒක දුන්නේ? 1999 වසරේ තමුන්නාන්සේලාගේ කලින් හිටපු නායිකාව තමයි ඒක දුන්නේ. අද ඉන්න අගමැතිතුමාත් ඒ නායිකාව යටතේ එදා ඒ කැබිනට් මණ්ඩලයේ හිටියා. ආණ්ඩු පක්ෂයේ ඉස්සරහ පේළිවල වාඩි වෙලා ඉන්න බහුතරයක් නොවෙයි, ඔක්කෝම එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ හිටියා. වාසුදේව නානායක්කාර මැතිතුමා හිටියාද කියන්න මම දන්නේ නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම ආණ්ඩුවෙන් අස්වෙලා විපක්ෂයේ වාඩි වුණා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමා විතරක් විපක්ෂයට ආවා.

ඒ කැබිනට් මණ්ඩලයේ හිටපු උදවිය අද මේ ආණ්ඩුවේ ඉන්නවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ ආණ්ඩුවේ ප්‍රධාන කැබිනට් ඇමතිවරයෙක්. ඔබතුමන්ලා තමයි මේ රටේ තිබෙන සම්පත් විදේශීය සමාගම්වලට දුන්නේ. 2013 වසරේ CICT එක චීන සමාගමට දුන්නේ කවුද? 2013 වසරේ CICT එකේ සියයට 85ක අයිතිය චීනයට දුන්නා. වරාය අධිකාරියට අයිති සියයට 15යි. කවුද ඒක දුන්නේ? මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති වෙලා ඉන්න කාලයේ තමයි CICT එක දුන්නේ? එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා හැටියට CICT එක විවෘත කරන්න ගිය වෙලාවේ, CICT එක ගත්තු චීන සමාගම අඩුම ගණනේ ලංකාවේ ජාතික කොඩියවත් දාන්න දුන්නේ නැහැ. මම දන්නේ නැහැ, මේ සභාවේ ඉන්න උදවියට ඒක මතක තිබෙනවාද කියලා. එහෙමයි විවෘත කරන්න දුන්නේ. CICT එක ඇතුළේ අපේ ජාතික කොඩියවත් දාන්න දුන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි ඒක විවෘත කළේ. චීන ජාතිකයන්ගේ කොඩි ටික දාලා තියෙද්දී තමයි එතුමා ඒක විවෘත කළේ.

ඊයේ - පෙරේදා බටහිර පර්යන්තයත් දුන්නා. කාටද දුන්නේ? අදානි සමාගමට.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එතැන පර්යන්තයක් නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
පර්යන්තයක් නැහැ. මුහුද හරි දුන්නා නේ; මුහුද දුන්නා නේ. පර්යන්තය ඔවුන් හදා ගනියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ හිටපු නායිකාව චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියත් ඒවා දුන්නා; මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාත් දුන්නා. විදේශිකයන්ට දීපු දේශීය සම්පත් සියල්ල නැවත ගන්නවා කියලා තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට ආවේ. මැතිවරණ පොරොන්දුවෙන් හම්බන්තොට වරාය නැවත පවරා ගන්නවා කියලා ආපු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වරායේ බටහිර පර්යන්තයත් දුන්නා. දැන් ඉතුරු වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් නැඟෙනහිර පර්යන්තය ඉතුරු වෙලා තිබෙනවා. JCT එක ඉතුරු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ - පෙරේදා ලෝකයේ තිබෙන විශාලම නැව ලංකාවට ආවා. ඒ එවර් ග්‍රීන් සමාගමට අයත් එවර් ඒස් නැව. ඒකේ කන්ටේනර් 24,000ක වාගේ ප්‍රමාණයක් ආවා. ඒ නැව ආවේ කොහේටද? ඒ නැව CICT පර්යන්තයට තමයි ගියේ; JCT එකට ආවේත් නැහැ, ECT එකට ආවේත් නැහැ. ඇයි ඒ? ඒකට JCT එකට එන්න බැහැ. JCT එක ඉතාම අඩු ගැඹුරක් තිබෙන පර්යන්තයක්. ඒ නිසා CICT එකට තමයි ඒ නැව ගියේ. 2013 වසරේ මහින්ද රාජපක්ෂ මැතිතුමා චීන ජාතිකයන්ට ලබා දීපු පර්යන්තයට තමයි ලෝකයේ විශාලම නැව ගියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නැවට ECT එකට එන්න පුළුවන්. එකේ මීටර් 28ක ගැඹුරක් තිබෙනවා. නමුත් ECT එකට ඒ නැව ආවේ නැහැ. ECT එකට ආවොත් ඒ නැව පාලනය කරන්න -ඒක handle කරන්න- අවශ්‍ය යන්ත්‍රසූත්‍ර තවම ECT එකේ සවි කරලා නැහැ. ජනවාරි මාසයේ රුපියල් මිලියන 13,000කට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කළා ECT එක සංවර්ධනය කරන්න. දැන් මේ අවුරුද්ද ඉවර වෙන්නත් යනවා. ඒත් ECT එක වෙනුවෙන් කරපු සංවර්ධනය මොකක්ද? කිසිම සංවර්ධනයක් කරලා නැහැ. බටහිර පර්යන්තය අදානි සමාගමට දීලා, බටහිර පර්යන්තය අදානි සමාගම හදාගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා "එක්ස්-ප්‍රෙස් පර්ල්" නැවේ තත්ත්වය. ඒ නැව ගිනි ගත්තා. අපි ඒක දන්නවා. ඒකට යම් කිසි වන්දි මුදලකුත් හම්බ වුණා. ඒ සම්පූර්ණ වන්දි මුදල කොයි තරම් ප්‍රමාණයක්ද කියලා අපේ ඇමතිතුමාගේ කථාවේදී කියයි කියලා මම හිතනවා. ඒ මුදල් ප්‍රමාණය කොහොමද මේ රටට ලැබෙන්නේ කියලා අපි දැන ගන්න ඕනෑ. ඒ නැව ගිනි ගැනීමෙන් පරිසරයට විශාල හානියක් වුණා. ඒ වාගේම ඒ ප්‍රදේශයේ ජීවත් වෙන ජනතාවගේ ආර්ථික ක්‍රියාවලියට විශාල හානියක් ඒ නැව හරහා සිද්ධ වුණා. ඒ ජනතාවට වෙච්ච පාඩුවට මොන විධියට මුදල් දෙනවාද කියලා අපි දැන ගන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අපට තව එක ප්‍රශ්නයක් තිබෙනවා. අපි නැවක් ගිනි ගන්නවා දැක්කා. ඊට කලින් නැඟෙනහිර ප්‍රදේශයේ මුහුදු සීමාවේදීත් නැවක් ගිනි ගත්ත හැටි අපි දැක්කා. ඒ නැව ගිනි ගත්තාම ඒක නිවන්න මොකක්ද කළේ? ඒ ගින්න නිවන්න එක්කෝ ඉන්දියාවේ වරායෙන් එන්න ඕනෑ. නැත්නම් සිංගප්පූරුවේ වරායෙන් එන්න ඕනෑ. නැඟෙනහිර පළාතේදී ගිනි ගත්තු ඒ නැවේ ගින්න ඉන්දියාවේ වරායෙන් ආපු නැවකින් නිව්වා. "එක්ස්-ප්‍රෙස් පර්ල්" නැවේ ගින්න නිවීම පමාවීම් ගැනත් නොයෙකුත් චෝදනා තිබෙනවා

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ වරායයන් ලෝකයේ තිබෙන ඉහළම වරායයයන් හැටියට සියලුදෙනා පිළිගන්නවා. ඒකේ වාදයක් නැහැ. ත්‍රිකුණාමල වරාය ස්වාභාවික වරායක් හැටියට ඒ මුහුදු මාර්ගයේ පිහිටා තිබෙන ඉතා වැදගත් වරායක්. නමුත්, ඒ වරායේ යටිතල පහසුකම් දියුණු වෙලා තිබෙනවාද කියන ගැටලුව අපට තිබෙනවා. ඒක තමයි මම කිව්වේ, ඒ අවට නැවක් ගිනි ගත්තාම ඒ ගින්න නිවන්න අල්ලපු රටවල්වලින් එනකල් අපට බලාගෙන ඉන්න වුණා කියලා. ඒක ඉතා ඛේදනීය තත්ත්වයක්.

එහෙම වුණාම වෙන්නේ මොකක්ද? ලංකාවට එන නැව් ප්‍රමාණය අඩු වෙන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. ඒ නැව් ලංකාවට එනකොට රක්ෂණය කරන්න ඉතා අධික මුදලක් ගෙවන්න වෙනවා. මොකද, යම්කිසි ආකාරයකින් අනතුරක් සිදු වුණොත් ඒ අනතුර වළක්වා ගන්න අපේ වරායට ඒකට අවශ්‍ය යන්ත්‍රෝපකරණවල විශාල අඩුවක් තිබෙන නිසා. මම දන්න විධියට, මට ලැබිච්ච තොරතුරු අනුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවම අපට තිබෙන්නේ 1980 දශකයේ ලබා ගත්ත යන්ත්‍රෝපකරණ.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මේ තත්ත්වය තුළ මොකක්ද වෙන්නේ? ඒ හානි වළක්වා ගන්න අපි අපොහොසත් බව ජාත්‍යන්තරය දැන ගන්නවා නම්, යම්කිසි ආකාරයෙන් ඒ ගොල්ලන් තුළ තිබෙන බලාපොරොත්තු අඩු වනවා නම් ඒ අය අපේ වරායවලට එන්නේ නැහැ. එවිට අපට ලැබෙන්න තිබෙන ආදායම තමයි අඩු වෙන්නේ. වරායට නැව් පැමිණීම අඩු වනවා කියන්නේ, වරායට ලැබෙන ආදායම අඩු වනවා කියන එකයි. ඒ නිසා අපට අයිතිය තිබෙන පර්යන්ත දෙකේම යටිතල පහසුකම් ටික හා වරාය අධිකාරියේ යටිතල පහසුකම් ටික දියුණු කිරීමේ ලොකු වගකීමක් රජයට තිබෙනවා. ඒ දියුණු කිරීමත් එක්කයි අපට මේ කලාපයේ තිබෙන වරායවල් එක්ක, සංවර්ධනය වන වරායවල් එක්ක තරගයකට යන්න පුළුවන් වන්නේ.

දැන් ලංකාවට එන නැව්වලින් සියයට 70ක් යන්නේ CICT එකටයි, ජෝන් කීල්ස් සමාගමට අයිති SAGT එකටයි. සියයට 30ක් තමයි අපට අයිති පර්යන්තයට එන්නේ. අපට අයිති පර්යන්තයට එන්නේ ඉතා කුඩා නැව්. විශාල නැව් එනකොට ඒ වාසිය CICT එකට යනවා, අපේ පර්යන්තයේ ගැඹුර ඉතා අඩු නිසා. ඒ නිසා මම ගරු ඇමතිතුමාට කියන්න කැමැතියි, ඉතා ඉක්මනින්ම -වහාම- ECT එක සංවර්ධනය කරන්න කියලා. ඉතා ගැඹුරක් තිබෙන ECT එක සංවර්ධනය කිරීම තුළින් තමයි අපට ආදායම වැඩි කර ගැනීමට පුළුවන් වෙන්නේ. අපි මේ පර්යන්තයේ සංවර්ධන කටයුතු පමා කරන්න, පමා කරන්න, අපේ රටේ තිබෙන සම්පත්වලින් විදේශීය සමාගම් තමයි උපරිම ලාභය ලබන්නේ.

අවසාන වශයෙන් මා අපේ ජලසම්පාදන ඇමතිතුමාගේ අවධානයට කරුණක් යොමු කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, මේ දවස්වල කොළඹ නගරයේ වතුවල ඉන්න ජනතාවට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, වතුවල ඉන්න ජනතාවට පොදු පහසුකම් යටතේ ලබා දීපු ජල පහසුකම කපා දැමීම. මේ පිළිබඳව පසුගිය කාලයේ යම් එකඟතාවකට ආවා. නිවාසවල ජල පහසුකම නැති වතුවල ඉන්න ජනතාවට පොදු ජල පහසුකම දීලා තිබුණා. කවුරු හෝ කෙනෙක් පෞද්ගලිකව ඒකේ අයිතිය භාරගෙන ඒ බිල්පත් පවා ගෙවාගෙන ආවා. නමුත්, ඒ ගෙවීම් පවා කරගෙන ආපු ජල පහසුකම හුඟක් තැන්වල මෑත කාලයේදී නැති කරගෙන යනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කිව්වා නේ. ඒවා ඔක්කෝම ආපහු ලබා දෙනවා. ඒවා එකක්වත් කපන්නේ නැහැ. එයාලාට බලයක් නැහැ ඒවා කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මම අනිවාර්යයෙන්ම ඔබතුමාගේ අවධානයට ඒ ලැයිස්තුව ඉදිරිපත් කරන්නම්. පසුගිය සතියේ පවා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරින් ඇවිල්ලා කොළඹ නගරයේ වතු කීපයක ජල සම්බන්ධතාව කපා දමලා ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, සඳහන් කළ කරුණු කෙරෙහි ගරු ඇමතිතුමන්ලාගේ අවධානය යොමු කරමින්, මගේ කථාව අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.18]

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වතුර තිබහෙන් ඇවිදපු මිනිස්සුන්ට වස දාපු කිරි පැකට් දීපු අය, අද වතු නිවාසවල ජලය කැපීම ගැන මේ ගරු සභාවේ කියනවා. පිපාසයෙන් ඇවිදපු මිනිස්සුන්ට වස දැමූ කිරි පැකට් දීපු අය තමයි ඒවා කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේ අද උදෑසන ඉඳලා බොහෝ අවස්ථාවල වරායේ බටහිර පර්යන්තය ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා වුණා.

බටහිර පර්යන්තය අපි ගොඩ නැඟුවේ නැති පර්යන්තයක්; ගොඩ නඟන්න තවමත් අපේක්ෂා කරන පර්යන්තයක්. නමුත් අපි හදලා අවසන් වුණු, ආදායම් ලබා ගන්න තිබුණු වරාය විකුණපු බව මේ මහත්වරුන් කාටත් අද අමතක වෙලා තිබෙනවා. අපි හදලා ඉවර වෙලා අපට ආදායම් ලබන්න තියෙද්දී තමයි ඒ වරාය විකුණුවේ. දැන් අහනවා, ඒ වරාය කවදාද පවරාගන්නේ කියලා. හදලා ඉවර වුණු වරාය කුණු කොල්ලයට විකුණුවා. ඒ වරාය පවරා දීපු කාලය අවසන් වෙද්දී මේ ඉන්න ඔබතුමන්ලාගේත්, අපේත් ජීවිත කාලය අවසන්. ඒ වරාය විකුණලා දැන් අහනවා, කවදාද ඒක පවරාගන්නේ කියලා. එදා ජනතා විමුක්ති පෙරමුණේ මහත්වරුන්ට තිබුණා, ඒකට විරුද්ධව නැඟිටින්න. හැබැයි ඒ එක මන්ත්‍රීවරයෙක්වත් ඒකට විරුද්ධව නැඟිට්ටේ නැහැ. මේ කථා කරන මම සති තුනක් තංගල්ල බන්ධනාගාරයේ රිමාන්ඩ් භාරයේ හිටියා. හම්බන්තොට වරාය විකුණන වෙලාවේ ඒකට විරුද්ධව උද්ඝෝෂණය කළාම, ඒකට විරුද්ධව පෙළපාළි ගියාම, පාරේ ටයර් එකක් පුච්චලා මහ පාරට හානි කළා කියලා, පාරට රුපියල් 395,000ක හානියක් කළා කියලා මාව සති තුනක් රිමාන්ඩ් බන්ධනාගාරයේ තැබුවා. තවම ඒ නඩුව යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය ගෙන ආවේ මේ මාතෘභූමියේ අනාගතය ගැන හිතලා මේ මාතෘභූමිය හදන්නයි. හැබැයි අපි කවුරුත් අපේක්ෂා නොකරපු විධියට දැවැන්ත ව්‍යසනයකට -වසංගතයකට- මුහුණ දෙන්න අපට සිද්ධ වුණා. එහෙම තත්ත්වයක් තිබියදීත් අප රටට ආයෝජකයකු ගෙනෙන කොට ඒ ආයෝජකයා ගේන්න දෙන්නේ නැතිව, ඒ ආයෝජනය කරන්න දෙන්නේ නැතිව අද මේ විපක්ෂයේ කණ්ඩායම හදන්නේ නැවත වතාවක් රටේ ආර්ථිකය හිර කරන්නයි, ආර්ථිකය විනාශ කරන්නයි.

අපි කියනවා, ඔබතුමන්ලාගේ අපේක්ෂා සාර්ථක වන්නේ නැහැ කියලා. මේ අමාරුකම් මැද්දේ, මේ තියෙන ගැටලු මැද්දේ අපි කොහොම හරි මේ මාතෘ භූමිය ඔසවා තබනවා. අපි මේ ආර්ථිකය නැවත නැඟිටුවනවා. ඒ සඳහා අද අපට හොඳ ඇමතිවරු කණ්ඩායමක් ඉන්නවා. මේ අමාත්‍යාංශ දෙකේ අපේ ගරු රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමා, ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා, ගරු සනත් නිශාන්ත රාජ්‍ය ඇමතිතුමා, ගරු ජයන්ත සමරවීර රාජ්‍ය ඇමතිතුමා තම අමාත්‍යාංශවලට අදාළව දක්ෂ ලෙස වැඩ කරනවා. ඒ විතරක් නොවෙයි, වැඩ කරන්න පුළුවන්,

දක්ෂ, ආදරයෙන් වැඩ කරන, මේ රට ගැන කැක්කුමකින් වැඩ කරන ලේකම්වරු ඇතුළු හොඳ නිලධාරි කණ්ඩායමක් එතුමන්ලාට ලැබී තිබෙනවා. ඒ නිසා අපි අභියෝග ජය ගන්න සූදානම්. අපි අභියෝග ජය ගන්නවා.

ඔබතුමන්ලා මේ පාලනය අපට භාර දෙද්දී ගාල්ල දිස්ත්‍රික්කයේ විතරක් ජලය ලබා ගන්න පොරොත්තු ලේඛනයේ 14,000ක් හිටියා. ඒ වෙද්දී එක ජල සැපයුමක්වත් දෙන්න බැරිව හිටියේ. ජලය ගන්න අවුරුදු 4ක් පෝලිමේ හිටපු මිනිසුන්ට අද කිසිම පෝලිමක් නැහැ. අද ගාල්ලේ සියලු ජල සැපයුම් දීලා ඉවරයි. අද අපේ දිස්ත්‍රික්කය තුළ ගාල්ල නගරයේ අයදුම් පත්‍රය භාර දෙන කෙනාට සතියෙන් ජලය සපයනවා. ජල සම්පාදන මණ්ඩලයෙන් ආවරණය නොවන සියලු ගම්මාන අපි ජාතික ප්‍රජා ජල සම්පාදනය හරහා ආවරණය කරනවා. දිගු කාලීන සැලසුම් විධියට ඒ ජල සම්පාදන වැඩසටහන සකස් කරමින් ඉදිරි වසර පහ තුළ ගාල්ල දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, ලංකාවේ සැමට ජලය සපයන්න පුළුවන් වැඩ පිළිවෙළ අපි සකස් කරමින් ඉන්නවා. ජල සම්පාදනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් මේ අය වැය ලේඛනයෙන් රුපියල් මිලියන 48,000ක් අපි වෙන් කර තිබෙනවා. ගරු මන්ත්‍රීවරුනි, අපි වැඩ කරන ආණ්ඩුවක්; අපි ජනතාවගේ ප්‍රශ්න -ජනතාවගේ ගැටලු- විසඳමින් යන ආණ්ඩුවක්. ඒ සඳහා අපට වැඩ කරන ඇමතිවරු ඉන්නවා; වැඩ කරන අමාත්‍යාංශ ලේකම්වරු ඉන්නවා. අද මහා මාර්ග අමාත්‍යාංශය, නිවාස අමාත්‍යාංශය ගත්තාම, ඉතා දක්ෂ ලෙස වැඩ කරනවා. පුතාණෝගේ කාලයේ අපේ දිස්ත්‍රික්කයේ ගෙවල් 150ක් විතර හදලා තියෙනවා. හැබැයි ඒ ගෙවල් 150 හදලා තියෙන්නේ රුපියල් ලක්ෂ 3 ගණනේ ණය දීලා. ඒකට බෝඩ් ගහලා තියෙනවා; සමරු ඵලකයක් හදලා තියෙනවා, රුපියල් ලක්ෂ 6 1/2 ගණනේ.

ඒ විතරක් නොවෙයි. පත්තර භාගයක දැන්වීම් පළ කරන්න, ගාල්ලේ උදාගමේ ගෙවල් පහළොව හදපු දැන්වීම කුරුණෑගලත් අලවන්න මුදල් වියදම් කළා. එහෙම තමයි පුතාණෝලා ගෙවල් හැදුවේ. හැබැයි, අපේ දිස්ත්‍රික්කයේ විතරක් මේ වන කොට අපි ගෙවල් 1,700ක් හදලා තිබෙනවා. අපි ඒ ගැන එක දැන්වීමක්, එක සමරු ඵලකයක්, එක පෝස්ටරයක් ගහලා නැහැ. මේක, වැඩ කරන ආණ්ඩුවක්. අප පසු ගිය අවුරුද්දේ ජල සම්බන්ධතා 10,000ක් දුන්නාට, තමුන්නාන්සේලාට එක ජල සම්බන්ධතාවක් දෙන්න බැරිව හිර වෙලා සිටියා. එදා ජල ධාරිතාව එක ඝන මීටරයකින් වැඩි කළේ නැහැ. අපේ දිස්ත්‍රික්කයේ මේ වසර තුළ අපි ජල සම්පාදනයේ ධාරිතාව වැඩි කළා විතරක් නොවෙයි, පොරොත්තු ලේඛනයේ හිටපු සියලුදෙනාට ජලය සපයා අවසන් කළා. පාර හදද්දී, වතුර ටික දෙද්දී, කටුමැටි පැල්පත, ලෑලි නිවස වෙනුවට හොඳ නිවසක් හදද්දී, වැසිකිළි නැති අම්මාට, තාත්තාට වැසිකිළි හදලා දෙද්දී දරාගන්න බැහැ, ඔබතුමන්ලාට. ඔබතුමන්ලාට කරන්න බැරි වෙච්ච වැඩ ගොඩක් අපි අද කරනවා. ගමේ ජනතාවගේ වැඩ අප අතින් සිද්ධ වෙනවා. ගමේ ජනතාවගේ වුවමනාවන් ටික අපි ඉෂ්ට කරනවා. ගමේ ජනතාවගේ අවශ්‍යතා ටික අපි පිරිමසනවා. ලබන අවුරුද්ද මේ අය වැය ලේඛනය තුළින් මිනිසුන්ගේ ආර්ථිකය හදන අවුරුද්දක්. ලබන අවුරුද්ද මේ අය වැය ලේඛනය තුළින් මිනිසුන්ගේ ජීවනෝපාය නැඟිටුවන අවුරුද්දක්; යටිතල පහසුකම් ටික හදනවා වාගේම අනෙකුත් සියලු අවශ්‍යතා ඉටු කරන්නත්, මිනිසුන්ගේ ජීවනෝපාය හදා දෙන්නත් උදව් කරන අවුරුද්දක්. අපි ලෑස්තියි, ඔබතුමන්ලා දෙන ඕනෑම අභියෝගයක් භාර ගන්න.

ඔබතුමන්ලා දෙන ඕනෑම අභියෝගයක් භාරගෙන, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා එක්ක, ජනතාවගේ අනාගතය භාරගත් ආණ්ඩුවක් විධියට ජනතාව වෙනුවෙන් මේ රට සාර්ථක අනාගතයක් කරා රැගෙන යන්න අපි සූදානම්.

පසු ගිය කාලය පුරා ඔබතුමන්ලා කළේ මේ රට අගාධයට රැගෙන යෑමයි. සෑම පැත්තකින්ම රට අගාධයට රැගෙන ගියා. සෑම දර්ශකයක්ම රට පහළට හෙළුවා. ඔබතුමන්ලා කියන්න, ඒ දර්ශක පහළ යන්න ඔබතුමන්ලාගේ කාලයේ මොන වසංගතයද තිබුණේ කියලා? ඒ සියලු දර්ශක පහළට යන්න ඔබතුමන්ලාගේ කාලයේ තිබුණු වසංගතය මොකක්ද? මොකක්ද තිබුණු ලෙඩේ? මොකක්ද ඔබතුමන්ලාට තිබුණු බාධාව? හැබැයි, ඒ සියලු දර්ශකවලින් අපේ රට පහළට රැගෙන ගියා. හොරා කාලා හොරා කාලා අද අහනවා, "හොරු අල්ලන්නේ නැද්ද" කියලා. මහ බැංකුව කඩලා, අද අපෙන් අහනවා, "හොරු අලන්නේ නැද්ද?" කියලා. වරාය විකුණලා, අද අහනවා, "වරාය පවරා ගන්නේ නැද්ද" කියලා. තමුන්නාන්සේලා මතක තියාගන්න, තමුන්නාන්සේලා කවුද කියලා ජනතාව හොඳින්, පැහැදිලිව තේරුම් ගෙන ඉන්න බව. ජනතාවට අමතක වෙලා නැහැ, තමුන්නාන්සේලා කවුද කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිවම මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා. ඒ තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා එක්ක මේ මාතෘ භූමිය ගොඩනඟනවාය කියන පොරොන්දුව. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය මේ රටේ ජනතාව අනුමත කළා. ඒ අනුමත කළ සෞභාග්‍ය කරා මේ ජනතාව රැගෙන යන්න අපට වගකීමක් තිබෙනවා. ඒ වගකීම අපි තේරුම් ගෙන ඉන්නවා. අපි දිස්ත්‍රික්ක මට්ටමින් ඒකට හයිය දෙනවා. අප ජීවත් වන ප්‍රදේශවල ග්‍රාමීය මට්ටමේ ජනතාව බලාගෙන ඉන්නවා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මේ මාතෘ භූමිය ගොඩ නඟන අයුරු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සූදානම් ඒ ගමනට. මේ මාතෘ භූමියේ හෙට දවස -අනාගතය- වෙනුවෙන් අවශ්‍ය කැපකිරීම් කරමින් ඒ ගමන යන්න අපි ලෑස්තියි. ඔබතුමන්ලා කොච්චර බාධා කළත් වැඩක් නැහැ. කොවිඩ් වසංගතය මැද්දේ ඔබතුමන්ලා බලාගෙන හිටියා, මේ වසංගයෙන් මේ රටේ මිනිස්සු ලක්ෂ ගණනක් මැරෙන කල්. දවසට මරණ සියයක් දෙසියයක් සිදු වන කොට, හාරසියයක් පන්සියයක් මැරෙන කොට තමුන්නාන්සේලා කාලකණ්ණි සතුටක් ලැබුවා. ඒ සෑම දෙයකින්ම, ජනතාව පීඩාවට පත් වන හැම වෙලාවකම තමුන්නාන්සේලා කාලකණ්ණි සතුටක් ලැබුවා. ඒ කාලකණ්ණි සතුට ඔබතුමන්ලා බලය පැහැර ගන්න සතුටක් බවට පත් කර ගන්න මාන බලන වෙලාවේ, ඒ ඕනෑම අභියෝගයකට අප සූදානම් බවත් මා මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.28]

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2022 වසර සඳහා වන අය වැය කාරක සභා අවස්ථා විවාදයේදී වරාය සහ නාවික අමාත්‍යාංශයේත්, ජලසම්පාදන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ ගැන අද සාකච්ඡා කරනවා. විශේෂයෙන්ම වරාය හා නාවික අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න මම අද බලාපොරොත්තු වෙනවා. ඒ ගැන කියද්දී, කරුණු කිහිපයක් මම පැහැදිලි කරනවා.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

ඉන්දියන් සාගරයේ අරුම පුදුම රටක් තිබෙනවා. මේ අරුම පුදුම රටේ වරායක් තිබෙනවා; ශ්‍රී ලංකා වරාය අධිකාරියක් තිබෙනවා; වරාය හා නාවික අමාත්‍යාංශයක් තිබෙනවා. මේ වරාය, ලෝකයේ වරායවලින් 25වන ස්ථානයේ තිබෙනවා. මේ වරායේ වසරකට කන්ටේනර් -බහාලුම්- මෙහෙයුම් ලක්ෂ 65ක් පමණ කරනවා. මේ වරායට පසුගිය අවුරුද්දේ ආදායම වශයෙන් රුපියල් බිලියන 54ක් -රුපියල් කෝටි 5,400ක්- ලැබී තිබෙනවා. රුපියල් බිලියන 20ක් -රුපියල් කෝටි 2,000ක්- ලාභ ලබා තිබෙනවා. ඉන්දියන් සාගරයේ අරුම පුදුම රටේ තිබෙන වරාය එහෙම වෙන්න හේතු කිහිපයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ තිබෙනවා, COPE වාර්තාව. මේ අරුම පුදුම රටේ හම්බන්තොට පැත්තේ සූරියවැව ක්‍රීඩාංගණය කියලා ක්‍රිකට් ක්‍රීඩාංගණයක් තිබෙනවා. COPE වාර්තාවේ තිබෙනවා, මේ ක්‍රීඩාංගණය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය රුපියල් බිලියන 2.18ක් -රුපියල් කෝටි 218ක්- ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවන්න ඕනෑ කියලා. නමුත් මෙවර අය වැය ලේඛනයේ වියදම් සාරාංශයේ තිබෙනවා, රුපියල් මිලියන 797ක් -රුපියල් කෝටි 79.7ක්- ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් සූරියවැව ක්‍රීඩාංගණයට දෙන්න ඕනෑ කියලා. 2020, 2021, 2022, 2023, 2024 යන අවුරුදු 5ට සමස්ත මුදල වන රුපියල් කෝටි 316ක් -රුපියල් බිලියන 3.16ක්- ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට, සූරියවැව ක්‍රීඩාංගණය වෙනුවෙන් දෙනවා. එහෙම වෙන්නේ කොහොමද? COPE වාර්තාවෙන් කියනවා, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් රුපියල් බිලියන 2.18ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට දෙන්න ඕනෑ කියලා. හැබැයි, අය වැය ලේඛනයේ වියදම් සාරාංශයේ තිබෙනවා, ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් සූරියවැව ක්‍රීඩාංගණයට 2020 සඳහා රුපියල් කෝටි 52කුත්, 2021 සඳහා රුපියල් කෝටි 70කුත්, 2022 සඳහා රුපියල් කෝටි 79.7කුත්, 2023 සඳහා රුපියල් කෝටි 58.9කුත්, 2024 සඳහා රුපියල් කෝටි 56කුත් වශයෙන් සමස්ත මුදල ලෙස රුපියල් කෝටි 316ක් දෙන්න ඕනෑ කියලා. අරුම පුදුම රටක නැතුව වෙන රටක මෙහෙම වෙන්න පුළුවන්ද? මේ පිළිබඳව අපේ ගරු ඇමතිතුමා ඉදිරියේ දී කථා කරයි කියලා මා හිතනවා.

තවත් කාරණයක් මම කියන්න ඕනෑ. මේ දවස්වල කොරෝනා වසංගතය තිබෙනවා. මේ අරුම පුදුම රටේ කොරෝනාවත් ගරානාවක් බවට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පත් කරගෙන තිබෙනවා. මා ළඟ තිබෙනවා, අපි පාවිච්චි කරන මුව ආවරණයක්. මා ඊයේ මුව ආවරණ 50ක පැකට් එකක් ගත්තා, රුපියල් 350කට. එක මුව ආවරණයක් රුපියල් 7යි වෙන්නේ. එක මුව ආවරණයක් රුපියල් 40 ගණනේ මුව ආවරණ 12,000ක් ගන්න ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඇණවුම් කරලා තිබෙනවා. ඒ බිල්පත්, ඇණවුම් සහ භාණ්ඩ වරාය තුළට ප්‍රවාහනය කිරීම සඳහා අවසර ලබා ගැනීමේ ලේඛනය යන සියල්ලම මා **සභාගත*** කරනවා. ඒ එක මුව ආවරණයක් රුපියල් 40යි. හැබැයි, සාමාන්‍ය වෙළෙඳ පොළේ මුව ආවරණයක් රුපියල් 7කට ගන්න පුළුවන්. මා මුව ආවරණ 50ක් ගනිද්දී එකක් රුපියල් 7 බැගින් ගත්තේ. එතකොට මුව ආවරණ 12,000ක් ගන්නකොට කොපමණ අඩුවෙන් ගන්න පුළුවන්ද? එක ඇණවුමකින් රුපියල් ලක්ෂ 4කට වැඩි ප්‍රමාණයක් කොරෝනාවෙන් ගරානාවක් කරගෙන තිබෙනවා. රට තුළ වසංගතයක් පවතිනකොට මෙවැනි දේවල් කරන්න පුළුවන් මේ වාගේ අරුම පුදුම රටකම තමයි. එහෙම නැත්නම් මෙවැනි දෙයක් කරන්න විධියක් නැහැ. ගරු ඇමතිතුමනි, මෙවැනි දේවල් සිද්ධවෙලා තිබෙනවා. ඔබතුමා මේ ගැන සොයා බලන්න.

ඒ විතරක් නොවෙයි. මෙම වරායට අයිති අක්කර 13ක ඉඩමක් චීනයට දෙන්න යනවා. ඒ ඉඩම, වරාය නගරය ළඟ තිබෙන ඉතා වටිනා ඉඩමක්. ඒ ඉඩම ඩොලර් මිලියන 150කට දෙන්න යනවා. අය වැයෙන් වරාය හා නාවික අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන්නේ, රුපියල් බිලියන 2.4යි -රුපියල් කෝටි 244යි-. මේ වරාය ඉතා ලාභ ලබන එකක්. මේ වරායෙන් ලාභ ලැබෙන්න නම්, අනෙක් සියල්ලටම අපි ආයෝජනය කරන්න ඕනෑ. හැබැයි, එහෙම ආයෝජනය කරන්නේ නැතුව, මුදල් වෙන් කරන්නේ නැතුව, දැන් ඒ අක්කර 13ක ඉඩම ඩොලර් මිලියන 150කට චීනයට දෙන්න යනවා. වර්තමානයේ ඩොලරයක අගය රුපියල් 200 ගණනේ ගත්තොත්, ඩොලර් මිලියන 150ක් කියන්නේ, රුපියල් කෝටි 3,000ක්. රුපියල් බිලියන 30ක්. හැබැයි, මහාමාර්ග අමාත්‍යාංශයට පසුගිය වසරේ රුපියල් බිලියන 350කුත්, මේ වසරේ රුපියල් බිලියන 250කුත් වශයෙන් රුපියල් බිලියන 600ක් වෙන් කරලා තිබෙනවා. මහාමාර්ග අමාත්‍යාංශයෙන් රටට ආදායමක් ලැබෙන්නේ නැහැ. නමුත් රුපියල් බිලියන 600ක් වෙන් කරනවා. මේ අක්කර 13 චීනයට දෙන්නේ නැතුව, ඒ රුපියල් බිලියන 600න් මේ වරාය සංවර්ධනයට රුපියල් බිලියන 30ක් වෙන් කරන්න බැරි ඇයි? එහෙම කරන්නේ නැත්තේ ඇයි? ආයෝජන ගෙනෙන්නම හදනවා.

ආයෝජන ගෙනෙන්න ඕනෑය කියලා, ඩොලර් ගෙනෙන්න ඕනෑය කියලා මේවා දෙන්න යනවා. වරායේ South Asia Gateway Terminals - SAGT - 1999 දීලා තිබෙනවා. තව අවුරුදු කිහිපයකින් ඒක අපට අයිති වෙනවා. දැන් ඒ ගිවිසුමත් දීර්ඝ කරන්න යනවා කියලා අපට ආරංචි වෙලා තිබෙනවා. Colombo International Container Terminals - CICT - 2012දී මහින්ද රාජපක්ෂ මැතිතුමා අවුරුදු 35කට දුන්නා. දැන් ඒ අයට තමයි මේ අක්කර 13 ඩොලර් මිලියන 150කට දෙන්න යන්නේ. මේක මහා අපරාධයක්. වරාය සේවකයෝ, ඒකාබද්ධ වෘත්තීය සමිති සංගම්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය දැන් මේකට විරුද්ධව කටයුතු කරනවා. එහෙම තියෙද්දී පසුගිය දිනවල වරායේ නැඟෙනහිර පර්යන්තය ඉන්දියාවට දෙන්න තීන්දු කරලා තිබුණා. වෘත්තීය සමිති විශාල අරගලයක් කරලා ඒක නවත්වා ගත්තා. එය නවත්වා ගත්තාට, එහි බටහිර දියකඩනය හදන එක දැන් අදානි සමාගමට ලබා දීලා තිබෙනවා. වරායේ නැඟෙනහිර ජැටිය මීටර් 1,360ක් දිගයි. එයින් මීටර් 600ක් දැන් හදලා තිබෙනවා. ඉතිරි මීටර් 700 ගණන හදන්න රුපියල් බිලියන 13ක් පසුගිය අය වැයෙන් වෙන් කරලා තිබුණා. දැන් ඒ ගැන කථාවක්වත් කරන්නේ නැහැ. අපි හිතන විධියට බටහිර ජැටිය දුන්නා වාගේ දැන් මේකටත් මොනවා හෝ කරන්නද දන්නේ නැහැ, හදන්නේ නැතිව ඉන්නේ. Jaya Container Terminals එකෙන් ගෙනැල්ලා තමයි මේකට අවශ්‍ය දොඹකර 3ක් දැනට සවිකර තිබෙන්නේ. JCT එකේ තිබුණු දොඹකර 3ක් ගෙනැල්ලා එතැන සවිකර තිබෙනවා. තවත් 4ක් හෝ 5ක් අවශ්‍යයි. ඒකට මුදල් වෙන් කරන්නේ නැහැ. විශේෂයෙන්ම මෙම නැඟෙනහිර ජැටිය විශාල ලෙස මුදල් උපයන්න පුළුවන් ස්ථානයක්. එතැනට අවශ්‍ය වෙලා තිබෙනවා තවත් Transfer දොඹකර, RTC දොඹකර 12ක්. ඒවා ගන්න මුදල් වෙන් කරලා තිබුණත්, ඒ ගැන ක්‍රියා කරන්නේ නැත්තේ සමහර විට මේක -,

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

ගරු මන්ත්‍රීතුමා කිව්වා, නැඟෙනහිර පර්යන්තයට JCT එකෙන් ගෙනැල්ලා දොඹකර 3ක් සවිකර තිබෙනවා කියලා. ඒ ගැන මට පොඩ්ඩක් පැහැදිලි කරන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඔව්. JCT එකේ පස්වන අදියරට ගෙනා දොඹකරවලින් 3ක් තමයි සවිකර තිබෙන්නේ, එහෙම නැතිව මේකට වෙනම ගෙනැල්ලා සවිකරලා නැහැ කියලා තමයි අපට දැනගන්න ලැබී තිබෙන්නේ. ඒවා JCT එකේ පස්වන අදියරට ගෙනාපු ඒවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
කවුද ගෙනාවේ?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඔබතුමන්ලා ගෙනැල්ලා තිබෙනවා, ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
ඒක තමයි, ඔබතුමාට දීපු තොරතුර වැරදියි. නැඟෙනහිර පර්යන්තයට අපි ඇණවුම් කළ දොඹකර සියල්ලම ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට ආවාම අවලංගු කළා. එසේ අවලංගු කළාට පසු JCT Phase 5 වැඩ පිළිවෙළට දොඹකර order කළා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කර ගත්ත මෝඩ වැඩේ ගැන ඔබතුමා දැනුවත් කරන්න එපායැ. ඒ වෙලාවේ JCT Phase 5 ක්‍රියාත්මක කරන්න සිවිල් එක හදන්නේ නැතිව ප්‍රසම්පාදනයෙන් ගිහිල්ලා cranes ටික ගෙන්නුවා. ඒ cranes ටික ගෙනැල්ලා බාන්න තැනක් නැති නිසා බෑවේ නැඟෙනහිර පර්යන්තයේ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
හරි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
ඔහොම ඉන්න මම මේක කියනකම්. අලියා ගෙනාවා, හෙණ්ඩුව ගෙනාවේ නැහැ. තවම හැදුවේ නැහැ, සිවිල් එක. මම කියනවා, ඒකෙන් අපරාධයක් කළේ කියලා. ඒවා නැඟෙනහිර පර්යන්තයට ගැළපෙන දොඹකර නොවෙයි. වැරදි තොරතුරු කියන්න එපා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
හරි. ඔබතුමාගේ කථාවේදී ඒක පැහැදිලි කරන්න. ඒවා JCT එකට ගෙනාපුවා කියලා දැන් කිව්වා නේ. ඒවා නැඟෙනහිර පර්යන්තයට ගොඩබෑවාට, ඒවා JCT 5 වන අදියරට ගෙනාපුවා නේ. මම කියපු එක හරි නේ, ඔබතුමා දැන් පැහැදිලි කළ විධියට. *[බාධා කිරීමක්]* දැන් ECT එකේ ඉතිරි ටික හදන්න ඔබතුමන්ලා මෙවර මුදල් වෙන් කරලා තිබෙනවාද, වෙන් කරනවාද කියලා ඔබතුමාගේ කථාවේදී පැහැදිලි කරන්න. ඒ තත්ත්වය තුළ නැඟෙනහිර පර්යන්තය හදලා තිබුණොත්, විශේෂයෙන්ම ඒක සේවා මධ්‍යස්ථානයක් විධියට අපට ගොඩනඟා ගන්න පුළුවන්. එයින් අපට විශාල මුදල් ප්‍රමාණයක් එන්න පුළුවන්. මම මුලින් කිව්වා වාගේ මේ වරායේ සමස්ත ආදායමින් සියයට 30යි අපට ලැබෙන්නේ. සියයට 70ක් පෞද්ගලික අංශය සහ වෙනත් රටවල් ගන්නේ. CICT එකෙන් සියයට 85ක් චීනයට අයිතියි. ඒකෙන් සියයට 15යි ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයිති. SAGT එක පෞද්ගලික අංශයේ John Keells Holdings සමාගමට තමයි අයිති වන්නේ. ඒ ගිවිසුම දීර්ඝ කරන්න යනවා කියලාත් ආරංචියක් ලැබී තිබෙනවා. මේවා අපේ රටට අයිති දේවල්. විශේෂයෙන්ම, වරාය කියන්නේ මේ රටේ මර්මස්ථානයක්; අපේ රටට ආදායම් එන ස්ථානයක්. එතකොට ඒ ස්ථානය දියුණු කළ යුතුයි. විශේෂයෙන්ම බලශක්ති ක්ෂේත්‍රයේ කෙරවලපිටිය යුගදනවි බලාගාරයෙන් සියයට 40ක් ඇමෙරිකාවට දෙන්න යනවා. එතකොට වරායේ බටහිර පර්යන්තය ඉන්දියාවට දීලා තිබෙනවා, CICT පර්යන්තය චීනයට දීලා තිබෙනවා. වරාය නගරය අසල තමයි අක්කර 13ක් දෙන්න යන්නේ. මේක අපේ රටේ ජාතික ආරක්ෂාවටත් ප්‍රශ්නයක් වෙනවා. භූ දේශපාලනය අනුවත් මේක විශාල ප්‍රශ්නයක්. චීනය කැමැති නැහැ ඇමෙරිකාවට මේවා දෙනවාට.

චීනය කැමති නැහැ ඉන්දියාවට මේවා දෙනවාට. ඉතින්, විශාල ප්‍රශ්නයක්. හැබැයි, අපේ වරාය ළඟ තිබෙන ඉඩම් සියල්ල දැන් එක එක රටවලට දෙන තත්ත්වයක් ඇවිත් තිබෙනවා. ඒ වාගේම අපට තවත් කරුණක් දැන ගන්න ලැබිලා තිබෙනවා. වරායෙන් පිටත පිහිටි හෙක්ටෙයාර 8ක භූමි ප්‍රමාණයක් ඇති පැරණි ගල්වල, මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් විකිණීමට කටයුතු කරනවා කියලා අපට දැන ගන්න ලැබිලා තිබෙනවා. ඒ ඉඩම වරාය සේවකයන්ගේ නිවාස සහිත ඉඩමක්. ඒ හෙක්ටෙයාර අටක ඉඩම චීන සමාගමකට ලබා දෙන්න වැඩ පිළිවෙළක් සකස් කරනවා කියලා අපට දැන ගන්න ලැබිලා තිබෙනවා, වරාය සේවකයන්ගෙන්. මේ ආණ්ඩුව ආවේ කොහොමද?පසුගිය රජය හම්බන්තොට වරාය දීලා තිබෙනවා, අපි ඒක නැවත ලබා ගන්නවා කියලා බලයට ආවේ. අපි දීපු එකත් ගන්නවා කිව්වා. එහෙම ආපු ආණ්ඩුව දැන් මේ වරායේ තිබෙන සියලු දේවල් දෙන්න යනවා. මේක අපට ආදායම් ලැබෙන වරායක් කියලා කවුරුත් දන්නවා. මේ ලෝකයේ 25වැනි ස්ථානයේ තිබෙන වරායක්. මෙවැනි වරායක් මේ විධියට දෙන්න ගියොත් මොකද වෙන්නේ? ඇයි මේ වරාය සංවර්ධනයට මුදල් වෙන් කරන්නේ නැත්තේ? මහා මාර්ගවලට රුපියල් බිලියන 600ක් -කෝටි 60,000ක්- වෙන් කරනවා. ඔබතුමන්ලා ඩොලර් මිලියන 325ක ණයක් ගන්න ECT එකට යනවා කියලා දැන ගන්න ලැබිලා තිබෙනවා. ඩොලර් මිලියන 325ක්! ඩොලර් මිලියන 325ක ණයක් කියන්නේ කෝටි 6,000ක්. කෝටි 6,000ක් කියන්නේ බිලියන 60ක්. මහා මාර්ගවලට වෙන් කරන මුදල්වලින් බිලියන 60ක් මේ වරාය සංවර්ධනය කරන්න වෙන් කරන්න බැරි ඇයි? ඇයි ණය ගන්නේ? විදේශ ණයක් ගත්තොත් අපි තවත් ණය උගුලක හිර වෙනවා. අය වැයෙන් මහා මාර්ග හදන්න මේ අවුරුදු දෙකට බිලියන 600ක් වෙන් කරලා තියෙද්දී, ඒකෙන් බිලියන 60ක් වරාය හදන්න වෙන් කරන්න බැරි ඇයි?

මේ තත්ත්වය තුළ මම කියන අරුම පුදුම රටේ විදේශිකයෙක්, මොළ හතක් තිබෙන කෙනෙක් මුදල් ඇමති වෙලා ඉන්නවා. ඒ වාගේම දේශපාලනඥයෙක් මහ බැංකු අධිපති වෙලා තිබෙනවා. දේශපාලනඥයකුට පුළුවන්ද මහ බැංකු අධිපති වෙන්න? විදේශිකයෙකුට පුළුවන්ද මුදල් ඇමතිකම ගන්න? ඒක තමයි මේක අරුම පුදුම රටක් කියලා මම කිව්වේ. මේ අරුම පුදුම රටේ මෙවැනි දේවල් සිදු වීම පිළිබඳව අපි ඉතාම කනගාටු වෙනවා. මේවා සිද්ධවීම වළක්වන්න කියලා අපි ඉල්ලා සිටිනවා. වරාය භාර ඇමතිතුමා හොඳ ඇමතිවරයෙක්. ඊයේ, පෙරේදා ඔබතුමා රුපියල් 5ක් වැඩි වුණා කියමින් මාළු පාන් කකා ඉන්නවා සමාජ මාධ්‍යවලින් අපි දැක්කා. අපට හරි සන්තෝෂයි. ඔබතුමා මාළු පාන් ගෙඩියක් කකා ඉන්නවා, සමාජ මාධ්‍යවල පළ වුණා. ඒ වාගේ වීඩියෝ පට දැක්කාම මේ දවස්වල ඔබතුමා හුඟක් ජනප්‍රියයි කියලා පෙනෙනවා. ඇතුළත්මුදලි මැතිතුමාගෙන් පසුව ඔබතුමා මේ වරාය දියුණු කරයි කියලා අපි හිතනවා. ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක්. හැබැයි, මේ වාගේ විකුණන ඒවා කරන්න

[ගරු අශෝක් අබේසිංහ මහතා]

එපා. මම කිව්ව අරුම පුදුම රට තමයි ශ්‍රී ලංකාව. මේ ශ්‍රී ලංකාව කියන අරුම පුදුම රටේ වරායේ තිබෙන අක්‍රමිකතා වහාම නවත්වන්න කියලා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Thavaraja Kalai Arasan. You have 16 minutes.

[பி.ப. 2.41]

**ගරු තවරාජා කලෙයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சு, களஞ்சிய வசதிகள், கொள்கலன்கள் முனையங்கள், துறைமுக வழங்கல் வசதிகள், இயந்திரப் படகுகள் மற்றும் கப்பற்றொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சு மற்றும் நீர் வழங்கல் அமைச்சு ஆகியவற்றின் குழுநிலை விவாதத்திலே கலந்துகொண்டு பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

எங்களுடைய அம்பாறை மாவட்டத்திலே திட்டமிடல் இல்லாமல் ஒரு துறைமுகம் அமைக்கப்பட்டிருக்கின்றது. அதுதான் ஒலுவில் துறைமுகம்! இதன் காரணமாக இன்று பல கிராமங்கள் கடலினால் காவுகொள்ளப்பட்டு அழிக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. இது அம்பாறை மாவட்டத்திலே நடைபெற்றுக்கொண்டிருக்கின்ற பாரியதோர் அழிவாகப் பார்க்கப்படுகின்றது. ஒலுவில் பிரதேசத்திலிருந்து பொத்துவில் வரைக்கும் அதேபோன்று ஒலுவில் பிரதேசத்திலிருந்து மட்டக்களப்பு வரைக்குமுள்ள கடலை அண்டிய பிரதேசங்கள் கடலரிப்பினால் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றன. அப்பிரதேசங்களில் கடல் நீரானது கிட்டத்தட்ட 300 மீற்றர் தூரத்துக்கு ஊடுருவியிருக்கிறது. இப்பொழுதும் அச்செயற்பாடு நடந்துகொண்டுதான் இருக்கின்றது. குறிப்பாக, திருக்கோவில் பிரதேசத்திலுள்ள பிரசித்தி பெற்ற ஓர் ஆலயப் பகுதியின் கிட்டதட்ட 300 மீற்றர் வரையான நிலப்பரப்பு கடலினால் காவுகொள்ளப்பட்டிருக்கிறது. இப்பொழுது அப்பகுதியில் ஒரு தடுப்புச் சுவர் அமைக்கப்பட்டு, அச்செயற்பாடு தடுத்து நிறுத்தப்பட்டிருக்கின்றது.

பாண்டிருப்பிலுள்ள பெறுமதியான ஒரு சிறுவர் பூங்கா கடலரிப்பினால் அழிக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. அதே போன்று, அங்குள்ள ஆலயத்தின் வளவு உட்பட மக்கள் குடியிருப்புக்களும் கடலினால் காவுகொள்ளப்பட்டிருக் கின்றன. இவ்வாறு பாதிக்கப்படுபவர்களுக்கு யார் நட்டஈடு வழங்குவது? இவ்வாறு பல பாதிப்புக்களை ஏற்படுத்துகின்ற கடலரிப்பைத் தடுக்க நடவடிக்கை எடுக்கவேண்டியது யார்? போன்ற கேள்விகளை இங்கு எழுப்ப வேண்டியிருக்கிறது. எனவே, இது தொடர்பில் துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர் அவர்கள் கூடுதல் கவனம் எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

இன்று எங்களுடைய மக்கள் குறிப்பாக, சுனாமியால் பாதிக்கப்பட்ட மக்கள் தங்களுடைய சொந்த வீடுகளில் உறங்குவதற்கு அச்சப்படுகின்றார்கள்; கடலிலிருந்து 500 மீற்றருக்கு அப்பால் சென்று தங்களுடைய உறக்கத்தை மேற்கொள்கின்றார்கள். இப்பொழுது அப்பிரதேசத்தில் வீதி அபிவிருத்தி அதிகாரசபையினூடாக இடப்படுகின்ற ஒரு பாரிய concrete பாதைகூட, கடலரிப்பால் அழிக்கப் பட்டுக்கொண்டிருப்பதனால், அப்பாதை அமைப்பு வேலைகள் கூட நிறுத்தப்படக்கூடிய ஒரு சூழல் இருக்கின்றது. எனவே, இந்த விடயத்திலும் சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் கூடிய கவனமெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். ஏனென்றால், இந்த விளைவுகளுக்கு எல்லாம் ஒலுவிலில் அமைக்கப்பட்டிருக்கின்ற அந்தத் துறைமுகம்தான் காரணம் என்று அந்தப் பிரதேச வாழ் மக்கள் கூறுகின்றார்கள்.

அது அவ்வாறிருக்க, எங்களுடைய அம்பாறை மாவட்டத்திலே குறிப்பாக ஒரு சமூகம் வாழ்கின்ற பிரதேச மக்கள் குடிநீர் இன்மையால் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கிறார்கள். நீண்டகாலமாக அது சம்பந்த மாகப் பல குரல்கள் எழுப்பப்பட்டு வந்த நிலையில், தற்பொழுது அதுசார்ந்த சில பணிகளை கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுத்திருக்கிறார். அதற்காக நான் கௌரவ அமைச்சருக்கு நன்றி தெரிவிக்கின்றேன். எங்களுடைய பிரதேசத்தில் 2012ஆம் ஆண்டுதான் குழாய் மூலமான நீர் விநியோகத் திட்டம் ஆரம்பிக்கப்பட்டது. அதனைத் தற் போதைய கௌரவ கல்வி அமைச்சர் தினேஷ் குணவர்தன அவர்கள்தான் அம்பாறையிலுள்ள ஓர் இடத்தில் ஆரம்பித்துவைத்தார். அந்த ஆரம்ப நிகழ்வில் நானும் கலந்து கொண்டேன். அத்திட்டமானது 2016ஆம் ஆண்டு வரைக்கும் மேற்கொள்ளப்பட்டாலும், குறிப்பாக எங்களு டைய தமிழ்ப் பிரதேசங்கள் புறக்கணிக்கப்பட்ட நிலையில் தான் நிறைவுசெய்யப்பட்டது. நாங்கள் அது சம்பந்தமாக அமைச்சர் களோடும் அதிகாரிகளோடும் கதைத்தும்கூட, எதுவுமே நடைபெறவில்லை. உண்மையிலே, நான் எங்களு டைய கௌரவ அமைச்சர் அவர்களுக்கு மீண்டும் நன்றி தெரிவித்துக் கொள்கின்றேன். ஏனென்றால், இப்பொழுது அந்த வேலைகள் கட்டங்கட்டமாக ஆரம்பிக்கப்பட்டுக் கொண்டிருக்கின்றன.

நாவிதன்வெளி என்பது 70 சதவீதமான தமிழர்களும் 30 சதவீதமான முஸ்லிம்களும் வாழ்கின்ற ஒரு பிரதேசம். இந்தக் குடிநீர் பிரச்சினையால் அங்கு இனரீதியான ஒரு முறுகல்நிலை தோற்றுவிக்கப்பட்டது. இங்கு இனங்களின் ஒற்றுமை பற்றிப் பேசுகின்ற சில அரசியல்வாதிகள், தங்களுடைய சமூகம் சார்ந்தே செயற்பட்டிருக்கிறார்கள். சமூகம் சார்ந்த செயற் பாட்டினூடாகத்தான் இன்று இனரீதியான முறுகல் நிலை உருவாக்கப்பட்டிருக்கின்றது. எங்கு பார்த்தாலும் சமூகரீதியான செயற்பாடுகள்! இதுதான் இந்த நாட்டிலே இருக்கின்ற முக்கியமான பிரச்சினை! இந்த நாட்டிலே வாழ்கின்ற அனைத்துச் சமூகங்களும் சமம் என்ற அடிப் படையிலும், அனைத்து மக்களும் 'இலங்கையர்கள்' என்ற அடிப்படையிலும் இந்த அரசியல்வாதிகள் சில பணிகளைக் கடந்த காலத்தில் முன்னெடுக்கவில்லை. அவ்வாறு முன்னெடுத்திருந்தால், பல பிரச்சினைகளுக்குத் தீர்வு கண்டிருக்கலாம்! அந்த அடிப்படையில்தான் இவர்களுடைய அரசியல் இருக்கின்றது.

மிக முக்கியமாக, நாவிதன்வெளிப் பிரதேசத்திலுள்ள சொறிக்கல்முனை-2 என்று சொல்லப்படுகின்ற வீரசோலைக் கிராமம் நீண்டகாலமாகக் குடிநீர்ப் பிரச்சினைக்கு முகங் கொடுத்துக்கொண்டிருக்கின்ற ஒரு கிராமமாகத்தான் இருக் கின்றது. இது தொடர்பில் நாங்கள் நேரடியாக கௌரவ அமைச்சர் அவர்களிடம் பேசியிருக்கின்றோம். 150க்கும் மேற்பட்ட குடும்பங்கள் வாழ்கின்ற அந்தப் பிரதேசத்தில் வறட்சிக் காலங்களில் பிரதேச சபையூடாகக் குடிநீர்

வழங்கப்படுகிறது. அந்த நிலைமை மாறவேண்டும். ஏனென்றால், கிணறுகளிலிருந்து எடுக்கப்படுகின்ற அந்த நீரானது, மனித குலத்துக்கு ஆபத்தை ஏற்படுத்தக்கூடிய அளவுக்கு மிகவும் மோசமான தரத்தில் இருக்கின்றது. எனவே, குடிநீருக்காகக் கஷ்டப்படுகின்ற அந்த மக்களுக்கு அதனைப் பெற்றுக்கொடுப்பதற்கு நீங்கள் விரைவாக நடவடிக்கை எடுக்கவேண்டுமென்ற அன்பான வேண்டுகோளை நான் உங்களிடம் முன்வைக்க விரும்புகிறேன். அதேபோன்றுதான் சம்மாந்துறைப் பிரதேச செயலகப் பிரிவிலே இருக்கின்ற மல்லிகைத்தீவுக் கிராமமும் இருக்கின்றது. 125க்கும் மேற்பட்ட குடும்பங்கள் வாழ்கின்ற அந்தக் கிராமத்திலும் குடிநீர்த் தட்டுப்பாடு மிகவும் மோசமாக இருக்கின்றது. ஆகையால், அந்த மக்களின் குடிநீர்ப் பிரச்சினையையும் விரைவாகத் தீர்த்துவைப்பதற்கு நீங்கள் நடவடிக்கை எடுப்பீர்கள் என்று நான் நம்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய பிரதேசத்திலே குடிநீர் வழங்கும் திட்டத்துக்காகப் பல இடங்களில் தண்ணீர்த் தாங்கிகளைக் கட்டுவதற்கான வேலைகள் முன்னெடுக்கப்பட்டு, அவை பூரணப்படுத்தப்படாத நிலையில் இருக்கின்றன. இதனால், அங்குள்ள மக்களுக்குக் குடிநீரைச் சீரான முறையிலே வழங்க முடியாத ஒரு நிலைமை இருக்கின்றது. அந்தவகையில், மத்திய முகாமிலே ஒரு தண்ணீர்த்தாங்கியும் மண்டூர், சங்கர்புரத்திலே ஒரு தண்ணீர்த்தாங்கியும் பக்கியல்ல என்ற இடத்தில் ஒரு தண்ணீர்த்தாங்கியும் நாமலோயாவிலே ஒரு தண்ணீர்த் தாங்கியும் இக்கினியாகலையிலே ஒரு தண்ணீர்த்தாங்கியும் தொட்டகம என்ற இடத்தில் ஒரு தண்ணீர்த்தாங்கியும் அமைக்கப்பட்டிருக்கின்றது. ஆனால், இவை அனைத்தும் பூரணப்படுத்தப்படாத நிலையில் அரைகுறையாகவே இருக்கின்றன. எனவே, நீங்கள் உடனடியாக இவ்விடயத்தில் தலையிட்டு, அந்த மக்களுக்குச் சீரான முறையில் குடிநீரை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கவேண்டும்.

அதுமாத்திரமல்ல, நாவிதன்வெளியில்கூட 60 கிலோமீற்றர் வரையான பகுதிகளுக்கு குடிநீர் வழங்கவேண்டி இருக்கின்றது. அந்த இடங்களுக்கும் நீங்கள் விரைவாக குடிநீரைப் பெற்றுக் கொடுக்க வேண்டும். கல்லோயா திட்டத்திலே இறுதியாக இருக்கின்ற பிரதேச செயலகமும் கிராமமும் என்றால், அது நாவிதன்வெளிதான். இந்த நாவிதன்வெளிப் பிரதேசத்திலுள்ள அன்னமலை - 2, நாவிதன்வெளி - 2, அன்னமலை - 3, மத்திய முகாம் ஆகிய கிராமங்களில் வருடத்தில் குறிப்பிட்ட காலத்துக்குப் பிற்பாடு நிலக்கீழ் நீர்கூட இல்லாத ஒரு சூழல் இருக்கின்றது. எனவே, அந்தக் கிராமங்களுக்கும் விரைவாக நீங்கள் குடிநீரைப் பெற்றுக்கொடுப்பதற்குரிய நடவடிக்கைகளை எடுப்பீர்கள் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. இப்பொழுது, நீங்கள் ஆலையடிவேம்பிலே ஒரு பாவனையாளர் காரியாலயத்தை அமைத்திருக்கிறீர்கள். அதற்கும் நான் உங்களுக்கு நன்றி சொல்கின்றேன். ஆலையடி வேம்பிலே பழம்பெரும் கிராமங்களாக இருக்கின்ற அலிக்கம்பை, கண்ணகிபுரம், பனங்காடு போன்ற கிராம மக்கள் நீண்டகாலமாகக் குடிநீருக்காக மிகவும் கஷ்டப்படுகின்றார்கள். அவற்றுக்கு அண்மையிலே இருக்கின்ற கிராமங்களுக்குக் குடிநீர் வழங்கப்பட்டிருக்கின்றது. ஆனால், இந்தக் கிராமங்களுக்கு மாத்திரம் இதுவரைக்கும் குடிநீர் வழங்கப்படாமலிருப்பது மனவேதனையான ஒரு விடயமாகும்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் விரைவாக எங்களுடைய இந்தப் பிரதேசங்களுக்கு குடிநீரைப் பெற்றுத்தர வேண்டும். அவ்வாறு பெற்றுத்தருவதனூடாகத்தான் எங்களுடைய மக்கள் சுகாதாரம் மிக்கவர்களாக, ஆரோக்கியம் மிக்கவர்களாக வாழமுடியும். அவர்கள் ஒவ்வொரு நாளும் கிட்டத்தட்ட 12 மணித்தியாலங்களைக் குடிநீருக்காகச் செலவழித்துக் கொண்டிருக்கிறார்கள். எனவே, தயவுசெய்து அந்த மக்களும் சுத்தமான குடிநீரைப்பெற்று, சிறந்த ஆரோக்கியமான சமூகமாக வாழ்வதற்கு நீங்கள் உதவி செய்ய வேண்டும்.

கிட்டத்தட்ட 35,000 மக்கள் வாழுகின்ற திருக்கோவில் பிரதேச செயலகப் பிரிவிலே ஒரு முறையான குடிநீர்த் திட்டம் இல்லை. சாகாமம் குளத்தை மையமாக வைத்தே அவர்களுக்கு குடிநீர் வழங்கப்படுகின்றது. அந்தக் குளத்தை விவசாயிகளும் பயன்படுத்துகின்றார்கள். அதன்காரணமாக ஒவ்வொரு வருடமும் மே மாதம் ஆகின்றபோது, அந்தக் குளத்திலே நீர் குறைவடைகின்றது. அதனால், அவர்களுக்கு ஒரு நாளைக்கு ஒரு மணித்தியாலம் அல்லது இரண்டு நாளைக்கு ஒரு தடவைதான் நீரைக் கொடுக்கக்கூடியதாக இருக்கின்றது. இதனால், திருக்கோவில் பிரதேச மக்களுக்குக் குடிநீர்ப் பிரச்சினை இருந்துகொண்டே இருக்கின்றது. எனவே, அவர்களின் குடிநீர்ப் பிரச்சினைக்கு நிலையான ஒரு தீர்வை உங்களுடைய காலத்திலே பெற்றுக்கொடுக்க வேண்டும். அந்த மக்களும் குடிநீரைச் சீரான முறையிலே பெறக்கூடிய வகையில், நீங்கள் ஏற்பாடுகளைச் செய்துகொடுப்பீர்கள் என்ற நம்பிக்கை எமக்கு இருக்கின்றது. சாகாமம் குளத்தினூடாக குடிநீர் திட்டம் ஆரம்பிக்கப்பட்டபொழுது, பன்னலகம ஆற்றைத் திருப்பி, அந்தக் குளத்தில் விட்டுத்தான், அந்தத் திட்டத்தை முழுமையாக நடைமுறைப்படுத்தலாம் என்ற ஓர் அடிப்படையிருந்தது. இப்பொழுது அதுவும் இனரீதியான பாகுபாட்டுக்கு உட்பட்டு, அந்த நீரும் சாகாமம் குளத்துக்கு வரமுடியாத ஒரு சூழல் ஏற்படுத்தப்பட்டிருக்கின்றது. இன்னும் மீள்குடியேற்றம் செய்யப்படாத பல கிராமங்கள் அங்கு இருக்கின்றன. அக்கிராம மக்களின் அடிப்படைத் தேவைகளில் ஒன்றாகவும் குடிநீர் இருக்கின்றது. குறிப்பாக, யுத்தம் நடந்த பிரதேசங்களான கஞ்சிகுடிச்சாறு, தங்கவேலாயுதபுரம், சாகாமம் போன்ற கிராமங்களிலுள்ள மக்களும் குடிநீருக்கு மிகவும் கஷ்டப்படுகின்றார்கள். எனவே, நீங்கள் இவற்றையும் கருத்திற்கொள்ள வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

2018ஆம் ஆண்டு நான் பிரதேச சபைத் தவிசாளராக இருந்தபோது, JICA project இன்கீழ் ஒருங்கிணைந்த கிராமிய நீர் விநியோகத்திட்டத்துக்குள் எங்களுடைய நாவிதன்வெளிப் பிரதேசத்திலுள்ள பல கிராமங்கள் உள்வாங்கப்பட்டன. நான் ஏற்கனவே கூறிய, கிணற்றிலிருந்து நிலக்கீழ் நீரை எடுத்து மக்களுக்குக் கொடுக்கின்ற செயற்பாடானது நிச்சயமாக வெற்றியளிக்காது. சொரிக்கல்முனை-1இலே முஸ்லிம் பெண்கள் அமைப்பானது பல கோடி ரூபாய்களைச் செலவழித்தும்கூட, எங்களுடைய மக்களுக்கு குடிநீரைப் பெற்றுக்கொடுக்க முடியாத ஒரு நிலைமையிருக்கின்றது. அதேபோன்று, 2010ஆம் ஆண்டு பொருளாதார மீளெழுச்சித் திட்டத்தின்கீழ் ஒருங்கிணைந்த நீர் விநியோகத்திட்டம் வழங்கப்பட்டும்கூட, அதன்மூலம் முழுமையாக நீரைப் பெறமுடியாத ஒரு சூழல் இருந்துகொண்டிருக்கின்றது. நான் ஏற்கனவே கூறிய வீரசோலைக்கும் ஓர் ஒருங்கிணைந்த நீர் விநியோகத்திட்டம் இருக்கின்றது. ஆனால், அது பூரணமாக அந்த மக்களுக்குப் பயன்படவில்லையென்ற கருத்தையும் இவ்விடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அந்தப் பிரதேசத்திலே JICA project இன்கீழ் பல பணிகள் முன்னெடுக்கப்பட்டன. அதுசம்பந்தமான கூட்டங்களில் கலந்துகொண்டு நான் இந்த விடயங்களை முன்வைத்தேன். எங்களுடைய கௌரவ உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்கள் உரையாற்றுகின்றபொழுது, நிலக்கீழ் நீர் மனித

[ගරු තවරාජා කලෛයි අරසන් මහතා]

குலத்துக்கு ஆபத்தைத் தரக்கூடிய வகையில் இருப்பதாகக் குறிப்பிட்டிருந்தார். அந்த அடிப்படையில், இந்தப் பிரதேச மக்களுக்குச் சுத்தமான குடிநீரை வழங்குவதற்கு நீங்கள் நடவடிக்கையெடுக்க வேண்டும். நான் ஏற்கெனவே குறிப்பிட்ட சாகாமம் குளத்தினூடாக திருக்கோவில் பிரதேசத்திலுள்ள மக்களுக்கு முழுமையாக நீரை வழங்கமுடியாது. ஏற்கனவே, பல திட்டங்கள் இக்கினியாகலையை மையமாக வைத்துத்தான் நடைமுறைப்படுத்தப்பட்டிருக்கின்றன. எனவே, அங்கிருந்து வருகின்ற நீரை எமது பிரதேசத்திலுள்ள மக்களுக்கும் வழங்குவதற்கு நீங்கள் எதிர்காலத்தில் நடவடிக்கையெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். அத்துடன், நான் ஏற்கெனவே கூறிய எங்களுடைய பிரதேசம் சார்ந்த விடயங்களையும் நீங்கள் கருத்திற்கொள்ள வேண்டும். அங்குள்ள அமைச்சர்கள் பலர் தங்களுடைய சமூகம் சார்ந்து பணிகளை முன்னெடுத்ததன் காரணமாகத்தான் நாங்கள் புறக்கணிக்கப்பட்டோம். கடந்த காலங்களில் அவர்கள் தங்கள் சமூகத்தை மையமாக வைத்தே தொழில்வாய்ப்புக்களை வழங்கினார்கள். குறிப்பாக, நீர் வழங்கல் அமைச்சினூடாக வழங்கப்பட்ட நியமனங்களின்போது, labourer தொழிலுக்கு கூட எங்களுடைய சமூகத்தைச் சேர்ந்தவர்கள் உள்வாங்கப் படவில்லை என்பது உங்களுக்குத் தெரியும்! இதற்கு உங்களைக் குற்றம் கூறமுடியாது.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට පොරොන්දු වෙනවා, දමිළ ගම්මාන මහ හැරලා ජල සම්පාදනය කරලා තිබෙන හැම තැනකම, ඒ හැම දමිළ ගම්මානවලටම ඒ පයිප්ප ලයින්වලින්ම වතුර ලබා දෙනවා කියලා.

**ගරු තවරාජා කලෛයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)

நன்றி. அமைச்சர் அவர்களே, நான் எங்களுடைய அம்பாறை மாவட்டத்திலே இருக்கின்ற குடிநீர் சம்பந்தமான பிரச்சினைகளை இங்கு முன்வைத்தேன். அதேபோல், பொத்துவில் பிரதேசத்திலும் இவ்வாறான பிரச்சினைகள் இருக் கின்றன. எனவே, அந்தப் பிரதேசத்தின்மீதும் உங்களுடைய பார்வையைச் செலுத்தி, அவற்றுக்குச் சிறந்த தீர்வுகளைப் பெற்றுத்தர வேண்டுமென்று கேட்டு, விடைபெறு கின்றேன். நன்றி, வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. K. Kader Masthan. You have ten minutes.

Order, please! මේ අවස්ථාවේ ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්,* ***ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. WEERASUMANA WEERASINGHE *left the Chair, and* THE HON. AJITH RAJAPAKSE *took the Chair.*

[பி.ப. 2.59]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற நீர் வழங்கல் அமைச்சு, கிராமிய மற்றும் பிரதேச நீர்க் கருத்திட்ட அபிவிருத்தி இராஜாங்க அமைச்சு, துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சு ஆகிய அமைச்சுக்களின் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு எனக்கும் பேசுவதற்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்காக முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

நாட்டின் பொருளாதாரம் பாதிக்கப்பட்டிருக்கின்ற இந்தக் காலகட்டத்திலும் எமது அரசாங்கமானது சுத்தமான குடிநீர் வசதிகளை ஏற்படுத்திக் கொடுப்பதற்கான வேலைத்திட்டங் களுக்கு முன்னுரிமை அளித்துச் செயற்படுகின்றது. அதற்காகப் பல்வேறு அபிவிருத்தித் திட்டங்களைத் திட்டமிட்டுச் செயல்படுத்துவதற்கான ஆயத்தங்களை எமது நீர் வழங்கல் அமைச்சு செய்துவருகின்றது. அதற்காக, நீர் வழங்கல் அமைச்சர் மாண்புமிகு வாசுதேவ நாணாயக்கார அவர்களு க்கும் கிராமிய மற்றும் பிரதேச நீர்க் கருத்திட்ட அபிவிருத்தி இராஜாங்க அமைச்சர் மாண்புமிகு சனத் நிசாந்த அவர்களுக்கும் அமைச்சின் செயலாளர் உட்பட ஏனைய அதிகாரிகளுக்கும் நான் இந்த இடத்தில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

எமது வன்னித் தேர்தல் மாவட்டத்தில் அதாவது மன்னார், முல்லைத்தீவு, வவுனியா மாவட்டங்களிலே மிகவும் வறுமை நிலையிலுள்ள குடும்பங்கள் வாழுகின்ற பகுதிகளில் nano filtration plant, RO plant ஆகியவற்றை நிறுவி, அதனூடாக அக்கிராம மக்களுக்குச் சுத்தமான குடிநீரை வழங்குவதற்கு அமைச்சு நடவடிக்கை எடுத்து வருகின்றது. நாங்கள் அங்குள்ள மக்களின் தேவைப்பாடுகளை இனங்கண்டு, அது தொடர்பான தகவல்களை அமைச்சுக்கு வழங்கியதன் அடிப்படையில்தான் அவை நிறுவப்பட்டன. சுத்தமான குடிநீர் இன்மையால், அங்குள்ள பலர் சிறுநீரக நோயால் பாதிக்கப்பட்டு இருக்கின் றார்கள். எதிர்காலத்தில் அப்பிரதேச மக்கள் இந்நோய்க்கு ஆளாகாமல் இருப்பதற்காகவே அங்கு nano filtration plant, RO plant ஆகியன அமைக்கப்பட்டு, குடிநீர் வசதி ஏற்படுத்திக் கொடுக்கப்பட்டிருக்கிறது. அதேபோல, நாங்கள் இன்னும் பல nano filtration plants அமைக்க இருக்கின்றோம். அதாவது, நாங்கள் சுகாதாரத்துறையினருடன் கதைத்து, எமது பிரதேசத்தில் எந்தெந்தக் கிராமங்களுக்கு அவை தேவை என்பதை இனங்கண்டு, அங்குள்ள மக்களின் தேவைக்கு ஏற்ப அவற்றை அமைத்துக்கொடுக்க இருக்கின்றோம்.

எதிர்வரும் வருடங்களில் எங்களுக்கு கிட்டத்தட்ட 50 nano filtration plants கிடைக்க இருக்கின்றன. அவற்றில் 20 nano filtration plants முல்லைத்தீவு மாவட்டத்துக்கும் மிகுதி வவுனியா மாவட்டத்துக்கும் வழங்கப்பட இருக்கின்றன. அதே போல, அவற்றை மன்னார் மாவட்டத்துக்கும் விரைவாகப் பெற்றுக்கொடுப்பதற்குரிய ஏற்பாடுகள் நடைபெற்றுக் கொண்டிருக்கின்றன. சுத்தமானதும், பாதுகாப்பானதுமான குடிநீரை மக்களுக்கு வழங்கவேண்டும் என்ற எமது அதிமேதகு சனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களுடைய எண்ணக் கருவுக்கு அமைய, எமது பிரதேசத்தில் எந்தெந்தப் பகுதிகளில் சிறுநீரக நோயாளர்கள் அதிகமாக இருக்கின்றார்களோ, அந்தப் பகுதிகளுக்குச் சுத்தமான குடிநீரை வழங்குவதற்கான

நடவடிக்கைகளை நாங்கள் எடுத்து வருகின்றோம். அவற்றை வருடாந்த செயற்றிட்டங்களிலும் உள்ளடக்கி இருக்கின்றோம்.

2024ஆம் ஆண்டுக்கு முன்னர் மக்கள் அனைவருக்கும் சுத்தமான குடிநீரை வழங்கவேண்டும் என்ற அடிப்படையில் முன்னெடுக்கப்படுகின்ற இச்செயற்றிட்டத்தை முல்லைத்தீவு மாவட்டத்தின் வெலிஓயா, துணுக்காய், ஒட்டுசுட்டான் போன்ற பகுதிகளிலும் மன்னார் மாவட்டத்தின் முசலி, மடு, மாந்தை மேற்கு போன்ற பகுதிகளிலும் முன்னெடுக்க வேண்டும். ஏனெனில், இப்பகுதிகளில் பாரிய குடிநீர்ப் பிரச்சினை இருக்கின்றது. இன்று மன்னார் மாவட்டத்தில் சுத்தமான குடிநீரைப் பெறமுடியாமையானது பாரிய ஒரு பிரச்சினையாகக் காணப்படுகின்றது. தற்பொழுது, அந்தப் பகுதியில் இவ்வாறான செயற்றிட்டங்கள் நல்ல முறையில் நடைபெற்று வருகின்றன. அந்த அடிப்படையில், எதிர்காலத்தில் சுத்தமான குடிநீரை வழங்கக்கூடிய விதத்தில் எமது வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள ஒவ்வொரு மாவட்டத்துக்கும் 50 nano filtration plants வழங்குவதற்குரிய ஏற்பாடுகள் இடம்பெறுவதாக நான் நினைக்கின்றேன். நாங்கள் கிராமங்களை அடையாளப்படுத்திக் கொடுத்திருக்கின்றோம். ஆகவே, எதிர்காலத்தில் நீங்கள் அவற்றை விரைவாக எங்களுக்குப் பெற்றுத் தருவீர்கள் என்ற முழு நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது என்பதை நான் இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோல, எமது வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள பல கிராமங்களில் மலசலகூட வசதிகள் இல்லாமல் கஷ்டப்படுகின்ற பல குடும்பங்களுக்கு இந்த அமைச்சினூடாக அவ்வசதிகள் செய்துகொடுக்கப்பட்டிருக்கின்றன என்பதையும் நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன். இவ்வாறு எமது பகுதிகளிலுள்ள தேவைப்பாடுகளைப் பூர்த்திசெய்யும் விதமாக சரியான திட்டங்கள் வகுக்கப்பட்டடிருக்கின்றன. Greater Mannar Project என்ற திட்டம் அமுல்படுத்தப்படும்பொழுது, எங்களால் கூடுதலான தேவைப்பாடுகளைப் பூர்த்திசெய்யக் கூடியதாக இருக்கும் என்று நான் நினைக்கின்றேன். குறிப்பாக, அப்பகுதியிலுள்ள அனைத்து மக்களும் சுத்தமான குடிநீரைப் பெறக்கூடிய ஒரு நிலைமை உருவாக்கப்படும். கௌரவ அமைச்சர் அவர்கள் இங்கே இருக்கின்றார். அந்த அடிப்படையில், Greater Mannar Projectக்கான estimateஐத் தயாரித்து, அதனை விரைவாகச் செயற்படுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். மேலும், எமது பகுதிகளிலுள்ள பாலியாறு, பறங்கியாறு, உப்பாறு போன்ற ஆறுகள் வீணாகக் கடலுடன் கலக்கின்றன. எனவே, ஆறுகளை மையப்படுத்தி வகுக்கப்பட்டுள்ள Greater Mannar Project போன்ற ஒரு திட்டத்தை முல்லைத்தீவு மாவட்டத்துக்கும் விரைவாக வகுக்க வேண்டும். "2024ஆம் ஆண்டுக்கு முதல் சகலருக்கும் சுத்தமான குடிநீர் வழங்குவோம்" என்ற சனாதிபதியினுடைய எண்ணக்கருவின் அடிப்படையில் அதற்குரிய நிதியைப் பெற்று, அதனை நடைமுறைப்படுத்தி, அங்குள்ள மக்களுடைய குடிநீர்த் தேவைப்பாடுகளைப் பூர்த்திசெய்து தரவேண்டும் என்பதை நான் இந்த இடத்தில் கோரிக்கையாக முன்வைக்கின்றேன்.

மேலும், யுத்தத்துக்கு முன்னர் இராமேஸ்வரத்துக்கும் Talaimannar Pierக்குமிடையில் கப்பல் சேவை நடைபெற்றது. அந்தக் கப்பல் சேவையானது, யுத்தம் காரணமாக இடைநிறுத்தப் =பட்டது. மீண்டும் அந்தக் கப்பல் சேவையை விரைவாக ஆரம்பித்தால், மன்னார் பிரதேசத்தில் பாரிய ஒரு வளர்ச்சியைக் காணக்கூடியதாக இருக்கும் என்று நான் நினைக்கின்றேன். இச்சேவையை மீண்டும் ஆரம்பிக்குமாறு நாங்கள் கௌரவ துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர் அவர்களிடமும் பல சந்தர்ப்பங்களில் கோரியிருக்கின்றோம். அதற்குரிய சாத்தியமான நடவடிக்கைகளை எடுப்பதாக அவர் கூறியிருக்கின்றார்.

இந்தக் கப்பல் சேவை இடம்பெற்றால், அது எமது மக்களின் வருமானத்தைப் பெருக்கக்கூடிய பாரிய ஒரு செயற்பாடாக அமையும் என்பதோடு, அவர்களின் வாழ்க்கையில் பாரிய முன்னேற்றத்தையும் ஏற்படுத்தும். எனவே, இதனைக் கருத்திலெடுத்து, கௌரவ அமைச்சர் அவர்கள் விரைவாக அக்கப்பல் சேவையை ஆரம்பிப்பதற்குரிய நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

இறுதியாக, நாங்கள் எமது மக்களுக்காகக் கேட்கின்ற இவ்வாறான செயற்றிட்டங்களைச் செயற்படுத்துவதற்கு நடவடிக்கை எடுக்கின்ற கௌரவ அமைச்சர் அவர்களுக்கும் அமைச்சின் செயலாளர் உட்பட ஏனைய அதிகாரிகளுக்கும் எனது நன்றியைக் கூறி, நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු දහසයක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 3.07]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතාම සතුටු වෙනවා, වරාය හා නාවික අමාත්‍යාංශයේත්, ඒ වාගේම ජල සම්පාදන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ සම්බන්ධව කථා කරන අද ඒ කැබිනට් ඇමතිවරුන් දෙදෙනාම සභාවේ දිගටම රැඳී සිටීම ගැන. ඒ ගැන සතුටුයි. මොකද, අපි දැක්කා සමහර අමාත්‍යාංශවල වැය ශීර්ෂ ගැන කථා කරද්දී ඒ අමාත්‍යවරුන් අහගෙන සිටියේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා ලබා දෙන්නේ හොඳ ආදර්ශයක්. ඒ ගැන අපි සතුටු වෙනවා.

මුලින්ම මම කැමැතියි, ජල සම්පාදන අමාත්‍යාංශය හා සම්බන්ධ කරුණු කිහිපයක් කථා කරන්න. ගරු ඇමතිතුමා, ජල සම්පාදන අමාත්‍යාංශයට වෙන් කර තිබෙන ප්‍රතිපාදන සම්බන්ධයෙන් නම් මම කනගාටු වෙනවා. ජලය කියන්නේ අපට අත්‍යවශ්‍ය දෙයක්. 2021 අය වැය තුළින් මේ අමාත්‍යාංශයට රුපියල් බිලියන 105.6ක් වෙන් කරලා තිබුණා. නමුත් 2022ට වෙන් කර තිබෙන්නේ ඒකෙන් තුනෙන් එකක් වාගේ ප්‍රමාණයක්. ඒ කියන්නේ රුපියල් බිලියන 34.6යි. කොහොම වුණත් මේ සඳහා අය වැයෙන් වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණය විශාල වශයෙන් අඩු වෙලා තිබෙනවා. ඒක වැඩි විය යුතු එකක්. මොකද, ජලය කියන්නේ අත්‍යවශ්‍ය දෙයක්.

පසුගිය දවස්වල කාබනික පොහොර සහ රසායනික පොහොර සම්බන්ධයෙන් ලොකු තර්ක-විතර්ක, ප්‍රශ්න ගණනාවක් මතු වුණා. එහිදී ගොඩක් කථා වුණේ, සෞඛ්‍යය ගැන; වකුගඩු රෝගය ගැන. නමුත් පානයට ගන්නා ජලය තමයි එවැනි රෝගවලට ප්‍රධානම හේතුව කියලා පෙන්නුම් කර තිබෙනවා. වෛද්‍යවරුන් ඒ පිළිබඳව වාර්තා ඉදිරිපත් කිරීමේදී පිරිසිදු ජලය පානය කරනවා නම් මෙවැනි රෝග ගණනාවක් අඩු වෙනවා කියලා සඳහන් කර තිබෙනවා. ඒ නිසා අපි පානීය ජලය සඳහා මීට වඩා වැඩි මුදලක් වෙන් කළා නම් හොඳයි කියන එක තමයි මම මුලින්ම කියන්නේ.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

ඇමතිතුමාගේ අවධානයට තව කාරණා කිහිපයක් යොමු කරන්න මම කැමැතියි. විශේෂයෙන්ම මෙතැනදී මන්ත්‍රීතුමන්ලා බොහෝ දෙනෙකු කථා කළේ, පසුගිය යහපාලන කාලයේදී මොනවත් කළේ නැති විධියට. මම හිතන විධියට ඒක එච්චර වැදගත් වෙන්නේ නැහැ. මේ කාරක සභා අවස්ථාවේ ඊට වඩා විෂයානුබද්ධව, සාධාරණව කරුණු කාරණා ඉදිරිපත් කළා නම් තමයි වැදගත් වෙන්නේ. විශේෂයෙන්ම මේ වේලාවේ කියන්න ඕනෑ, - *[බාධා කිරීමක්]* ඔව්, මොකක්ද කියන්න තිබෙන්නේ? කියන්න. *[බාධා කිරීමක්]* හරි එහෙනම්, පටන් ගන්න. ඔබතුමන්ලා ඒකෙන්ම නේ, කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජල ව්‍යාපෘති ගණනාවක් සම්බන්ධ ලැයිස්තුවක් අපි ළඟ තිබෙනවා. මේ ලැයිස්තුව බැලුවාම අපට පෙනී යනවා, ADB, JICA වැනි නොයෙක් ආයතන හරහා මේ හැම ව්‍යාපාරයක්ම වාගේ ආරම්භ කරලා තිබෙන්නේ 2016, 2017 කාලයේ බව. මේවා විශාල ව්‍යාපෘති. එසේ ආරම්භ කළ ව්‍යාපෘති කිහිපයක් ගැන මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අපේ පළාතට අදාළ ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධව. ඒවායේ කටයුතු ඉතාම කඩිනමින් අවසන් කරනවා නම් හොඳයි. මේ වෙනකොට එම ව්‍යාපෘති අවසන් කරන්න තිබුණු දින පැනලා. ඒකට නොයෙක් හේතු බලපාන්න ඇති. කොවිඩ් තත්ත්වයත් බලපාන්න ඇති. නමුත් දැන්වත් ඒවායේ කටයුතු ඉක්මනින් අවසන් කළොත්, පානීය ජල පහසුකම් නොමැතිව ඉන්න විශාල සංඛ්‍යාවකට පානීය ජලය ලබා දීමේ හැකියාව ලැබෙනවා.

වයඹ පළාත ගත්තාම, පානීය ජල අවශ්‍යතාව ඉතාම ඉහළයි. මොකද, අනෙක් පළාත් එක්ක බලනකොට, නළ ජලය, පිරිසිදු - පිරිපහදු- කළ ජලය අඩුවෙන්ම ලැබෙන ප්‍රදේශයක් තමයි වයඹ පළාත කියන්නේ. අපි පසුගිය රජය කාලයේත් මේ සම්බන්ධව ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කළා. අපි ඔබතුමාට යෝජනා කරනවා, ඉදිරියේදී ඒ ප්‍රදේශයට අදාළව එවැනි ව්‍යාපෘති තව-තවත් කඩිනමින් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්න කියලා. මා නියෝජනය කරන්නේ මාවතගම ආසනය. කටුගස්තොට-මාවතගම-මල්ලවපිටිය කියන ජල ව්‍යාපෘතියට මාත් සම්බන්ධ වෙලා 2016දී අපි මුල්ගල් තැබුවා. එවකට අමාත්‍යවරයා හැටියට හිටපු හකීම් මැතිතුමා සමඟ එකතු වෙලා අපි ඒ සියලු වැඩ කටයුතු 2019 වනවිට අවසන් කළා. දැන් නිවාස 5,000කට ආසන්න ප්‍රමාණයක් අසලටම ජල නළ එළා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙතැන ඇති වෙලා තිබෙන ගැටලුව මේකයි. මේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් වුණාට, ඒකට මහවැලි ගඟෙන් ජලය ලබා දෙන ස්ථානය තිබෙන්නේ කටුගස්තොට. ජලය ලබා දෙන ස්ථානයේ පිරිපහදුවේ ඉදිකිරීම් කටයුතු කළ සමාගම, මම හිතන විධියට චීන සමාගමක්. ඒ ව්‍යාපෘතියේ වැඩ අවසන් වෙලා අවුරුදු දෙකකට ආසන්න වුණත්, පිරිපහදුවේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාද දෝෂ ඇති වුණු නිසා, තවම එම ප්‍රදේශයේ ජනතාවට ජලය ලබා දීමේ හැකියාවක් ලැබී නැහැ.

එම නිසා මම ඒ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මොනවා හෝ ප්‍රශ්න තිබෙනවා නම් ඒවාත් විසඳාගෙන ඉතාම කඩිනමින් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළොත් අපේ ප්‍රදේශයේ ජනතාවට ඒ ව්‍යාපෘතියේ ප්‍රතිඵල, පානීය ජලය, පිරිසිදු ජලය ලබා ගැනීමේ අවස්ථාව උදා වෙනවා. ඒ වාගේම ඒ ප්‍රදේශයේ වෙළෙඳ කලාපයක් තිබෙනවා; කර්මාන්ත පුරයක් තිබෙනවා. ඒ ස්ථානවලිනුත් ජල ඉල්ලීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවාටත් ජලය ලබා දීමට තමයි මේ ව්‍යාපෘති සකස් කරලා තිබෙන්නේ. එක පැත්තකින් පානීය ජලය වාගේම කර්මාන්ත සඳහා අවශ්‍ය ජලයත් මේ ව්‍යාපෘතියෙන් ලැබෙන බව මම මතක් කරන්න ඕනෑ. ඒ ප්‍රමාදයට හේතුව මොකක්ද කියලා බලලා, ඒ කටයුතු කඩිනම් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම අපි 2017දී තවත් ව්‍යාපෘතියක් ආරම්භ කළා. *[බාධා කිරීමක්]*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ලබන සුමානයේ ඉඳලා වතුර දෙනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
හොඳයි, බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම පොල්ගහවෙල, පොතුහැර සහ අලව්ව ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය අපි 2017දී ආරම්භ කළා. ඒක 2021දී නිම වෙන්න නියමිතව තිබුණත්, ඔබතුමාම දන්නා පරිදි මේ වෙනකොට සියයට 50ක විතර ප්‍රගතියක් තමයි තිබෙන්නේ. පොල්ගහවෙල, පොතුහැර සහ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරි වසම් සියල්ලම මේ ව්‍යාපෘතියෙන් ආවරණ වෙනවා. ඊට අමතරව මල්ලවපිටිය සහ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසත් ආවරණය වෙනවා. නමුත් වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 35ක් මේ ව්‍යාපෘතියෙන් මඟ හැරිලා තිබෙනවා. නමුත්, මේ ව්‍යාපෘතියේම දෙවෙනි අදියර හැටියට වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 35ටත් පානීය ජලය ලබා දෙන වැඩසටහන ඒ සැලැස්මේ තිබුණා. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මේ වෙලාවේ ඉල්ලා සිටිනවා. මේවා අත්‍යවශ්‍ය යෝජනා හැටියටයි සැලකිය යුත්තේ. *[බාධා කිරීමක්]*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ වැඩ කටයුතු සියයට 90ක් ඉවරයි. දැන් පොල්ගහවෙලට, අලව්වට වතුර දෙන්න connections දීගෙන යනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු ඇමතිතුමනි, එතැන පොල්ගහවෙල, අලව්ව විතරක් නොවෙයි- *[බාධා කිරීමක්]* මල්ලවපිටිය, කුරුණෑගල.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ ඔක්කෝටම වතුර දෙන්න පුළුවන්. දැනට අලව්වටයි, පොල්ගහවෙලටයි දීගෙන යනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
හොඳයි, ගරු ඇමතිතුමනි.

විශේෂයෙන් මේ සැලැස්මටම එකතු කරලා තිබුණා වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 35ක්. ඒ වෙලාවේ යම් යම් හේතු මත ඒ ප්‍රදේශ ව්‍යාපෘතියෙන් ඉවත් වුණා. දෙවෙනි අදියරේදී ඒක ක්‍රියාත්මක කරන්න නියමිතව

තිබුණා. මම ඔබතුමාට යෝජනා කරනවා දෙවෙනි අදියරේදී වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩ පිළිවෙළටත් අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා.

අපි ඔබතුමාට පෞද්ගලිකවත්, ලිපි මඟිනුත් දැනුම්දීලා තිබෙනවා අංකුඹුර - ඉහළමුල්ල ජල ව්‍යාපෘතිය ගැන. අංකුඹුර ඉහළමුල්ල ජල ව්‍යාපෘතිය මේ වෙනකොට- *[බාධා කිරීමක්]* ඔව්. මේ වෙනකොට ඒ ව්‍යාපෘතිය ඉහළමුල්ල පන්සල අසලින් නවත්වලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමාට ලිපි ගණනාවක් දීලා තිබෙනවා. විශේෂයෙන් ඉහළමුල්ල වේළුවන විද්‍යාලය අසල දක්වා ජලය ලබා දෙනවා නම් විශාල පිරිසකටත්, ඒ පාසල් දරුවන්ටත් ජලය ලැබෙනවා. *[බාධා කිරීමක්]* ඔව්. ඒක ඉතාම වැදගත් නිසා ඒ යෝජනාවත් ගේනවා.

ලංකාව පුරා ආරම්භ කරලා තිබෙන මෙවැනි ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. ඒවායේ යම් යම් සුළු සුළු අඩු පාඩුකම් නිසා පසුගිය කාලයේ ප්‍රමාද වෙලා තිබුණා. අපේ රජය යටතේ, JICA, ලෝක බැංකුව හා Exim Banks හරහා ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කළා. ඒවා තවදුරටත් ප්‍රමාද නොකර කඩිනමින් අවසන් කරන ලෙස ඉල්ලා සිටිනවා. පසු ගිය කාලයේ කොරෝනා වසංගතය නිසා ඒ කටයුතු ප්‍රමාද වෙන්න ඇති. ඒ කෙසේ වෙතත්, වර්තමාන තත්ත්වය තුළ ඒවා කඩිනමින් අවසන් කරලා ජනතාවට පානීය ජල පහසුකම් ලබා දීමට අවශ්‍ය පියවර ගන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ප්‍රජා ජල ව්‍යාපෘති ගණනාවක් අපි ආරම්භ කළා. ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා ජලය ලබා දෙන්න බැරි සමහර ගම්මානවලට, ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට - ගෙවල් 100කට, 150කට, 200කට වෙන්න පුළුවන්- ජල නිධි හොයාගෙන, ප්‍රජාව එක්ක එකතුවෙලා කළ ව්‍යාපෘතිවලට තමයි මේ ප්‍රජා ජල ව්‍යාපෘති කියන්නේ. එය ඉතා හොඳ ව්‍යාපෘතියක්. දැන් මේ ව්‍යාපෘතිත් අතර මඟ නතරවෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරලා, ඒ ව්‍යාපෘති එහෙම ප්‍රමාද වීමට හේතු මොනවාද කියා සොයා බලා, අවශ්‍ය පියවර ගන්න කියලා මම කියනවා. *[බාධා කිරීමක්]* එවැනි ස්ථාන පිළිබඳව ඔබතුමාට අපි දැනුම් දෙන්නම්. ඒවා ඉතා වැදගත් ව්‍යාපෘති කියන කාරණයත් මම මතක් කරනවා. ඔබතුමා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියාත් මම ඉල්ලා සිටිනවා.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)

ගරු මන්ත්‍රීතුමා, කුරුණෑගල දිස්ත්‍රික්කය ගත්තාම නළ මාර්ගයෙන් පානීය ජලය ලබා දෙමින් තිබුණේ සියයට අටකට පමණයි. නළ මාර්ගයෙන් පානීය ජලය ලබා දීම ලංකාවේ ඉතා අඩු මට්ටමක තිබුණු ප්‍රදේශයක් තමයි කුරුණෑගල දිස්ත්‍රික්කය. ඒ නිසා තමුන්නාන්සේලාගේ ප්‍රදේශයට අවශ්‍ය ජලය ලබා දීමේ ලොකු ව්‍යාපෘතියක් මේ වනකොට කඩිනමින් ක්‍රියාත්මක වනවා. අපි ඒ කටයුතු අවසන් කරනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මගේ කථාව මුලදී මම කිව්වේ ඒකයි. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පානීය ජලය තිබෙන්නේ සියයට 10කට අඩු ප්‍රමාණයකට. ඒ නිසා තමයි අපි එදා අලුත් ව්‍යාපෘති ගණනාවක් ගෙනාවේ. ඔබතුමන්ලා ඉදිරියටත් ඒවා ක්‍රියාත්මක කරනවා නම් ඉතා වැදගත් කියන කාරණයත් මම මේ වෙලාවේ කියන්න ඕනෑ.

මෙවැනි ව්‍යාපෘති හරහා පානීය ජලය ලබා දීමේදී වයඹට ජල මූලාශ්‍ර පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන බව මම විශේෂයෙන් කියන්න ඕනෑ. ඒ නිසා තමයි දැන් මහවැලි ගඟේ ඉඳලා මල්ලවපිටිය දක්වා ජලය ගෙන යන ව්‍යාපෘතිය කරන්නේ. ඒ සඳහා දීර්ඝ කාලයක ඉඳලා යෝජනාවක් ඉදිරිපත්වෙලා තිබුණා, වදුරාපිල්ල වැව පානීය ජලය සඳහා විතරක් සකස් කර දෙන්න ඕනෑ කියලා. ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමා අමාත්‍යවරයා නිසා දන්නවා ඇති, මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර කවදාවත් වයඹට පානීය ජලය ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න හැකියාවක් නොමැති බව. මේ වනකොට කෘෂි කර්මාන්තයට යොදා ගෙන තිබෙන වැව්වලින් පානීය ජලය ලබාගැනීමේ හැකියාවක් නැහැ. මොකද, ඒ ජලය කෘෂි කර්මාන්තයටවත් ප්‍රමාණවත් නැති තත්ත්වයේ තිබෙන්නේ. ඒ නිසා මේ ව්‍යාපෘතියට ගොඩක් බාධා ඇතිවෙලා තිබුණා. මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. අපේ කාලයේ මේ ව්‍යාපෘතිය අපි ඉදිරියට ගෙනාවා. ඒ ගැන පරීක්ෂණ කර තිබෙනවා වාගේම ශක්‍යතා වාර්තා ඔක්කොම හදලා තිබෙනවා. ඒ ව්‍යාපෘතිය ආරම්භ කළොත් විතරයි වයඹට ජලය දෙන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්නේ කියන කාරණයත් මම මේ වෙලාවේ සඳහන් කරනවා.

වරාය හා නාවික අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කිරීමේදී විශේෂයෙන්ම අපේ හිතවත් හිටපු අමාත්‍ය ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ගැනත් මතක් කරන්න ඕනෑ. අපේ කිසිම කරීකයෙකුගෙන් එතුමාගේ නම කියැවුණේ නැහැ. එතුමා තමයි ඒ යුගයේ හිටපු ඇමතිවරයා හැටියට අපේ වරාය ජාත්‍යන්තර තත්ත්වයට, ප්‍රමිතියකට අනුව ඉස්සරහට ගෙනාවේ. දීර්ඝ කාලයක ඉඳලා කොළඹ වරායටත්, අපේ රටටත් පිහිටීම අනුව විශාල අවස්ථා ගණනාවක් ලැබී තිබුණා. නමුත් මම විශ්වාස කරනවා, ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා වෙළඳ හා නාවික ඇමතිවරයා හැටියට හිටපු කාලයේ අපේ වරාය, කලාපයේ හොඳම වරාය බවට පත් කරන්න විශාල කාර්යභාරයක් කළා කියලා. මම හිතන්නේ ගරු ඇමතිතුමාත් ඒ කාරණය පිළිගන්නවා. ඒ යුගයේ අපි පාසල් ශිෂ්‍යයන් හැටියට ඒ පිළිබඳව අහලා තිබුණා. ඒ තොරතුරු බැලුවාම අපට පෙනෙනවා, ඒ යුගයේ එතුමා විශාල කාර්යභාරයක් මේ වරාය දියුණු කරන්න කරලා තිබෙන බව.

අපි විශ්වාස කරනවා, අද ලෝකය යන තත්ත්වයත් එක්ක මේක ඉතා තරගකාරී ව්‍යාපාරයක් කියලා. මාසයක්, අවුරුද්දක් මේ කටයුතු ප්‍රමාද වනවා කියන්නේ ආපසු ඒ කාලය අල්ලන්න ලේසි වන්නේ නැහැ. අද චීනය, ඉන්දියාව ආදී මේ හැම රටකම වරායවල් ඉතා ශීඝ්‍රයෙන් දියුණු කරගෙන යනවා. අපට ඒකට හොඳ උදාහරණයක් තිබෙනවා, සිංගප්පූරුවේ. 1960 ගණන්වල සිංගප්පූරුවේ වරාය තිබුණේ කොහොමද, අද තිබෙන්නේ කොහොමද? ලී ක්වාන් යූ මැතිතුමා අගමැතිවරයා හැටියට හිටපු කාලය තුළ ඒ වරාය විශාල වශයෙන් දියුණු තත්ත්වයට පත් කරලා තිබෙනවා. අද වන විට සිංගප්පූරුවේ වරාය ලෝකයේ දියුණුම වරායවල් අතරින් දෙවැනි ස්ථානයට පත්වෙලා තිබෙනවා. ඒ කියන්නේ, කුඩා රටක් වුණත් ලබා ගන්න තිබෙන සියලු වාසි ලබා ගෙන, ඒ අවස්ථා උපයෝගි කරගෙන අද විශාල දියුණු තත්ත්වයකට ඒ රට ගෙනැල්ලා තිබෙනවා. මම හිතන්නේ මුළු සිංගප්පූරුවේම දියුණුවට ඒ රටේ වරාය බලපා තිබෙනවා. ඒ නිසා තමයි අද එතුමන්ලාට වරාය විතරක් නොවෙයි, ඒ රටේ ව්‍යාපාරත් වරාය හරහා ක්‍රියාත්මක කර ගන්න හැකිවෙලා තිබෙන්නේ.

සිංගප්පූරුවේ නිෂ්පාදනය කරන්නේ නැති ගොඩක් දේවල් සිංගප්පූරුව අද විකුණමින් ඉන්නවා. ඒකට හේතුව තමයි, වරාය මුල් කරගෙන ලබාගත් දියුණුව. බහාලුම් පැත්තෙන් ගත්තත්, ඉන්ධන පැත්තෙන් ගත්තත් එහෙමයි. ඒ එකක්වත් සිංගප්පූරුවේ නිෂ්පාදනය කරන්නේ නැහැ. නමුත් සිංගප්පූරුව අද වෙළෙඳ පොළක් වෙලා තිබෙනවා. වරාය සමඟ එකතු වෙලා ඒ තත්ත්වය

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

උදා කරගෙන තිබෙනවා. කෘෂිකාර්මික භෝග -ගම්මිරිස්, කරාබුනැටි පවා- අපේ රටවල නිෂ්පාදනය කරනවා. නමුත් සිංප්පූරුව කියන්නේ ඒවාට හොඳ වෙළඳ පොළක්. එහි මේ නිෂ්පාදන විකුණනවා. ඒ තත්ත්වය අද ඔවුන් හදාගෙන තිබෙනවා. මා හිතන හැටියට අපේ වරායත්, ආසියානු කලාපයේ තිබෙන හොඳම වරායක් බවට පත් කරගන්න අවස්ථාව තිබෙනවා. එහිදී පෞද්ගලික ද රජයේ ද කියන එක නොවෙයි වැදගත්. ආණ්ඩුවට සල්ලි නැත්නම්, පෞද්ගලික අංශය හරි උපයෝගි කරගෙන අපට අවාසි වන විධියට නොව, වාසි වන විධියට ඒ කටයුතු කළ යුතුයි. අපි චීනයට දීලා තිබෙන CICT එකට අදාළව තිබෙන්නේ සියයට 15ක් අපටත්, සියයට 85ක් ඒ අයටත්. මා විශ්වාස කරන විධියට ඒක අපට වාසිදායක තත්ත්වයක් නොවෙයි. ඒ නිසා ඊට වඩා හොඳ විධියකට කටයුතු කළ යුතුයි. අපට මුදල් ප්‍රතිපාදන නැත්නම්, ඩොලර් හිඟයක් තිබෙන මේ වෙලාවේ අපට ඒ කටයුතු කරන්න අපහසු නම්, පෞද්ගලික අංශය හරි උපයෝගි කරගෙන අපට වාසි ලැබෙන විධියට ඒ කටයුතු ඉදිරියට ගෙන යන්න ඕනෑ කියන එකයි අපි කියන්නේ. මේ කටයුතු ප්‍රමාද කිරීමෙන් අපට තිබෙන අවස්ථා අහිමි වන එක විතරයි සිද්ධ වන්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, වරායට යාබදව තිබෙන ඉඩම සම්බන්ධයෙන්. මා හිතන්නේ එය අක්කර 13ක ඉඩමක්. මා ඒ ඉඩම ගැනත් කිව යුතුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ඒ අක්කර 13 ඉඩම අපේ වරායට ඉතාම වටිනා ඉඩමක්. අපි ඒ ඉඩම වරාය දියුණු කිරීමට යොදාගන්න අවශ්‍යයි. හැබැයි, ඉදිරි කාලයේදී අපේ රටට වාසි වන ආකාරයට. එය කොළඹ පිහිටි ඉතාම වටිනා ස්ථානයක්. පර්යන්ත හැම එකක්ම ආසන්නයේ තිබෙන ඒ ඉඩමට මිලක් නියම කරන්න ඉතාම අපහසුයි. එම නිසා අපට අවාසි වන විධියකට කටයුතු නොකර, අපේ වරාය ඉදිරියේදී දියුණු කරගන්න, අපේ රටට වාසි වන ආකාරයට කටයුතු කරන්න ඒ ඉඩම පාවිච්චි කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින්, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.24]

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சு, நீர் வழங்கல் அமைச்சு ஆகியவற்றுடன் மேலும் 5 இராஜாங்க அமைச்சுக்கள் தொடர்பான இன்றைய குழுநிலை விவாதத்திலே வடக்கு, கிழக்கிலே இருக்கின்ற வீடமைப்புத் தொடர்பான தேவைகளையும் அதிலுள்ள பிரச்சினைகளையும் நான் இங்கே முன்வைக்க விரும்புகின்றேன்.

கடந்த 2018ஆம், 2019ஆம் ஆண்டுகளிலே தேசிய வீடமைப்பு அதிகாரசபையினால் வடக்கு, கிழக்கிலே வீட்டுத் திட்டங்கள் வழங்கப்பட்டிருந்தன. அந்தவகையிலே, அதற்குரிய கொடுப்பனவுக்கான வாக்குறுதிகள் வழங்கப்பட்டு, மக்கள் வீடுகளைக் கட்டுவதற்கு ஆரம்பித்திருந்தார்கள். ஆனால், 2019ஆம் ஆண்டு ஏற்பட்ட ஆட்சி மாற்றத்தைத் தொடர்ந்து அவர்களுக்குரிய மிகுதிக் கொடுப்பனவுகள் வழங்கப்படுவது நிறுத்தப்பட்டது. இன்று இரண்டு ஆண்டுகள் கடந்துவிட்ட நிலைமையிலும் அந்த மக்களுக்கான மிகுதிக் கொடுப்பனவுகள் - அவர்களுடைய வீடுகளின் குறை வேலைகளுக்கான நிதிகள் - கிடைக்கவில்லை. அதனால், அந்த மக்கள் மிக மோசமான அவமானங்களுக்கும் சட்ட ரீதியான பிரச்சினைகளுக்கும் சமூகப் பிரச்சினை களுக்கும் முகங்கொடுத்துக் கொண்டிருக்கின்றார்கள். குறிப்பாக, விதவைக் குடும்பங்களும் பல்வேறு வகையிலும் நலிவடைந்த குடும்பங்களும் இதனால் பாதிக்கப்பட்டிருக் கின்றார்கள். அந்தவகையிலே, மட்டக்களப்பு மாவட்டத்திலே 4,169 பயனாளிகளுக்கு 1,338.32 மில்லியன் ரூபாயும், மன்னார் மாவட்டத்திலே 2,898 பயனாளிகளுக்கு 1,480.72 மில்லியன் ரூபாயும், முல்லைத்தீவு மாவட்டத்தில் 2,252 பயனாளிகளுக்கு 1,319.18 மில்லியன் ரூபாயும், கிளிநொச்சி மாவட்டத்தில் 4,952 பயனாளிகளுக்கு 1,912.35 மில்லியன் ரூபாயும், யாழ்ப்பாண மாவட்டத்திலே 1,177.08 மில்லியன் ரூபாயும் மிகுதிக் கொடுப்பனவாக வழங்கவேண்டி யிருக்கின்றது. ஆனால், இந்த அரசாங்கம் பதவியேற்று 2 ஆண்டுகள் முடிவடைகின்றபோதும்கூட, இதனைத் தீர்த்துவைப்பதற்கான நடவடிக்கைகளை எடுத்திருக்கவில்லை என்பது கவலைக்குரிய விடயம். ஆகவே, சம்பந்தப்பட்ட அமைச்சர் இது தொடர்பாகக் கவனத்திலெடுத்து, இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கு உடனடியாக நடவடிக்கை எடுக்கவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதேநேரத்திலே, புதிய வீடுகள் தேவைப்படுபவர்களது விபரத்தைப் பார்க்கின்றபோது, மட்டக்களப்பு மாவட்டத்தில் மீள்குடியேற வேண்டியவர்களுக்கு 3,016 வீடுகள் வழங்கப்பட வேண்டியிருக்கின்றது. அதேபோன்று, திருகோணமலை மாவட்டத்திலே 6,883 பேருக்கும், முல்லைத்தீவு மாவட்டத்திலே 3,996 பேருக்கும், கிளிநொச்சி மாவட்டத்திலே 4,470 பேருக்கும், மன்னார் மாவட்டத்திலே 5,926 பேருக்கும், யாழ்ப்பாண மாவட்டத்திலே 45,516 பேருக்கும் புதிய வீடுகள் வழங்கப்படவேண்டியிருக்கின்றது. இது தொடர்பாகவும் விரைவாக நடவடிக்கைகளை மேற்கொள்ளவேண்டுமென்று நான் உங்களிடம் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதேநேரத்தில், இந்த வீட்டுத் திட்டங்களுக்கு ஒதுக்கப்படுகின்ற 6 இலட்சம் ரூபாய், 10 இலட்சம் ரூபாய் நிதியில் மனிதர்கள் வாழக்கூடிய ஓர் உருப்படியான வீட்டைக் கட்ட முடியாத நிலைமை இருக்கின்றது. அதுவும், இந்தக் 'கொவிட்' நிலைமைக்கு முன்பிருந்தே அப்படியான ஒரு பிரச்சினை இருக்கிறது. ஆகவே, தயவுசெய்து தற்போதைய சூழலிலே நீங்கள் வீடுகள் அமைப்பதற்கு நிதி ஒதுக்குவதாக இருந்தால், குறைந்தது 15 முதல் 20 இலட்சம் ரூபாய் வரையான நிதியை ஒதுக்கவேண்டும். குறிப்பாக, விதவைக் குடும்பங்களும் நோய்வாய்ப்பட்டு உழைக்க முடியாத நிலைமையிலிருக்கின்ற குடும்பங்களும் குறைந்தளவு நிதி ஒதுக்கப்பட்டதன் காரணமாகச் சமூகத்திலே மிக மோசமான பிரச்சினைகளை எதிர்கொள்கின்றார்கள். ஆகவே, அதை நீங்கள் கருத்திற் கொள்ளவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

மேலும், இந்த வீட்டுத் திட்டங்கள் வழங்கப்படுகின்ற பொழுது, மக்கள் வாழக்கூடிய இடங்களாகத் தெரிவுசெய்து, அந்த வீட்டுத் திட்டங்களை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கவேண்டுமென்றும் இந்த இடத்திலே நான் கேட்டுக் கொள்கின்றேன். நான் இங்கு குறிப்பிட்டதுபோன்று, மன்னார் மாவட்டத்திலே 5,926 பேருக்கு வீடுகள் தேவைப்படுகின்ற நிலைமையிலே, கடந்த காலங்களிலே முறைகேடான வகையில், அதிகாரத் துஷ்பிரயோகங்கள்மூலம் வீடுகள் இருக்கின்றவர்களுக்கு மேலும் வீடுகள் அமைத்துக் கையளிக் கப்பட்டிருக்கின்றன. அவ்வாறு கையளிக்கப்பட்ட அந்த வீடுகளிலே மக்கள் இல்லை. அவ்வாறு கிட்டத்தட்ட 5,000 வீடுகள் இருக்கின்றன. அதனைக் காரணங்காட்டி உண்மையிலே வேறு பிரதேசங்களில் வீடுகள் தேவைப் படுகின்றவர்களுக்கு வீடுகளை வழங்க மறுப்பதென்பது ஏற்றுக்கொள்ளமுடியாத ஒரு விடயமாகும். அவர்கள் விரும்பாத இடங்களிலே அவர்களை வற்புறுத்திக் குடியமரச் செய்வதற் கான முயற்சிகளைச் செய்யக்கூடாது. எனவே, முறைகேடாக வீடமைப்புக்களைப் பெற்றுக்கொண்டவர்கள் தொடர்பாக விசாரணைகள் நடத்தப்பட்டு, நடவடிக்கை எடுக்கப்பட வேண்டும். அதேநேரம், இன்று வீடுகள் தேவைப்படுகின்றவர் களுக்கு வீடுகளை வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்பதையும் இந்த இடத்தில் நான் வலியுறுத்திக் கொள்ள விரும்புகின்றேன்.

அதேபோன்று, கல்முனை பிரதேச செயலாளர் பிரிவிலே பெரியநீலாவணைப் பகுதியிலே ஒரு மாடிக் குடியிருப்பு இருக்கின்றது. அது சுனாமியால் பாதிக்கப்பட்ட 245 குடும்பங்களுக்கு 2006ஆம் ஆண்டிலே வழங்கப்பட்டது. அந்த மாடிக் குடியிருப்பிலே மலக் கழிவுகளை வெளியேற்றுகின்ற பொறிமுறை முற்றாகப் பழுதடைந்திருக்கின்றது. அதன்காரண மாகக் கீழ்த்தளத்தில் உள்ள மக்கள் வீடுகளைப் பயன்படுத்த முடியாதளவுக்குத் துர்நாற்றம் வீசுவதுடன், அங்குள்ள மலக்குழிகள் நிரம்பி வழிந்துகொண்டிருக்கின்றது. இதுதொடர் பாக வீடமைப்பு அதிகாரசபையும் நகர அபிவிருத்தி அதிகாரசபையும் கவனத்திற்கொள்ள வேண்டும். இவ்வளவு தொகையான மக்கள் வாழுகின்ற ஓரிடத்திலே ஒரு சுகாதாரச் சீர்கேடு ஏற்படுகின்றபோது நகர அபிவிருத்தி அதிகாரசபை உடனடியாக அதை ஒழுங்குபடுத்துவதற்குரிய நடவடிக்கை களை மேற்கொள்ளவேண்டுமென்று இந்த இடத்திலே கேட்டுக்கொள்கின்றேன்.

அம்பாறை மாவட்டத்திலே ஆலையடிவேம்பு பிரதேச செயலாளர் பிரிவிலே கண்ணகிபுரம் என்ற கிராமத்தில் 245 குடும்பங்களுக்கு வீடமைப்பு அதிகாரசபையால் 1974ஆம் ஆண்டில் காணிகள் வழங்கப்பட்டிருக்கின்றன. அந்தக் காணிகளுக்கான கட்டணமொன்று அந்த உரிமையாளர்களால் வீடமைப்பு அதிகாரசபைக்குச் செலுத்தப்பட வேண்டியிருக் கின்றது. வறுமை காரணமாக அவர்களால் இன்றுவரை கிட்டத்தட்ட 45 வருடங்கள் கடந்தும் அதனைச் செலுத்த முடியவில்லை. அதனால் அதன் உடைமை அந்த மக்களுக்கு வந்து சேரவில்லை. இன்று அவர்களின் மூன்றாவது தலைமுறை தோற்றம்பெற்றுள்ள நிலையிலும் அதன் உடைமை மாற்றம் நடைபெறவில்லை. இதனால் அவர்கள் பாரிய பாதிப்புகளைச் சந்திக்கிறார்கள். ஆகவே, அவர்கள் செலுத்த வேண்டிய அந்தக் கட்டணத்தைத் தள்ளுபடிசெய்து, கண்ணகி புரம் மக்களுக்கு அந்த வீட்டு உரிமைகளை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கவேண்டுமென்று நான் மிகவும் விநயமாக உங்களிடம் வேண்டிக்கொள்கின்றேன்.

அடுத்து, நகர அபிவிருத்தியுடன் தொடர்பானதாக யாழ்ப்பாணத்தில் இடம்பெறுகின்ற சில விடயங்களை நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். யாழ்ப்பாணப் பிரதேசமானது சம தரையான, நிலத்திற்குக்கீழ் சுண்ணாம்புக் கற்பாறை களைக் கொண்டதாகும். அங்கே அதிகளவு மக்கள் வாழுகின்ற காரணத்தினால் வீடுகள் அமைக்கப்படுகின்றபொழுது அங்குள்ள வளங்கள் அழிக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. இதனால் நீர் வளமும் சரி, ஏனைய விவசாய நிலங்களும் சரி தீர்ந்துபோகின்ற நிலைமைகள் அதிகரித்துக்கொண்டு வருகின்றன. ஆகவே எதிர்காலத்திலே நிலைத்துநிற்கக்கூடிய பேண்தகு அபிவிருத்தியை முன்னெடுப்பதற்காகச் சரியான ஒரு திட்டமிடல் மேற்கொள்ளப்படல் வேண்டும். அந்தவகையில், குடியிருப்புகளுக்காக உயர்ந்த மற்றும் உயரம் குறைந்த மாடிக் கட்டடங்களை அமைப்பதற்கான நடவடிக்கைகள் மேற் கொள்ளப்பட வேண்டும். அவை எந்தெந்தப் பகுதிகளிலே அமைக்கப்பட வேண்டும் என்பது தொடர்பாகச் சரியான திட்டமிடலொன்று இருக்கவேண்டும்.

ஏனென்றால், அங்கே நிலத்திற்குக்கீழ் சுண்ணாம்புக்கல் இருக்கின்றது. அந்தச் சுண்ணாம்புக்கல் பாறைகளில் பாரிய குகைகள் இருக்கின்றன. இந்தக் குகைகள் இருக்கின்ற இடங்களில் மாடிக் குடியிருப்புக் கட்டிடங்கள் அமைப்பதற்கு அனுமதிக்கப்பட்டால் பாரிய விபரீதங்கள் ஏற்படும். அந்த விபரீதங்களைத் தவிர்க்க வேண்டுமாகவிருந்தால், அது தொடர்பாக அளவை செய்யப்பட வேண்டும். அதாவது, GPR - Ground-Penetrating Radar - முறைமை மூலமாக அந்த அளவை செய்யப்பட வேண்டும். அதன்மூலமாக நிலக்கீழ் அமைப்புத் தொடர்பான தரவுகள் சேகரிக்கப்பட்டு, அந்தத் தரவுகளின் அடிப்படையிலே எந்தெந்தப் பகுதிகளிலே மாடிக் குடியிருப்புகளை அமைக்கலாமென்று வலயங்கள் வகுக்கப்பட வேண்டும். அதன் பின்னர்தான் அந்த மாடிக் குடியிருப்புகளை அமைப்பதற்கான அனுமதிகள் வழங்கப்பட வேண்டும். அதுதொடர்பாக நகர அபிவிருத்தி அதிகாரசபை மிக விரைவாக நடவடிக்கை எடுக்கவேண்டும். இந்த GPR முறைமைமூலம் தரவு சேகரிக்கப்படுகின்றபோது, நிலக்கீழ்ப் பாறை அமைப்பையும் அந்தப் பாறைகளில் இருக்கக்கூடிய குகைகள் தொடர்பான தரவுகளையும் கண்டறிந்து சரியான திட்டமிடல்களை வகுக்கக்கூடியதாக இருக்கும். இதன்மூலம் இந்த மாடிக் குடியிருப்புகள் அமைக்கின்ற முறைமையை அறிமுகப்படுத்தப்படுவதனூடாக நிலக்கீழ் நீரைப் பாது காத்தல், விவசாய நிலங்களைப் பாதுகாத்தல் மற்றும் ஏனைய வளங்களைப் பாதுகாத்தல் போன்ற செயற்பாடுகளை உறுதிப்படுத்திக்கொள்ளக்கூடியதாகவிருக்கும் என்பதனை இந்த இடத்தில் நான் பதிவுசெய்துகொள்ள விரும்புகின்றேன்.

அத்தோடு, யாழ்ப்பாண மாவட்டம் சமதரையாக இருக் கின்ற காரணத்தினால், பிரதான வடிகாலமைப்புத் திட்ட மொன்று தயாரிக்கப்படுதல் வேண்டும். வடிகாலமைப் பின்மையால் பாரிய வெள்ளப்பெருக்கின்போது பெருமளவு பாதிப்பு குடாநாடு முழுவதும் ஏற்படுகின்றது. இதனைத் தயாரிப்பதற்கு நில அளவைத் திணைக்களத்தில்கூட மழைவீழ்ச்சித் தரவோ, நில உயரத் தரவுகளோ கிடையாது. ஆகவே, நீங்கள் இந்த நில உயரத் தரவுகளைப் பெறுவதற்கு LiDAR சேவை முறைமைமூலம் முப்பரிமாண வடிவில் அவற்றைத் தயாரிக்கின்ற நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். இலங்கையிலே தென் மேற்குப் பகுதியில் அமைந்துள்ள களனி கங்கை, களு கங்கை, ஜின் கங்கை, நில்வள கங்கை ஆகியவற்றின் வடிநிலப் பிரதேசங்களை உள்ளடக்கிய நிலத்தின் முப்பரிமாணத் தரவுகள் LiDAR அளவீடுகள்மூலம் பல்லாயிரம் மில்லியன் ரூபாய் செலவிலே பெற்றுக்கொள்ளப்பட்டு அபிவிருத்திகள் மேற்கொள்ளப் படுகின்றன. ஆனால், இந்த வடிகால் அமைப்புக்காக யாழ்ப்பாணம் தந்திரோபாய நகர அபிவிருத்தித் திட்டத்தின்கீழ்

[ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා]

ஒதுக்கப்பட்ட கிட்டத்தட்ட 1,870 மில்லியன் ரூபாய் நிதி முறையற்ற விதமாகப் பயன்படுத்தப்பட்டுத் துஷ்பிரயோகம் செய்யப்பட்டிருக்கின்றது. அந்த ஒப்பந்தமானது கொழும்பில் இருக்கின்ற UDA இன்கீழ் இயங்குகின்ற தந்திரோபாய நகர அபிவிருத்திட்ட முகாமைத்துவ அலகினால் தனியார் நிறுவனம் ஒன்றுக்கு வழங்கப்பட்டிருந்தது. சரியான தரையுயரத் தரவுகள், மழைவீழ்ச்சித் தரவுகள் இல்லாமல் ஒரு முறைகேடான வகையிலே 55 மில்லியன் US Dollars டொலரிலே திட்டமிடப் பட்ட அந்த அபிவிருத்தித் திட்டம் முற்றாகத் தோல்வியடைந் திருக்கின்றது.

இந்த மோசடியை மூடிமறைப்பதற்காக அந்த 1,870 மில்லியன் ரூபாயில் வெறுமனே யாழ்ப்பாணத்திலே 200 மில்லியன் செலவில் 2 குளங்கள் திருத்தப்பட்டிருக்கின்றன. அத்துடன், 200 மில்லியனுக்கு யாழ். மாநகர சபைக்குக் கழிவகற்றலுக்கான உபகரணங்கள் வழங்கப்பட்டிருக்கின்றன. அதன்மூலமாக அங்கு வெள்ளம் வடிந்தோடுவதற்குத் தாங்கள் நடவடிக்கை எடுத்திருப்பதான ஒரு தோற்றப்பாட்டைக் காட்டுவதற்கு இந்த மாநகர சபையோடு இணைந்து அங்கஜன் இராமநாதனும் நடவடிக்கைகளை மேற்கொண்டிருக்கின்றார். அதற்கான பிரதான வரைபடத்தைத் தயாரிக்கும் செயற் பாட்டை மேற்கொண்டு, இந்த 1,870 மில்லியன் ரூபாயிலே ஒரு பாரிய வடிகாலமைப்பினை அமைப்பதற்கு நடிவடிக்கை எடுத்திருந்தால் அங்கு எதிர்கால அபிவிருத்தியைச் சிறப்பாக கொண்டுசென்றிருக்க முடியும். ஆனால், நடைபெற்றிருக்கின்ற அந்த நிதி மோசடியினை மூடிமறைப்பதற்கான கண்துடைப்பு நடவடிக்கைகளாக வாய்க்காலைத் துப்புரவாக்குகின்றோம், வெள்ளம் வழிந்தோடச் செய்யப்பட்டுள்ளது என்ற ஏமாற்று வேலைகள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. ஆகவே, இது தொடர்பாக ஒரு விசாரணை நடாத்தப்படவேண்டும். இந்தத் தந்திரோபாய நகர அபிவிருத்தித் திட்டத்தின் மூலம் யாழ்ப்பாணத்தின் வடிகாலமைப்புத் தொடர்பாக வழங்கப்பட்ட அந்த ஒப்பந்தத்தில் எங்கே மோசடி நடைபெற்றிருக்கின்றது என்பது தொடர்பாக ஒரு சரியான விசாரணை நடாத்தப்பட்டு உரிய நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்று இந்த இடத்திலே நான் வலியுறுத்திக் கேட்டுக்கொண்டு, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂ අමාත්‍යාංශ දෙකක් වන වරාය හා නාවික අමාත්‍යාංශයේත්, ජලසම්පාදන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ ගැනයි අද කථා කරන්නේ. රටේ සමස්ත ජනතාවට ඉතාම වැදගත් විෂයයන් දෙකක් විධියටයි මම මේ අමාත්‍යාංශ දෙක දකින්නේ. හැබැයි, මේ ගැන කථා කරද්දී මේ අවස්ථාවේ රට තිබෙන තත්ත්වය ගැනත් වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. එදා පාස්කු ප්‍රහාරය සිද්ධ වෙලා මේ රටේ අහිංසක දුප්පත් මිනිස්සුන්ගේ, පුංචි ළමයින්ගේ රුධිරය මේ මිහිතලය මත ගලා ගෙන ගියා. ඒ රුධිරය ගලා ගෙන ගියාට පස්සේ, දිගින් දිගටම මේ රටේ සිදුවුණු කරුණු කාරණා අරගෙන බැලුවාම, අපට හිතන්නවත් බැරි දේවල් මේ රටේ සිද්ධ වෙනවා. රටක් හැටියට ගත්තාම, දැන් ජලයෙනුත් අපට ප්‍රශ්න තිබෙනවා. නැවත වතාවක් අපට ගින්දරෙනුත් ප්‍රශ්න ඇතිවෙලා තිබෙනවා. අද මේ වන විට අපේ කුස්සියේ තිබෙන ගෑස් සිලින්ඩරය නිකම්ම පත්තු වෙනවා. ගෑස් සිලින්ඩරය නිකම්ම පත්තු වෙන්න, මේ රටට වෙලා තිබෙන්නේ මොකක්ද? රටට යම්කිසි ශාපයක්ද? කාගේ හෝ මිනීමරු දෑත්, එහෙම නැත්නම් ලේ තැවරුණු දෑත් තිබෙනවාද? මෙවැනි ප්‍රශ්නයක් රටේ මතු වෙලා තිබෙනවා.

ඒ වාගේම බඩු මිල සම්බන්ධව, පොහොර සම්බන්ධව ප්‍රශ්න තිබෙනවා. වකුගඩු රෝගීන් රෝහල්වලට ගිහිල්ලා බෙහෙත් ටික දෙන්න කියලා මරා ගන්න හදන හැටි අපි දැක්කා. විශේෂයෙන්ම අද සෞඛ්‍ය අංශත් පාරට ඇවිල්ලා අරගළ කරනවා. ජනතාව ඉතා අපහසුවෙන් ජීවත් වනවා.

ඔබතුමන්ලා ආණ්ඩුවක් හැටියට ලිට්‍රෝ ගෑස් සම්බන්ධයෙන් මීට වඩා දැඩි පියවර ගත යුතුයි කියලා මම කියනවා. ගරු අමාත්‍යවරු කියනවා, ඒ අයත් මේ ගෑස් සිලින්ඩරය ගෙදර තියා ගන්න බයෙන් ඉන්නේ කියලා. ඒ නිසා ගෑස් සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක විසඳන්න මාස ගණන් ගත කරන්න එපා කියලා මම කියනවා. මේ නිසා හෙට අනිද්දා කාගේ හෝ ගෙදරක කෙනෙක්, අපේ කවුරුන් හෝ කෙනෙක් මැරුණොත් මොකද කරන්නේ? මේ රටේ කවුරු මැරුණත්, ඒ අපේ සහෝදරයෙක්. ඒකට වගකියන්නේ කවුද? ඒ නිසා ලිට්‍රෝ ගෑස් සිලින්ඩරවලින් මේ ගිනි ගැනීම් සිද්ධ වෙනවා නම්, වහාම ඒ සමාගමේ වග කිවයුතු අය ගෙන්වලා ඒ පිළිබඳව දවසින් තීන්දුවක් අරගෙන, ඒ අයට නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. ඒ වාගේම රටේ ජනතාවට සාධාරණය ඉෂ්ට විය යුතුයි. මේ රටේ ජනතාවට භය නැතිව ජීවත් වෙන්න පුළුවන් අවස්ථාව සලසා දෙන්න ඕනෑය කියන එක තමයි මම විශේෂයෙන්ම මතක් කරන්නේ. විහාර මහාදේවිය රටින් යැව්වා වාගේ, මේ රටේ තිබෙන ප්‍රශ්න නිසා ඉදිරි කාලය තුළ කවුරුන් හෝ මුහුදේ පා කරලා යවන්න වෙයිද කියන්න මම දන්නේ නැහැ. ඒ නිසා ඉදිරි කාලය තුළ මේ ප්‍රශ්න ගැන විශේෂයෙන්ම සලකා බලන්න කියලා ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. මොකද, අද ජනතාව ඉතා අපහසුතාවට ලක් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය හා නාවික අමාත්‍යාංශය ගැනත් මම කථා කරන්න ඕනෑ. ශ්‍රී ලංකාව පිහිටලා තිබෙන ස්ථානය ඉතා වැදගත් ස්ථානයක්. දකුණු ආසියාව ගත්තොත්, අපි ආසියාවේ මැද පිහිටලා තිබෙන දූපතක්. මේක ඇත්තටම රත්තරන් රටක්. ඒ නිසා මේ රටට වරාය කියන එක ඉතාම වැදගත්. ගරු අමාත්‍යතුමනි, මේ වරායවලට ආයෝජන ගෙනාවට කමක් නැහැ. වරාය සමඟ යම් කිසි රටක් එක්ක සම්බන්ධතා ඇති කරගෙන, අපේ වෙළෙඳ කටයුතු, නාවික කටයුතු බෙදා හදා ගත්තාට කමක් නැහැ. රටවල් ගොඩක් ඒ විධියට දියුණු වෙලා තිබෙනවා. ඒ ගැන නොවෙයි තිබෙන ප්‍රශ්නය. මම කියන්නේ අපි හැම රටකටම -චීනයට, ඇමෙරිකාවට, තවත් රටවලට- යටත් වෙන විධියට ගිවිසුම් ඇති කරගෙන වැඩ කටුතු කිරීම වැරැදියි කියන එකයි. අපි දන්නවා වරායේ නැඟෙනහිර ජැටියේ ඇති වූ ප්‍රශ්නය. නැඟෙනහිර ජැටියේ ප්‍රශ්නය ඇති වූ වෙලාවේ රටේ හැම දෙනාම කෑ ගැහුවා, ඒක පිට රටට දෙන්න එපා කියලා. ඒ නිසා බටහිර ජැටිය දුන්නා, අදානි සමාගමට. දැන් නැඟෙනහිර ජැටිය සංවර්ධනය කරන එකේ යම් කිසි ප්‍රමාදයක් තිබෙනවා ද, යම්කිසි නතර කිරීමක් තිබෙනවා ද,

එහෙම නැත්නම් කවුරුන් හෝ කණ්ඩායමක් කුමන්ත්‍රණකාරී විධියට ඒ සංවර්ධන කටයුතු නතර කරන්න යනවාද කියන එක ගැන මේ සභාවට කියන්න, ගරු ඇමතිතුමනි. එහෙම දෙයක් සිද්ධ වෙනවා නම් ඒක විශාල වැරැද්දක්. ඒ ජැටිය අපි තියා ගත්තේ අපේ සම්පතක් හැටියට අපේ රටට වැඩියෙන් ආදායම් ලබා ගන්නයි. ආනයන-අපනයන ක්‍රියා, ප්‍රතිඅපනයන ක්‍රියා, නාවික සේවා යන මේ සියල්ල සිද්ධ වෙන ප්‍රධාන තැනක් තමයි එතැන, මම අර කියපු පිහිටීමත් එක්ක. මේ වෙලාවේ අපට ප්‍රතිපත්තියක් නැහැ. මම හිතන විධියට නාවික කටයුතු සම්බන්ධ පනත ඇති කරලා තිබෙන්නේ 1972දී. අපි ඒක වෙනස් කරලා අලුත් වැඩ පිළිවෙළකට එනවා.

අලුත් වැඩ පිළිවෙළකට එද්දී අපි ඉන්නේ කොරිඩෝවක. නැව් සම්බන්ධ ජාත්‍යන්තර මුහුදු ගමන් මාර්ග ගත්තොත්, අපේ රටට තමයි ඉතාම හොඳ නාවික ගමන් මාර්ගයක් තිබෙන්නේ. එහෙම නම්, අපි ඒ සම්බන්ධීකරණය හරියට හදා ගනිමු. චීනය ගැන කියද්දී, චීනයේ අසුචිත් හොඳයි කියපු කණ්ඩායම් ඉන්නවා.

දැන් වරායට සම්බන්ධ අක්කර 13ක් සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අක්කර 13ක් චීනයට දෙන්න යනවා. චීනයත් එක්ක සම්බන්ධ වෙලා ඒ කරන්න යන්නේ logistics එක්ක ඇත්තටම වැදගත් රාජකාරියක්. ගරු අමාත්‍යතුමාට අපි යෝජනාවක් කරනවා. ඔබතුමාට ඒ පිළිබඳව වෙනස්කම් කරන්න හැකි නම්, අපේ රටට වැඩිපුර ශක්තිය ලැබෙන විධියේ, අපේ රටට වැඩිපුර ආදායම් එන විධියේ වැඩ පිළිවෙළක් හදන්න.

ඒ වාගේම අපි දන්නවා, Port City එකට එහා පැත්තේ තිබෙන කොටස තිබෙන්නේ චීනයට; මෙහා පැත්ත ඉන්දියාවට. අපේ රටේ හොඳම තැන එහෙම වුණාම, අපේ රටේ ආරක්ෂාවට පොඩි ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා ඔබතුමාට ඒ ගැනත් හිතන්න වෙයි. අපි maritime hub එක අපි හරි විධියට හදා ගත්තොත්, ලෝකයේ අනෙක් රටවල වරායවලට වඩා අපේ වරාය දියුණු කරන්න හැකි වෙයි. ඒ නිසා තමයි මම මේ විධියට ඔබතුමාට දිගින් දිගටම යෝජනා ගේන්නේ.

මෙතැනදී අපට කරන්න තව දෙයක් තිබෙනවා. අපි නැව්වලට අදාළ ප්‍රධාන කටයුතු ටික -ආනයන, අපනයන කටයුතු ටික- කරන්න වරායට භාර දෙනවා වාගේම, වෙනත් නාවික ක්‍රියාකාරකම්වලට යන්නත් අපට පුළුවන්. අපට අවශ්‍ය නම් මේ අක්කර 13 ඉඩම තුළ තව ක්‍රියාකාරකම්වලට යන්න අපට පුළුවන්. ඒ ක්‍රියාකාරකම් මොනවාද කියලා බැලුවොත්, විශේෂයෙන්ම containers repair සහ cleaning කරන තැනක් අපේ වරායේ නැහැ. ඒ නිසා අපට එතැන එවැනි දෙයක් කරන්න පුළුවන්. එසේ ගොඩනඟද්දී වරායවලට අදාළ දර්ශක පැත්තෙන් අපි උඩට එනවා විතරක් නොවෙයි, අපට විශාල ආදායමකුත් ලැබෙනවා. සමහර වෙලාවට එතකොට මීට වඩා නැව් සංඛ්‍යාවක් අපේ රටට ගෙන්වා ගන්න හැකියාව ලැබෙයි. එම නිසා මම ඔබතුමාට ඒ යෝජනාවත් කරනවා.

අපි තවත් පැත්තක් අරගෙන බැලුවොත්, නාවික රැකියාව කියන්නේ ලෝකයේ විශාල ඉල්ලුමක් තිබෙන රැකියාවක්. එම රැකියාව සම්බන්ධයෙන් ගත්තොත්, ඒකට හරියන විධියට අපේ පාසල් පද්ධතිය හරියට හදලා තිබෙනවාද? ඒ ක්ෂේත්‍රය මීට වඩා තව කොච්චර දියුණු කරන්න පුළුවන්ද? ඒවාට ලෝකයේ ඉල්ලුම කොපමණද? ඒ රැකියාවට විශාල පඩියක් ලැබෙනවා. අපට ඒ මඟින් ලැබෙන්නේ විදේශ විනිමය. අපට ගෘහ සේවිකාවන් යවා ලැබෙන ආදායමට වඩා වැඩි ආදායමක් මේ අංශයෙන් ගන්න පුළුවන්. අපේ රටේ පාසල් අධ්‍යාපනය අවසාන කරන පිරිමි අයට ඒ රැකියාව විශේෂයි. අපි නැවක් අරගෙන බැලුවොත්, ඒ නැවේ රැකියා ගණනාවක් තිබෙනවා. අපි නැවක engine room එක ගත්තාම, wiperගේ, oilerගේ ඉඳලා Second Engineer, Third Engineer කියන තනතුරු එක්කම Chief Engineer කියන තනතුර දක්වා තිබෙනවා. ඊළඟට electrician ඉන්නවා. නැවක පිටත කොටස ගත්තාම, විශේෂයෙන්ම deck boyගේ ඉඳලා, bosunගේ ඉඳලා, First Officer, Second Officer and Third Officer කියලා ඒකේත් නොයෙක් අංශ තිබෙනවා. නැවකට කෑම සපයන ප්‍රදේශය ගත්තාම, ඒ ප්‍රදේශයේ වෙනම අංශයක් තිබෙනවා. විශේෂයෙන්ම අපේ හොඳ අරක්කැමියන්ට - cooksලාට - මේ සඳහා අවස්ථාව තිබෙනවා. Radio officer කෙනෙක් වෙන්නත් අවස්ථාව තිබෙනවා. එම නිසා, නාවිකයන් පුහුණු කිරීමේ සහ නාවිකයන්ට අවශ්‍ය විභාග පවත්වා ඉගැන්වීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් ඒක ඉතාම හොඳයි කියලා මම ඔබතුමාට යෝජනා කරනවා.

මේ ගැන කථා කරද්දී කථා කළ යුතුම දෙයක් තමයි, "X-Press Pearl" නෞකාවේ සිද්ධිය. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, ඒ නෞකාවේ රසායනික ද්‍රව්‍ය ගිනි ගත්තාට පස්සේ තමයි අපි ඒ නැව ඇදගෙන ආවේ කියන එක. එසේ ඇදගෙන ආවත්, අද නෞකාව තිබෙන ස්ථානය පිළිබඳව අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මේ සිද්ධියෙන් අපේ ප්‍රදේශයේ හැම ධීවරයාටම විශාල ප්‍රශ්නයක් ඇති වුණා. විශේෂයෙන්ම මීගමුවෙන් එහාට මේ සිද්ධිය විශාල වශයෙන් බලපෑවා. අපි දන්නවා, කළුතර පැත්තටත් මේ සිද්ධිය බලපෑවා. නමුත් අපට හරි විධියට වන්දියක් ලැබුණේ නැහැ. අපි ඒ වන්දිය වෙනුවෙන් ගනු ලැබූ තීන්දුව මොකක්ද?

ඊළඟට, මේ රටට අනවශ්‍ය වැඩක් කරන්න යනවා කියලා තමයි අපට දැනගන්න ලැබෙන්නේ. අපි ඒ නැවේ තිබෙන කන්ටේනර් ඇතුළු සුන් බුන්ටික ඉවත් කරන්න ඕනෑ.

හැබැයි ඒකේ තිබෙනවා, අපේ රටට හොඳ නැති විෂ රසායනික ද්‍රව්‍ය. සිංගප්පූරු කොම්පැනියකට තමයි ඒ පිරිසිදු කිරීමේ කටයුත්ත භාර දීලා තිබෙන්නේ. ඒ අපද්‍රව්‍ය ගෙනැල්ලා අපේ රටටද දමන්න යන්නේ? අපේ රටට ඒ විෂ රසායනික ද්‍රව්‍ය ටික නැවත වතාවක් ගෙනාවොත්, අපේ රටට ඇතිවන තත්ත්වය මොකක්ද? අපි කොතැනද ඒවා වළලන්නේ? එයින් රටට කොපමණ හානියක් වෙනවාද? මේ කාරණා ගැන ඔබතුමා විශේෂයෙන් සොයා බලන්න ඕනෑ. එහි සමහර දේවල් ඔබතුමාට අයිති නැහැ. සමහර වෙලාවට පරිසරය ගැන ප්‍රශ්න තිබෙනවා. හැබැයි අපට දැනගන්න ලැබිලා තිබෙනවා, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියත්, පරිසර අමාත්‍යාංශයත් මේ නැවේ තිබෙන සියලු විෂ ද්‍රව්‍ය ලංකාවට ගේන්න අනුමැතිය ලබා දීලා කියලා. නැවක් අපේ රටේදී අනතුරට ලක්වෙලා මුහුදුබත් වෙනකොට, ඒ නැවේ කොටස් ටික අපට තමයි අයිති වන්නේ. හැබැයි, අනිවාර්යයෙන් මේ අයගෙන් අපේ රටට ගන්න තිබෙන වන්දි ටික ගන්න වැඩසටහනක් හදන්න ඕනෑ. මොකද, මේ නිසා අපේ ධීවරයන්ට විශාල වශයෙන් හානි වුණා. ඔබතුමාගේ අමාත්‍යාංශය ගැන මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. හැබැයි, ඔබතුමාගෙන් මම විශේෂ ඉල්ලීමක් කරනවා. වරාය කියන්නේ අපේ රටේ ආර්ථිකයට විශාල වශයෙන් බලපාන දෙයක්. කරුණාකර, ඒකට හොඳ වැඩ පිළිවෙළක් හදන්න. හොඳ වැඩ පිළිවෙළක් හදන්න ඔබතුමාට අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ඒ අවස්ථාව රටේ මිනිසුන්ට දෙන්න. විදේශ විනිමය සොයාගන්න වැඩසටහන් පමණක් නොවෙයි, දේශීය වශයෙන් රැකියා උත්පාදනයත්, ඒ වාගේම දේශීය වශයෙන් අපේ රටේ ජීවත් වන මිනිසුන්ගේ ව්‍යාපාරික අවස්ථා විශාල වශයෙන් දියුණු කරන්න පුළුවන් තැනක්, ඒ වාගේම ජාත්‍යන්තර සම්බන්ධතාවලින් අපට ගොඩක් ඉදිරියට යන්න පුළුවන් තැනක් හරි විධියට නිර්මාණය කරන්න කියලා ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා.

මම ඊළඟට සූදානම් වන්නේ ජල සම්පාදන අමාත්‍යාංශය ගැන කථා කරන්නයි. ජල සම්පාදනය ගැන කථා කරද්දී, මම විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කය ගැන කථා කරන්න ඕනෑ. මම

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

එක පැත්තකින් සතුටු වෙනවා, පුත්තලම දිස්ත්‍රික්කයට ජලය සම්බන්ධ රාජ්‍ය අමාත්‍යවරයෙක් ලැබීම ගැන. මෙපමණ කාලයකට අපට එවැනි කිසිදු අමාත්‍යවරයෙක් ලැබිලා නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාට ඉටු කරන්න දැන් විශාල රාජකාරියක් තිබෙනවා. වෙන්නප්පුව, නාත්තන්ඩිය, හලාවත, පුත්තලම, ආනමඩුව කියන අපේ මැතිවරණ ආසන පහේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ලටම ජල සැපයුම ලැබිලා තිබෙන්නේ ස්වල්ප පිරිසකට බව අපි දන්නවා. මා ඔයෙන් ආශ්‍රිතව කරන දංකොටුවේ තිබෙන ව්‍යාපෘතියෙන් ඒ ප්‍රමාණය දෙගුණයක් කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. නමුත් තවම එක වැඩ පිළිවෙළයි තිබෙන්නේ. පරණ වැඩ පිළිවෙළම තමයි තිබෙන්නේ. ඒ අනුව තමයි තවම කටයුතු කරන්නේ. අලුත් වැඩ පිළිවෙළක් ඒකට ආවා කියලා කිව්වා.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
දෙවැනි වැඩ පිළිවෙළ යනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
දෙවැනි වැඩ පිළිවෙළ යනවා නම් හොඳයි. ඒ දෙවැනි වැඩ පිළිවෙළ යනවා නම්, ඔබතුමාට මම විශේෂ යෝජනාවක් කරනවා. සිරිගම්පල ජනපදය කියන්නේ එදා අපි කැබලි 2,250කට බෙදපු ඉඩම. අද ඒ ඉඩම කැබලි 3,750කට පමණ බෙදී ගිහින් තිබෙනවා. සමහර තැන්වල පර්චස් 5, 10, 15 ප්‍රමාණවලත් ගෙවල් හැදිලා තිබෙනවා. ඒ නිසා ඉදිරි කාලයේදී එතැන විශාල ප්‍රශ්නයක් එන්න පුළුවන්. ඉදිරි කාලයේ ජලය පොළොවෙන් අරගෙන පාවිච්චි කරන්න බැරි වෙනවා. මොකද, විශේෂයෙන්ම ජලයට මලපහ එකතු වෙන්න පුළුවන් නිසා. මේ කාරණය විශේෂකොට සලකන්න ඕනෑ. අපේ පළාතට රාජ්‍ය අමාත්‍යවරයෙක් ඉන්න වෙලාවේ මේ සිරිගම්පල ජනපදයට ජල සැපයුම ලබා දෙන්න සුදුසු අවස්ථාව තමයි මේ අවස්ථාව. විශේෂයෙන්ම ඔබතුමාත් දන්නවා, මුහුදුකරයේ ජලය පාවිච්චි කරන්න අමාරු බව. වෙන්නප්පුවේ කෙළවර සිට පටන් ගත්තාම හලාවත, පුත්තලම කෙළවර දක්වා මුහුදු තීරයටත්, බරුදැල්පොළ, තොඩුවාව, ඉරණවිල ආදී ප්‍රදේශ සියල්ලටත් ජලය ලබා දීම අවශ්‍යයි. ඒ ප්‍රදේශවල ජල ප්‍රශ්නය දිගින් දිගටම තිබෙනවා. සාමාන්‍ය කුඩා ව්‍යාපෘති ටිකක් තිබෙනවා. නමුත්, ඒවා ප්‍රමාණවත් නැහැ. පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුවේ අපේ යහ පාලන ආණ්ඩුව කාලයේ හදපු ජල ව්‍යාපෘතිය ගැන ඔබතුමාත් දන්නවා. හැබැයි, ඒ වෙලාවේ එයින් වනාතවිල්ලුවේ අයට ජලය දෙන්නේ නැතිව පුත්තලම නගරයට ජලය දුන්නා. වනාතවිල්ලුවේ අය පසුකර ගෙන ඇවිත් තමයි පුත්තලමට ජලය ගෙනැල්ලා දුන්නේ. මම හිතන හැටියට දැන් ඒ ජල ප්‍රමාණයේ ධාරිතාව මදි. ඒ නිසා ඒ ධාරිතාව වැඩි කරන්න වැඩ පිළිවෙළක් තිබෙනවා නම් හොඳයි.

ඊළඟට, දැදුරු ඔය ආශ්‍රිතව බිංගිරියෙන් එන ඒ ව්‍යාපාරයෙන් මේ සියල්ලම සම්පූර්ණ කරන්න හැකි නම්, ඒක ඉතාම වැදගත්. මොකද, තවත් ජල පහසුකම් අවශ්‍ය බොහෝ අය ඉන්න නිසා. ඒ අයටත් ඒ ජල පහසුකම් ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඔබතුමා කරගෙන යනවා, 'නැනෝ' කියන පොඩි ව්‍යාපෘති. එවැනි ව්‍යාපෘති කර ගෙන යද්දි මීට පෙර අපේ රටේ කල්පිටිය ප්‍රදේශයේ යම් පරීක්ෂණයක් සිදු කරලා තිබුණා, මුහුදු වතුර යම් ආකාරයකින් පිරිසිදු කරලා දෙන්න පුළුවන්ද කියලා.

හැබැයි, ඒකට ඒ කාලයේ විශාල වියදමක් ගිහිල්ලා තිබුණා. ඔබතුමා කිව්වා වාගේ භූගත ජලය නැතුව මතුපිට ජලය පාවිච්චි කරමින් යම්කිසි වැඩපිළිවෙළක් කරනවා වාගේම, මුහුදු ජලය අරගෙන යම්කිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ හැකි නම් එය ඉතා වැදගත්. හැබැයි, ඒකට විශාල මුදලක් යනවා නම්, ඒකටත් යම්කිසි ක්‍රමවේදයක් හදන්න පුළුවන්ද කියලා ඔබතුමා සොයා බලනවා නම් හොඳයි කියන එක තමයි විශේෂයෙන් මතක් කරන්න තිබෙන්නේ. මොකද, අපට පානීය ජලය ඉතා වැදගත්.

**ගරු සනත් නිශාන්ත මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த)
(The Hon. Sanath Nishantha)
ගරු මන්ත්‍රීතුමනි, මේ වෙද්දී අපි කල්පිටියට පානීය ජලය ලබාදීම සඳහා මූලික වැඩකටයුතු ආරම්භ කරලා තිබෙනවා. එළුවන්කුලමෙන් මුහුදට යටින් බට ලයින් එකක් කිලෝමීටර දෙකහමාරක් ගෙනියන්න සැලසුම් කරලා තිබෙනවා. එහෙම ගෙනිහිල්ලා කල්පිටියට ජලය ලබාදීමේ සම්පූර්ණ ව්‍යාපෘතියක් මේ වෙනකොට යනවා. ඊට අමතරව, කන්දකුලිය ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 10ක් ආවරණය වෙන්න RO ක්‍රමයට ජලය ලබා දෙන්න ළිං හදන්න පටන් අරගෙනයි තිබෙන්නේ. මෙතැනදී පක්ෂය පැත්තකට දාලා සියලුදෙනා එකතු වෙලා මේ වැඩේ කරමු. ඒ ප්‍රදේශයේ ඉන්න ඔබතුමන්ලාගේ නියෝජිතයන්ටත් කියන්න අපට උදවු කරන්න කියලා. මොකද, අනවශ්‍ය බයක් ඇති කරලා ජනතාව ඒකට විරුද්ධව කථා කරනවා. ඒ නිසා විශාල ව්‍යාපෘතිය එන තෙක් ඒ වැඩේ කරන්න උදවු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ජලය සම්බන්ධ ඕනෑ ප්‍රශ්නයකට ඔබතුමා කථා කරන්න. ඒ පිළිබඳ දැනුවත් කරලා සම්පූර්ණ සහයෝගය ලබාදීමේ වැඩකටයුත්ත අපි කරන්නම්. ජල ප්‍රශ්නය නිසා ඒ ප්‍රදේශයේ ජනතාව කොච්චර දුකක් විඳිනවාද? මේ වෙනකොට කල්පිටිය ප්‍රදේශයේ අක්කර 6,500කට වැඩි වගා බිම් ප්‍රමාණයක් ජලයට යට වෙලා. නිවාස ටික වෙනම යට වෙලා. ඒ නිසා මේ ජල ප්‍රශ්නය අපට විශාල ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය විසඳනවා නම් එක පැත්තකින් පිනකුත් වෙනවා. ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න අපි සූදානම් බව ප්‍රකාශ කරනවා. කාල වේලාව මදි නිසා මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 41ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි.

අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ වරාය හා නාවික අමාත්‍යාංශයත්, අපේ රාජ්‍ය අමාත්‍යාංශයත්, ජල සම්පාදන අමාත්‍යාංශයත්, ඒ රාජ්‍ය අමාත්‍යාංශයත් සම්බන්ධ වැය ශීර්ෂ විවාදය සඳහා අද අපට වෙලාව වෙන් කර දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන් ඔබතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා.

අද මේ අමාත්‍යාංශ දෙකේ විවාදයේදී මමත්, ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාත් අපේ ගරු සනත් නිශාන්ත රාජ්‍ය ඇමතිතුමාත් උදේ ඉඳලා මේ හැමදෙනාටම ඇහුම්කන් දුන්නා. අද මගේ රාජ්‍ය අමාත්‍ය ගරු ජයන්ත සමරවීර මැතිතුමා අසනීප තත්ත්වයෙන් ඉන්න නිසා එතුමාට සභාවට ඒමට නොහැකි බවත් මම මේ සභාවට මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශයට එල්ල කරපු චෝදනා සහ යෝජනා සම්බන්ධයෙන් කියනවා නම්, යෝජනා පිළිගන්නත්, චෝදනාවලට පිළිතුරු දෙන්නත් අපට වගකීමක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වරාය හා නාවික විෂය භාර අමාත්‍යවරයා හැටියට මේ අමාත්‍යාංශය භාරගෙන අද වෙනකොට අවුරුද්දයි, මාස තුනයි, දින 20ක් ගත වෙනවා. මේ කාලය තුළ මේ අමාත්‍යාංශයට පවරන වගකීම්වලදී, විශේෂයෙන්ම මගේ රාජ්‍ය අමාත්‍යාංශයේ අමාත්‍යතුමාත්, ඒ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්, මේ රටේ හදවත බඳු ශ්‍රී ලංකා වරාය අධිකාරිය, එහි සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සියලු නිලධාරින්, මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරින්, මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන නැව් සංස්ථාව, වෙළඳ නාවික ලේකම් කාර්යාලය, Jaya Container Terminal Limited , SLPMCS (Pvt) Limited කියන මේ සමාගම්වල සියලු නිලධාරින්, සභාපතිවරු ලබා දෙන සහයෝගය ප්‍රථමයෙන්ම අගය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ හැම කථාවකටම ඇහුම්කන් දුන්නා. වරාය සම්බන්ධයෙන් විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු අදහස් ඉදිරිපත් කළා. නමුත් ඒ අය සිහිපත් කළත් නොකළත් මම සිහිපත් කරනවා, ඉතිහාසයේ හිටපු අමාත්‍යවරයකු වන දිවංගත ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා. සුදු මහත්වරු අපට උරුම කරපු වරායට, ඊට පස්සේ යම් සේවාවක් කිරීමට යම් වැඩ පිළිවෙළක් සඳහා ඉදිරි දැක්මකින් කටයුතු කළ ඇමතිවරයකු හැටියට අදත් අපි ශ්‍රීමත් ලලිත් ඇතුළත්මුදලි හිටපු ඇමතිතුමා සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එයින් පස්සේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ස්වර්ණමය යුගය ඇති වුණේ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඇතුළු මේ අමාත්‍යාංශය හරහා මේ රට නාවුක කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ පුරෝගාමියා බවට කටයුතු කළේ වෙන කවුරුවත් නොවෙයි, 5වන විධායක ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාය කියන එක වග කීමකින් මම කියනවා. ඇයි මම එහෙම කියන්නේ? මම එදා එතුමාගේ රාජ්‍ය ඇමතිවරයා. එතුමා 2005දී ආණ්ඩුව භාරගෙන 2009 වන විට මහා යුද්ධයක් අවසන් කරපු නායකයා. එතුමාට බොහොම පැහැදිලිව අවශ්‍ය කරලා තිබුණා, යුද්ධයෙන් පස්සේ මේ රට සංවර්ධනය කරන්න. ඒ සංවර්ධනය කිරීමේදී අපි නොදැක්ක, අපි රූපවාහිනියෙන් පමණක් දුටු, අධිවේගී මාර්ග හැදෙන හැටි දැක්කා. ඒ අධිවේගී මාර්ගයේම අපේ ජනාධිපතිතුමා වාහනයක් පදවාගෙන ගිහින් ඒ මාර්ගය ජනතා අයිතියට පත් කළා.

ඒ වාගේම තමයි මේ වරාය ක්ෂේත්‍රය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කය. ඔබතුමා ඉන්න දිස්ත්‍රික්කයේ ඉතිහාසයේ ඉඳන්ම හම්බන්තොට වරායක් ගැන කියලා තිබෙනවා. ඔබතුමාගේ තාත්තා, මුත්තා, කිත්තා, කිරිකිත්තා කාලයේ ඉඳන්ම හම්බන්තොට වරායක් ගැන කියලා තිබෙනවා. හැබැයි, ඒක අපි දැකලා තිබුණේ නැහැ. නමුත් ඒ වරායක උරුමකම ඔබේ ඇස් දෙකෙන්, මගේ ඇස් දෙකෙන් දකින්න වුණේ කොහොමද? ලෝකයේ වරායවල් හඳනකොට ඇතුළත වරාය සහ පිටත වරාය කියලා තිබෙනවා. ලංකාවේ හදපු නැව් මාර්ගයක තිබෙන ප්‍රබලම වරාය තමයි හම්බන්තොට වරාය. අපේ ඇස් දෙකට කවදාවත් නොදකින්න පුළුවන් දෙයක් ඒ වරාය හදනකොට අපට දකින්න හැකි වුණේ කොහොමද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කොළඹ වරායේ පතුළ දැකපු කිසි කෙනෙක් අපට හොයන්න පුළුවන්ද? වතුර පිරෙන්න ඉස්සෙල්ලා කොළඹ වරායේ පතුළ දැකපු කෙනෙක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඔබතුමා හම්බන්තොට වරායේ වතුර පිරෙන්න ඉස්සෙල්ලා පතුළ දැක්කා. ඔබතුමා දැක්කා ඒ වරාය හදනවා; ඔබතුමා දැක්කා ඒ වරායට වතුර පිරෙනවා; ඔබතුමා දැක්කා ඒ වරායට නැව් එනවා; ඔබතුමා දැක්කා ඒ වරාය විකුණාගෙන කනවා. ඒ සියල්ලම ඔබතුමා දැක්කා. ඔබතුමාත් ඒවා බලාගෙන හිටියා. ඔබතුමාත් එක්ක අපිත් ඒ දිහා බලාගෙන හිටියා. එදා ඒකට විරුද්ධ වෙලා බොහොම අමාරුවෙන් හිරේ යන්නේ නැතිව බේරුණා. මේ ඉන්න මන්ත්‍රීතුමාත් එක්ක නාමල් රාජපක්ෂලා, ඩී.වී. චානකලා, ප්‍රසන්න රණවීරලා එදා හිර ගෙදරට ගියා. මේක තමයි ඒ ඉතිහාසය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2005දී අපි ආණ්ඩුව භාර ගන්නකොට අපට මොනවද උරුමවෙලා තිබුණේ? 2005ට පෙර අපට උරුමවෙලා තිබුණේ ජයබහලු පර්යන්තය - JCT පර්යන්තය. ජයබහලු පර්යන්තයේ දිග මීටර් 1,290යි. ඒ වාගේම තමයි SAGT පර්යන්තය. එහි දිග මීටර් 930යි. මේ තමයි අපට උරුමවෙලා තිබුණු වරායේ ප්‍රධාන නැංගුරම්පොළවල් දෙක, ප්‍රධාන terminals දෙක. එතකොට මේවා තුළට මොන නැව්වලටද එන්න පුළුවන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මේවාට එන්න පුළුවන් ලෝකයේ නිෂ්පාදනය කරන සාමාන්‍ය බහලුම්, කන්ටේනර් 3,000ක්, 4,000ක් උපරිමය දා ගත්ත නැව්වලට විතරයි. කොළඹ වරායට විශාල නෞකාවලට එන්න බැහැ. නැව්වලට එන්න පුළුවන්; කිට්ටු වෙන්න පුළුවන්. නමුත් වරාය ඇතුළට එන්න බැහැ. මොකද හේතුව, අපේ කොළඹ වරායේ ගැඹුර මදි. අපේ ජයබහලු පර්යන්තයේ උපරිම ගැඹුර මීටර් 13ත් - 15ත් අතර. එතකොට ඒකට ලෝකයේ විශාල නැව්වලට එන්න බැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එදා කල්පනා කළේ මොකක්ද? එතුමා කල්පනා කළා, එහෙම නම් මේකට එක එක්කෙනානට බැණ බැණ ඉඳලා හරියන්නේ නැහැ, මම තීන්දුවක් ගන්න ඕනෑ කියලා. මොකක්ද එතුමා ගත්ත තීන්දුව? එතුමා එදා යුද්ධය කරන ගමන් මේ සම්බන්ධයෙන් තීන්දුව ගන්න ලෑස්ති වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකද්ද ඒ තීන්දුව? ඒ තීන්දුව මේකයි. ඔබතුමාත්, මමත් Galle Face පිටිය ගාවට යනකොට පෙනෙනවා, මහ මුහුද දක්වා යන තාප්පයක් වාගේ තිබෙන මහ දියකඩනය. මේ දියකඩනය හදන්න වෙනවා. දියකඩනයක් හැදුවොත් තමයි වරාය පුළුල් කරන්න පුළුවන් වෙන්නේ. අපේ ඉංජිනේරුවන්ගේ බුද්ධිය, දැනුම ඇතුළු සියලු දේ පාවිච්චි කරගෙන එතුමා එදා ජනාධිපතිතුමා විධියට තීන්දුවක් ගන්නවා. එතුමාගේ ආණ්ඩුව තුළ එදා එතුමාගේ රාජ්‍ය ඇමතිවරයා ලෙස කටයුතු කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ දියකඩනය හදන්න අපි ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 300ක් ගන්නවා. අපේ වරාය අධිකාරිය ඩොලර් මිලියන 300ක් වියදම් කරනවා. මේ දියකඩනයේ දිග මීටර් 5,200යි. අක්කර 1,300ක භූමියක් අපට අයිති වෙනවා. අක්කර 1,300ක භූමියක්. දිග මීටර් 5,200යි. ඒ කියන්නේ, කිලෝමීටර් 5යි, මීටර් 200ක් දිගයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් අහගෙන හිටියා, මේ ගරු සභාවේ අපේ සහෝදර මන්ත්‍රීවරු කථා කරනවා. මම දැක්කා එක මන්ත්‍රීවරයෙක් කියනවා, CICT ජැටිය විකුණාගෙන කාලා, බටහිර ජැටියත් විකුණලා, අක්කර 13ක් විකුණාගෙන කන්න හදනවා කියලා. එතුමා හිටියා නම් මම කැමැතියි, විකුණාගෙන කාපු විධිය අහන්න. ඒක කියලා දෙන්න කලින්, මේ කියන ජැටි, මේ කියන අක්කර 13 ලැබුණේ කවුරු නිසාද කියලා මම අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැන මහ මුහුදේ රැල්ල ගහනවා. ආපහු රැල්ල අනෙක් පැත්තට ගහ ගෙන යනවා. ඒ හැර එතැන වෙන මොකුත් තිබුණේ නැහැ. මෙන්න මේ දියකඩනය හැදුවාට පස්සේ තමයි අපට පර්යන්ත තුනක අයිතිය හම්බ

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

වෙන්නේ; පර්යන්ත තුනක් හදන්න අයිතිය හම්බ වෙන්නේ. ආසියානු සංවර්ධන බැංකුව එදා අපට ණය දෙනකොට කොන්දේසියක් දමනවා, පර්යන්ත තුනෙන් එක පර්යන්තයක වැඩ රජයෙන් කරන්න, ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් කරන්න කියලා. ඉතුරු පර්යන්ත දෙකේම වැඩ පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා කරන්න කියලා ආසියානු සංවර්ධන බැංකුව අපට කොන්දේසියක් දමනවා.

මේ ළඟදී වරායේ බටහිර පර්යන්තය විකුණුවා කියලා එක ගෞරවනීය ස්වාමීන් වහන්සේ කෙනෙක් කථා කරලා ඇහුවාම මම ගිහිල්ලා උන් වහන්සේ හම්බවුණා. මම කිව්වා, අපේ හාමුදුරුවනේ බටහිර පර්යන්තය විකුණුවා කියලා ඔබවහන්සේ කියනවා, මම ආවේ ඒ නිසා කියලා. උන්වහන්සේ කිව්වා, ඔව්, මහත්තයෝ කියලා. මම කිව්වා, ඒ පර්යන්ත තියෙන තැන හොයලා දෙන්න හාමුදුරුවනේ කියලා. එහෙම එකක් නැද්ද කියලා හාමුදුරුවෝ මගෙන් අහනවා. මේ ඒක තමයි වෙලා තිබෙන්නේ. එතැන බටහිර පර්යන්තයක් නැහැ. බටහිර පර්යන්තයට මේ වනතුරු සිමෙන්ති කොට්ටයක්වත් දාලා, එක ගඩොලක් තියලා නැහැ. තවම තියෙන්නේ දියකඩනය විතරයි. වෙන කිසිම දෙයක් නැහැ. මේ හදන්නේ රටට රකුසෙක් මවන්න. එහෙම පිටින්ම රටේ මිනිස්සු අමාරුවේ දමන, මිනිසුන්ගේ ඔළුව නරක් කරන එකයි මේ කරන්න හදන්නේ. 2015දීත් මේ වැඩේම කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා දියකඩනය හදපු නිසා අපට පර්යන්ත තුනක් හදන්න ඉඩ ලැබෙනවා. එකක් තමයි, නැඟෙනහිර පර්යන්තය. අනෙක් දෙක තමයි, බටහිර පර්යන්තය එක සහ බටහිර පර්යන්තය දෙක. ඒවා අපට උරුමකමකට ලැබෙනවා. මේ දියකඩනයට දකුණු අත පැත්තෙන් මොකක්ද තිබෙන්නේ? අංග සම්පූර්ණ කොළඹ වරාය නගරය - Port City එක - තිබෙන්නේ. අපි ඒකට රුපියලක් වියදම් කළේ නැහැ. චීන සමාගමක් විසින් ඒ මුළු නගරයම - Port City එක - ගොඩ නඟනවා. කොළඹ වරාය නගරයට හෙක්ටෙයාර 289ක් ලැබෙනවා. මුහුදෙන් හෙක්ටෙයාර 289ක ප්‍රමාණයක් ගොඩ කරලා, ලෝකයේ ප්‍රබලම ආර්ථික මර්මස්ථානයක් බවට පත් කරන්න බලාපොරොත්තුවෙන් ඉන්න කොළඹ වරාය නගරය දකුණු අත පැත්තෙන් තිබෙනවා. ලෝකය දියුණු වනවාත් එක්කම ලෝකයේ ව්‍යාපාරික ප්‍රජාව අපිත් එක්ක මේ නගරය හරහා අත්වැල් බැඳගන්න සූදානමින් ඉන්නවා. දියකඩනයට අනෙක් පැත්තෙන් මේ කියන අපේ පර්යන්ත තුන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා -එතුමා දැන් හිටියා නම් හොඳයි.- බොහොම පැහැදිලිව ඇහුවා, නැඟෙනහිර පර්යන්තය සම්බන්ධයෙන්. නැඟෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් එතුමාට උත්තර දෙන්න ඉස්සෙල්ලා, මේ කාරණය රටට කියන්න වෙනවා. අපි මේක කියලාත් තිබෙනවා. 2015 ජනවාරි 08වන දා ජනතාව බොහොම සුළු ඡන්ද සංඛ්‍යාවකින් අප ප්‍රතික්ෂේප කරනවා. මේ නැඟෙනහිර පර්යන්තයේ මුළු දිගින් මීටර් 440ක් අපි හදලා අවසන්. මුළු පර්යන්තයේ දිග මීටර් 1,320යි. ඒ මුළු පර්යන්තයේ මීටර් 1,320න් මීටර් 440ක් අපි හදලා ඉවරයි. අපි ඒකට දොඹකර ගෙනැල්ලා නැහැ. පර්යන්තයේ කොටසක් හදලා ඉවරයි. ඒක ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් කරන්නේ. ඒ පර්යන්තය හදලා ඉවර කරලා, 2014දී අපි දොඹකර ඇණවුම් කරනවා. හැබැයි, කඩේට ගිහිල්ලා පාන් ගෙඩියක් ගන්නවා වාගේ දොඹකරයක් ගෙනෙන්න අපට පුළුවන්කමක් නැහැ. රජයේ නීති රීතිවලට අනුව, ප්‍රසම්පාදන ක්‍රියාවලියට ගිහිල්ලා, කැබිනට් එකට යොමු කරලා, කැබිනට් අනුකාරක සභාවකින් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ කමිටු පත් කරන්න ඕනෑ. ඒකයි ක්‍රියාවලිය. අපි දොඹකර තුනකට අවශ්‍ය ක්‍රියාවලිය පටන් ගන්නවා. ඒක අනුමත වෙනවා. ආණ්ඩුව ආපු ගමන් විෂයය භාර ඇමතිවරයාගේ -වරායට එන පළමුවෙනි ඇමතිවරයාගේ- පළමුවන වගකීම වන්නේ කුමක්ද?

ඒ ආණ්ඩුව ආපු ගමන්ම අපි ඇණවුම් කරලා තිබුණු දොඹකර ටික ගෙන්වන එක නැවැත්වුවා. දොඹකර ගෙන්වීම නැවැත්වුවා කියමු කෝ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නැවැත්වුවා නම් කරන්න තිබෙන්නේ ඉතා ඉක්මනින් ප්‍රසම්පාදන ක්‍රියාවලියකට ගිහිල්ලා නැවත දොඹකර ටික ඕඩර් කරන එක නේ. එහෙම කළත් ඒවා ගෙනෙන්නත් තව අවුරුදු එකහමාරක් යනවා. අවුරුදු එකහමාරක්, දෙකක් යනවා ඒ අවශ්‍ය උපකරණ ටික ගෙනෙන්න. නමුත් ඒ සඳහා මොකුත් කළේ නැහැ. ඒවා ගෙන්වන එක නැවැත්වුවා. ඒ නිසා හදපු පර්යන්තය එහෙමම තිබුණා; මොකුත් කළේ නැහැ. අවුරුදු පහක් යහපාලන ආණ්ඩුව තිබුණා. වරාය ඇමතිවරු තුන්දෙනෙක් මාරු වුණා. එක ඇමතිවරයෙකුගේවත් කොන්ද කෙළින් තිබුණේ නැහැ, ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්න. හිටපු ජනාධිපතිට, හිටපු අගමැතිට, ඇමතිවරුන්ට කොන්ද කෙළින් තිබුණේ නැහැ, නැඟෙනහිර පර්යන්තයට අවශ්‍ය දොඹකර ටික ගෙනැල්ලා ඒ පර්යන්තයේ කටයුතු ක්‍රියාත්මක කරවන්න. ක්‍රියාත්මක කරවන්න අවශ්‍යතාවක් තිබුණේත් නැහැ. වුවමනාවක් තිබුණේත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊට පස්සේ මොකක්ද සිද්ධ වුණේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා විපක්ෂය නියෝජනය කළ අයගෙන් මම අහනවා, 2015 ජනවාරි 8වැනි දා ඉඳලා 2019 නොවැම්බර් 17වැනි දා එළිවෙනතුරු කාලය තුළ වරාය ක්ෂේත්‍රයට කරපු එක දෙයක් කියන්න කියලා. "මෙන්න, අපි අවුරුදු පහක් මේ ක්ෂේත්‍රයේ වැඩ කරලා තිබෙනවා. මෙන්න, අපි වරාය ක්ෂේත්‍රයට කරපු දේ" කියලා එක දෙයක් කියන්න. නමුත් එක දෙයක් කළා. ඒ ගොල්ලන් දන්නේ නැති වුණාට මම දන්නා එක දෙයක් කළා. ඒ ඇමතිවරු තුන්දෙනාම ඒක කළා. ජයබාහලුම් පර්යන්තයේ විශාල ධාරිතාවෙන් යුතු නැව් දෙකක් එකට මෙහෙයුම් කරන්න අපේ ජැටියේ ඉඩ මදි. ඒ ජැටියට තව කොටසක් එකතු කරලා තව දොඹකර තුනක් ඒකට දැම්මාම නැව් දෙකක් මෙහෙයවන්න අපට පුළුවන්. ඒක කළ යුතු දෙයක්. නමුත් පසු ගිය ආණ්ඩුව මොකක්ද කළේ? ප්‍රසම්පාදන ක්‍රියාවලියකට ගියා; කැබිනට් අනුමැතිය ගත්තා ජැටිය හදන්න සහ cranes ටික ගෙනෙන්න. ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනවා. නමුත් ජැටියේ වැඩ වෙන්නේ නැහැ. Cranes ගෙනෙනවා; ජැටිය නැහැ. ඒකට හේතුව මම කියන්නේ නැහැ. ඒක තේරුම් ගැනීම ඔබ සතුයි. ඇණවුම් කරලා අවශ්‍ය cranes ටික ලංකාවට එනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් ජැටිය නැහැ. අලියා එනවා; හෙණ්ඩුව නැහැ. දැන් කරගන්න දෙයක් නැහැ. ඒවා බාන්න තැනක් නැහැ. අන්න එතකොට අපි හදපු නැඟෙනහිර පර්යන්තය ගැන හිතනවා. දොඹකර බානවා කියන්නේ උදැල්ලක්, පිහියක් බානවා වාගේ නොවෙයි නේ. ඒ නිසා එවා ගෙනැල්ලා නැඟෙනහිර පර්යන්තයේ බානවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක මීටර් 19ක්, 20ක්, 22ක් විතර ගැඹුරක් තිබෙන පර්යන්තයක්. ඒකේ ලෝකයේ විශාල නෞකා මෙහෙයවන්න පුළුවන්. ඒකට ලෝකයේ නවීන වාගේම වැඩිම මීටර් ප්‍රමාණයක් -අත දිග- තිබෙන cranes තමයි හරි යන්නේ. නමුත් ඒවා නොවෙයි ගෙනෙන්නේ. අනෙක් පර්යන්තයට ගෙනාපු ඒවා මේ පර්යන්තයේ බානවා. එහෙම බාපු ඒවායෙන් වැඩ ගන්න ඕනෑනේ. නමුත් අපට සිද්ධ වෙනවා, නැව් සමාගම්වලට කියන්න ඒ කොටසක් බාලා ඉතුරු නැව් ටික හරවාගෙන යන්න කියලා. ඒක හරියට පිටකොටුවේ bus stand එක වාගෙයි.

මම ඇමතිවරයා විධියට ආවාට පස්සේ, ජයබාහලුම් පර්යන්තයට අදාළව ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරලා

ඉතා ඉක්මනින් ජයබාහුලුම් පර්යන්තයේ පස්වැනි අදියරේ වැඩ අවසන් කරන්න පටන් ගත්තා. තව මාස හයකින් ඒ වැඩ අවසන් වෙනවා. ඒ වැඩ අවසන් වෙන කොට එතැනට ගැළපෙන දොඹකර තුන ජයබාහුලුම් පර්යන්තයට අරගෙන යනවා.

අවුරුදු පහක් නැඟෙනහිර පර්යන්තය අපට අහිමි කරලා තිබුණු එකෙන් අපට කොච්චර අවාසියක් වෙනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එදා ඇණවුම් කරපු දොඹකර ටික ගෙනැල්ලා ඒ පර්යන්තයේ කටයුතු ආරම්භ කළා නම්, අද එතැනින් ආදායම් ලබනවා. එහෙම වුණා නම් ඒ ජැටියේ මීටර් 1240 දක්වා වැඩ අවසන් වෙනවා; ඉතුරු දොඹකර ටිකත් ක්‍රියාත්මක වෙනවා. එහෙම නම් මේ වන විට නැඟෙනහිර පර්යන්තය අංග සම්පූර්ණ පර්යන්තයක්. අපට වාර්ෂිකව අනිවාර්යයෙන්ම ඩොලර් මිලියන 200ක, 250ක ආදායමක් ලබා ගන්න පුළුවන් පර්යන්තයක් අපට අහිමි කරපු උන්නැහේලා තමයි අද මේ සභාවේ ඉඳගෙන අපට වැදි බණ කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තත්ත්වය ඇති කරලා එතුමන්ලා අපට කියනවා, නැඟෙනහිර පර්යන්තය විකුණන්න ගියා කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ කථාව අහන්න විපක්ෂයේ කිසිම කෙනෙක් නැහැ නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
ඔව්, විපක්ෂයේ එක්කෙනෙක්වත් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා, "නවීන තාක්ෂණය තිබෙනවා. ගෙදර ඉඳගෙන බලාගෙන ඉන්නවා" කියලා. ගෙදර ඉඳන් මේවා බලනවාද, වෙන ඒවා බලනවාද දන්නේ නැහැ. මොනවා බලනවාද කියලා කවුද දන්නේ? අපට පෙනෙන්නේ නැහැනේ. එතුමා මේ සභාවේ හිටියා නම් අපට පේනවා එතුමා ඉන්නවා කියලා.

නැඟෙනහිර පර්යන්තය අපට අහිමි කිරීම නිසා ලොකු පාඩුවක් සිද්ධ වුණා. දැන් අහනවා, "මොකද කරන්නේ, නැඟෙනහිර පර්යන්තයට?" කියලා. අද මම ඒකට උත්තර දෙනවා. ඒ උත්තරය බොහොම වැදගත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නම, වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නම සහ අපේ රජයේ නම එළියට ගෙන යන උත්තරයක් අද මම දෙන්නේ. ඒ උත්තරය තමයි, 2021 මාර්තු මාසයේ ඉඳන් ආරම්භ කරලා තිබෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය.

අපි ඒ ක්‍රියාවලිය ආරම්භ කළ නිසා කොරෝනා වසංගතය අතරේත් අපේ රාජ්‍ය නිලධාරින් ඒ කටයුතු ඉදිරියට ගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. මේ වනවිට සිවිල් වැඩ පිළිවෙළට අවශ්‍ය මූලික අනුමැතිය ලබා ගැනීමේ කටයුතු අවසන් කරලායි තිබෙන්නේ. දොඹකර ගෙන ඒම පිළිබඳ ක්‍රියාවලියත් අවසන්. ඒකට අනුමැතිය ලබා ගන්න ලබන සඳුදා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂය භාර ඇමතිවරයා වශයෙන් මම වගකීමකින් කියනවා, ජනවාරි මාසය වනකොට නැඟෙනහිර පර්යන්තයේ වැඩ අවසන් කරලා අවුරුදු 2යි, මාස 6ක් යනකොට අංගසම්පූර්ණ නැඟෙනහිර පර්යන්තයක් මේ රටේ දරුවන් වෙනුවෙන් උරුම කරනවා කියලා. ඊට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සියලු වැඩකටයුතු අවසන්. එහි කිසිම අඩු පාඩුවක් නැහැ. පළමු අදියර යටතේ අප්‍රේල් මාසයේ 23වැනි දා වන විට දොඹකර 6ක් සවි කරන්න අපි බලාපොරොත්තු වනවා. දෙවන අදියර යටතේ 2023 ජූනි මාසය වන විට දොඹකර 20ක් සවි කරන්න බලාපොරොත්තු වනවා. තුන්වන අදියර යටතේ 2023 දෙසැම්බර් වන විට ග්‍රැන්ට් දොඹකර 9ක් සවි කරන්න බලාපොරොත්තු වනවා. 2024 ජූනි මාසය වන විට හතරවන සහ පස්වන අදියරත් නිම කරලා, 2024 දෙසැම්බර් මාසය වන විට ඒක අංගසම්පූර්ණ පර්යන්තයක් ලෙස ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය කියනවා, අපි නැඟෙනහිර පර්යන්තය විකුණන්න ගියා කියලා. අපි නැඟෙනහිර පර්යන්තය විකුණන්න ගියේ නැහැ. ඒ අයගේ ආණ්ඩුව කාලයේ ශ්‍රී ලංකාව, ජපානය සහ ඉන්දියාව එක්ක රාජ්‍ය තාන්ත්‍රික ගිවිසුම්වලට ගිහින් තිබෙනවා. ඒවායින් ලේසියෙන් බේරෙන්න බැහැ. ඒ විතරක් නොවෙයි. ඒවාට අනුව අපි ගිහිල්ලා ණයකුත් ගන්න ඕනෑ, ජපානයෙන්. ජපන් යෙන්වලින් ණය ගන්න ඕනෑ. ලලිත් ඇතුලත්මුදලි හිටපු ඇමතිතුමාගේ කාලයේ යන්ත්‍රෝපකරණවලට ගත්ත ණය තිබෙනවා. දැන් ඒ යන්ත්‍රෝපකරණ යකඩවලටත් විකුණලා ඉවරයි. ඒ ණය ගෙවා අවසන් වෙන්නේ, 2043දී. නමුත්, අපට පුළුවන්කම ලැබුණා එවැනි ණයවලට යන්නේ නැතුව අද මේ ආකාරයෙන් අපට අවශ්‍ය වැඩ පිළිවෙළ කරන්න.

බටහිර පර්යන්තයේ වැඩකටයුතු ගැන අපි අදානි සමාගමත් එක්ක සාකච්ඡා කර ගත්තා; ආදානි සමාගමත් එක්ක ගිවිසුමක් ඇති කරගත්තා. අදානි සමාගම ලබන අවුරුද්දේ ජනවාරි මාසය වනකොට බටහිර පර්යන්තයේ වැඩ ආරම්භ කරනවා. ඔවුන්ටත් අපි ඉලක්කයක් දීලා තිබෙනවා. ඒ ඉලක්කය අනුව ඒ පර්යන්තයේ වැඩ අවසන් වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් අපි සියලුදෙනාත් 2024 වනකොට නැඟෙනහිර පර්යන්තය සහ බටහිර පර්යන්තයේත් තව විශාල අලුත් පර්යන්ත දෙකකත් අයිතිකරුවන් බවට පත් වනවා.

දැන් විපක්ෂය කථා කරනවා විකුණපු විධිය ගැන. විකුණපු විධිය මම පැහැදිලිව පෙන්වන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙන්න මේ ලේඛනය මම **සභාගත*** කරනවා.

CICT එක කියන්නේ, චීන සමාගමක් විසින් ක්‍රියාත්මක කරන, අපි ඔවුන්ට භාර දීපු ව්‍යාපෘතියක්. ඔවුන් ඩොලර් මිලියන 500ක් වියදම් කරලා, පර්යන්තය හදලා, පාලනය කරලා අවුරුදු 35කට පස්සේ අපට අයිතිය දෙනවා. ඒ අයිතිය ලැබෙනකොට, ඒ වනතෙක් අපට මොකුත් නොලැබිලා නොවෙයි. අපට ඒ වනතෙක් ලැබෙන දේවල් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. CICT එකට අපි ලබා දෙනවා, හෙක්ටෙයාර 58.4ක්. ඒක තමයි ඒ ව්‍යාපෘතියේ වපසරිය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ඔක්කෝම කථා කළේ වරාය විකිණීමක් ගැන. හැබැයි, ඒ කාලයේ විකුණපු ඉඩම් ටික ගැන කථා වුණේ නැහැ. අද මම කියනවා ඒ ඉඩම් ටික ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ තිබෙන වරායට අයත් භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 1,188යි. ගණන් හදලා බලන්න, අධිවේගී මාර්ගය ගිහිල්ලා නවතින්නේ එතැන. ලෝකයේ ප්‍රබල වරායක් වටේ තිබෙන හෙක්ටෙයාර 1,188ක් එදා

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

විකුණනවා. 99 අවුරුදු බද්දකට දෙනවා. අපි අවුරුදු 35ට තමයි CICT එක දෙන්නේ.

හැබැයි, ඒක අපි හදපු එකක් නොවෙයි. අපි හදලා, මෙහෙයුම් කරන එකක් නොවෙයි. අපි දෙන්නේ මුහුද විතරයි. සම්පූර්ණයෙන්ම මුහුද. ඔවුන් ඩොලර් මිලියන 500ක් වියදම් කරනවා ඒක හදන්න. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර පැත්තේ අය එදා විකුණුවේ මොකක්ද? වික්කේ අපි හදපු වරාය. ඒක අවුරුදු 99කට බදු දුන්නේ. රනිල් වික්‍රමසිංහ හිටපු අගමැතිතුමා අද උදේ කිව්වේ මොකක්ද? නෑ, අවුරුදු හැත්තෑවටලු දුන්නේ. මට පෙනෙන විධියට එතුමාට තිබුණු කලබලේට අවුරුදු ගණනත් අමතක වෙලා! පුදුම කලබලයකින් එතුමා ඒක විකුණලා තිබෙන්නේ. විකුණනවා කියලා දැනගෙන, අවුරුදු ගණන දැනගෙන විකුණපිය කෝ! මගෙන් ඉල්ලුවා ඒ ගිවිසුම. මම ගෙනාවා ඒ ගිවිසුම. ඒකේ තිබෙනවා බොහොම පැහැදිලිව අවුරුදු 99කට විකුණාගෙන කෑවා කියලා. සාමාන්‍යයෙන් හොරෙකුගෙන් ඇහුවාම විකුණාගෙන කෑවාද කියලා, ඒකා කියනවා, "අනේ ඔව්, හොරකම් කරලා විකුණුවා." කියලා. දැන් මේ අය ඒකවත් දන්නේ නැහැ. දෙයියාමුදුරුවනේ! එහෙම පිරිසකටනේ අපි මේ රට අවුරුදු පහක් දීලා තිබුණේ.

ඊළඟට, වාර්ෂිකව ඉඩම්වලින් ලැබෙන බදු ප්‍රමාණය බැලුවොත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, CICT එකෙන් අපට රුපියල් මිලියන 1,488ක් ආවා. රුපියල් මිලියන 1,488ක් වාර්ෂිකව අපට CICT පර්යන්තයෙන් ලැබෙනවා. හම්බන්තොට වරායෙන් ලැබෙනවා, බිංදුවක්. මම දන්නේ ඒකට "බින්දුව" කියන්න විතරයි, මොකුත් නැති හින්දා. ඒකෙන් බින්දුවක් ලැබෙනවා. ඊළඟට, CICT එකෙන් වාර්ෂික රාජ්‍ය භාගය ලැබෙනවා, රුපියල් මිලියන 1,983ක්. හම්බන්තොට වරායෙන් හම්බ වෙනවා, අවුරුද්දටම රුපියල් මිලියන 18.5ක්. ඒ කියන්නේ රුපියල් ලක්ෂ 185ක්. හම්බන්තොට නායකයාත් මේ සභාවට එන වෙලාවේ මේ ගැන කියන්න ලැබීම හොඳයි. ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන හොඳට දන්නවා.

ඊළඟට, CICT එකෙන් වාර්ෂික ලාභාංශ රුපියල් මිලියන 1,374යි. හම්බන්තොට වරායෙන් බින්දුවයි. CICT පර්යන්තයෙන් දළ වශයෙන් අපි වාර්ෂිකව රුපියල් බිලියන පහක් ලබා ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හම්බන්තොට වරායෙන් මොනවාද අපට හම්බ වෙන්නේ? හම්බන්තොට වරායෙන් අපට හම්බ වෙලා තිබෙන්නේ මේ කාලයටම රුපියල් ලක්ෂ 185යි. ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමනි, අඩු ගණනේ ඒ හෙක්ටෙයාර 1,188ක භූමි ප්‍රමාණයේ තැඹිලි විකුණුවා නම්-

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වරාය අමාත්‍යතුමා වැදගත් කාරණයක් පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ හම්බන්තොට වරාය සම්බන්ධයෙන් වැඩිදෙනෙක් කථා නොකරන වැදගත් කාරණයක් මේ සභාවටත්, ගරු ඇමතිතුමාටත් මතක් කරලා දෙන්න මා කැමැතියි. හම්බන්තොට වරාය ඉදිකරපු සමාගම, අවුරුදු 35ක කාලයකට ඩොලර් මිලියන 780ක් ගෙවන්න ඒ වරාය ඉල්ලුවා. හැබැයි, එවකට පැවැති රජය අවුරුදු 35කට ඉල්ලන සමාගමට ලබා නොදී දැනට දීලා තිබෙන, අවුරුදු 99ක කාලයට ඉල්ලපු සමාගමට තමයි දුන්නේ. ඒ ගැන කැබිනට් මණ්ඩලයට මම කරුණු පෙන්නුවා. කැබිනට් ඇමති ධුරයෙන් මා නෙරපීමට පවා ඒක හේතු වුණා. ඒ ගැන මා සතුටු වෙනවා. මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අවුරුදු 35ක කාලයකට පමණක් ඒ වරාය බදු අරගෙන කටයුතු කරන්න වරාය ඉදිකළ සමාගමම ඉල්ලා තිබියදී, අවුරුදු 99කට ඉල්ලපු සමාගමට වරාය දුන්නේ ඇයි කියන කාරණය ගැන කරුණාකර ඔබතුමන්ලා කොමිෂන් සභාවක් හරි පත් කරලා පරීක්ෂණයක් කරන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු විජයදාස රාජපක්ෂ හිටපු අමාත්‍යතුමනි. එදා කැබිනට් මණ්ඩලයේ හිටපු කෙනෙකු හැටියට ඔබතුමා කියපු කාරණා සියයට සියයක් හරි. ඒ සියලු ගිවිසුම් ගැන, ඔබතුමා කියපු කාරණා හරි.

මම තව එක කාරණයක් මතක් කරනවා, ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමනි. ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලය තුළ, ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමාගේ කාලය තුළ වරායේ එක බිම් අඟලක් ශ්‍රී ලංකාවේ නීතියට අනුව තක්සේරුකරුගේ තක්සේරුවට පිටින් දීලා තිබෙනවා නම්, ඇමතිකම්වලින් ඉල්ලා අස්වෙන්න ලෑස්තියි කියන එක බොහොම වගකීමෙන් අපි කියනවා.

මා දැන් විපක්ෂයේ තොත්ත බබාලාගෙන් අහනවා, හම්බන්තොට වරායට ගත්ත තක්සේරුව කෝ කියලා. හම්බන්තොට වරායට ගත්ත තක්සේරුව කෝ? අද මේ සභාවේ කථා කරපු විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් රෙදි ඇඳගෙනද කථා කළේ? තක්සේරුවක් නැතිව අම්මාගේ තාත්තාගේ බූදලය වාගෙයි ඒක වික්කේ. අම්මාගේ තාත්තාගේ බූදලය විකුණන කොටත් තාත්තා ළඟට ගිහින් අඩු ගණනේ අහනවා, "තාත්තේ, මේක ඒ කාලයේ ගත්තේ කීයටද?" කියලා. තක්සේරුවක් නැතිව ගෙඩිය පිටින් ඒ වරාය දුන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම කරපු අය තමයි අද අපෙන් අහන්නේ, මේක මේ විධියට විකුණුවේ කොහොමද කියලා. එතුමන්ලා එහෙම අහනවා අපි අහගෙන සිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නවලට මේ අවස්ථාවේ පිළිතුරු දෙන්න ඕනෑ. එතුමා කිව්වා, අපේ කොළඹ වරායේ අක්කර 13ක ඉඩමක් චීනයට විකුණන්න යනවා කියලා. තව මන්ත්‍රීවරයෙක් කිව්වා, අපි මහර තිබෙන ඉඩමක් චීනුන්ට විකුණන්න යනවා කියලා. එතුමන්ලාට චීන මේනියාවක් තිබෙනවා. එතුමන්ලා රෑ දෙ ගොඩහරියේ නැඟිටලා "චැං - චූං" ගානවාද දන්නේ නැහැ. මොන මඟුලක් ද මා දන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැම වෙලාවේම චීනා. ලෝකයේ රටවල් එක්ක අපට ගනුදෙනු කරන්න බැරිද? ලෝකයේ අනෙකුත් රටවල් එක්ක වෙළෙඳ ගනුදෙනු කරන්න අපට බැරිද? මොකක්ද මේ වෛරය? දැන් අපි මොකක්ද මේ කරන්න යන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කියන අක්කර 13ත් අපට ලැබුණේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න. ඒ ගොඩ කිරීම කරපු කාලයේ විෂය භාර ඇමතිවරයා හැටියට හිටියේ චමල් රාජපක්ෂ මැතිතුමා. ගොඩ කරපු එකක්, ඒ ඉඩම. ඒ ඉඩම මොනවා සඳහා පාවිච්චි කරන්නද මා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියනවා, අපේ රට නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්න ඕනෑ; ලෝකයේ තිබෙන ප්‍රබල නැව් අපේ වරායට ගෙන්වාගන්න ඕනෑ; ප්‍රධාන නැව් ඒජන්තවරුන් එක්ක අපට ගනුදෙනු තිබෙන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වරාය ප්‍රබල වරායක්; අද ලෝකයේ 24වන ස්ථානයේ ඉන්නේ. 24වන ස්ථානයට ගියේ මා අර කියපු ඉතිහාසයත් එක්ක. අපි ක්‍රමක්‍රමයෙන් තව ඉදිරියට යන්න ඕනෑ. අපි ඉදිරියට යන්න නම්, අපේ වරායවල පර්යන්ත ප්‍රමාණය වැඩි වෙන්න ඕනෑ; අප සපයන සේවාව ගුණාත්මක වෙන්න ඕනෑ; අපේ සේවාව අන්තර්ජාලයත් එක්ක සම්බන්ධ වෙන්න ඕනෑ. අපි ලෝකයේ අනෙකුත් වරායවල් එක්ක සංසන්දනාත්මකව බලන්න ඕනෑ. අපට අවශ්‍යයි, සේවා සපයන මධ්‍යස්ථානයක්. මේ ඇත්ත තිත්තයි. අපේ භාණ්ඩාගාරයේවත්, එහෙම නැත්නම් අපේ වරායේවත් මහා ලොකු මුදලක් තිබෙනවාද? නැහැ, අපට එහෙම දෙයක් නැහැ. අපි තිබෙන මුදලින් තමයි, නැඟෙනහිර පර්යන්තයේ ජැටිය හදන්න මුදල් ටික මේ වන විට වෙන් කරගෙන තබාගෙන ඉන්නේ. අපි අනාගතය ගැන බලන්න ඕනෑ.

අපි දන්නවා, ලෝකයේ අනෙකුත් වරායවල් ගැන. මේ වන විට අපි MCC මෙහෙයුම කරන්නේ සියයට 3යි. අපි දන්නවා, කොරියාවේ බූසාන් වරාය ප්‍රතිඅපනයනයෙන් සියයට 20ක් කරනවා කියලා. ඉදිරි අනාගතයේ නැඟෙනහිර පර්යන්තය සහ බටහිර පර්යන්තය කියන පර්යන්ත දෙකම අපට උරුම වුණාම අපේ කන්ටේනර් මෙහෙයුම් ධාරිතාව වැඩි වෙනවා. අප දැනට කරන කන්ටේනර් මෙහෙයුම් ධාරිතාව මිලියන 7යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව අවුරුදු දෙකහමාරකින් තුනකින් එය කන්ටේනර් මිලියන 14 දක්වා ඉහළට යනවා. මිලියන 14ක කන්ටේනර් මෙහෙයුමක් කරන්න යන කොට logistics hub එකක අවශ්‍යතාව තිබෙනවා. ඒ සඳහා අපි ආයෝජකයකුට කථා කරලා තිබෙනවා. අපි ආයෝජකයන්ට එන්න කියලා කියනවා. ඔවුන් ඩොලර් මිලියන 200ක් විතර වියදම් කරනවා. ඔවුන් ඉදි කිරීම කරනවා; මෙහෙයුම කරනවා; අවසානයේ අපට ඒකේ අයිතිය භාර දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉඩම් දීපු එක ගැන විපක්ෂය කථා කළා. අපේ වරාය ඇතුළේ අපි බදු දීපු ඒවා ගොඩක් තිබෙනවා. අපි වරාය ඇතුළේ ඉඩම් සිමෙන්ති සමාගම්වලට බදු දීලා තිබෙනවා. මොකද, ඒක අපට කරන්න පුළුවන් ව්‍යාපාරයක් නොවෙයි. ඒක කළ යුතු වන්නේ පෞද්ගලික අංශය. ඒ නිසා ඒක එහෙම කරන්න වෙනවා. අපි ඒ අයගෙන් වාර්ෂිකව බදු මුදල් ගන්නවා.

ලෝකයේ වරායවල් ගැන ඔබතුමන්ලා සොයා බලන්න. මොකද, සමහරුන් හිතාගෙන ඉන්නේ, වරායක ජැටිය කියන්නේ මුළු වරායම කියලා. ඒක එහෙම නොවෙයි. ඒක එක්තරා කොටසක් විතරයි. ඔවුන්ට කරන්න තිබෙන්නේ, නැවෙන් එන බඩු ටික ගොඩ බෑම සහ නැවත පැටවීම. හැබැයි, ඒ කොටස මුළු වරායම කියලා පෙන්නුම් කරන්න යනවා.

වරාය ගැන කථා කරන එතුමන්ලාගේ ආණ්ඩුව එදා ත්‍රිකුණාමලය වරායේ ඉඩම් දීලා තිබෙනවා. UNP ආණ්ඩුව කාලයේ ත්‍රිකුණාමල වරායේ ඉඩම් ප්‍රීමා සමාගමට, ටෝකියෝ සමාගමට ලබා දීලා තිබෙනවා. අද වනතුරු රාජ්‍ය භාගය හැටියට එක රුපියලක්වත් ලැබිලා නැහැ. අපට නාවික මෙහෙයුමෙන් විතරයි ලැබෙන දෙයක් ලැබෙන්නේ. අඩු ගණනේ ඩොලර් භාගයක්වත් ප්‍රීමා සමාගමෙන් අපට ගෙවන්නේ නැහැ. අපට අධිකරණයටවත් යන්න බැරි විධියට තමයි ඒ ගිවිසුම් අත්සන් කරලා තිබෙන්නේ. ඒ අය අපට ගෙවන්නේ නැහැ. මේක තමයි ඇත්ත කථාව. මේ විධියට තමයි ඉතිහාසයේ කරලා තිබෙන්නේ. යම් ඉඩමක් සම්බන්ධව යම් පෞද්ගලික ආයෝජකයකු සමඟ ක්‍රියා කරනවා නම්, අපට වාසි සහගත ලෙස, ඒ ඉඩමේ අයිතිය අප ළඟ තියාගෙන ඒ මෙහෙයුම ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ රජයේ තක්සේරුකරුත් සම්බන්ධ කරගෙනයි අපි කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහර ඉඩම ගැනත් කියන්න ඕනෑ. දැන් මෙතැන කථා කරපු සමහර මන්ත්‍රීතුමන්ලා අඩු ගණනේ මහර ඉඩම දැකලාවත් නැහැ; කොළඹ වරායේ හතර මායිම් දන්නේත් නැහැ. එක් මන්ත්‍රීවරයෙක් කථා කරද්දී මහර ඉඩම ගැන කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ආසනයේ තිබෙන ඉඩමක්. ගම්පහ දිස්ත්‍රික්කයේ අපේ නායකතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. ඒක ඒ දවස්වල කොළඹ වරාය හදන කොට ගල් ගත්ත තැන. අක්කර 20යි ඒ ඉඩම. එතැන අක්කර පහක තනි ගල් වළක් තිබෙන්නේ. අපේ ගරු ඇමතිතුමාත් දන්නවා, අපි ඒ ඉඩම බොහොම අමාරුවෙන් තමයි බේරාගෙන ඉන්නේ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

අපි බොහොම අමාරුවෙන් බේරාගෙන ඉන්නේ, ඒ ඉඩම. අපි දන්නවා, හුඟක් වෙලාවට මිනිස්සු ඇවිත් එහි පර්චස් 5, 10 අල්ලා ගන්න හදන බව. එවැනි නොයෙකුත් ප්‍රශ්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වරාය සේවකයන්ගේ නිල නිවාස දැන් අවුරුදු 100කට වඩා පරණයි. බ්ලූමැන්ඩල්, මට්ටක්කුලිය නිල නිවාස සංකීර්ණ වරාය ආශ්‍රිතව තිබෙන්නේ. ඒවා, විශාල වෙළෙඳ වටිනාකමක් තිබෙන ඉඩම්. ඒවායේ පර්චස් එකක් ලක්ෂ ගණනක් වෙනවා. හැබැයි ඒ නිවාස දැන් කඩාගෙන වැටෙමින් තිබෙනවා. ඒවායේ වහල දිරලා, උළු කැට කැඩිලා, උළුවහු ගැලවිලා; මිනිසුන්ට ඉන්න බැහැ. ඒ නිසා මම ඇමතිවරයා හැටියට තීන්දුවක් ගත්තා. මොකක්ද තීන්දුව? මම කල්පනා කරලා කැබිනට් මණ්ඩලයට යෝජනාක් ඉදිරිපත් කළා, ඒ මහර ඉඩමේ අපේ නිලධාරීන්ට නිවාස 500ක් හදන්න. හැබැයි, අපි ළඟ ඒකට වියදම් කරන්න මුදල් නැහැ. අපි පෞද්ගලික ආයෝජකයෙකුට කථා කරලා කිව්වා, අපට ගෙවල් 500ක් හදලා දෙන්න, ඉතිරි ගෙවල් ටික ඔබතුමා ගන්න කියලා. වැරැද්ද මේක? දැන් ඒවායේ තෙමි තෙමී ඉන්න අපේ සේවකයාට හොඳ ස්ථානයක ගෙයක් ලැබෙනවා; අංග සම්පූර්ණ, නව අංගෝපාංග සහිත, නවීන පන්නයේ ගෙයක් ලැබෙනවා. අනෙක් පැත්තෙන්, වෙළෙඳ වටිනාකමක් තිබෙන කොළඹ ඉඩම අරගෙන වරාය ක්ෂේත්‍රයේ ඉදිරි අනාගතය වෙනුවෙන් පාවිච්චි කරන්න පුළුවන් වෙනවා. අර සියයට 3 කට්ටිය ඉන්නවා නේ. හැමදාම කරන්නේ වෛර කරන එකම නේ. මොකක් හෝ කරනවා මේ වාගේ වැඩවලට. අනේ මම දන්නේ නැහැ අපි නම් කල්පනා කරන්නේ මේවා වැඩි දියුණු කරගෙන ඉදිරියට යන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වරායේ නිලධාරීන් මෙතැන ඉන්න වෙලාවේ අපේ තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා කිව්වා, මුඛ ආවරණ -face masks- මිල දී ගැනීමක් සම්බන්ධව. එකක් රුපියල් 40 ගණනේ අරගෙන තිබෙනවා කිව්වා. මන්ත්‍රීවරු දෙදෙනෙක් ඒ ගැන චෝදනා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිව කියන්න ඕනෑ, ඒක කරලා තිබෙන්නේ තාක්ෂණික කමිටුවක් මඟින් ලබා ගත් ටෙන්ඩරයකින් බව. සංචාරක විෂය භාර ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා සංචාරක ඇමතිවරයා. මම වරාය ඇමතිවරයා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා මුඛ ආවරණවල ප්‍රමිතියක් තිබෙන බව. අපි දන්නවා කඩේට ගියාම මුඛ ආවරණ රුපියල් 10ටත්, රුපියල් 15ටත් ගන්න තිබෙන බව. හැබැයි, වරායකට, ගුවන් තොටුපළකට මුහුණු ආවරණ ගන්න කොට එහෙම ඒවා ගන්න

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

බැහැ. අපි මේ රෝගයෙන් දෙපැත්තකින් බේරෙන්න ඕනෑ. එක පැත්තකින්, නැවේ එන විදේශිකයාත් එක්ක යම් විධියකින් සම්බන්ධ වෙනවා නම්, අපි ඒ පැත්තෙන් රෝගයෙන් බේරෙන්න ඕනෑ; රට ඇතුළේ අයගෙන් බේරෙන්නත් ඕනෑ. එතකොට ප්‍රමිතියෙන් යුතු දේවල් තමයි අරගෙන දෙන්න ඕනෑ. ඒ නිසා මේ තාක්ෂණික කමිටුව අනිවාර්යයෙන්ම අවශ්‍ය පරිදි ක්‍රියා කරලා තිබෙනවා. මම මේ ගරු මන්ත්‍රීවරුන්ටත් කියනවා, යම් හෝ වැරැද්දක් වෙලා තිබෙනවා නම් කරුණාකර ඒවාට අදාළ ලිපිගොනුත් එක්ක විස්තර මට ලබා දෙන්න කියලා. වැරැද්දක් වෙලා තිබෙනවා නම්, වැරැද්ද කරපු කෙනා කවුරු වුණත් මට අදාළ නැහැ, ඔහුට අවශ්‍ය දඬුවම් ලබා දෙන්න මම ලෑස්තියි. හැබැයි, නිකරුණේ අවලාද කරන්න එපා කියන එක පැහැදිලිව මතක් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කොළඹ වරාය විතරක් නොවෙයි, අපි බලාපොරොත්තු වෙනවා ගාලු වරායත් සංවර්ධනය කරන්න. ගාල්ල වරාය සංවර්ධනය කිරීම කියන හීනය එදා ගරු රිචර්ඩ් පතිරණ ඇමතිතුමා දැක්කා. එතුමා ඒකට යම් උත්සාහයකුත් කළා.

ඒ.එච්.එම්. අෂ්රොෆ් ඇමතිතුමා හිටපු කාලයේ එතුමා ගනුදෙනුවකුත් ඇති කරගෙන තිබුණා, නැඟෙනහිරට අග්නිදිග විශ්වවිද්‍යාලය දීලා, දකුණට ගාල්ල වරාය දෙන්න. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. රිචර්ඩ් පතිරණ ඇමතිතුමා නැඟෙනහිරට විශ්වවිද්‍යාලය දුන්නා. නමුත් අනෙක් පැත්තෙන් සිදුවිය යුතු කාරණය ඉෂ්ට වුණේ නැහැ. එම නිසා අපි තීන්දුවක් ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රුමස්සල කන්දත් එක්ක, අද සංචාරක පුරවරයේ ඉතාම වැදගත් ස්ථානයක් බවට ගාල්ල පත්වෙලා තිබෙනවා. අපි මේ වන විට අවශ්‍ය කටයුතු කරලා කැබිනට් පත්‍රිකාවක් දාලා තිබෙනවා, ගාල්ල වරාය අංග සම්පූර්ණ සංචාරක වරායක් බවට පරිවර්තනය කරන්න. මේ වෙනකොට අපි පෞද්ගලික අංශයේ ආයෝජකයන් 8 දෙනෙකු සමඟ ඒ සඳහා සාකච්ඡා කරනවා. අදත් අපි කොරියන් සමාගමක් සමඟ සාකච්ඡා කරනවා. අපේ කාලය තුළ ගාල්ල වරායත් ශක්තිමත් වරායක් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ත්‍රිකුණාමලය වරායේත් ආධිපත්‍යයක් තිබුණා. මම ඒ නම කියලාම කරුණු කියන්නම්. මම භය නැහැ නම කියන්න. ඒ තමයි ටෝකියෝ සිමෙන්ති සමාගම. එදා ටෝකියෝ සිමෙන්ති සමාගම ත්‍රිකුණාමලය වරායේ "එක වරායක් - එක ආයතනයක්", "one port, one plant " කියන ආධිපත්‍යය තිබුණා. වෙන කාටවත් ඒකට එන්න බැහැ. පසුගිය රජය ඒ සම්බන්ධයෙන් යම් විධියක උත්සාහයක් ගත්තාම, ඔවුන් අධිකරණයට ගිහිල්ලා නියෝගයක් ගත්තා, වෙන කිසි කෙනෙකුට එන්න බැහැ කියලා. අපි මේ ගැන තීන්දුවක් ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකක්ද ඒ තීන්දුව? ඒ ක්‍රමය දැන් කරන්න බැහැ. අපට අවශ්‍යයි මේක කර්මාන්ත වරායක් බවට පත් කරන්නට. අපි ඒකට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත්තා. මේ වෙනකොට සිමෙන්ති කර්මාන්තකරුවෝ, යකඩ කර්මාන්තකරුවෝ වාගේ නොයෙකුත් කර්මාන්තකරුවෝ අපි ළඟට ඇවිල්ලා තිබෙනවා. මේ වාගේ ආධිපත්‍ය නවත්වන්න ඕනෑ, අපි මේ වරාය දියුණු කරන්න ඕනෑ. අපි ත්‍රිකුණාමලය වරායත් අංග සම්පූර්ණ වරායක් බවට පරිවර්තනය කරන්නට ඕනෑ. ඒ වගකීමත් අපි ඉටු කරනවා.

මා අවසාන වශයෙන් ඔබතුමන්ලාට කියන්න ඕනෑ, මේ වගකීම් ටික ඉටු කරද්දී එන ඕනෑම චෝදනාවකට මුහුණ දෙන්න රජයක් හැටියට අපි ලෑස්තියි කියන එක. මේ කටයුතු සඳහා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙනුත්, ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගෙනුත් ලැබෙන සහයෝගය අගය කරන්නට ඕනෑ. ඒ වාගේම මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගෙන් ලැබෙන සහයෝගයත් අගය කරනවා. මොන විධියේ චෝදනා ආවත් රට වෙනුවෙන් තීන්දු ගන්න අපි භය වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රට වෙනුවෙන් තීන්දු ගන්න අපි භය වෙන්නේ නැහැ. හොරට විකුණාගෙන, හොර වැඩ කරන්නේ නැතිව, රට වෙනුවෙන් අපි තීන්දු ගන්නවා. ඒ තීන්දු ගන්නේ රට වෙනුවෙන්; රටේ අනාගතය වෙනුවෙන්. අපි දන්නවා සිංගප්පූරුව දියුණු වුණේ වරාය නිසා බව. විෂය භාර අමාත්‍යවරයා හැටියට අනිවාර්යයෙන්ම මේ රටේ ආර්ථිකයට ප්‍රබල ලෙස දායක වන්න, මේ රටේ වරාය ඉහළටම ගෙන යන්න ලැහැස්තියි කියන පණිවුඩය ලබා දෙමින්, මා නිහඬ වෙනවා. මට කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.32]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of Water Supply)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මගේ සහෝදර ගරු රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමාත්, මමත්, අපේ රාජ්‍ය අමාත්‍යවරු දෙපොළ වන ගරු ජයන්ත සමරවීර මැතිතුමාත්, ගරු සනත් නිශාන්ත මැතිතුමාත් මැදිහත් වෙමින් මේ විවාදය ඉදිරියට ගෙන ගියා.

මගේ විෂය අනුව සාර්ථක, අසාර්ථකභාවය මනින්නේ මොකකින්ද? ඒකට කෝඩු කිහිපයක් තිබෙන්නට පුළුවන්. ඒ එක ප්‍රධාන කෝඩුවක් තමයි වර්ෂයක් ඇතුළත කොපමණ ජල සම්බන්ධතා ලබා දුන්නාද කියන එක. ඒකට උත්තරයක් දෙනකොට, වරදක් නොවන්නට මම ලියා ගත්ත ඉලක්කම් කියවන්නට මම කැමැතියි. 2020දී අපි නව ජල සම්බන්ධතා 116,908ක් ලබා දීලා තිබෙනවා. ඊළඟට, 202 දී ජල සම්බන්ධතා 201,854ක් ලබා දීලා තිබෙනවා . ඊළඟට එන්නේ 2022. එම වර්ෂයේ ජල සම්බන්ධතා 436,000ක් ලබා දීමටයි අපේ සූදානම. ඔන්න මගේ record එක.

ඊළඟට, මම අපේ හිතවත් ගරු මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට, විපක්ෂයට, ඔබ හැමදෙනාටම කියන්න කැමැතියි, අපේ අමාත්‍යාංශයේ සංයුක්ත සැලැස්ම - Corporate Plan - එවලා තිබෙනවා කියලා. ඔබතුමන්ලා හැමදෙනාම ඒකේ තමන්ගේ දිස්ත්‍රික්කය තිබෙන පිටුව හරවා ගෙන බලන්න. එවිට ඔබතුමන්ලාට පෙනී යනවා නම් යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් මඟ හැරිලා, එහෙම නැත්නම් යම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් මඟ හැරිලා, යම් උස් බිමක තිබෙන ගමක් මඟ හැරිලා කියලා, කරුණාකර ඒක අපට කියන්න.

හැබැයි, මතක තියා ගන්න. මේ සැලැස්ම තමයි අපේ ජල සම්පාදන මණ්ඩලයේ සැලැස්ම. ඊට අමතරව අපේ රාජ්‍ය ඇමතිතුමාගේ නායකත්වයෙන් අපි ප්‍රජා ජල සම්පාදන අංශයකුත්

පවත්වා ගෙන යනවා. ඒ ග්‍රාමීය ජල සම්පාදන ක්‍රමය යටතේ අපි ලබා දෙන ජලයත් සමස්ත ජල සම්බන්ධතා එකතුවට අයිති වෙනවා. අපගේ සංයුක්ත සැලැස්මේ ඔබගේ දිස්ත්‍රික්කයට අදාළව අඩු පාඩු තිබෙනවා නම්, සොයා බලා අපට දන්වා එවන්නය කියලා අපි කලිනුත් කියා තිබෙනවා. සමහර අය ඒ සම්බන්ධව අපට කියලා එව්වා; සමහර අය එව්වේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා මේ සභාවේදී කියන ඒවා අපි පුළුවන් හැම වේලාවකම සටහන් හැටියට ලියා ගෙන ගිහිල්ලා සැලැස්ම අනුව බලලා, අඩුපාඩුවක් තිබෙනවා නම් අපේ සැලැස්ම නැවත revise කරනවා.

අපි ජලයට කියන තවත් නම් තිබෙනවා. අපි නම් හඳාගත්තා. ඒ එකක් තමයි, "ජන ජීවිතයේ ධවල රුධිරය" කියන නාමය. ඒ වාගේම අපි වාරි ජලය "ගොවි ජනතාවගේ ජීවන හුස්ම" යනුවෙන් හඳුන්වනවා. ඊළඟට, පොදුවේ ආර්ථික සංවර්ධනයේදී "ආර්ථිකයේ ගාමක බලවේගය" කියලා කියනවා. විවිධ ස්වරූපයෙන් විවිධ ප්‍රයෝජන ජලයෙන් ලැබෙනවා. මම හිතන විධියට අපට මෙහි විශාලම වගකීම තිබෙන්නේ සමාජය හා ජන ජීවිතය පැත්තෙන්.

ඊළඟට, අපේ අමාත්‍යාංශයට තවත් රක්ෂාවක් ලබා දීලා තිබෙනවා. ඒ තමයි මලාපවහන කටයුතු. මම ආඩම්බරයෙන් කියනවා. ජලය සැපයීම වාගේම අනෙක් පැත්තෙන් මල ද්‍රව්‍ය- අපද්‍රව්‍ය- බැහැර කිරීමේ විෂයයත් අපට භාර දීලා තිබෙන බව. ඒ තුළින් මෑතකදී අප ඉටු කළ විශාලම මෙහෙවර තමයි නගරයේ පරිධියත් ඇතුළත් වන ආකාරයට මහනුවර අපද්‍රව්‍ය බැහැර කිරීමේ විශාල ව්‍යාපෘතිය. මොකක්ද ඒකේ ප්‍රතිඵලය? අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, "නුවර වැවට තවදුරටත් මල ද්‍රව්‍ය යන්නේ නැහැ. නුවර වැවේ සිට යන මහ ඇළට යන්නේත් නැහැ. තවදුරටත් මහවැලියට මල ද්‍රව්‍ය යන්නේත් නැහැ" කියලා. මේ තමයි මල ද්‍රව්‍ය බැහැර කිරීමේ අපේ වගකීම.

ඊළඟට, අපි ලාභ අලාභත් ටිකක් බලන්න ඕනෑ. නමුත් අපි දන්නවා, මේක ලාභ ලබන ව්‍යාපාරයක් නොවෙයි කියලා. ජලය සැපයීම, මලාපවහනය කියන්නේ ලාභ ලබන ව්‍යාපාර නොවෙයි. මේවා ජනතා සත්කාර. නමුත් මේවාට වියදමක් යනවා. ඒ වියදම අපි සොයා ගන්නට ඕනෑ. ඒ වියදම සොයා ගැනීමේදී අපි ඒ සේවය සැපයීමට යන වියදම පමණයි එකතු කරගන්නේ. සමහර විට යන වියදමටත් වඩා අඩුවෙන් එකතු කරගන්නේ. ඒ ඇයි? දුප්පත් මිනිසුන්ට බැහැ, ඒ මුදල දෙන්න. ජල ඒකකයක් ලබා දෙන්න අපේ ජල සම්පාදන මණ්ඩලයට රුපියල් 50ක් විතර වැය වෙනවා. නමුත් අපි රුපියල් 500කට, ඒකක 01 සිට ඒකක 15 දක්වා හැම මාසයකම ජල සැපයුම දෙනවා. එතකොට මාසයකට රුපියල් 500යි වැය වෙන්නේ. සාමාන්‍යයෙන් ගෙදරක ප්‍රයෝජනයට අවශ්‍ය ජල ප්‍රමාණය ඒකක 15කින් පිරිමහ ගන්න පුළුවන්. දැන් අපි කොහොමද මේ ආදායම් එකතු කර ගන්නේ? මේක ඉතා වැදගත් ප්‍රශ්නයක්. අපට ආදායමක් එකතු කර ගන්න අවශ්‍යයි. ඒ සඳහා අපි එක පැත්තකින් ප්‍රජාව දායක කර ගන්නවා. අපේ ඉන්නවා, මාධ්‍ය ලේකම්වරයෙක්. එතුමා මේ ගැන බොහොම උනන්දුයි. ඒ තමයි සංජීව. අපි එක පැත්තකින් ප්‍රජාව එකතු කරගන්නවා, තවත් පැත්තකින් අපි සේවක බල ඇණිය එකතු කර ගන්නවා. ඒ අය ස්වේච්ඡාවෙන් තමන්ගේ සේවය ලබා දෙනවා. ප්‍රජාව ඇවිල්ලා ස්වේච්ඡාවෙන් ඔවුන්ගේ ශ්‍රමය ලබා දෙනවා. මේ දෙක එකතු කළාම අපට ලොකු ගණනක් ඉතුරු කරගන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ කටයුත්ත අපි භාර දෙන්න ඕනෑ, කොන්ත්‍රාත්කරුවෙකුට. එසේ භාර දුන්නා නම්, ඔහුගේ ලාභයත් එක්ක බැලුවාම, අපට යන වියදම වාගේ හෝ අපි බේරන වියදම වාගේ කිහිප ගුණයකින් වියදම වැඩි වෙනවා.

මේ අනුව, අපි ගිණුම පෙන්වන්න ඕනෑ. මේක අපි අය වැයේදී කරන්න ඕනෑ දෙයක්. 2009දී බදු ගෙවීමට පස්සේ අපට අලාභයක් තිබුණා, රුපියල් මිලියන 1,126ක. 2020දී අපි බදු ගෙව්වාට පස්සේ අපේ ලාභය රුපියල් මිලියන 529ක් වුණා. මම හිතන්නේ මේක තමයි අපේ සේවක බල ඇණියේ කැපවීම; අපේ ඉංජිනේරු බලකායේ දක්ෂතාව. වෙන දා සැලසුම් හදන්න විදේශීය සමාගම් ඔවුන් දෙන අරමුදල්වලට පිරිමැහෙන්න දීර්ඝ කාලයක් ගන්නවා. අද විශාල ව්‍යාපෘති ගණනාවක සැලසුම්කරණයට අපි අරගෙන තිබෙන්නේ අවුරුද්දයි. අපේ සියලු සැලසුම්කරණ දැන් සූදානම්. අපට දැන් තිබෙන්නේ ඒවා ක්‍රියාවට නංවන්න පමණයි. අපේ ඉංජිනේරු අංශයේත්, කාර්මික අංශයේත්, පුහුණු-නුපුහුණු සේවක බල ඇණියේත් දායකත්වය හා කැපවීම මත තමයි අපට මේ වාගේ ඉදිරි පිම්මකට යන්න පුළුවන් වුණේ.

ඊළඟට, පිරිසිදු ජලයේ අනුපාතයට සෞඛ්‍ය වියදම් අඩු වන හැටි පෙන්වන්න මම කැමැතියි. පිරිසිදු පානීය ජලය තිබෙන තරමට ජලයෙන් හට ගන්නා වූ රෝග සම්බන්ධයෙන් ජනතාවට වැය වන වියදම අපි බේරනවා. නමුත් මේවා පේන්නේ නැහැ. ජලය නිසා හට ගන්නා රෝග ගණනාවක් තිබෙනවා. ඒ රෝග මේ රටේ ජනතාවට වැළඳීම අපි පිරිසිදු පානීය ජලය ලබා දීමෙන් වළක්වනවා. සෞඛ්‍ය සඳහා වැය වන වියදමේ ගණන තවම අපි හදලා නැහැ. හැබැයි, එක ගණනක් ලෝක බැංකුව හදලා තිබෙනවා. ඒ තමයි, ගෘහස්ථයකට අපි ජල සම්බන්ධතාව දෙන්න අපේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.3ක් වියදම් කරනකොට දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1ක් එකතු වීම. මම ඒ කාරණය ආපසු කියනවා. අපි ගෘහස්ථයකට ජල සම්බන්ධතාවක් දෙන්න සියයට 0.3ක් වියදම් කරනකොට, සියයට 1ක් දළ දේශීය නිෂ්පාදිතයට එකතු වනවා. මේක තමයි අපේ ක්‍රියාදාමයේ ස්වභාවය. මේ පැත්තෙන් වියදම් කරනවා; අනික් පැත්තෙන් සෞඛ්‍ය වියදම් අඩු වනවා; තවත් පැත්තකින් දළ දේශීය නිෂ්පාදිතයට වටිනාකමක් එකතු වනවා. හැම වියදමකටම වටිනාකමක් එකතු වනවා. මම මේ පෙන්නුවේ අපි වියදම් කරනකොට අපේ දළ දේශීය නිෂ්පාදිතයට එකතු වන වටිනාකම පිළිබඳවයි. ඒක ලෝක බැංකුවේ අධ්‍යයනයක්.

ඊළඟට, ඔබතුමන්ලා කවුරුත් වැඩියෙන් නොදන්නා "ආදායමක් නොලැබෙන ජල සැපයුම" කියලා එකක් තිබෙනවා. ඒ, මොකක්ද? පරණ පයිප්පවලින් දිගටම ජලය කාන්දු වනවා. සමහර ගෙවල්වල නිකම් පයිප්ප ඇර දමා තිබෙනවා. ඒවා නම් ආපහු මීටර ගාස්තුවෙන් ලැබෙනවා. මීටරයට යන්න ඉස්සෙල්ලා, අතරමැදදී කාන්දුවන ජලය ඔක්කොම අපට ආදායම් නොලැබෙන ජලය. දැන් එහෙනම් අපි කරන්න ඕනෑ මොකක්ද? වහාම මේ කාන්දු වන පයිප්ප ටික ඉවත් කරලා, අලුත් පයිප්ප දමන්න ඕනෑ. ඒ කටයුත්ත දැන් කරගෙන යනවා. ඒක අපේ සැලැස්මේ කොටසක්. එහි ප්‍රතිඵලයක් හැටියට මොකක්ද වෙන්නේ? කොළඹ නගරයේ ආදායම් නැති ජලය සියයට 45ක් තිබුණා. අද ඒක සියයට 18කට අඩු වෙලා, හිතන්න, කොච්චර ආදායමක් ඒ නිසා අපට ලැබෙනවාද කියලා? අපතේ යන ජලය අපි බේරා ගන්න තරමට අපේ ආදායම වැඩි වනවා.

අයථා ලෙස ගන්නා ජලය පිළිබඳවත් මම කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි වැටලීම් දිගටම කරනවා. අපේ වැටලීම් අංශය ශක්තිමත් මදි. හැම තැනම වැටලීම් අංශ දමන්න ඕනෑ. සමහර රාජ්‍ය ආයතන අපට බිල් ගෙවන්නේ නැතිව ජලය අරගෙන තිබෙනවා කිව්වොත් ඔබතුමන්ලා පුදුම වේවි. මේවා ඔක්කොම වැටලීම්වලට යටත්. මේ කාන්දුවන ජලයත් බේරාගෙන, අයථා ලෙස ජලය ගැනීමත් නවතා ගත්තොත්, සියයට 40ක ඉඳලා සියයට 15ක වර්ධනයකට අපට එන්න පුළුවන්.

ජල ගාස්තුව වැඩි නොකර කොහොමද මේ ආයතනය කරගෙන යන්නේ කියලා ඔබතුමන්ලා පුදුම වෙයි. අපි 2022දීත්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

ජල ගාස්තුව වැඩි කරන්නේ නැහැ. එතකොට හැමෝම අහනවා, "හැම දෙයක්ම ගණන් යනවා, කොහොමද ජලය විතරක් ගණන් නොගිහින් තිබෙන්නේ" කියලා. Infilling කියලා එකක් තිබෙනවා. අපි නිකම් ගණන් බැලුවා, දැනට අපි එළා තිබෙන නළ දිගේ තවත් ජල සම්බන්ධතා කොපමණ දෙන්න පුළුවන්ද කියලා. එහෙම බැලුවාම අපට ගණනක් එනවා. හරියට සංවිධානය කර ගත්තොත් මේ එළා තිබෙන නළවලින්ම 500,000කට පමණ අලුත් ජල සම්බන්ධතා දෙන්න පුළුවන්. මෙන්න මේ විධියට තමයි අපි ආදායම් සොයා ගන්නේ. හැම ජල සම්බන්ධතාවක්ම ආදායමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පිරිපහදු යන්ත්‍ර තිබෙනවා. මේ පිරිපහදු යන්ත්‍රවල ධාරිතාව වැඩි කරන්න පුළුවන්, ඉංජිනේරු උපක්‍රමවලින්. අපි ගාල්ල ප්‍රදේශයේ ඒ විධියට වැඩි කළා. ඒ විධියට වැඩි කිරීම තුළින් ගාල්ල ප්‍රදේශයේ තිබුණු අමාරුම තත්ත්වය අපි ලිහිල් කරගෙන තිබෙනවා. ඒ වාගේම තිබෙන පිරිපහදු යන්ත්‍ර ගණනාවක ධාරිතාව අපි වැඩි කරනවා. අලුත් යන්ත්‍ර අපි සවි කරනවා. ප්‍රජා ජල අංශයෙන් එදා දුන්නේ ජලය. එදා මිනිස්සු ඉල්ලුවේත් ජලය. කවුරුවත් ඉල්ලුවේ නැහැ, පානීය ජලය, පිරිසිදු ජලය. නමුත්, අද හැමෝම පානීය ජලය ඉල්ලනවා. එම නිසා අද හැම ප්‍රජා ජල ව්‍යාපෘතියකම අපි කුඩා පිරිපහදු යන්ත්‍රයක් සවි කරනවා. ඒ නිසා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙනුත්, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙනුත් ලබා දෙන ජලය පිරිසිදු ජලය හැටියට දෙන්න පුළුවන් වෙන බව අපි විශ්වාස කරනවා. එක පැත්තකින් නව යෝජනා ක්‍රමවලින් ජලය ලබා දෙන අතර, තිබෙන ඒවායේ ධාරිතාව වැඩි කිරීමෙනුත්, තිබෙන නළවලින් නව සම්බන්ධතා දීමෙනුත්, අපතේ යන ජලය හා අයථා ක්‍රමයට ලබා ගන්නා ජලය බේරා ගැනීමෙනුත් මේ ජල ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්. ඒ නිසා ජල බිල්පත වැඩි වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැලණි ගඟ දකුණු ඉවුර, දැදුරු ඔය, කටාන, මැදිරිගිරිය, විසල් මාතලේ, නාගදීපය, මහනුවර වැනි මලඅපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘති ආදී මේ ඔක්කෝම 2021දී අපි කරපු විශාල යෝජනා ක්‍රම. මේ වාගේම 2022දීත් මෙන්න මේ ව්‍යාපෘති අපි කරලා අවසන් කරනවා. ඒවා තමයි, ආනමඩුව පොල්ගහවෙල, අලව්ව, තඹුත්තේගම, මහ කොළඹ ජල සහ අපජල II සහ III අදියර, අත්තනගල්ල, අගලවත්ත, මතුගම, කඩුවෙල, ඔරුගොඩවත්ත, මාතර IV, රුවන්වැල්ල, හෙම්මාතගම, මාවනැල්ල. මේ ටික අවසන් වෙනකොට මම ඉස්සෙල්ලා කිව්ව ගණනට එන්න පුළුවන්. මම කිව්ව ගණන කීයද? අලුත් ජල සම්බන්ධතා 436,000ක් අපට දෙන්න පුළුවන්.

ඊළඟට, ජලයේ පිරිසිදු බව සලකා බලමු. මගේ ළඟ වාඩිවෙලා ඉන්නේ අපේ පරිසර අමාත්‍යතුමා. එතුමායි, මමයි කථා කරමින් හිටියේ මේ ගැන. එතුමාගේ "සුරකිමු ගංගා" වැඩසටහන මට ඉතාම අදාළයි. මගේ වුවමනාව එතුමාගේ සුරැකීමට ඉතාම අදාළයි. මේ ගංගාවල ඉවුරු දෙපැත්තේ තිබෙනවා, නගර හා කුඩා නගර. මේ හැම නගරයකින්ම මලද්‍රව්‍ය, අපද්‍රව්‍ය බැහැර කරන්නේ ජලයට, මේ ගංගා ජලයට.

මේ ගංගා පහළට ගලන්නේ විශාල කුණු කන්දරාවක්, මළ කන්දරාවක්, අපජල කන්දරාවක් එකතු කරගෙන. මෙන්න මේවා වළක්වන්නේ කොහොමද? අපට ඉදිරි කාලයේ තිබෙන ලොකුම අභියෝගය මේකයි. ඒ සඳහා පරිසර අමාත්‍යාංශයත්, ජලසම්පාදන අමාත්‍යාංශයත් එකතු වෙලා නගරයෙන් නගරය පරීක්ෂා කරමින් මේවා හඳුනා ගන්න වැඩ පිළිවෙළක් දියත් කරනවා. මෑත කාලයේ කාර්මික වැඩ පොළ 1,700ක අප ද්‍රව්‍ය බැහැර කරලා යවන්නේ කැලණි ගඟට. මේවා ලොකු වැඩ පොළවල්. ඒ වැඩ පොළවල අපද්‍රව්‍ය ඉවත් කරන මැෂින් තිබෙනවා. නමුත් ඒවා නිහඬ කරලා. ඇයි ඒ? විදුලිය යන නිසා. ලාභයම පමණක් මුල් කර ගත්තාම වෙන නස්පැත්තියක් තමයි ඒක. ඔබතුමාගේ ගවේෂණය අනුව උස් ස්ථාන 1,700කින් අපද්‍රව්‍ය ඔක්කොම යන්නේ කැලණි ගඟට. ඒ නිසා මේ ජලය පිරිපහදු කිරීම බොහොම අමාරු කාර්යයක්. ගඟට ඔක්කොම අපද්‍රව්‍ය, මළ ද්‍රව්‍ය එවන අය හිතනවා, "ආ ඒවා ඉතින් ගඟ දිගේ යනවා නේ. ගඟ දිගේ ගිහිල්ලා මුහුදට යනවා. ඉතින් මොකක්ද? ඒක ගඟට බරක් යැ. නැහැ. එහෙනම්, උඹට ඇති අමාරුව මොකක්ද" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මළ අපද්‍රව්‍ය වැඩි වෙන තරමට ජලය පිරිපහදු කිරීමේ වියදම වැඩි වෙනවා. මේක කවුද දන්නේ? පිරිපහදු කිරීමේ වියදම එන්න එන්නම වැඩි වෙනවා. පිරිපහදු කිරීමේ වියදම වැඩි වෙනකොට ඔබේ ජල බිල්පත වැඩි නොවී තිබෙන්නේ නැහැ. ඇයි ඒ? අපි ජලය සැපයීමෙන් ලාභයක් ගන්නේ නැහැ. අපි ඒක කරන්නේ සත්කාරයක් හැටියට. නමුත්, ජල පිරිපහදුව සඳහා යන වියදම අපි හොයා ගන්න ඕනෑ. මතක තියා ගන්න. කවුරු හෝ වේවා, කොතැනක හෝ වේවා ගඟකට අපද්‍රව්‍ය මුදා හරිනකොට ඒ අය දැනගත යුතුයි ඒ අයගේ ජල බිල්පත වැඩි විය හැකි බව. මෙන්න මෙවැනි පණිවුඩයක් අපි මේ ගංගා අසල ජීවත්වන සියලුදෙනාට ලබා දිය යුතුව තිබෙනවා. සමහර විට හොඳ දෙයක් වෙයි. ජල බිල්පත වැඩිවීමට බොහෝ දුරට බලපාන්නේ ගංගා අයිනේ තිබෙන නගරවල ව්‍යාපාර හා ගෘහස්ථවලින්. ඒවායින් තමයි මේ ඔක්කොම අපද්‍රව්‍ය එන්නේ. ඒ නිසා ඒ ගොල්ලන්ගේ ජල බිල්පත වැඩි කරන්න වෙනවා, ඒ අපද්‍රව්‍ය මුදා නොහරින සෙසු ජනයාගේ බිල්පත් දැනට තිබෙන ප්‍රමාණයේම රඳවා ගැනීම සඳහා.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
ගරු ඇමතිතුමනි,-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්, ගරු මන්ත්‍රීතුමා. මොකක්ද ඔබතුමා කියන්න හදන්නේ?

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
ගරු අමාත්‍යතුමනි, ජල සම්පාදන මණ්ඩලය ගැන ඔබතුමා කිව්වා. මුදල් එකතු කර ගන්නා ඒ නිලධාරින් සම්බන්ධයෙනුත් අපි වචනයක් කියන්න ඕනෑ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කියන්න, කියන්න.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
ගරු ඇමතිතුමා, තාවකාලික පදනමෙන් සේවය කරන අවුරුදු 5ට වැඩි 960 දෙනෙක් ඉන්නවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තාවකාලික පදනමින් සේවය කරන සියලු දෙනා ස්ථිර පදනමකට ගන්න මම යෝජනා කරලා තිබෙනවා.

භාණ්ඩාගාරයෙන් මට තවමත් ඒකට වුවමනා අනුමැතිය ලැබී නැහැ. අපේ cadre එක ඉදිරිපත් කරනකොට තාවකාලිකව සේවය කරන සියලු දෙනා ඇතුළත් කරලායි තිබෙන්නේ.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ මනු සටහන්කරුවන් 960 දෙනා පිළිබඳ ඉතා සාධනීයව බලලා ඒ අය ස්ථිර සේවයට බඳවා ගැනීමට ඉදිරි කාලයේ දී කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
භාණ්ඩාගාරයට මේ පිළිබඳව කියන්න ඕනෑ. අපි මුදල් ඇමතිතුමාටත් මේ පිළිබඳව කියන්නම්. මොකද, මේ මිනිස්සු නැතිව වැඩ කරන්න බැහැ. තාවකාලික, අනියම් කිව්වාට මේ තමයි අපේ බලඇණිය. මේ බලඇණිය නැතිව අපට මේ කාර්යය කරන්න බැහැ. ඒ නිසා අපට අත්‍යවශ්‍යයි මේ මිනිසුන්ට ස්ථිර සේවයක සුවය ලබා දෙන්න.

මම කියාගෙන ආවේ මළ අප ද්‍රව්‍ය දැමීම ගැන. ඔබතුමන්ලා කවුරුත් දන්නවා, උඩරට කඳුකරයේ විශාල ප්‍රමාණයක් වතු සේවක ජනතාව ජීවත් වෙනවා කියලා. ඔවුන්ට මනුෂ්‍ය වාසයට සුදුසු නිවහනක් නැහැ. එබඳු ජනයාගේ වැසිකිළි ගැන මොන කථාද? ඉතින් එහෙම නම්, මේ කඳුකරයේ නිසි වැසිකිළි නැතිව ජීවත්වන විශාල ජන සමූහය බැහැර කරන මනුෂ්‍ය අපද්‍රව්‍ය අවසාන වශයෙන් ගලා ගෙන එන්නේ ඇළවල් දිගේ, ගංගා දිගේ.

එහෙම නම් අපි ඉස්සෙල්ලාම මොකක්ද කරන්න ඕනෑ? ගංගා අයිනේ වාගේම, කඳුකරයේ ඉන්න වතු සේවක ජනයාටත් මනුෂ්‍ය වාසයට සුදුසු නිවහනකුත්, සනීපාරක්ෂක වැසිකිළියකුත් ලබා දෙන්න ඕනෑ. එහෙම ලබා දුන්නොත් අපට පිරිසිදු ජලය ලැබෙයි. එහෙම ලබා නොදුන්නොත් අපේ ගංගාවල ජලය අපිරිසිදු වීම වළක්වන්න බැරි වෙයි. එහෙම වුණොත් ඒ වෙනුවෙන් අපට දරන්න වන වියදම වැඩි වෙයි.

ඒ අතර හොඳ ප්‍රවෘත්තියකුත් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්ලෝරීන් ඇතුළු රසායනික ද්‍රව්‍ය රාශියක් අපි ගන්නවා, වතුර පිරිසිදු කරන්න. මෙපමණ කල් අපි මේවා import කළා. ඉස්සර -අපේ ආණ්ඩුව තිබුණ කාලයේ- පරන්තන්වල තිබුණා රසායනික කම්හලක්. ඒකෙන් තමයි මේවා ලැබුණේ. ආචාර්ය විමලසූරිය කියලා විද්‍යාඥයෙක්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස් වේ.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අදට නියමිත කටයුතු අවසාන වනතුරු කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பட்டது.-*
*[மாண்புமிகு தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. -*
*[*THE HON. PRESIDING MEMBER *in the Chair.]*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම විනාඩි 10කින් කථාව අවසන් කරන්න උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ කඳුකරය ගැන, වතු සේවක ජනතාව ගැන. ඔවුන්ට වග කීමක් නැහැ, ඔවුන්ගේ ජීවිතය ගත කරන ආකාරය ගැන. ඒ බලය හා තීන්දුව තිබෙන්නේ, වතු අයිතිකරුවන් -පාලකයන්- අතේ. ඒවාට යම් පියවරක් ගත යුතුව තිබෙනවා. මනුෂ්‍ය වාසයට ගැළපෙන නිවාස හා සනීපාරක්ෂක වැසිකිළි ඔවුන්ට ලබා දිය යුතුයි. මනුෂ්‍ය වාසයට ගැළපෙන නිවාසයක් නොදී සනීපාරක්ෂක වැසිකිළියක් හදන්න පුළුවන්ද? එහෙමත් අපි හැදුවා. ලෝක බැංකුවේ සහන ණය මත අපට ලැබුණු අරමුදලක් තිබෙනවා. ඒ අරමුදලින් අපි ජලසම්පාදන හා සනීපාරක්ෂක කටයුතු කරගෙන යනවා. එමගින් 2021දී ජල සැපයුම් 17,500ක් දීලා තිබෙනවා. 3,000ක් සනීපාරක්ෂක වැසිකිළි හදලා තිබෙනවා. ඒ වාගේම 2022දී අපි බලාපොරොත්තු වෙනවා, ජල සැපයුම් 20,000ක් ලබා දීලා 3,000ක් සනීපාරක්ෂක වැසිකිළි හදන්න. ඒවායින් සියයට 10ක්, 15ක් අතර ප්‍රමාණයක් අපි සනීපාරක්ෂක වැසිකිළි හදලා තිබෙන්නේ, ජලය සපයා තිබෙන්නේ වතුකරයේ. ඒ ගැන මම සතුටින් කියන්නට ඕනෑ. නමුත්, ඒ ප්‍රමාණයෙන් මේ ප්‍රශ්නය විසඳන්නට බැරි බවයි මා මේ පවසා සිටින්නේ.

ඊළඟට, ජාතික ජල සම්පත් මණ්ඩලය ගැන කථා කරන්නම්. ජාතික ජල සම්පත් මණ්ඩලය කියන්නේ පොළොව යට තිබෙන ජලයට වග කියන අය. හැබැයි, වගකීමක් නැති කට්ටිය පොළොව යට තිබෙන ජලය එළියට ඇදලා ගන්නවා, කිසිම සීමාවක් නැතිව. ඒවා ගණන් බලන්න කෙනෙක් නැහැ. ඒවා නියමානුකූලව නියාමනය කරන්න බලයක් නැහැ. එම නිසා අපි මේ පනත සංශෝධනය කරන්න ලැහැස්ති කරලා තිබෙනවා. භූගත ජලය අපට හරියාකාරව පිරිසිදුභාවයකින් පවත්වාගෙන යන්න බැරි වුණොත්, පොළොව යට තිබෙන ඔක්කෝම ජලය එක්තරා විධියකට අපිරිසිදු වී යනවා. භූගත ජලය තල කිහිපයක තිබෙනවා. ඒ තල කිහිපය එකිනෙකට සම්බන්ධයි. ඒ නිසා භූගත ජලය ගැඹුරින් ගත්තා කියලා අපට එහි ලොකු වෙනසක් දකින්නට බැරි වේවි. මේ පොළොව යට තිබෙන ජලය සීමිතයි, අසීමිත නැහැ. නමුත් සමහරු හිතනවා, පොළොව යට අසීමිත මහා ජල සාගරයක් තිබෙනවා, ඒකෙන් ඕනෑ තරම් ගන්න පුළුවන් කියලා. ඒක ඇත්ත නොවෙයි. පොළොව යට තිබෙන ජලය -භූගත ජලය- මත තමයි අපේ ශාකවල වර්ධනය තිබෙන්නේ. භූගත ජලය නැත්නම් ගස් කොළන් පවතින්නේ නැහැ. මේ බව දන්නේ ටික දෙනයි. භූගත ජලය විසින් ගස් කොළන් බේරාගෙන තිබෙනවා වාගේම, ඒ ගස් කොළන් මතුපිට ජලය විසින් බේරාගෙන තිබෙනවා. ඒවා අපිරිසිදු වෙන්න නොදී පානීය ජලය ලෙස ජනතාවට ලබා දීම අපේ වගකීම හැටියට අපි භාරගෙන තිබෙනවා. තව එක කාරණයක් කියලා මම මේ මාතෘකාව අවසන් කරනවා.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

පොළොවෙන් ජලය ගන්නවා කියන කථාව තමයි ඔබ හැමෝම දන්නේ. නමුත්, අපි පසුගිය කාලයේ දැනගෙන හිටියා, කරන්නට තව එකක් තිබෙනවා කියලා. ඒ තමයි, "ජලාරෝපණය." ජලය ආරෝපණය කරනවා පොළොවට. පොළොව ඇතුළට ජලය දෙනවා. ස්වාභාවිකව, වැව්වලින්, ජලාශවලින්, එහෙම නැත්නම් වරුසාවෙන් යම් ජල ප්‍රමාණයක් පොළොව යටට යනවා. නමුත්, පොළොව යටට කෙළින්ම ගලාගෙන යන ආකාරයට ජලය ආරෝපණය කිරීමේ විද්‍යාවක් තිබෙනවා. එය අපි ක්‍රියාත්මක කරනවා. එය ක්‍රියාත්මක කිරීම තුළින් භූගත ජලය එක්තරා විධියකට පිරිසිදුවත්, භූගත ජලය තිබිය යුතු මට්ටම් තුළ පවත්වාගෙන යෑමටත් අපි පුළුවන් හැම දෙයක්ම කරගෙන යනවා. අපේ ජාතික ජල සම්පත් මණ්ඩලයේ කාර්යය තිබෙන්නේ භූගත ජලය සමහයි. ඔවුන් කරගෙන යන වැඩ බොහෝ ප්‍රමාණයක් තිබෙනවා. භූගත ජලය කොපමණ ප්‍රමාණයක් තිබෙනවාද, කොයි කොයි තැන්වල, කොයි කොයි මට්ටම්වලින්ද තිබෙන්නේ, ඒවායේ හොඳ නරකභාවය කොහොමද කියලා ඒ ඔක්කෝම මැනීම් කරගෙන යනවා. දැන් අපි කරගෙන යන්න හදන්නේ, මහ පොළොවෙන් ජලය ලබා ගන්නා හැමෝගේම ගැඹුරු ළිං පිළිබඳ සංගණනයක් කොට ඒවාට මීටර් සවි කිරීමත්, ඒ අනුව ගත හැකි ජලය සීමා කිරීමත්. ගෘහස්ථවලට නොව, ව්‍යාපාරික වශයෙන්, වාණිජමය වශයෙන් ගන්නා ජලය ගැනයි අපි මේ කියන්නේ. එහෙම නැතිව, කුඩා ගොවිපොළකට ගන්න ජලය ගැන නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොරෝනා වසංගතය නිසා අපි ලොකු පරිහානියකට මුහුණ දුන්නා. ඒක අපි කවුරුත් දන්නවා. දීර්ඝ කාලයක් යටත් විජිතයක්ව තිබුණු අපේ රටට, යටත් විජිතභාවයෙන් ගැලවුණාට පසුවත්, අපේ වෙළෙඳාමේදී නිසි මිල නොලැබී වෙළෙඳ හුවමාරුවේදී නැවත යටත් වෙන්නට සිදු වී තිබෙනවා. එම නිසා අපේ රටට ඒ තත්ත්වයෙන් ගොඩ එන්න වෙන්නේ අපේම හයියෙන් පමණයි. අපේම මුහුද හරහා, අපේම අහස හරහා කෙටි මාර්ග සොයාගෙන විශාල සමාගම්වල නැව්, අහස් යානා යනවා. ඒ අය ඒ කෙටි මාර්ගය භාවිත කිරීම මඟින් බිලියන දහස් ගණනින් ලාභ හොයනවා. නමුත්, අපි දුප්පත්. මේක වෙන්න දෙන්න බැහැ.

අපේ මුහුදු කලාපය හරහා අසූපන්දහස් වාරයක් යනවා, නැව්. එහෙම යන නැව්වලින් පිටවන කාබන් වායුව අපේ ජලයට එකතු වෙනවා. ඒවා අපට බලපෑම් කරනවා, දේශගුණික විපර්යාස වෙමින්. මේවා ඔක්කොම පෙන්වලා, අපේ මේ කෙටි මාර්ග හරහා බිලියන ගණන් ලාභ ලබන විශාල සමාගම්වලින් අපි ඉල්ලනවා අපේ රටේ සංවර්ධනයට දායක වෙන්න කියලා. දායක නොවුණත් කමක් නැහැ, අඩු ගණනේ අපට දුන්නාය කියන මේ මහා ණය කන්දරාව අත්හැර දැම්මත් ඇති. මේ වෙනුවෙන් උත්සාහයක් ගන්න මම ඉදිරි කාලයේ කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

මගේ කථාව අවසන් කරන්නට පෙර අවසාන වශයෙන් සඳහන් කරන්න ඕනෑ, රාජ්‍ය ඇමතිතුමාගේ නායකත්වයෙන් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව එම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේත් දායකත්වයෙන්, කාර්ය මණ්ඩලයේ ශක්තියෙන්, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් හේරත් මහතාගේ මැදිහත්වීමෙන් අද අපි විශාල ඉදිරි ගමනක යෙදී සිටින බව. ඊළඟට, අපේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ගැන කිව්වොත්, ඔහු ලේකම්වරයෙක් පමණක් නොවෙයි, ඔහු ඉංජිනේරුවෙක්. ඔහු වරායේ හිටපු සභාපතිවරයා. ඔහු හම්බන්තොට වරාය හදපු නිර්මාණකරුවා. ඔහු අද මගේ ලේකම්වරයා වීම මට නම් ලොකුම ගෞරවයක්, ඒ වාගේම ලොකුම හයියක්. දැන් ගාල්ලේ වතුර නැහැ, වතුර නැහැ කිය කියා ඉන්නවා. අපේ ලේකම්තුමා ගියා. "ඇයි, මේකේ ධාරිතාව වැඩි කරන්න පුළුවන් නේ" කියලා වහාම ධාරිතාව වැඩි කිරීමේ ඉංජිනේරු උපක්‍රමය කියලා දුන්නා. ඒකෙන් තමයි ගාල්ලේ තිබුණු ඒ විශාල පීඩනය ලිහිල් වුණේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා රත්නපුරයේ ඉපදුණු කෙනෙක්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්. එතුමා රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රදේශයෙන් ජනිත වී මේ රටට දායාද වීම ගැන අපට පොඩි ආඩම්බරයකුත් තිබෙනවා.

ඊළඟට, අපේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති නිශාන්ත රණතුංග මහතා, උපසභාපති නීතිඥ රණවක මහතා ඇතුළු ඒ අධ්‍යක්ෂ මණ්ඩලය විශාල මෙහෙවරක් කරනවා. ඒ සභාපතිතුමා වෙලාව නොබලා විශාල උනන්දුවකින් ක්‍රියා කරනවා. ඒ වාගේම සාමාන්‍යාධිකාරිතුමා, අතිරේක සාමාන්‍යාධිකාරිවරුන් ඇතුළු ඉංජිනේරු බල ඇණියම අද අපට ලොකු හයියක්. ඊළඟට, මගේ අමාත්‍යාංශයේ සිටින අනෙකුත් කාර්ය මණ්ඩලය, මගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය, ජල සම්පත් මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු එහි අධ්‍යක්ෂ මණ්ඩලය, එහි සාමාන්‍යාධිකාරිතුමා, පුහුණු නුපුහුණු අපේ සේවක බලකාය ආදී මේ සියලුදෙනාටම මාගේ හෘදයාංගම ආචාරයත්, කෘතඥතාවත් පළ කරමින්, ඔබතුමා මට ලබාදුන් කාලයට නැවත ස්තුතිවන්ත වෙමින් මගේ වචන කිහිපය හමාර කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

"176 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 184,450,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

176 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 3,700,000

"176 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

176 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 466,700,000

"176 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 466,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

176 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 790,000,000

"176 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 790,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

176 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**336 වන ශීර්ෂය.- වෙළඳ නාවික ලේකම් කාර්යාලය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 90,000,000

"336 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 90,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

336 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 6,300,000

"336 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 6,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

336 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 184,450,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ்செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளை யிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபாய் 3,700,000

"தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 3,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபாய் 466,700,000

" தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 466,700,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபாய் 790,000,000

"தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 790,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 336.- வணிகக் கப்பற்றுறைச் செயலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபாய் 90,000,000

"தலைப்பு 336, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 90,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 336, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபாய் 6,300,000

"தலைப்பு 336, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 6,300,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 336, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 184,450,000, for Head 176, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 176, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 3,700,000

Question, "That the sum of Rs. 3,700,000, for Head 176, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 176, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 466,700,000

Question, "That the sum of Rs. 466,700,000, for Head 176, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 176, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 790,000,000

Question, "That the sum of Rs. 790,000,000, for Head 176, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 176, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 336.- MERCHANT SHIPPING SECRETARIAT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 90,000,000

Question, "That the sum of Rs. 90,000,000, for Head 336, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 336, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 6,300,000

Question, "That the sum of Rs. 6,300,000, for Head 336, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 336, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

"434 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 101,150,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

434 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 3,000,000

"434 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

434 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 797,000,000

"434 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 797,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

434 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" தலைப்பு 434, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 101,150,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 434, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபாய் 3,000,000

" தலைப்பு 434, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 3,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 434, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபாய் 797,000,000

" தலைப்பு 434, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 797,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 434, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 101,150,000, for Head 434, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 434, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 3,000,000

Question, "That the sum of Rs. 3,000,000, for Head 434, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 434, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 797,000,000

Question, "That the sum of Rs. 797,000,000, for Head 434, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 434, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

## ජල සම්පාදන අමාත්‍යාංශය
## நீர் வழங்கல் அமைச்சு
## MINISTRY OF WATER SUPPLY

| | |
|---|---|
| පුනරාවර්තන | 363,475,000 |
| මූලධන | 32,150,500,000 |

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2022 කාරක සභා අවස්ථාවේදී, ජල සම්පාදන අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"44 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'මූලධන 47,150,500,000' "

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

"මූලධන වියදම සඳහා රු.47,150,500,000ක් දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 47,150,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the incrased sum of Rs. 47,150,500,000 for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"166 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 363,475,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

166 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 31,500,000

"166 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 31,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

166 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 363,475,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபாய் 31,500,000

"தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 31,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 363,475,000, for Head 166, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 31,500,000

Question, "That the sum of Rs. 31,500,000, for Head 166, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 32,119,000,000**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 32,119,000,000

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 32,119,000,000

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2022 කාරක සභා අවස්ථාවේදී 166 වන වැය ශීර්ෂයේ 02වන වැඩසටහන සඳහා සංශෝධනය ඉදිරිපත් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"44 වන පිටුවේ, 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02 සංවර්ධන වැඩසටහන - 47,119,000,000' "

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අයවැය යෝජනා අංක 10 - සැමට ජලය වැඩසටහන යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින් රු. 15,000,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි)

"166 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 47,119,000,000ක් දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

166 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 47,119,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 47,119,000,000, for Head 166, Programme 2, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 2, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"433 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 54,980,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

433 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 5,200,000

"433 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 5,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

433 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 600,000,000

"433 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 600,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

433 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**332 වන ශීර්ෂය.- ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 272,185,000

"332 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 272,185,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

332 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 1,207,250,000

"332 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 1,207,250,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

332 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 433, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 54,980,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 433, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபாய் 5,200,000

"தலைப்பு 433, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 5,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 433, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபாய் 600,000,000

"தலைப்பு 433, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 600,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 433, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 332.- தேசிய சமுதாய நீர் வழங்கல் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபாய் 272,185,000

"தலைப்பு 332, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 272,185,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 332, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபாய் 1,207,250,000

"தலைப்பு 332, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 1,207,250,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 332, நிகழ்ச்சித்திட்டம் 01 மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 54,980,000, for Head 433, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 433, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 5,200,000

Question, "That the sum of Rs. 5,200,000, for Head 433, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 433, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 600,000,000

Question, "That the sum of Rs. 600,000,000, for Head 433, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 433, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 332.- DEPARTMENT OF NATIONAL COMMUNITY WATER SUPPLY

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 272,185,000

Question, "That the sum of Rs. 272,185,000, for Head 332, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 332, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 1,207,250,000

Question, "That the sum of Rs. 1,207,250,000, for Head 332, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 332, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

*එකල්හි වේලාව අ.භා. 5.00 පසු කර තිබුණෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් විය.*
*කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2021 දෙසැම්බර් 03වන සිකුරාදා.*

*அப்பொழுது நேரம் பி.ப. 5.00 மணிக்குப் பிந்திவிட்டமையால், குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*
*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2021 டிசம்பர் 03, வெள்ளிக்கிழமை.*

*And it being past 5.00 p.m., Mr. Presiding Member left the Chair to report Progress.*
*Committee report Progress; to sit again on Friday, 03rd December, 2021.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ශීර්ෂ අංක 166 සංශෝධන සහිතව ද, ශීර්ෂ අංක 176, 336, 434, 433, 332 සංශෝධන රහිතව ද කාරක සභාවේදී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා.

## ඇළ, වේලි හා වාරිමාර්ග නිසි ලෙස නඩත්තු කිරීම
### கால்வாய்கள், அணைக்கட்டு மற்றும் நீர்ப்பாசன வாய்க்கால்களை உரிய முறையில் பராமரித்தல்
### PROPER MAINTENANCE OF CANALS, ANICUTS AND IRRIGATION CHANNELS

[අ.භා. 5.09]

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහ වැව්, මධ්‍ය පරිමාණ වැව් හා කුඩා වැව් 4000ක් පමණ ඇත. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ 'වාරි සෞභාග්‍යා' වැඩසටහන යටතේ වැව් විශාල ප්‍රමාණයක් අලුත්වැඩියා කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වෙමි.

වැව් ප්‍රතිසංස්කරණය වුවද ඇළ වේලි හා කෘෂි මාර්ග විධිමත් ලෙස නඩත්තු නොවීම අප ගොවීන් මුහුණ දෙන විශාල ගැටලුවකි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් අමුණු හා ඇළ වේලි ආයතන කිහිපයක් මඟින් පාලනය වේ.

1. මහවැලි අධිකාරිය
2. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
3. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
4. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

වසර ගණනාවකින්වත් අලුත්වැඩියාවක් නොවූ ඇළ වේලි හා කෘෂි මාර්ග විශාල ප්‍රමාණයක් දිස්ත්‍රික්කය පුරා ඇත. මෙම ඇළ වේලි හා කෘෂි මාර්ග නිසි පරිදි නඩත්තු කිරීමට නිසි වැඩපිළිවෙළක් ඉතා කඩිනමින් සකස් කළ යුතු බවට මම යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ලංකාවේ විශාල වැව් ප්‍රමාණයක් තිබෙනවා. "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ වැව් 1,500කට වැඩි ප්‍රමාණයක් සංවර්ධනය කරලා ඒ වැව් සංරක්ෂණය කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම ලංකාවේ වැව් වැඩියෙන්ම තිබෙන දිස්ත්‍රික්කය තමයි කුරුණෑගල දිස්ත්‍රික්කය. එහි වැව් 5,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තාම, වැව් 3,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. වැව් සංවර්ධනයේදී ගරු චමල් රාජපක්ෂ මැතිතුමා වාරිමාර්ග අමාත්‍යවරයා හැටියට අපේ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, ලංකාව පුරා විශාල වැව් ප්‍රමාණයක් සංවර්ධනය කළ එක ගැන අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම රාජ්‍ය අමාත්‍යවරයාට වැව් 1,000ක් සංවර්ධනය කිරීමටයි ඉලක්කය දුන්නේ. නමුත් වැව් 1,500කට ආසන්න ප්‍රමාණයක් අපේ රාජ්‍ය අමාත්‍ය ගරු අනුරාධ ජයරත්න මැතිතුමා සංවර්ධනය කළා. මේ සියලුදෙනාට මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැව් සංවර්ධනය වෙනවා; වැව් හැදෙනවා. ඒ වුණාට වැව්වල තිබෙන ඇළ වේලි සහ කෘෂි මාර්ග පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඒ ගැන තමයි මගේ මේ යෝජනාව. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍ය පරිමාණ හා කුඩා වැව් 4,000ක් පමණ ඇති අතර අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ 'වාරි සෞභාග්‍යා' වැඩසටහන යටතේ වැව් විශාල ප්‍රමාණයක් අලුත්වැඩියා කළා. ඒකට අපේ ගෞරවනීය ස්තුතිය අතිගරු ජනාධිපතිතුමාට පුද කරන්න ඕනෑ. මම හිතන්නේ මේ අවුරුද්දේ තමයි ඉතිහාසයේ වැඩිම වැව් ප්‍රමාණය ප්‍රතිසංස්කරණය වුණේ. වැව් පිළිබඳව කථා කරනකොට අපේ වැව්, ආයතන හතරක් මඟින් පාලනය වෙනවා. මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව කියන ආයතන හතරකට ඒවා බෙදලා තිබෙනවා.

වසර ගණනාවක් අලුත්වැඩියාවක් නොවූ වැව් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම මා පෙර කියපු විධියට විශාල වැව් ප්‍රමාණයක් අපි සංවර්ධනය කරලා තිබෙනවා. කැබිනට් අමාත්‍යවරයා හැටියට සිටින ගරු චමල් රාජපක්ෂ මැතිතුමාටත්, ඒ වාගේම රාජ්‍ය අමාත්‍යතුමා හැටියට සිටින අනුරාධ ජයරත්න ඇමතිතුමාටත් මා කියනවා, අවුරුදු 50ක්, 60ක් තිස්සේ සංවර්ධනය නොවූ ඇළ, වේලි විශාල ප්‍රමාණයක් තිබෙන බව. ඒ වාගේම ගොවියාගේ මූලික අවශ්‍යතාවක් තමයි කෘෂි මාර්ග කියන්නේත්. අපි දන්නවා, ගොවියා වගා කටයුතු අවසන් කරලා ඒ අස්වැන්න ලබා ගන්න වෙලාවේ -වී අස්වැන්න නෙළපුවාම- කෘෂි මාර්ග සංවර්ධනය කර නොමැතිකම නිසා විශාල ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්නට සිද්ධ වෙලා තිබෙන බව.

අද වැව් වැඩි ප්‍රමාණයක් සංවර්ධනය කරනවා.

වැව සංවර්ධනය වුණාට කෘෂිමාර්ග සහ ඇළවේලි සංවර්ධනය වෙන්නේ නැහැ. ඒ නිසා වැව හදන්න ඇස්තමේන්තු කරනකොට, ස්ථිර වශයෙන්ම කෘෂිමාර්ග සහ ඇළවේලි සකස් කරන්නත් ඇස්තමේන්තු කරලා කටයුතු කළ යුතුයි. ඒ අනුව, අනුරාධපුරය, පොළොන්නරුව දිස්ත්‍රික්කවල පමණක් නොවෙයි, මේ රටේම ඉන්න ගොවීන්ගේ අවශ්‍යතාව වෙනුවෙන් ඒ කෘෂිමාර්ග ටික, වාරිමාර්ග පද්ධති හා ඇළවේලි පද්ධති ටික සකස් කරන්න අවශ්‍ය පහසුකම් සපයන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු මේජර් සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.13]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව මම ස්ථිර කරනවා. එතුමා මේ ඉදිරිපත් කළේ කාලෝචිත යෝජනාවක් බව මම කියන්න ඕනෑ. මෙය අත්‍යවශ්‍යම යෝජනාවක්. මොකද, මේ වන විට අතිගරු ජනාධිපතිතුමාගේ "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ ලංකාව පුරාම විශාල වැව් ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කෙරෙනවා. මෑත කාලයේ සිට මේ වන විට අපට හිතා ගන්නවත් බැරි තරම් විශාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණයක් අපේ රටේ දකින්න ලැබෙනවා. විශේෂයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ වැව් 56ක් විතර ප්‍රතිසංස්කරණය කෙරෙනවා. අපේ රටේ තිබෙන සමහර වැව් අවුරුදු 100කින් විතර කිසිම ප්‍රතිසංස්කරණයක් කරලා නැහැ; ඒ කටයුතුවලට අතවත් තියලා නැහැ. එ් වැව් ගොඩවෙලා පිට්ටනි බවට පත්වෙලා තිබුණේ. අද ඒ වැව්වල ජලය උතුරා යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේක ඉතාම වැදගත් දෙයක්. මේවා ටිකෙන් ටික හැදිලා "වාරි සෞභාග්‍යා" නමටම ගැළපෙන විධියට ලංකාවේම තිබෙන වැව් ප්‍රතිසංස්කරණය කිරීම මේ වන විට ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, SLLR&DC ආයතනයත් එකතු වෙලා ඒ

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

වැව් ප්‍රතිසංස්කරණ කටයුතු මේ වෙනකොට කරගෙන යනවා. ඒක සාර්ථක වැඩ පිළිවෙළක්.

ඒ වැව් ප්‍රතිසංස්කරණය කරලා ස්වයං රැකියාවක් වශයෙන් මත්ස්‍යයන් ඇති කිරීමට බලාපොරොත්තු වෙනවා. අපේ ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමාත් යෝජනාවක් කරලා තිබෙනවා, තාරාවන්, කුකුළන් වැනි සතුන්ගේ කුඩු මේ වැව්වලට ඉහළින් හදලා, ඒ මත්ස්‍යයන් ඇති කිරීමත් එක්ක සම්බන්ධ කරලා ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කරන්න. එතුමා මේ වන විටත් ඒ සම්බන්ධ කටයුතු කරගෙන යනවා. ඒක ඉතාම වැදගත්. අපේ කුමාරසිරි මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ඇළ වේලි සහ කෘෂිමාර්ග විධිමත් ලෙස සංවර්ධනය කිරීමත් ඇත්තටම අත්‍යවශ්‍ය දෙයක්. වැව්වලින් ගලා යන ජලය අපතේ නොයවා, අවශ්‍යතාවට ගැළපෙන පරිදි යොදවා ගන්න පුළුවන් නම් ඉතාම වැදගත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම තවත් යෝජනාවක් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැව් සියල්ලම දැනට තිබෙන්නේ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව කියන ආයතන දෙක යටතේ. සමහර වැව් අයිති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ද, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට ද කියලා සොයා ගන්නත් බැරි තරම්.

තව එක යෝජනාවක් විතරක් ඉදිරිපත් කරලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපේ රටේ තිබෙන සියලු වැව් එක ආයතනයක් යටතට ගන්න කියලා. මේ වැව් ප්‍රතිසංස්කරණය කරලා එක ආයතනයකට බාර දෙන්න. ඉන් අනතුරුව ගමේ ගොවි ජනතාව සමඟ කටයුතු කරන ගොවි සංවිධානවලට බාර දීලා ඒවා නඩත්තු කිරීමේ කටයුතු කරන්න. ඒ යෝජනාවත් මගේ කථාවට එකතු කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.16]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ අපේ ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඉතා වැදගත් යෝජනාව ගැන අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

ඉතිහාසයේ අපේ ශිෂ්ටාචාරය ගොඩ නැඟුණේ, වැවයි, දාගැබයි - ගමයි, පන්සලයි කියන සංකල්පය පදනම් කරගෙන. වැව හා බැඳුණු ස්වයංපෝෂිත ගමක් විධියට තමයි අපේ පෞරාණික ගම්බිම් වර්ධනය වුණේ. එහෙම නැත්නම් ගංගා නිම්නයක් ආශ්‍රිතව තමයි අපේ ගම්බිම් නිර්මාණය වුණේ. අපි හැම දාමත් ජලය එක්ක බොහොම හොඳින් ගනුදෙනු කළ රටක්. ඒ වාගේම, අපි ජලයට හොඳින් සත්කාර කරපු රටක්. අපි ජලය හොඳින් කළමනාකරණය කරපු රටක්.

විශේෂයෙන්ම කුඩා වැව් ගැන කථා කරද්දී, වර්තමානය වන විට ඒ කුඩා වැව්වලින් වැඩිම ප්‍රයෝජනයක් ලබා ගන්නේ ඒ ප්‍රදේශවල ඉන්න ගොවි සංවිධාන ඇතුළු ගොවි ජනතාව බව අපි දන්නවා. ඒ ගොවි සංවිධානයට තමයි වැවේ අගය, වැවේ ප්‍රයෝජනය වැඩියෙන්ම තිබෙන්නේ. මේ සෑම වැවකම වැඩි වගකීමක් ගොවි සංවිධාන විසින් දරන නිසා, ඒ අයත් එක්ක එකතුවෙලා වැව් ගැන කටයුතු කරන එක ඉතාම වැදගත්.

අපි දන්නවා, වැවක් සංවර්ධනය කිරීම ඉතා වැදගත් බව. හැබැයි, අද ගොඩක් තැන්වල වැව් දියුණු කිරීම, වැව් සංවර්ධනය කිරීම නිධන් හැරිල්ලක් බවට පත් වෙලා තිබෙනවා. මම ඒ බව කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, ගරු ඇමතිතුමනි.

අද ගොඩනැඟිලි ද්‍රව්‍ය වන වැලි සහ මැටිවල මිල ඉතාම අධික තත්ත්වයට පත්වීම නිසා වැව ජාවාරම් කරන තැනක් බවට පත් වෙලා තිබෙනවා. ඊයේ පෙරේදා ඔබතුමන්ලාගේ පැත්තේ රාජ්‍ය ඇමතිවරයෙක් ඔබතුමන්ලාගේම පැත්තේ රාජ්‍ය ඇමතිවරයෙකුට චෝදනා කළා, වැවක් ප්‍රතිසංස්කරණයේදී ලක්ෂ 15ක් ගන්නවා කියලා. මම හිතන විධියට මෙය ඇමතිතුමාගේ දැඩි අවධානය යොමු විය යුතු කාරණයක්. වැවේ වැඩි අයිතිය, වැඩි කළමනාකරණ ශක්තිය ගොවි සංවිධානවලට දීමේ වටිනාකම ඇති වෙන්නේ ඒ හරහායි. මොකද, ඒ ජාවාරම්කාරයන් අවශ්‍යතාවට ප්‍රමුඛතාව දෙමින් වැව කැණීම නිසා අවශ්‍ය ගැඹුරටත් වඩා යටට හාරලා තිබෙනවා. ඒ හේතුවෙන් වැව් ගොඩක් නාස්ති වෙන බව අපි දැකලා තිබෙනවා.

වැවේ යට තිබෙන්න ඕනෑ මැටි තට්ටුව. ඇමතිතුමා මට වඩා හොඳට ඒක දන්නවා. කාලයත් එක්ක රොන්මඩත් එක්ක ඇවිත් වැවේ මැටි තැන්පත් වෙනවා. ගොඩක් වෙලාවට අපි වැව සංවර්ධනය කරද්දී ඒ යට තිබෙන රොන්මඩ තට්ටුව ඉවත් කරලා නැවත ඒ මැටි අතුරනවා. නමුත්, සංවර්ධන ව්‍යාපෘතියක් නාමයෙන් ඒක ජාවාරමක් බවට පත් වුණාම, ඒ කටයුත්ත හරියට කරන්න බැහැ. අපි දන්නවා ඉතා හොඳ නිලධාරින් හිටියත් ඔවුන්ගේ අණටත් අවනත නොවී, දේශපාලන අධිකාරියේ අය මේවාට මැදිහත් වෙලා තිබෙන බව. විශේෂයෙන්ම ඔබතුමා කුඩා වැව් පද්ධතිය දියුණු කිරීමට ලොකු උනන්දුවක් දක්වන ඇමතිවරයකු හැටියට මේ ගැන දැඩි අවධානය යොමු කරන්න.

ගරු ඇමතිතුමනි, නඩත්තුව තමයි ඉතාම වැදගත්. වැව වෙන්න පුළුවන්, ඇළ වේලි වෙන්න පුළුවන්, අමුණු වෙන්න පුළුවන්, ඒවායේ නඩත්තුව හරියට කෙරුණොත් තමයි වැඩි ප්‍රයෝජනයක් ගොවියාට ලබා ගන්න පුළුවන්. ඒ නිසා නඩත්තුව සඳහා වෙන් කරන මුදල් වැඩි වශයෙන් යොදවනවා නම්, වැඩි වශයෙන් වියදම් කරනවා නම්, වැව් සංවර්ධනය කරන්න වැඩි මුදලක් යොදවන්න සිද්ධ වන්නේ නැහැ. ඒ නිසා නිරන්තර නඩත්තුව ඉතා අවශ්‍යයි. ඒ නිසා ගොවි සංවිධානයට තිබෙන බලතල තවදුරටත් වැඩි කරලා මේ සෑම කටයුත්තකටම ගොවි සංවිධානය සෘජුව සම්බන්ධ කරගන්න ඔබතුමාට පුළුවන් වුණොත්, අපට ඉතාම හොඳ කුඩා වැව් පද්ධතියක් නිර්මාණය කරගන්න පුළුවන්. ඒ යෝජනාවත් ඔබතුමාට ඉදිරිපත් කරමින් මම තව එක කාරණයක් කියන්න ඕනෑ.

අපි දන්නවා, දැන් හොඳ වැසි කාලයක් තිබෙන බව. මේ දවස්වල ජල මාර්ග දෙගොඩ තලා යනවා. හැබැයි අපට නියං කාලයක් එනවා. 2017 වසරේදීත් අපට ඒ තත්ත්වය අත්දකින්න සිද්ධ වුණා. අප නියං කාලයේදී වැව් ටික හරියාකාර නඩත්තු කරලා සංවර්ධනය කරලා තිබුණොත් තමයි වැඩි ජල ධාරිතාවක් රඳවා ගන්න පුළුවන් වන්නේ. මේ වෙලාවේ වැව් සංවර්ධනය කරන්න පුළුවන් තත්ත්වයක් නැහැ, වැව් පිරී ගිහින් තිබෙන නිසා. හැබැයි, මේ කන්නයෙන් දෙකෙන් පස්සේ ඒ අඩු පාඩු තිබෙන

වැව් සංවර්ධනය කරන්න ඕනෑ. විශේෂයෙන්ම මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ තමයි වැඩිම වැව් ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ වැව් සියල්ල ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් සංවර්ධනය කරන්න ඔබතුමාට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, ඔබතුමාට සුබ පතමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුව අපේ ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, මෙවන් කාලෝචිත යෝජනාවක් ගෙන ඒම සම්බන්ධව. ඇත්තටම එතුමා කිව්වා වාගේම මටත් කියන්න තිබෙන්නේ මේකයි. අපේ ප්‍රදේශය වන කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන වැවක් සංවර්ධනය කරනවා දැක්කේ අප උපන්නාට පසුව අද තමයි. ඒ කටයුත්ත වෙනුවෙන් අපේ වාරිමාර්ග අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමාට මේ අවස්ථාවේදී අපේ ගෞරවය, ස්තුතිය සහ ප්‍රණාමය පුද කරනවා.

අපේ "බොල්ගොඩ ව්‍යාපාරය" කියලා ව්‍යාපෘතියක් තිබුණා. 1977 ආණ්ඩු පෙරළියත් එක්කම පොලිසිය ඇතුළු සියලු තැන්වලට සතියක නිවාඩුවක් දුන්නා. ඒ වෙලාවේ ඒ ව්‍යාපෘතියට අයත් මැෂින් ආදි ඔක්කොම යකඩවලට ගලවාගෙන ගියා. එදායින් පස්සේ මේ දක්වා ඒ ආශ්‍රිතව අක්කර දහස් ගණනක් පුරන් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ බොල්ගොඩ ව්‍යාපාරය නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මා මේ අවස්ථාවේදී කරනවා. මා එය යෝජනාවක් හැටියටත් ගෙන එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඇළ වේලි සංවර්ධනයේදී අපට ලොකුම ගැටලුවක් වෙලා තිබෙන්නේ, මේ කටයුතු ඇස්තමේන්තු කිරීමට අදාළ නිලධාරින්, විශේෂයෙන්ම කාර්මික නිලධාරින් නොමැතිකම. කාර්මික නිලධාරින්ගේ විශාල අඩුවක් කළුතර දිස්ත්‍රික්කයේ තිබෙනවා. මුදල් තිබුණත් ඇස්තමේන්තු කරන්න විධියක් නැහැ. එම නිසා කාර්මික නිලධාරින් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කරනවා නම් හොඳයි කියන එකත් මා කියනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ඇතැම් ගරු මන්ත්‍රීතුමන්ලා සමහර තැන්වලට අදාළව දේශපාලනඥයන්ට ඇඟිල්ල දිගු කළා, වැව්වල වැලි හාරනවා, ඒවායේ නිධන් හාරනවා කියලා. මම මෙහිදී දැකපු තවත් දෙයක් තිබෙනවා. උදාහරණයකට ගනිමු, අපේ බණ්ඩාරගම ආසනයේ තිබෙන වැව්ට වැව. අපේ ගරු ඇමතිතුමාත් ඒ ගැන දන්නවා. මම මීට පෙරත් මේ ගැන ප්‍රකාශ කරලා තිබෙනවා. වැව්ට වැව ආශ්‍රිත කොටසක් එක් හෝටල් හිමියෙකුට ඉතිරි කරන්න යැම පිළිබඳව වාරිමාර්ග අමාත්‍යාංශයත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවත් දෙපැත්තට කඹ ඇද ඇද ඉන්නවා. ඒ හේතුවෙන් අද ඒ වැවේ සංවර්ධන කටයුතු නැවතිලා තිබෙනවා.

"ෆේස්බුක්" වැනි සමාජ මාධ්‍යවලින් ඒවා දැක්කාම දේශපාලනඥයන්ට තමයි අපි බණින්නේ. මම ගෞරවයෙන් නැවත ඉල්ලා සිටින්නේ, නිලධාරින් දෙපැත්තට කඹ ඇද ඇද ඉන්නේ නැතිව, දෙගොල්ලන් එකතු වෙලා ඒ වාගේ ගැටලු තැන් නිවැරැදි කරන්න කියලායි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.24]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මගේ හිතවත් ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා අද ඉතාම කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කළා. "වැව් බැඳි රාජධානිය" කියලායි අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයට කියන්නේ. අනුරාධපුර දිස්ත්‍රික්කය තමයි ලංකාවේ දෙවැනියට වැඩියෙන්ම වැව් තිබෙන දිස්ත්‍රික්කය වාගේම, එල්ලංගා පද්ධතියක් සහිතව විශාල වාරි පද්ධතියකට හිමිකම් කියන දිස්ත්‍රික්කය. අපේ ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපේ ඉතිහාසය හා බැඳී තිබෙන සංකල්පයක් තමයි "වැවයි-දාගැබයි, ගමයි-පන්සලයි" කියන එක. "වැවයි-දාගැබයි" කියන සංකල්පයටත් ඉතිහාසයේ ලොකු කතන්දරයක් තිබෙනවා. වැවට නයිට්‍රජන් ලබා ගැනීම වෙනුවෙන් තමයි වැවත් එක්ක දාගැබ නිර්මාණය කරලා තිබෙන්නේ. දාගැබට අකුණු වැදුණාම ඒ නයිට්‍රජන් ටික වැවට එකතු වෙනවා. ඉතිහාසයේ වාරි කර්මාන්තය ගැන දන්නා විශාල පිරිසක් ඒ ගැන අදහස් පළ කරලා තිබෙනවා. වාරි කර්මාන්තයට අදාළ ඉංජිනේරුමය දැනුම නිසා තමයි එදා එවැනි දේවල් නිර්මාණය කරලා තිබුණේ. එවැනි ඉතිහාසයකට උරුමකම් කියන රටක ඉන්න අපි, අද මේ වාරි කර්මාන්තයේ නියැළෙද්දී කරන දේවල් දැක්කාම හරි දුකයි, ගරු ඇමතිතුමනි. අපි ඔබතුමන්ලාට මේ කරුණු පැහැදිලි කරලා දෙන්නේ, අපේ කුහකකමකටවත්, ඔබතුමන්ලා එක්ක තිබෙන අමනාපයකටවත් නොවෙයි. ගොවි ජනතාව වෙසෙන දිස්ත්‍රික්කයක ජීවත් වන, ගොවියෙකුගේ පුතෙකුගෙන් පැවත එන කෙනෙකු විධියට මේ වාගේ දේවල් දැක්කාම මට හරි දුකයි, ගරු ඇමතිතුමනි. මේ රටේ ජනතාවගෙන් එකතු කරන බදු මුදල්, අපේ රටේ සල්ලි මේ විධියට කාබාසිනියා වන කොට, විනාශ වන කොට අප බලාපොරොත්තු වන දේ සිදු වනවාද කියන කාරණය නිසා අපට දුකයි. අපේ ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමාත් සඳහන් කළ පරිදි, අද වැව හදන කොට කෙත් ඇළවල් ටික හැදෙන්නේ නැහැ; අපේ කෘෂි මාර්ග ටික හැදෙන්නේ නැහැ. ඒක සම්පූර්ණ ඇත්ත, ගරු ඇමතිතුමනි.

මහවැලි ව්‍යාපාරයට අයත් නොවන වැව් තිබෙනවා, සාමාන්‍යයෙන් යල කන්නයේ වගා කරන්න ජලය සැපයීමට අපහසු. ඒ සමහර වැව්වල ජලය ටිකක් ඉතිරි වෙනවා. ගරු ඇමතිතුමනි, මම එක ඉල්ලීමක් කරනවා, වැවක් සංවර්ධනය කරන්න තීරණය කරනවා නම්, ඒ කටයුතු කිරීම සඳහා ප්‍රදානය කිරීමේ ලියුම දෙන කොට ඒකට අවශ්‍ය මුදල් ටික ඒ ආදළ ආයතනයට එවන්න කියලා. අපි ඒ කොන්ත්‍රාත් එක වේගවත්ව කරන්න ඕනෑ. නැත්නම් වෙන්නේ මොකක්ද? කොන්ත්‍රාත් එක කරගෙන යනවා. ඒ බිල් ඉදිරිපත් කළාම ඒවාට ගෙවන්න සල්ලි නැති වන කොට කොන්ත්‍රාත් එක අතර මඟ නතර වෙනවා. කොන්ත්‍රාත් එකේ වේගවත්භාවයට ඒක බලපානවා. එකක්, ඒක. අනෙක් කාරණය මේකයි. ගොවි සංවිධානයත් එක්ක ගිවිසුම්ගත වෙන්න, "ඒ කොන්ත්‍රාත් එක යන අතරේ ඒ වැඩේ ඉවර වෙන

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

කල් සමහර වෙලාවට ඔබතුමන්ලාට එක කන්නයකට කැපවීමක් කරන්න වුණොත් ඒ කැපවීම කරන්න ලෑස්ති වෙන්න" කියලා. එහෙම නොවුණොත් මොකද වෙන්නේ? කොන්ත්‍රාත් එක කරගෙන යන අතරේ වර්ෂාව එනවා. වර්ෂාව ආවාම වැව වතුරෙන් පිරෙනවා. වැව පිරුණාම කොන්ත්‍රාත් එක අතර මඟ නතර වෙනවා.

ගරු ඇමතිතුමනි, අපේ ප්‍රදේශයේ වැව්වල රොන්මඩ ඉවත් කිරීමට විශාල ආයාසයක්, නැත්නම් උනන්දුවක් ඇති කරන තැනට පත් වුණේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ අපේ ප්‍රදේශයේ පැවැති "දැයට කිරුළ" වැඩසටහනත් එක්කයි. එහිදී අපේ දිස්ත්‍රික්කයේ වැව් විශාල ප්‍රමාණයක රොන්මඩ ඉවත් කිරීම සිද්ධ වුණා. හැබැයි, ඒ රොන්මඩ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය කරගෙන යන කොට වැස්ස ආවා; ඒ කටයුත්ත නතර වුණා. ඊට පස්සේ තමයි අප දැන ගත්තේ වැව් සංවර්ධනය කරන ක්‍රම දෙකක් තිබෙනවා කියලා. එක ක්‍රමයක් තමයි, වැවේ වතුර හිඳිලා තිබෙන කාලයේ ඩෝසර් දාගෙන, බැකෝ දාගෙන, ටිපර් දාගෙන වැව හදාගෙන යන එක. වැහි කාලයේ වැව සංවර්ධනය කරන එක හරිම ලේසියි. වතුර පිරුණාම 'පොතෙන්' වැව සංවර්ධනය කරනවා. ඒක තමයි වෙන්නේ. වැවට ඩෝසර් දාගෙන, බැකෝ දාගෙන වැඩ කරන කොට වියදම් යනවා. හැබැයි ගරු ඇමතිතුමනි, වැව පිරුණාට පස්සේ 'පොතෙන් සංවර්ධනය කරන කොට' ඒ සල්ලි ටික සාක්කුවේ දාගන්න හරිම ලේසියි. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට චෝදනා කරනවා නොවෙයි, මේ. ඔබතුමා ගිහින් ඒ සල්ලි ටික ගන්නේ නැහැ. හැබැයි, ඔබතුමා තමයි මේ විෂය භාරව ඉන්න, වගකීම් දරන ඇමතිතුමා. ඒ නිසා පොතෙන් වැව් සංවර්ධනය කරන ක්‍රමවේදය අපේ වාරි කර්මාන්තයෙන් අයින් කරමු. සැබැවින්ම වැව හදනවා නම් ඒ වැඩ අවසන් වන කල් යම් කන්නකදී කැපවීමක් කරන්න වෙයි. එහෙම කැපවීම් කළාට ගොවියාට පාඩු නැහැ. මොකද, ඊට පස්සේ ඇස් පියාගෙන වුණත් කන්න ගණනාවක වැඩ කරගෙන යන්න පුළුවන්. එතකොට වැව සම්බන්ධව ඒ අයට හිසරදයක් නැහැ. ඒ නිසා එක වැවකට ඇස්තමේන්තු කරනවා නම්, ඒ වැවේ කෙත් ඇළේ ඉඳලා, කෘෂි මාර්ගයේ ඉඳලා, වැවේ bund එකේ ඉඳලා, රොන් මඩ ඉවත් කිරීම ඇතුළු සියලුදේටම ඇස්තමේන්තු කරලා ඒ මුදල් ටික ඒ කොන්ත්‍රාත් එක කරන ඉංජිනේරු ආයතනයට හෝ ගෙවීම් කරන ආයතනයට ලබා දීලා ඒ වැඩ කටයුතු වේගවත්ව කරගෙන යන්න. එහෙම කරගෙන යනකොට වතුර ඇවිල්ලා වැඩ නතර කරන්න වෙනවා නම්, වැව් bund එක කපලා ඒ එන වතුර ටික පිට කරන ක්‍රමයක් හදාගෙන වැවේ කටයුතු අවසන් කරලා නැවත ඒ කපපු හිඩැස මකන්න කටයුතු කරන්න. එහෙම කළොත් වැව් ප්‍රතිසංස්කරණය කරන්න අප යොදන මුදල් ප්‍රයෝජනවත් වෙයි; අපේ අනාගතයට ලොකු ශක්තියක් වෙයි.

අපි වැව් පද්ධතිය ශක්තිමත් කර ගත්තොත්, අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයට බෙහෙවින් වැදගත්. කෘෂි කර්මාන්තයේ නියැළෙන ප්‍රදේශයක් නිසා ඒ වැව් ටික ශක්තිමත්ව තිබීම බොහොම වැදගත්.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම සංවර්ධනය කරන වැව අවුරුද්දක්, දෙකක් හෝ තුනක් ඇතුළත නැවත නැවත සංවර්ධනය කරනවා. නමුත් සංවර්ධනය කරන්න අතවත් නොතියපු වැව් විශාල ප්‍රමාණයක් අපේ ප්‍රදේශවල තිබෙනවා. හදන්නේ නැතුව, අතවත් නොතියපු වැව් තිබෙනවා. ඒ වැව් මහා වාරිමාර්ගවලට අයිති ඒවා නොවෙයි. ග්‍රාමීය මට්ටමේ තිබෙන ගොවි සංවිධානවලට අයත් වැව්. ඒ ගොවි සංවිධාන ඉතාම දුප්පත්. ඔවුන්ට අඩුම තරමින් කෙත් ඇළක් සුද්ද කර ගන්නවත්, පස් ටිකක් දාගන්නවත් ශක්තියක් නැහැ. ඒ කුඹුරු කන්න කීපයකට සැරයක් වැඩ කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ වැව් හදලා ජල ධාරිතාව වැඩි කරනවා නම්, මම හිතනවා අපේ ගොවි සංවිධාන ටිකත් ශක්තිමත් කරන්න පුළුවන් කියලා. ඒ හරහා අපේ පුරන් වෙච්ච කුඹුරු විශාල ප්‍රමාණයක් අස්වද්දා ගන්නත් පුළුවන්. ගරු ඇමතිතුමනි, අපේ වැවේ වතුර ටික රැඳිලා පවතිනවා නම් ඒ ආශ්‍රිත ප්‍රදේශය සශ්‍රීක වනවා. අවට තිබෙන අනෙකුත් බෝග සියල්ලත් සශ්‍රීක වනවා. පොල් ගහක් වෙන්න පුළුවන්, අඹ ගහක් වෙන්න පුළුවන්, කොස් ගහක් වෙන්න පුළුවන්, ඒ අවට තිබෙන සියලු බෝග සශ්‍රීක වෙනවා.

අපේ දිස්ත්‍රික්කය ගත්තාම, එල්ලංගා පද්ධතියත් එක්ක, චේන් එකක් වාගේයි මේ වැව් ටික තිබෙන්නේ. ඒ වැව් ටිකේ ජලය රඳා පවත්වා ගන්න අපට පුළුවන් නම්, අනුරාධපුර දිස්ත්‍රික්කයට නියං කාලවලට මුහුණ දෙන්න අවශ්‍ය වෙන එකක් නැහැ, ගරු ඇමතිතුමනි. අපි මේවා ඔබතුමන්ලාට කියන්නේ, කුහකකමින් නොවෙයි. ජනතාව මේ පාර්ලිමේන්තුවට අපි සියලුදෙනාම පත් කරලා එවා තිබෙන්නේ, ඔවුන් වෙනුවෙන් යමක් කරන්න. අපි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ ගොවි ජනතාවගේ ආශිර්වාදයෙන්. ඔබතුමන්ලා කරන හැම වැඩකදීම අපි කකුලෙන් අදින මිනිස්සු නොවෙයි. අපි කරන්නේ, වැරැද්ද පෙන්වා දීමයි. මම කියපු වැවේ කතන්දරයට ඔබතුමාට තරහ ගියා. ඔබතුමාට තරහ ගියාට, මම ඒ කථාව කිව්වේ අවංකවමයි. ඒ ගැන අපේ ප්‍රදේශයට ඇවිත් අහන්න. ඒ සිද්ධිය වෙනකොටම ඔබතුමාගේ පුතා, ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය අමාත්‍යතුමාට මම ගිහින් කිව්වා, මේ කරන වැඩේ වැරැදියි කියලා. එතුමා කිව්වා, "ඔබතුමා කලින් කිව්වා නම් මට ඒක නතර කරන්න තිබුණා. දැන් වැඩේ කරලා ඉවරයි නේ" කියලා. ඒ නිසා තමයි අපි මේ දේවල් කිව්වේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලොකු ශක්තියක් තිබෙනවා. ඒ නිසා අපේ ප්‍රදේශයේ වැව් ටික හදලා දෙන්න, අපේ කෘෂි මාර්ග ටික හදලා දෙන්න, කෙත් ඇළවල් ටික හදලා දෙන්න කියලා බොහොම ගෞරවයෙන් ඉල්ලනවා. රටේ කෘෂි කර්මාන්තය නඟා සිටුවීමේ ලොකු වගකීමක් ඔබතුමාට තිබෙනවා. ඒ සඳහා ඔබතුමාට ශක්තිය ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.30]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කොළඹ දිස්ත්‍රික්කය කිව්වාම අපි සමහර වෙලාවට හිතනවා, ගොවිතැනෙන් ඉවත් වෙච්ච දිස්ත්‍රික්කයක් කියලා. හැබැයි අද බොහෝ දෙනෙක්, -බොහොම ගොවියෝ හා ගොවි සමිතිවල සාමාජිකයෝ- අපෙන් ඉල්ලන්නේ වෙන මොනවත් නොවෙයි, ගරු ඇමතිතුමනි. ඔවුන් ඉල්ලන්නේ, ඇළවේලි ටික සුද්ද කරලා දෙන්න කියලායි. කොළඹ වැඩි හරියක් ඉන්නේ, නොයෙකුත් කර්මාන්ත, නොයෙකුත් ව්‍යාපාර එක්ක සම්බන්ධ වෙච්ච පිරිසක්. කෙටියෙන් කිව්වොත්, කොළඹ ඉන්නේ යමක් කමක් තිබෙන අය. ඒ නිසා ඔවුන්ට ඇළ වේලි ටික විතරක් සුද්ද කරලා දුන්නොත් ඇති. ඒ අය ඉතා පහසුවෙන් අනෙක් කටයුතු කර ගනීවි.

පසුගිය කාලයේ විශාල නවෝදයක් ඇති වුණා, පුරන් කුඹුරු අස්වද්දන්න ඕනෑ කියලා. අපේ කඩුවල ප්‍රදේශයේ, කැස්බෑව ප්‍රදේශයේ දිගට හරහට පුරන් වෙච්ච කුඹුරු අස්වද්දන්නට පටන් ගත්තා, අපි දැක්කා. ඒ ක්‍රියාවලිය හමුවේ අද වනකොට ගොවි සමිති අපෙන් කරන ඉල්ලීම තමයි, ඇළවේලි ටික විතරක් සුද්ද කරලා දෙන්න කියන එක. ඒ අය ජීවන තත්ත්වයෙන් උසස් මට්ටමක සිටින පුරවැසියන්. කෘමි නාශක යොදලා වගාවෙන් ආදායමක් උත්පාදනය කර ගන්න ඒ අයට අවශ්‍ය නැහැ. කුඹුර වපුරලා, තමන්ගේ පරිභෝජනය සඳහා අවශ්‍ය වී ටික නිපදවා ගැනීම තමයි ඒ අයට අවශ්‍ය වන්නේ. ඒ නිසා, කොළඹ දිස්ත්‍රික්කයේ සීමිතව හෝ තිබෙන ඇළවේලි ටික අපට සුද්ද කරලා දෙන්න කියලා ඉතා ගෞරවයෙන් ඉල්ලනවා. එහෙම කළොත්, කොළඹ කෙත්වතු ටික පුරන් වෙච්ච ස්වභාවයෙන් අයින් කරලා දෙන්න අපට පුළුවන්.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමල් රාජපක්ෂ අමාත්‍යතුමා.

[අ.භා. 5.32]

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் அரச பாதுகாப்பு மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சரும் உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation, State Minister of National Security and Disaster Management and State Minister of Home Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ.පී.එස්. කුමාරසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් එතුමාත් ගරු මන්ත්‍රීතුමන්ලාත් අදහස් දැක්වූවා. විශේෂයෙන්ම එතුමා මතු කර තිබෙන්නේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් පිළිබඳවයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් විශාල ප්‍රමාණයක් තිබෙනවා. එහි කුඩා වැව් හා විශාල වැව් ගත්තාම, 4,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. මහා වාරිමාර්ග යටතේ නම් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිබෙන්නේ වැව් සුළු ප්‍රමාණයක්. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ තමයි ගොඩක් වැව් තිබෙන්නේ. මධ්‍ය වාරිමාර්ග යටතේ වැව් 89ක් සහ මහා වාරිමාර්ග යටතේ වැව් 14ක් තිබෙනවා. අපි පසුගිය අවුරුද්දේ සහ මේ අවුරුද්ද තුළ "වාරි සෞභාග්‍යා" වැඩ පිළිවෙළ යටතේ කුඩා වැව් 51ක් ප්‍රතිසංස්කරණය කරන්න කටයුතු කළා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, රුපියල් මිලියන 500ක් වැනි විශාල මුදලක් ඒ සඳහා වැය කර තිබෙනවා. ලංකාවේ කුඩා වැව් 55,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ගම්වල තිබෙන සමහර කුඩා වැව් මිනිස්සු අනවසරයෙන් අල්ලාගෙන තිබෙනවා. ඒ වාගේම ගොඩක් වැව් ගොඩ වෙලා තිබෙනවා. එම පර්යන්තයේ වැඩ අවසන් වෙන්න ඕන.

කිසිම රජයක් පසුගිය කාලයේ මේවා නඩත්තු කරන්න කටයුතු කරලා තිබුණේ නැහැ. මේ තත්ත්වය අතිගරු ජනාධිපති, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දැකපු නිසා තමයි මේ සඳහා වෙනම අමාත්‍යාංශයක් ඇති කළේ. මේ සියලු වැව් සඳහා රාජ්‍ය අමාත්‍යවරයෙකු ඉන්නවා. එතුමා යටතේ තමයි මේ කුඩා වැව් සියල්ල තියෙන්නේ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වැව් තියෙනවා; ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ වැව් තියෙනවා. මේ වැව් ක්‍රමානුකූලව පුනරුත්ථාපනය කරන්න, වැව් ගොඩ වෙලා තියෙනවා නම් ඒවායේ මඩ ඉවත් කරන්න, මිනිස්සු වැව් අල්ලාගෙන තියෙනවා නම් ඒවායේ මිනුම් කටයුතු කරලා නැවත නිදහස් කර ගන්න, ගමේ වැවත් එක්ක ගමේ ආර්ථිකය ගොඩනඟන්න අපි වැඩ පිළිවෙළ හදලා තිබෙනවා.

මේ අවුරුද්දේ අපි බොහෝ දුරට කොන්ත්‍රාත් පදනමින් බැහැරව රාජ්‍ය ආයතනවලට මේ වැව් හදන්න භාර දුන්නා. ඒ වාගේම, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවත්, SD&CC එකත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඉංජිනේරු සංගමයත් වැව් හදන්න භාරගෙන, දැනට වැව් කිහිපයක කටයුතු අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෙරෙනවා. පහත් බිම් ප්‍රදේශ ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් කිහිපයක කටයුතු කරනවා. මේ වැව්වල වැඩ ඇස්තමේන්තු කරන්නේ ඉංජිනේරු මහත්වරු. ඇස්තමේන්තු කළාට පස්සේ තමයි ඒ අයට මුදල් දීලා ඒ කටයුත්ත කරන්නේ. "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ ඇළ වේලිත් හදනවා. සමහර තැන්වල ඇළ වේලි සෑදීම ලැබෙන මුදල අනුව කෙරෙන්න නැතුව ඇති. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා යම් චෝදනාවක් කළා නම්, අපි ඒ ගැන සොයනවා. හොඳ වැඩක් කරලා චෝදනා අහන්න අවශ්‍ය නැති නිසා, මීට පසුව අපි ඇස්තමේන්තුවක් සකස් කළාට පස්සේ ස්වාධීන කණ්ඩායමක් මඟින්ත් නැවත ඇස්තමේන්තු කරනවා. ඊට පසුව මුදල් වෙන් කරන්න තමයි අපි ඉදිරියේ දී බලාපොරොත්තු වෙන්නේ. එතකොට ඒ කටයුත්ත සිද්ධ වෙනවා. ඒ වාගේම, ඒ කරන වැඩේ හරියට කරනවාද කියලා අධීක්ෂණය කරන්නත් කටයුතු කරනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා කිව්වා, රාජ්‍ය ඇමතිවරයෙක් සල්ලි ඉල්ලුවා කියලා. එහෙම එකක් වෙලා නැහැ, අපි සොයාලා බැලුවා. ගමේ සිටින වෙනත් පුද්ගලයෙක් තමයි වැවක් හදන්න කෙනෙකුගෙන් සල්ලි ඉල්ලා තියෙන්නේ. එහෙම නැතුව මේ රාජ්‍ය ඇමතිවරයෙක්වත්, වෙන කවුරුවත් ඒකට සම්බන්ධ වෙලා නැහැ. මේ වැව් සියල්ලේම කටයුතු කරන්න ඕනෑ නිසා අපි තීන්දුවක් ගත්තා. ඒ අනුව ඉංජිනේරුවන් විසින්, තාක්ෂණ නිලධාරින් විසින් ඒ වැව හරියට තක්සේරු කරලා, මිනුම් කටයුතු කරලා, කොපමණ රොන්මඩ ප්‍රමාණයක් ඉවත් කරන්න ඕනෑද ආදී සියල්ල තක්සේරු කරලා, ගොවි සංවිධානවලට ඒ කොන්ත්‍රාත් එක භාර දෙයි. රාජ්‍ය භාරය ගෙවලා ගොවි සංවිධානවලට ඒ කොන්ත්‍රාත් එක ගන්න පුළුවන්. ඒ පස් ඉවත් කරලා හෝදලා ගත්තාට පස්සේ වැලිත් ගන්න ලැබෙනවා. මැටි ලැබෙනවා නම් මැටි කර්මාන්තය කරන අයට දෙන්න පුළුවන්. වැලි ටික හෝදලා විකුණන්න පුළුවන්. නමුත් රාජ්‍ය භාරය ගෙවන්න ඕනෑ. අපි බොහෝ දුරට චෝදනා, අරවා මේවා නැති වෙන විධියට රාජ්‍ය ආයතන මඟින් තමයි මේ කටයුත්ත කරන්න බලාපොරොත්තු වෙන්නේ. නමුත් අනුරාධපුරයේ වැවකට විශාල මුදලක් ලබා දීලා තිබෙනවාය කියන කරුණ ඔබතුමන්ලා සඳහන් කළා. අපි නැවත වරක් සොයලා බලනවා, කොහොමද එච්චර මුදලක් වැය කළේ කියලා.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

මට ප්‍රශ්නයක් නඟන්න අවස්ථාව දෙන්න, ගරු ඇමතිතුමනි. මධ්‍යම පළාතේ වැව් කිහිපයක් කඩාගෙන යෑමේ අවදානමක් ඉතා ආසන්න මට්ටමට තිබෙනවා. එකක් තමයි හන්තාන රජමහා විහාර වැව් බැම්ම. අනෙක් එක තමයි ගොවින්දල නවලියන්ග වැව. මේ වැව් දෙක වාගේම, උඩත්තව, මීගහමඩ වැව, කොහිලපතා වැව සහ හිඹුටුව ගොවි ගම්මානයේ වැව යන මේ වැව්වල අවදානමක් තියෙනවා, ගරු ඇමතිතුමනි. අවදානම් සහිත ඇළ වේලි පිළිබඳව මම ලේඛනයක් හදලා තියෙනවා. ඒ අනුව

[ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා]

උඩුදුම්බර රඹුක්වැල්ල ඇළ වේල්ල සහ ගම්පොළ කීරපනේ ඇළ වේල්ල කැඩී බිඳී ගොස් තිබෙනවා. එම ලේඛනය සකස් කිරීමට අපේ රාජ්‍ය ඇමතිතුමාත් සම්බන්ධයි. අවදානම්සහගත ඇළ වේලි පිළිබඳව කඩිනමින් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉතා කාරුණිකව ඉල්ලීමක් කරනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

හොඳයි. සියලු ගම්වල තිබෙන වැව් ටික හදන එක තමයි අපේ ඉලක්කය; අරමුණ. ඒ තුළින් ගමේ ආර්ථිකය ගොඩනඟන්නත් අපි කටයුතු කරනවා. අපි වැව විතරක් හදලා නිකම් ඉන්නේ නැහැ, ඇළ වේලිත් හදනවා. ඒ වාගේම, ගමේ වැව හැදෙනකොට එක පැත්තකින් ගමේ අයට එතැනින් විවේක ගන්න, විනෝදාස්වාදයක් ලබා ගන්නත් පුළුවන්.

ආර්ථික වශයෙන්, මත්ස්‍යයන් වැවට දමලා ධීවර කර්මාන්තය කරන්න පුළුවන්. ඒ වාගේම වැව ඉහත්තාවේ කුකුළන්, තාරාවන් ඇති කරලා ආර්ථිකය දියුණු කර ගන්නත් පුළුවන්. උස්සාන වාරි මාර්ග තුළ වැව ඉහත්තාවේ තිබෙන ගෙවතු වගා කරන්න අවශ්‍ය ජලය සපයන්නත් කටයුතු කරනවා. අපි යමක් කරන්නේ බොහොම සද්භාවයෙන්. යම් අඩුපාඩු තිබෙන්න පුළුවන්. ඒ අඩුපාඩු පෙන්වා දුන්නොත්, ඒවා නිවැරදි කරන්න කිසිවිටෙකත් අපි අතපසු කරන්නේ නැහැ.

අපේ රාජ්‍ය ඇමතිවරු දෙපළ වන ගරු අනුරාධ ජයරත්න මැතිතුමාත්, සිරිපාල ගමලත් මැතිතුමාත් ඉතා උනන්දුවෙන් ඒ කටයුතු කරනවා. ඒ නිසා අපට පුළුවන් වෙයි, අපේ ඉලක්කය කරා යන්න. අපේ ඉලක්කය, අවුරුදු 4ක් ඇතුළත ගම්වල වැව් 5,000ක් සෑදීමයි. හැම ගමකම තිබෙන වැවක් හැදෙනවා. සමහර වෙලාවට ඒ මන්ත්‍රීතුමා කියපු කථාවත් හරි. මම Southern Expressway එකේ Bedigama Exit එකෙන් එළියට බැහැලා වීරකැටිය පැත්තට යනකොට බැදිගම ප්‍රදේශයේදී කුඩා පොකුණක් දැක්කා. ඒක excavator එකක් දාලා හාරනවා. මම ඇහුවා, මේක කරන්නේ කවුද කියලා. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් කරලා තිබෙන්නේ. ඒකේ ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ 147ක්. මම කිව්වා, ඒක වහාම නවත්වන්න කියලා. මොකද, ගමේ කෙනෙකුට රුපියල් ලක්ෂ 10ක් දුන්නා නම් ඒක කරගන්න තිබුණා. ඒ බිම් ප්‍රමාණය අක්කරයකටත් වඩා අඩුයි. ඒ වාගේ දේවල් අපි දැකපු තැන නතර කරන්න ඕනෑ. ඒවා පිළිබඳව අධීක්ෂණය කරන වැඩ පිළිවෙළකුත් හදන්න ඕනෑ. එහෙම වුණොත් මුදල් අපතේ නොයවා උපරිම ලෙස ප්‍රයෝජනවත් ආකාරයට යොදවන්න පුළුවන්.

පුරන් කුඹුරු අස්වද්දන්නත් පුළුවන්, ගමේ ආර්ථිකය ගොඩනඟන්න. ගමට වැවක් හැදුණාම ඒ වැව නඩත්තු වෙන්නත් ඕනෑ. වැව රැකබලා ගන්න වැවට අයිතිකාරයෙක් ඕනෑ. ඒ සඳහා ගමේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ හෝ ආගමික නායකයෙකුගේ නායකත්වයක් දෙන්න ඕනෑ. ගමේ විදුහලේ විදුහල්පතිතුමා සිටියොත්, පාසලේ ළමයි එතැනට එකතු වෙනවා. පරිසර නියමු ඒකක - environmental pioneer brigades - ඒ හැම තැනම හදලා තිබෙනවා. ඒ අයට පුළුවන්, වැව් සංස්කෘතියත් එක්කම වැව ගැන අවබෝධයක් ලබා ගන්න; වැව නඩත්තු කරන්න; පිරිසිදු කරන්න. ගමේ වැඩිහිටි සංවිධාන තිබෙනවා, කාන්තා සංවිධාන තිබෙනවා, තරුණ සංවිධාන තිබෙනවා, ධීවර සංවිධාන තිබෙනවා, ගොවි සංවිධාන තිබෙනවා. ඒ හැම කෙනෙකුගෙන්ම සමන්විත කමිටුවක් හදලා වැවේ භාරකරත්වය ඒ අයට ලබා දෙන්න ඕනෑ. එතකොට වැවක් වාර්ෂිකව නඩත්තු කරන්නත්, ඒ කටයුතු සද්භාවයෙන් කරන්නත් පුළුවන්.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට අදාළ තොරතුරු ගොඩක් තිබෙනවා. ඒ ඔක්කෝම කියවන්න වෙලාව නැහැ. එම නිසා මම ඒ තොරතුරු සියල්ල ඇතුළත් වාර්තාව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා. එතකොට ඕනෑම කෙනෙකුට ඒක කියවන්න පුළුවන්.

ස්තුතියි.

***සභාමේසය මත තබන ලද වාර්තාව:***
***சபாபீடத்தில் வைக்கப்பட்ட அறிக்கை:**
**Report tabled:*

අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් අමුණු හා ඇළ වේලි පහත පරිදි කළමනාකරණය සිදු කෙරේ.

* මහා වාරිමාර්ග හා අන්තර් පළාත් වාරිමාර්ග - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

* මහවැලි විශේෂ බල ප්‍රදේශවල පිහිටි වාරිමාර්ග - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

* සුළු හා මධ්‍යම වාරිමාර්ග - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා උතුරු මැද පළාත් සභාව

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන වාරි ව්‍යාපාරවල ඇළ වේලි හා වැව් අමුණු සියල්ල නඩත්තු කරමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවද, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා පළාත් සභාව මඟින් වැව් 3,054ක්, අමුණු 127ක් හා ඇළ පද්ධති 27ක් කළමනාකරණය කෙරෙන අතර, මහවැලි H කලාපය මඟින් මහවැලි බල ප්‍රදේශ ආශ්‍රිත සමස්ත ඇළ වේලි හා වැව් කළමනාකරණය සිදු කෙරේ.

දිවයින පුරා පිහිටි 55,000කට නොඅඩු කුඩා, මධ්‍යම, විශාල වැව් හා ඇළ වේලි සංඛ්‍යාව කලක සිට නිසි ප්‍රතිසංස්කරණවලට ලක් නොවීම නිසා නව රජය මඟින් ප්‍රමුඛතම සංවර්ධන කාර්යයක් ලෙස සලකා ඉදිරි වසර පහ ඇතුළත කුඩා වැව්, අමුණු හා ඇළ වේලි 5,000ක් ආශ්‍රිතව පූර්ණ ප්‍රතිසංස්කරණයක් සිදු කිරීම මේ වන විටත් ආරම්භ කර ඇත.

ඒ අතුරින් මේ මුදල් වර්ෂය තුළදී වැව් හා අමුණු 1,590ක් ආශ්‍රිතව ප්‍රතිසංස්කරණ කටයුතු මේ වන විටත් ඉතා සාර්ථකව සිදු වෙමින් පවතින අතර, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් හා අමුණු 100ක් හඳුනාගෙන ඉන් 80ක වැඩ කටයුතු මේ වන විටත් අවසන් වෙමින් පවතී. ඉදිරි වසර හතර ඇතුළත වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තවත් වැව් සිය ගණනක් ප්‍රතිසංස්කරණය වනු ඇත. මීට අමතරව අතිගරු ජනාධිපතිතුමන් විසින් දියත් කරන ලද "ගම සමඟ පිළිසඳර" විශේෂ වැඩසටහන යටතේ හඳුනාගත් ව්‍යාපෘති ගණනාවක් හා "වැව්ගම් පුබුදුව එල්ලංගා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය" යටතේද වැව් 40කට නොවැඩි ගණනක් ප්‍රතිසංස්කරණය කර ඇත.

උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය මඟින් මොරගහකන්ද / කළු ගඟ ජලාශවල එක්රැස් කරනු ලබන ජලය යකල්ල දක්වා දිවෙන ඇළ මාර්ගයක් ඔස්සේත්, අනතුරුව එම ජලය හුරුළු වැව, නුවර වැව, මාන්නක්කට්ටිය, මහකනදරාව ඇතුළු මහා වැව් හා කුඩා වැව් පන්සියයක් පමණ පෝෂණය කරමින් 2024 වර්ෂය වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ මහවැලි ජලයෙන් දෙකන්නයම පෝෂණය කෙරෙනු ඇත.

නව රජයේ ප්‍රමුඛතම සංවර්ධන කාර්යයක් ලෙස දියත් කොට ඇති "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ දිවයිනේ සියලු ග්‍රාමීය ප්‍රදේශ ආවරණය කෙරෙමින් සිදු කෙරෙන ග්‍රාමීය වැව් පුනරුත්ථාපන වැඩ පිළිවෙළ පිළිබඳව රජරට නියෝජනය කරනු ලබන මහජන නියෝජිතයකු ලස ඔබතුමන්ද සතුටු වනු ඇතැයි විශ්වාස කරමි.

1. <u>මහවැලි අධිකාරිය</u>

අනුරාධපුර දිස්ත්‍රික්කය තුල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් පාලනය වන වැව්, ඇළ වේලි හා කෘෂිමාර්ග වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ පුනරුත්ථාපනය කරන ලද හා ඉදිරියේදී සංවර්ධනය කිරීමට අපේක්ෂිත කාර්යයන් පිලිබඳව වාර්තාව,

මහවැලි H හා හුරුළුවැව බල ප්‍රදේශ වල අනුරාධපුර දිස්ත්‍රික්කය අයත් වැව්වල තොරතුරු ;

| කලාපය | H | හුරුළුවැව | එකතුව |
|---|---|---|---|
| මුළු වැව් සංඛ්‍යාව | 120 | 13 | 133 |
| වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ නිම කරන ලද වැව් සංඛ්‍යාව | 33 | 2 | 35 |
| හොද තත්වයේ පවතින වැව් සංඛ්‍යාව | 13 | - | 13 |
| වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ පිළිසකර කරමින් පවතින වැව් සංඛ්‍යාව | 9 | 3 | 12 |
| 2022 වසරේ වාරි සෞභාග්‍යා වැඩසටහනට ඇතුලත් කර ඇති වැව් සංඛ්‍යාව | 6 | - | 6 |
| ගාස්තු ලබාගෙන රොන්මඩ ඉවත් කරමින් පවතින වැව් සංඛ්‍යාව | 21 | - | 21 |
| 2022 වසරේ ගාස්තු ලබාගෙන රොන්මඩ ඉවත් කිරීමට අපේක්ෂිත වැව් සංඛ්‍යාව | 10 | 2 | 12 |
| 2023 වසරේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට අපේක්ෂිත වැව් සංඛ්‍යාව | 28 | 6 | 34 |

2. <u>වාරිමාර්ග දෙපාර්තමේන්තුව</u>

අනුරාධපුර දිස්ත්‍රික්කය තුල කුඩා වැව් 3418ක් පළාත් වාරිමාර්ග හා ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව යටතේද මධ්‍ය වාරිමාර්ග 89ක් හා මහා වාරිමාර්ග 14ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේද පවතී. මෙම වසරේ අබලන් වූ කුඩා වැව් 51ක් වාරි සෞභාග්‍යා යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පුනරුත්ථාපනය කරන ලදී. මේ සඳහා රු.මිලියන 500කට ආසන්න ප්‍රමාණයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැය කර ඇත.

ඉහත ප්‍රශ්න ගත යෝජනාවේදී මෙයාකාරයෙන් වැව් පුනරුත්ථාපනය කලද දිස්ත්‍රික්කය තුල පිහිටා ඇති වාරි ඇළවල් තව දුරටත් අබලන්ව තිබෙන බවත් ඒවා නිසි පරිදි පුනරුත්ථාපනය කිරීමට නිසි වැඩපිළිවෙලක් කල යුතු බව අනුරාධපුර පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ.පී.එස්.කුමාරසිරි මැතිතුමා විසින් යෝජනා කර ඇත. එතුමන්ගේ මෙම යෝජනාව තත්කාලීනව සත්‍ය කරුණක් බව පසක් කරමි. එනමුදු වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රමුඛතාවය මත තෝරා ගන්නා ලද ඇළ පද්ධති හා (ප්‍රධාන ඇළ, බෙදුම් ඇළ, කෙත් ඇළ හා අපවහන ඇළ පද්ධතිය) කෘෂි මාර්ග වල කරන ලද පුනරුත්ථාපන හා නඩත්තු සඳහා පසුගිය වසර 03 පුරා කරන ලද වියදම් විස්තරය පහතින් දක්වා ඇත.

(A). වාරිමාර්ග දෙපාර්තමේන්තුව - අනුරාධපුර කලාපයේ පසුගිය වසර කිහිපය තුළ ඇලවේලි ඉදිකිරීම හා නඩත්තු කිරීම සම්බන්ධ තොරතුරු

01. CRIP ව්‍යාපෘතිය

හුරුළුවැව ව්‍යාපෘතිය - NCB 27 හා NCB 32 - රු. මිලියන 61

රාජාංගනය ව්‍යාපෘතිය - උස්සාන වාරිමාර්ග ව්‍යාපෘති NCB 105, NCB 106 හා NCB 107 - රු. මිලියන 119

පදවිය කොට්ඨාශය - NCB 19, NCB 20 හා NCB 23 - රු.මිලියන 109.2

02. දෙපාර්තමේන්තු සම්මත වැය ශීර්ෂ යටතේ සිදුකරන ලද වැඩ විස්තර

| වැය ශීර්ෂය | 2019 (රු.මිලියන) | 2020 (රු.මිලියන) | 2021 (රු.මිලියන) | මුළුමුදල (රු.මිලියන) |
|---|---|---|---|---|
| වාරිමාර්ග දෙපාර්තමේන්තු සතු ව්‍යාපාරවල මාර්ග නඩත්තු කිරීම | 0.46 | 1.26 | 2.59 | 4.3 |
| පෝෂිත ඇලවල් නඩත්තු කිරීම | - | - | 0.45 | 0.5 |
| මධ්‍ය හා මහා ව්‍යාපාරවල අත්‍යවශ්‍ය වැඩිදියුණු කිරීමේ කටයුතු | 42.2 | 25.9 | 76.29 | 144.4 |
| දැනට පිහිටි ව්‍යාපාරවල අමතර වැඩිදියුණු කිරීමේ කටයුතු | 2.76 | 0.16 | 3.24 | 6.2 |

03. PIESIP ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර, හුරුළුවැව, පදවිය, රාජාංගනය හා නාච්චාදුව ව්‍යාපාර වල ඇලවේලි පද්ධති නවීකරණය සිදු කර ඇත. ඒ සඳහා අනුරාධපුර කලාපයේ පසුගිය අවුරුදු 3 තුළ වැය කළ මුදල පහත පරිදි වේ.

2019 - රු.මි. 75.6

2020 - රු.මි. 56.15

2021 - රු.මි. 35

04. ISEWP ව්‍යාපෘතිය යටතේ හුරුළුවැව ව්‍යාපාරයේ ඇල පද්ධති නවීකරණය කිරීම සඳහා රු.මිලියන 7.75ක ඇස්තමේන්තු මේවන විට සකසා ඇති අතර වැඩ ආරම්භ කර ඇත.

(B). ලබන වර්ෂය සඳහා යෝජනා කර අනුමත වී ඇති ව්‍යාපෘති පහත සඳහන් කරමි.

01. අනුරාධපුර ප්‍රාදේශීය ඉංජිනේරු කොට්ඨාශයට අයත් මහ කනදරාව ව්‍යාපාරයේ බෙදුම් හා කෙත් ඇළ පද්ධතිය පුනරුත්ථාපනය කිරීම (ජලාප්‍රවාහන මණ්ඩලයේ ප්‍රතිපාදන) රු.මිලියන 300ක් මගින්

02. ඒරු වැව සිට මහකනදරාව දක්වා ඇති පෝෂිත ඇළ යලි විවෘත කිරීම (ජලාප්‍රවාහන මණ්ඩලයේ ප්‍රතිපාදන) රු.මිලියන 81යි.

03. ඒරු වැව ඇළ පදධතිය පුනරුත්ථාපනය කිරීම REDIP ව්‍යාපෘතිය (JICA) රු.මිලියන 30යි.

04. හුරුළුවැව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාශය යටතේ හුරුළුවැවේ වම හා දකුණ ප්‍රධාන ඇළ දිගින් අඩක් වූ මුල් කොටස් පුනරුත්ථාපනය කිරීම. (IWRRMP) ලෝක බැංකු ව්‍යාපෘතිය රු.මිලියන 250 යි.

05. පදවිය ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාශයට අයත් පදවිය හා වාහල්කඩ කෘෂි මාර්ග හා ඇළ පද්ධතිය පුනරුත්ථාපනය කිරීම රු.මිලියන 230ක් (ගම සමඟ පිළිසඳරක් වැඩසටහන)

06. පදවිය ජයන්ති වැවෙන් පහල බෙදුම් ඇළ අංක 28 සිට 42 දක්වා පුනරුත්ථාපනය කිරීම රු.මිලියන 800යි. (යාන් ඔය බහුකාර්ය යෝජනා ක්‍රමය යටතේ )

07. අත්හැර දමා තිබූ හුරුළුවැව කොට්ඨාශයට අයත් සේරුනුවැව හා අනුබද්ධ ඇල පද්ධති නවීකරණය කිරීම සඳහා දේශගුණික සුහුරු ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයට රු.මිලියන 78 ඇස්තමේන්තු පිළියෙල කර ඇත.

[ගරු චමල් රාජපක්ෂ මහතා]

(C). මීට අමතරව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් ව්‍යාපාර වල ඇළ වේලි හා කෘෂි මාර්ග පුනරුත්ථාපනය සඳහා ප්‍රමුඛතාවය මත අවධානය යොමු කල යුතු ව්‍යාපාර පහත සඳහන් වේ.

| ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාශය | ව්‍යාපාරයේ නම |
|---|---|
| අනුරාධපුර | මහවිලච්චිය, මහකනදරාව |
| හුරුළුවැව | හුරුළුවැව, මානන්කට්ටිය |
| රාජාංගනය | උත්සාන වාරිමාර්ග ඇතුළුව රාජාංගනය |
| පදවිය | පදවිය හා වාහල්කඩ |

මේ ආකාරයෙන්ම දිස්ත්‍රික්කය තුල ඇති මධ්‍ය පරිමාණ වැව් 89ද වැව හා ඇළ හා පද්ධතියද පුනරුත්ථාපනය විය යුතු බව අවධාරණය කරමි.

3. <u>පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව</u>

අංක 1704/6 දරණ 2011.05.02 දිනැතිව නිකුත් කරන ලද ගැසට් පත්‍රය අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වැව් 2991ක් අයත්ව ඇත. එසේම මෙයට ඇතුළත් නොවුන මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් නොවන වැව් විශාල ප්‍රමාණයක් ද ඇත. ඒ අනුව ආසන්න වශයෙන් වැව් 3050ක් පමණ ද, කුඹුරු අක්කර 128,000.00 ක් පමණ ද අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පවතියි. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් වර්ෂයකට වැව් 60ක් පමණ සම්පූර්ණ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනු ලබයි.

එහෙත් කෘෂිමාර්ග හා කෙත් ඇලවල් සම්පූර්ණ වශයෙන් ප්‍රතිසංස්කරණය කිරිමට, වෙන්වන ප්‍රතිපාදන තුළ සිදු කිරිමට හැකියාවක් නැත. විදේශ ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දී ඇලවේලිත් සමඟ වැව් ප්‍රතිසංස්කරණය කිරිමට අවශ්‍ය පියවර ගෙන ඇත. කෙසේ වෙතත් ඇල වේලි නඩත්තුව පිළිබඳ ගොවීන්ගේ අවධානය අඩු බවක් ද පෙනෙන්නට ඇත. කෙසේ වෙතත් ඉදිරියේ දී ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කිරිමට කටයුතු කරන බවත් කාරුණික ව දන්වා සිටිමි.

4. <u>ගොවිජන සේවා දෙපාර්තමේන්තුව</u>

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පාලනය වන වැව් 3421 අනුරාධපුර දිස්ත්‍රික්කය තුල පිහිටා ඇත. ඒ අතරින් පසුගිය වසර 5 ක කාලය තුල වැව් 450 ක් පමණ සංවර්ධනය කර ඇත.

ඒ අතරින් ප්‍රතිසංස්කරණය කළ යුතුව ඇති ඒවා හඳුනාගෙන ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව් හා වාර්මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2021 වසරේ රු.මිලියන 56 ක වියදමින් වැව් 10 ක් පමණ මේ වන විට සංවර්ධනය කර ඇත.

ග්‍රාමීය එල්ලංගා සංවර්ධන වැඩසටහන යටතේ තිරප්පනේ,මරදන්කඩවල සහ ඉපලෝගම ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශ වල පිහිටා ඇති තෝඩමඩුව එල්ලංගා වාරි පද්ධතිය දැනටමත් සංවර්ධනය කරමින් පවතී. වැව් 35 කින් සමන්විත මෙම එල්ලංගාවෙහි සංවර්ධනයට අයත් වන ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්ද ක්‍රියාත්මක කර ඇත. ඒ යටතේ ද රුපියල් මිලියන 13.8 ක් වැය කරමින් ව්‍යාපෘති 22 ක් ක්‍රියාත්මක කර ඇති අතර, මේ වන විට බොහෝ ව්‍යාපෘති වැඩ අවසන් කර ඇත. මෙම එල්ලංගාවෙහි ඉතිරි වැව් 2022 වර්ෂය තුල සංවර්ධනය කිරිමට සැළසුම් කර ඇත.

ලෝක බැංකු ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෝන්වැව,පරංගියාවාඩිය, හොරොව්පොතාන කෝන්වැව ,පේමඩුව හා රනෝරාව යන ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශ තුල පිහිටා ඇති වැව්, ඒ ආශ්‍රිත කෘෂි මාර්ග හා කමත් 37 ක් පමණ මේ වන විටත් සංවර්ධනය වෙමින් පවතී. ඒ සඳහා දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය මගින් රු.මි.330 ක් පමණ මේ වන විටත් වෙන් කර ඇත. ඉදිරි වසර තුල ග්‍රාමිය වැව් 205 ක් පමණ මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට යෝජිතය.

වාරි පද්ධතියක තිරසාර පැවැත්ම තහවුරු කිරීම සඳහා දේශගුණික සුහුරු වාරි කර්මාන්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක බල ප්‍රදේශයේ පිහිටි ගොවිජන සේවා මධ්‍යස්ථාන 10 ක් සඳහා යාන්ත්‍රික ඒකක 10 ක් ලබා දිමට සැළසුම් කර ඇත. ඒ යටතේ වාරි පද්ධතියේ නඩත්තුව සහ සුහුරු කෘෂිකාර්මික කටයුතු සඳහා උපකරණ අවශ්‍යතාව ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් මේ වන විටත් හඳුනාගනිමින් සිටී.

සුළු වාරි පද්ධතියේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය තණකොළ කපන යන්ත්‍ර 350 ක් ගොවි සංවිධාන 264 ක් සඳහා මේ වන විටත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ලබා දී ඇත. ඒ යටතේ ගොවි සංවිධාන මගින් වැව් බැම්ම හා ඇළවේලි ක්‍රමානුකූලව නඩත්තු කිරීම අපේක්ෂා කරනු ලබයි.

අයවැය යෝජනා මගින් 2022 වර්ෂය සඳහා වෙන්ව ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් ලබන වසර තුල තවදුරටත් ප්‍රතිසංස්කරණය කළ යුතු වැව් මේ වනවිටත් හඳුනාගෙන ඇත. එම සුළු වාරි වැව් සංවර්ධනය කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු මේ වන විටත් සකස් කරමින් පවතින බව ගරු සභාව වෙත වාර්තා කරනු කැමැත්තෙමි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.42ට 2021 නොවැම්බර් 20 වන දින සභා සම්මතිය අනුව, 2021 දෙසැම්බර් 03 වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.42க்கு, பாராளுமன்றம் அதனது 2021 நவம்பர் 20ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2021 டிசம்பர் 03, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.42 p.m. until 9.30 a.m. on Friday, 03rd December, 2021, pursuant to the Resolution of Parliament of 20th November, 2021.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.